නෙක්ඛිසාරාඛ්‍යදීපනී.

නෙතනීසාරාර්ථදීපනී.

මහාක්ෂීණාශ්‍රව මහාකාත්‍යායන

මහාසාමිප්‍රණීත

නෙතනීප්‍රකරණයට

පාණ්ඩුරේ වලපල

ශ්‍රී සඛමෝදය පාරිවෙණික ගණවාචකාචාර්‍ය

කෝදාගොඩ උපසෙන මහිමිපාණන්

වීසින්

විරචිත සිංහලාර්ථ ව්‍යාඛ්‍යානයයි.

මාතර සවියන

ඩී. ඇස්. විජේකෝන් නමැති

මාවීසින්

ප්‍රකාශිත්‍ය

කොළඹ ශ්‍රීහාරතී යන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරවන ලදී.

ශ්‍රී බු. ව. 2476.

ක්‍රි. ව. 1933.

මිල රු. 2-50.



ආරඤ්ඤික විදර්ශනාචාර්ය සිරිසුමන මාහිමි.

සිරිසුමනමහාසාමි
සද්ධරඤ්ඤවිපස්සකො
හොතු කල්‍යාණමිත්තෙතා මේ
යාව සංසාරමුත්තියා.

SRI BHARATI PRESS

දැන්වීමයි.

නෙතතිසාරුවිදීපනී නම්වූ මේ බණපොත් වහන්සේ මෙහි කතෘවූ අපගේ කල්‍යාණ මිත්‍ර **හරුතර කෝදුණාඩ උපසෙන** මාහිම්‍යාණන් වහන්සේගේ අනුමතයෙන් මෙහි නම සඳහන් වන මාවිසින් මුද්‍රණය කරවා බුඩසුජා ධම්සුජා වශයෙන් පුදා පින් අන්පත්කර ගැණීමට අදහස් කරණලදී.

වෙසෙසින් මාගේ ප්‍රේෂ්ඨ පුත්‍රවූ පරලොකප්‍රාප්ත දෙන් කරෝලිස් විජේකෝන් පොඩිමහත්මයා ඝිහිකිරීමෙන් පින් අනු මෝදන් කිරීම පිණිස මෙයින් පොත් (2000) ක් මුද්‍රණය කරවා (1000) ක් අනුරුඩපුර රුවන්මැලි මහසෑයේ ප්‍රතිසංඝකරණයට ආධාර පිණිස පූජාකිරීමටද- (500) ක් ගටියන ජයවර්ධනාරාම යෙහි ආරම්භකරණලද පුස්තකාලයෙහි නවකම්නාත පිණිස පරිත්‍යාග කිරීමටද, ඉතිරිපොත් උපසෙන සවාමීන්වහන්සේගේ අභිමතයේ සුදුසු පොත්ගුල් පිරිවෙන්වලට හා ගිහි පැවිදි පින් වතුන්ට සතුටුපඬුරු වසයෙන් දීමටපිණිස පරිත්‍යාග කිරීමටද නියමකර ගන්නාලදී. මෙයින් ලැබෙන ආදායමෙන් සවලපය කුදු අපගේ හෝ කතෘවූ සවාමීන් වහන්සේගේ හෝ කිසිම කව ග්‍රන්ථකට නොගන්කෙමු. මෙයින්එක් කොපියක් රුපියල් 2/50 ට දීමෙන් මහසෑයේ වැඩට රුපියල් 2000 ක් ලබාගත හැකිවේ. ජයවර්ධනාරාමයේ පොත්ගුලේ නවකම් පිණිස පොත් 500, මගේ පුත්‍රවූ-ඔබ්ලිව්. විජේකෝන් කරගොඩ උයන්හොඩ විදානආරච්චි මහත්මයාට පත්කරණු ලැබේ.

තවද මෙය මුද්‍රණය කරවීමෙහිදී කොපිලියාදීම් ප්‍රාප්බැලීම් සංඥපන ශුඩිපත්‍ර යෙදීම් ආදි කටයුතු සම්පාදනයෙහි යෙදුනාවූ පමුණුවේ අප ගරු බුඩදහන සවාමීන් වහන්සේ ප්‍රධාන කලවානේ ධම්මදස්සී සවාමි, කැකුණේවල ඉන්දගුත්ත සවාමී, අරම්වල අතුලසෙන සවාමි, වලපල්ල ජෝතිරත්න සවාමි, මහලේහොඩ චන්දජෝති සවාමි, ගලගම ජිනසෙන සවාමි යන ඔත් නමද, මුද්‍රණාලයේ මහතුන් හා සෘණවශ්‍ය කිරීමෙන් අපගේ නියමයෙන් මුදල්දීමෙන් අවශ්‍ය ශ්‍රඩාධ්‍යාශයෙන් කටයුතුකළාවූ පාණදුරේ ඒ. පී. අෆිප් ජයසූරියමහත්මයා, ඒ. වී. ප්‍රනාන්දු මහත්මයා, බී. ඇස්. ගුණසේකර මහත්මයා යන මහත්වරුද, මුද්‍රණාලයේ ප්‍රධාන යූ. පී. ඒකනායක සහෝදර මහත්වරුද, අපගේ මේ ගරු පින්කමට සහභාගිව පින් ලබාගන්නෝය. පාණදුරේ

සී. ඒ. පීරිස් මහත්මයා අපගේ කල්‍යාණමිත්‍රවූ විදර්ශනාචාර්‍ය්‍ය ආරඤ්ඤික රංගාගොඩ සිරිසුමන මාහිමියාණන් වහන්සේගේ ජායාරූපය බ්ලොක් කප්පවා දීමෙන්ද, (මුද්‍රණයගැන) ආර්තර් සිල්වා මහත්මයා රූපියල් 5 ක් හා කෝදාගොඩ ශ්‍රී. ජේ. ඒ. චන්ද්‍රසිංහ මහත්මයා රු. 25. පත්කිරීමෙන්ද මම සහභාගීවූහ.

තවද සම්බුද්ධශාසනයාගේ පැවැත්මට එකාන්තයෙන්ම ආධාර වන්නාවූ මේ සත්කෘත්‍යයෙන් ජනිත පුණ්‍යසමූහය අපගේ මූලික කල්‍යාණ මිත්‍රවූ දකුණුලක රාජඤ්ඤනිකාය පිහිටුවා ශීලාදිගුණයෙන් බැබළෙවිවාවූ විදර්ශනාචාර්‍ය්‍ය ආරඤ්ඤික පුවක්දණ්ඩාවේ ඤාණේශ්වර මහා සඞ්ඝරාජ වණ්ණාර්හ ඇතුළු උත්තමයාණන් වහන්සේලාද, අපගේ මාතෘ පිතෘ පුත්‍රදාරු භ්‍රාතෘ භගිනී ආචාර්‍ය්‍ය ඥාතිමිත්‍ර මිත්‍රාදි සකල මනුෂ්‍යයෝද සකල දිව්‍ය බ්‍රහ්ම අසුරකාය සුපර්ණී යක්ෂ රාක්ෂසාදි අමනුෂ්‍යයෝද, සකල රජදරුවෝද සකල දඹදිව්වාසීහුද අනුමෝදන් වෙත්වා.

සබ්බේ සත්තා අවේරා හොන්තු අබ්‍යාපජ්ජා හොන්තු
සුඛිතත්තා භවන්තු.

වත්තාරෝව මහාරාජා-සහකාවාපි සුරාපරේ
අනුමෝදිත්වා ඉමං පුඤ්ඤං අඛාරක්ඛන්තු සාසනං
ඉමිනා යාවනිබ්බානං සව්වධම්ම රතොසදා
කල්‍යාණමිත්තෙන සෙවමානා කරිස්සං පුඤ්ඤසඤ්චයං.

ඉදං මේ පුඤ්ඤං ආසවක්ඛයා වහං හොතු.

මම,

ඩී. ඇස්. විජේකෝන්.

යටියන-මාතර.

ශ්‍රී බුද්ධ වර්ෂයෙන් 2476 ඉල් මස
අවතෙළෙස්වක්ලත් කිවිදින දින.
1932 නොවැම්බ්‍ර 25.

කරුණාවෙන් දැන්වීමයි.

පසුගිය වර්ෂයේ ගරු කෝදාගොඩ උපසෙන මාහිමියාණන් වහන්සේගේ දඹදිව වන්දනා ගමන ගැන ඒ ඒ පලාත්වල දායක මහතුන් විසින් අපවෙත එවනලද මුදල් ඒ ගමන වැලකුණු බැවින් ඒ ස්වාමීන් වහන්සේගේ නියමයෙන් මේ පොතේ මුද්‍රණය ගැන ඒ මුදල රු. 157, ජී. පී. ඇප්. ජයසූරිය මහත්මයා වෙත භාරකරණලදී.

මම,-එච්. ලියනාරච්චි-නිධානාරක්ෂක.

නෙත්තිව්‍යාඛ්‍යා සූචි.

		පිට.
	ව්‍යාඛ්‍යාරම්භ ගාථා 10	1
	ව්‍යාඛ්‍යාරම්භ වාක්‍ය	2
1. සඞ්ග්‍රහවාර.	අවයවාදී විභාග	2
"	සමුදයාදී විභාග	
	යෝජනාදී විභාග	4
ප්‍රථම ගාථා	නිජීවන නිද්දේසාදී විභාග	5
	සරූපාදී විභාග	6
	ශාසනාදී විභාග	7
	විතීය ගාථාදී විභාග	8
	තෘතීය ගාථාදී විභාග	9
	චතුර්ථගාථාදී විභාග	10
	පඤ්චම ගාථාදී විභාග	11
	නවාඞ්ග සඞ්කර පරිහාර විභාග	11
	නෙත්තිපාළිමුත්තකප්‍රකීර්ණකවිනිශ්චය	13
2. උද්දේසවාර.	හාරෝද්දේශ වර්ණනා	14
	නයෝද්දේශ වර්ණනා	18
	මූලපදෙද්දේශ වර්ණනා	16
3. නිද්දේසවාර,	දේසනාහාර නිද්දේශ වර්ණනා	21
හාරනිද්දේස.	විචයහාරනිද්දේශ වර්ණනා	23
	යුත්තිහාරනිද්දේශ වර්ණනා	25
	පදට්ඨානහාරනිද්දේශ වර්ණනා	26
	ලක්ඛණහාරනිද්දේශ වර්ණනා	27
	චතුබ්‍යූහහාරනිද්දේශ වර්ණනා	28
	ආවට්ටහාර නිද්දේශ වර්ණනා	29
	විභත්තිහාර නිද්දේශ වර්ණනා	30
	පරිවත්තනහාර නිද්දේශ වර්ණනා	31
	වෙවචනහාර නිද්දේශ වර්ණනා	32
	පඤ්ඤත්තිහාර නිද්දේශ වර්ණනා	33
	ඔතරණහාර නිද්දේශ වර්ණනා	34
	සෝධනහාර නිද්දේශ වර්ණනා	35
	අධිට්ඨානහාර නිද්දේශ වර්ණනා	35
	පරික්ඛාරහාර නිද්දේශ වර්ණනා	36
	සමාරොපනහාර නිද්දේශ වර්ණනා	37
නයනිද්දේස.	නන්‍දුපාවතීනය නිද්දේශ වර්ණනා	38
	නිප්පක්කලනය නිද්දේශ වර්ණනා	39

		පිට.
	සිනම්භකිත්‍රිතනය නිද්දේස වණ්ණනා	40
	දිසාලොචනනය නිද්දේස වණ්ණනා	40
	අඩ්ඪුඤනය නිද්දේස වණ්ණනා	41
	භාරනය යොජනාභාර වණ්ණනා	41
	ව්‍යඤ්ජනපද නිද්දේස විභාග	42
	අථපද නිද්දේස විභාග	45
	නෙත්තිංසනෙත්‍යවයව විභාග	46
	නෙත්තිනිද්දේස ප්‍රකීණක විභාග	47
4. පට්ඨිදෙසභාර. භාරවිභඩග.	දෙසනාභාරවිභඩග	51
	විවයභාරවිභඩග	67
	යුත්තිභාර විභඩග	86
	පදට්ඨානභාර විභඩග	96
	ලක්ඛණභාර විභඩග	102
	චතුබ්‍යූහභාර විභඩග	107
	ආවට්ටභාර විභඩග	119
	විභත්තිභාර	128
	පරිවත්තනභාර	137
	වෙවචනභාර	139
	පඤ්ඤත්තිභාර	145
	ඔතරණභාර	152
	සොධනභාර	160
	අධිට්ඨානභාර	161
	පරික්ඛාරභාර	169
	සමාරොපනභාර	174
5. භාරසම්පාත.	දෙසනාභාරසම්පාත	178
	විවයභාරසම්පාත	184
	යුත්තිභාරසම්පාත	213
	පදට්ඨාන ,,	214
	ලක්ඛණ ,,	214
	චතුබ්‍යූහ	215
	ආවට්ට	215
	විභත්ති	215
	පරිවත්තන	216
	වෙවචන	216
	පඤ්ඤත්ති-ඔතරණ-සොධන	217
	අධිට්ඨාන-පරික්ඛාර-සමාරොපන	218
නාළන්දිකත්‍රිතක භෙත්‍රිභභාර සම්පාත විභාග		218-225

		පිට.
නයසමුට්ඨාන.	නන්දියංවට්ටනය භූමිවණ්ණනා	225
	සංකෙලෙස පක්ෂයෙහි දිශාඛම් විභාග	229
	වෙදනාපක්ෂයෙහි දිශාඛම්විභාග	234
	වෙමිස්සකනයවිභාග	236
	පාළිමුත්තකනයසමුට්ඨානවිභාග	238
සාසනපට්ඨාන විභාග		
	සඞ්කිලෙසභාගියාදි සූත්‍රවිභාග	243
	සඞ්කිලෙසභාගිය සූත්‍රෝදහරණ	245
	වාසනාභාගිය සූත්‍රෝදහරණ	251
	නිබ්බෙධභාගියාදි සූත්‍රෝදහරණ	252
	අසෙඛභාගිය සූත්‍රෝදහරණ	257
	සංකිලෙසභාගිය වාසනාභාගිය සූත්‍ර	259
	සංකිලෙසභාගිය නිබ්බෙධභාගිය සූත්‍ර	260
	සංකිලෙසභාගිය අසෙඛභාගිය සූත්‍ර	261
	සංකිලෙස-නිබ්බෙධ-අසෙඛභාගිය සූත්‍ර	262
	සංකිලෙස-වාසනා-නිබ්බෙධභාගිය	264
	ලෝකිකාදි අටවිසි සුතුරු විනිස	(265-278)

සංඥාපනය.

නෙත්තිපපකරණය.

සබ්බමනඤ්ඤවෙඤ්ඤ නෙත්ති- වෙනෙය ජනයන් නව ලොවුතුරා දහමට පමුණුවන හෙයින් නෙත්ති නම්, සසරගත සතුන් කාමභවාදියට පමුණුවන හෙයින් තාණ්හා නොමෝ භව නෙත්තියයි කියනු ලබන්නී මෙනි, නොහොත්- හාර- නය- පට්ඨාන- සංඛ්‍යාතවූ සම ඛණ ශාසනත්‍රයකින් ධර්මකථිකයෝ වෙනෙය ජනයන් දේශනාභූමියට පමුණුවත්ද ඒ ධර්මශාසත්‍රය නෙත්ති නම්, සොළසහාර- පඤ්චනය- අට්ඨාරස මූලපද (මූලික පට්ඨාන) ඡබ්‍යඤ්ජනපද- ඡඅත්ථපද- සංඛ්‍යාත එකාපඤ්ඤාභාව යවශෙන් යුත් බෞද්ධ න්‍යායශාසත්‍රය නෙත්තියි- ඇය සකල නවාඞ්ග ශාස්තෘ ශාසනයාගේ අවිපරීතාර්ථය බොධයට උපාය මාර්ගයි, එහෙයින් "නහි නෙත්ති උපදෙස සන්නිස්සයෙන විනා අවිපරීත සුත්තත්ථාවබෝධෝ සම්භවතීති" කීහ. විසතර ව්‍යාඛ්‍යා නයින් දතයුතු.

මේ නෙත්ති න්‍යායශාසත්‍රයද නවාඞ්ගශාස්තෘශාසනාර්ථ වණ්ණ නා හෙයින් අට්ඨකථා ක්‍රමයකි, භාෂිතාර්ථ කථාවෙහි හා- මේ නෙත්‍යර්ථ කථාවෙහි අන්‍යෝන්‍ය විශෙෂ ලක්ෂණ කිමෙක්ද? පිටකත්‍රය පර්‍යාපන්න නවාඞ්ග ශාස්තෘ ශාසනයාගේ අවයවාර්ථ සමුදයාර්ථාදිය ප්‍රකාශක ප්‍රකීර්ණක දෙශනාග්‍රන්ථ පඬිකතිය භාෂි නාර්ථ කථායි, නවාඞ්ග ශාස්තෘ ශාසන පර්‍යාපන්න පර්‍යාය නිඃ පර්‍යාය නීත නෙර්‍යය සාසව අනාසව වාසනාභාගීය නිර්ඛේධ භාගීය සෙඛභාගීය අසෙඛභාගීයාදි අර්ථ සමුදය තත්තත් සූත්‍ර යෙන් උඩරණය කොට අසාදී ආදීනව නිස්සරණ ඵල උපාය ආර්ණතා වශයෙන් බෙදූ ප්‍රතිපදා වතුෂ්ක පුද්ගලත්‍රිකාදි යෙහි භාග්‍ය සම්පත්තීදි නය වශයෙන්ද සමථ විදර්ශනා මාර්ගානුසාරයෙන් දාර්ශ්ටාන්තයට වෙනෙය ජනයන්ගේ සිත්සතන් පමුණුවන ආකාරොපදෙශය නෙත්‍යර්ථ කථායි- මේ සැකෙවින් එදෙතැන වෙනැසි:-

ඒ මේ නෙත්ති නොමෝ කවරෙකු විසින් හදුරණ ලද්දේද? යත්: සිව්පිළිසිඹියාපත් මහාකසින් මාර්ගඵලාර්ණව වකන්සේ විසිනි, ඒ වග සැකෙවින් මෙසේයි- මෙසින් කප්ලකකින් පෙර ලොව පහළවූ පියුමතුරා බුදුන් විසින් සියසවුතමක් "සැකෙවින් වදුල දහම් විතරින් බෙදා දක්වන්නවුන් අතුරෙන් අගතැන් තබා පඤ්ඤා දුටු" එක් ගැහැවි මහඵල් කුලදරුවෙක් ඒ තත

තුරෙහි ඇලීගිය සිතැත්තේ බුදුපාමොක් මහසඟනට සනියක් දන්දී බුදුන් පාමුල හෙව සාමිනි ඉකුත් සත්වැනිදින ලෝහිමියාණන් වහන්සේ විසින් දහම්බෙදීමෙහි අහනැන් නැබූ වහන්දැලත් තනතුර මම්ත් මතුකල් ලබන්නෙමැයි කීය. ඒ පියුම්තුරු ලෝහිමියාණෝ අහා තැණින් මතුකල් බලනුමෝ ඒ සඛඳ සියලු අහා පුවත් දුන එම්බා හැහැවිය- "හෝ මෙයින් කප්ලකක් ගියකල හොයුම් ලෝහිමියාණන්ගේ සස්නෙහි ඉදිමුවා පිරිකරින් පැවිදිව රහත්ව එම තනතුර ලබන්නෙහියයි" වදාළ සේක- එයින් පහන් සිතැතිව එතැන්පටන් පෙරුම් පුරමින් අවුත් සුමේඛ නම් බුදුන් සමයෙහි විජ්ජාධරයෙක්ව කිණිහිරිමලින් ඒ බුදුන් පුදා- කසුප් බුදුන් සමයෙහි බරණැස් නුවර ඉපිද ඒ බුදුන් පිරිනිවි කල රන්සෑය කිරීමට රන් ගඩොලක්පුදා පින්ගත්තේය. නැවත අප බුදුන් සමයෙහි උජ්ජනිරට වණඹපජ්ජොත රජුගේ පුරොහිත බමුණුකට පුත්ව කසයින් බමුණුගොත උපන්නේය- යටකී කිණිහිරිමල් පූජාවෙන් හා රන් ගඩොල් පූජාවෙන් ලත් පිණෙන් රන්වන් සිරුරු ඇතිවූ හෙයින් කඤ්චන මාණවික යයි නම් කළෝය. තුන්වෙදයෙහි කෙළ පැමිණියේ පියබමුණුහුගේ ඇවැමෙන් පුරොහිත තනතුරට පත්වූයේ බුදුන් ලොව පහළවූ බව ඇසූ වණඹපජ්ජොත රජු විසින් සියනුවරට බුදුන් වැඩමවාගෙන ඒමට ඇමතියන් සත්දෙනෙකුන් පිරිවර කොට යවන ලද්දේ බුදුන්වෙත පැමිණ ඔණ අහා එහි භික්ඛුසාඛයෙන් පැවිදිව රහත්ව රජුගේ හස්ත බුදුන්ට දන්වියි. ලෝහිමියන්ගෙමේ මහණ නෝ පළමුකොට එහි ගොස් රජකට බණකියා පහදවයි වදාළසේක. එබස් පිළිගත් කඤ්චන් හිමියන්ගෙමේ උජ්ජනි රටට වැඩමවා දහම්දෙසා රජ ඇමතීන් හා රටවැස්සන් සරණ සීලාදි ගුණයෙහි පිහිටුවා අවනතී දකුණා පථයෙහි බුදුසසුන් පිහිටුවා නැවත බුදුන් හමුවට පැමිණියේය.

නවද මේ මහකසයින් මාහිමියාණෝ බුදුන් සමයෙහිවූ මහ සවුවන් අතුරෙහි බුදුසසුන් වඩාළු මහොතනමයෙකි. තවුන් වහන්සේගේ සඩ්විහාරිකවූ කුවිනණණ්ඩාන සථවිරයන්ට වර පසක් කියාදී බුදුන්වෙත එවා "අනුජානාමි භික්ඛවෙ සඛඛ පච්චන්තිමෙසු ජනපදෙසු විනයධරපඤ්චමෙන ගණෙන උපසම්පදං" යනාදි ප්‍රඥප්ති වරපසෙක් සාසනයෙහි සථිරකරවා තබනලදී. නැවත බුදුරජාණන් වහන්සේ දෙව්රම්වෙහෙර ඉරිගව් පවත්වන සේක්, මධුපිණ්ඩික සූත්‍ර පාරාසරිය සූත්‍ර තවවාරණ පෙය්‍යාල යන සූත්‍රානන්තරයන් අට්ඨාරපත්ති ඨකාව සංඛිත්තනාමයි කියාගේ අටිය වත්තරෙහින් විභාග කරන්නවුන් අතුරෙන් අග තන්හි නැබූසේක.

තවද "පණ්ඩිතෝ භික්ඛවේ මහාකච්චානෝ මහාපඤ්ඤෝ භික්ඛවේ මහාකච්චානෝ" යනාදි වශයෙන් ලෝකස්වාමීන් විසින්ද-

"අයං ඛෝ ආයස්මා මහාකච්චානෝ සත්ථුවෙව සංවණ්ණිතෝ සම්භාවිතෝ ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං පහොති ආයස්මා මහාකච්චානෝ ඉමස්ස භගවතා සංඛිත්තෙනන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං" යනාදි වශයෙන් හා-

"තං ඛෝ පන භවන්තං කච්චානං එවං කල්‍යාණෝ කිත්ති සද්දෝ අබ්භුග්ගතෝ පණ්ඩිතෝ වියත්තෝ මේධාවී බහුස්සුතෝ චිත්‍රකථී කල්‍යාණ පටිභාණෝ වුද්ධාවෙව අරහාව" යනාදි වශයෙන්ද මහ සවුවන් විසිනුත් පශ්ස්තාලද පිරිසිදු පඬිතුමෙකි. ඒ මේ මහනසගින් මාහිම්‍යාණන් වහන්සේ විසින් හාර- නය- පට්ඨාන- සංඛ්‍යාත ත්‍රිභාගයෙන් යුත් නෙතත්‍රිප්‍රකරණය හා අරිය සච්චපකාසනභූමි ආදි අෂ්ටවිධ භූමිනය පරිවේදයෙන් යුත් පෙටකොපදේශ ප්‍රකරණයද- වදාළබව-

"එකසමිං සමයෙ ආයස්මා මහාකච්චානත්ථෙරෝ ජම්බුවන සණ්ඩ විහරන්තෝ අන්තරන්තා සන්තිකා වචරූනං භික්ඛූනං ඉමං හාරනය සාසනපට්ඨාන පතිමණ්ඩිතං පකරණං අහාසි යි" සඟහළු සුදනී නම් නෙතත්ති ටීකාවෙහි කියනලදී.

එහෙයින් මේ නෙතත්ති පෙටකොපදේශ- යන ග්‍රන්ථවය- ඝාවකහාෂිතයි. හාග්‍යවතුන් වහන්සේ විසින් අනුමෝදිත හෙයින් හා බුඩහාෂිත දෘෂ්ටාන්ත කොට ඇති හෙයින්ද බුඩහාෂිත කදවේ- නෙතත්තෝමෝ පාළිවශයෙන් සඩහහවාර- විභාග වාර යයි දෙවදුරුම් වන්නීය- එහි-

"යං ලෝකෝ පූජයතෙ- යනාදි හාථාපඤ්ඩකවශයන් පිරිසිදිනාලද්දේ සඩ්ග්‍රහවාරයයි- විභාගවාරය- උද්දෙශ- නිද්දෙශ- පටිනිශද්දශ- වශයෙන් තෙවදුරුම්වේ. එහි පටිනිද්දෙසවාරය හාරවිභඩගවාර- හාරසම්පාතවාර- නය සමුට්ඨානවාර- සමෙන පට්ඨානවාර යයි-සිව්වැදුරුම්වේ, සෙසුනය අට්ඨවණයින් හා ව්‍යඤ්ජනයින්ද දතයුතු.

ඒ මේ නෙතත්තිය හා පෙටකොපදෙශය- සඩගිතියෙහිදී බුදුකණිකාවෙහිලා සඩගායනා කරණලදී. උපාලිදශකාදි ඇදුරු පරපුරෙන් අඟකරව ගෙනෙන ලද්දී දකුණු දඹදිව ලක්දිවට අභිමුඛව පිහිටි නාගපට්ටන නම් මහතොට දම්සෝ

මහරජු විසින් කරවනලද වෙහෙර විසූ අටුවාචාරී තෙපෙණෙක්වූ බදරතීර්ථ ධම්පාල මහාසථවිරයන් වහන්සේ විසින් අර්ථකථා සම්පාදනයෙන් සඞ්ග්‍රහකරණ ලදදීය.

මේ දම්පල් මාහිම්පුරයේ මහාවිහාර පරම්පරා යානවූ උතුමෙකි. ඒ තෙනැති අටුවාභි ලීනාර්ථ සන්දර්ශනයෙන් ත්‍රිපිටක මහාසථවිර තුමෙකු විසින් ලීනාර්ථප්‍රකාශනී නම් ටීකාවක්ද, එතිම-ඤ්ඤාගිවංස ධම්මසෙනාපති මහාධම්ම රාජාධිරාජගුරු සංඝරාජ මාහිම්පුරාණන් විසින් සංඝභථසූදනී නම් පෙටකාලඞ්කාර මහා ටීකාවක්ද- ත්‍රිපිටක සම්බන්ධපාල රාජගුරු මහාසථවිරයන් විසින් නෙතැති විභාවනී නම් ව්‍යාඛ්‍යානයක්ද පෙළබඳින් කරණලදී.

මේසේ දඹදිව බුද්ධකාලයෙහි පහළවූ නවාඞ්ග ශාසනාභාසන සංවර්ණනොපායභූත නෙතැති න්‍යායශාස්ත්‍ර ප්‍රචාරකොපායොප ග්‍රන්ථයන්ගේ ප්‍රාතුර්භාවයද- ජම්බුද්වීපිකවූද ත්‍රිපිටකවූද ශාසන පාලක සුධීන් ප්‍රභවකොට ඇතිවූවද- පිටකත්‍රයාර්ථකථා මූල ටීකා අනුටීකා ගණ්ඨිපද ව්‍යාඛ්‍යා ව්‍යාකරණ ඡන්දාලඞ්කාරාදි ප්‍රකරණ ග්‍රන්ථොත්පාදනයෙහි අතුල්‍ය කීර්තිකදම්බ ක්‍රිවොවහනය කළාවූ පෙරුණික මහෙංකලීය පණ්ඩිතයන් කෙරෙන් තව්‍ය පාරුපගමය කිසැවිදූනත්වයක්හේ පෙණිගිය නමුත් සාහනාය්‍ය හෙයින් මේ පස්විසිවැනි ශතවර්ෂයෙහි මෙලක්දිවපහළවූ අපගේ ගරු ඇදුරු මාහිම්පුරාණන්ගේ නෙතතිරතනාකර නෙතතිසාරත්ථ දීපනී ඇති පණ්ඩිත සමභාව්‍ය නෙතතිග්‍රන්ථවර රචනාවෙන් එය පිරී මැකී ගියේය. ඒ මේ ග්‍රන්ථවර ගුණමකු ඉසිවතුන් හැර නිසි ඉදි කැණැති පඬුවෝ වෙසෙසින් පසතත්වය ඒ ගැන වැඩි වැණුම් උවමනා නොවේ. පෙළබඳින් සූත්‍රව්‍යාති උදාහරණ සහිතව ෂට්පරිවෙජ්ජතමක වශයෙන් රචනාකරණලද නෙතතිරතනාකරය පඬුවන් විසින් පරීක්ෂාවෙන් බැලිය යුතු.

නවද-අපගේ ප්‍රාවාදයිවූ අරණ්‍යවාසි විද්‍යාචාර්‍යවර්‍ය රංහෙබ ශ්‍රී සුමන මාහිම්පුරාණන් වහන්සේ ඒ මේ නෙතතිරතනාකර ග්‍රන්ථය සතුරින් බැලීමෙන් නෙතතිශාස්ත්‍රය පිළිබඳව බලවත් ප්‍රීතියට පැමිණ ඒ ගැන කරුණු විමසා නෙතතිනයශාස්ත්‍රයාගේ මූල ග්‍රන්ථයවූ නෙතතිප්‍රකරණයට සිංහල භාෂාවෙන් ව්‍යාඛ්‍යානයක් කරණ හැටියට අපදුරු මාහිම්පුරාණන්ට නියම්කළහෙයින්-මේ නෙතතිසාරදීපනී නම් නෙතතිව්‍යාඛ්‍යාන ග්‍රන්ථය සම්පාදනය කරණලදී.

තවද අපගේ ඒ ඇදුරු මාහිමියාණන් විසින් තවත් ග්‍රන්ථ රාශියක් නිපදවනලදී. එනම්-

1 ධාතුවත්ථවිලාසිනී නම් ව්‍යාකරණ මහාටීකාව පරිච්ඡේද 13 යි, ගරුතර භික්ඛුත්වේ ශ්‍රී සුමඞ්ගල මහානායක මාහිම් යාණන් වහන්සේ විසින් ගාථා එකොළසකින් ගෞරව යෙන් පිළිගන්නාලදී.

2 මහාසමයෙහි වදුල සපනසූත්‍ර පදවිභන්නය සිංහල මුද්‍රිතයි.
3 අට්ඨකාර විනිච්ඡය-විනය පාළි
4 සමෙමාහතාසනී-පාළි මුද්‍රිතයි.
5 බඞ්ගසීමා විනිච්ඡය සහ සංඝදන් විනිච්ඡය-සිංහල මුද්‍රිතයි.
6 අඛඞ්ගසීමා විනිශ්චය-සිංහල මුද්‍රිතයි.
7 ගණ්ඨාභරණය-පාළි ගාථා.
8 මුඛමත්තදීපනී ව්‍යාකරණ ප්‍රථමාඛ්‍යා ව්‍යාඛ්‍යා.
9 විනයසික්ඛා සංවරවිභාගය-පාළි.
10 සංඝාවාස වාරිත්ත දීපනී-සිංහල මුද්‍රිතයි.
11 සුජනපපසාද-සිංහල මුද්‍රිතයි.
12 අඞ්ගුත්තරනිකාය ගණ්ඨිපද-(තික නිපාතාවසන් කොට)
13 සමෙහාන විනිශ්චය-සිංහල මුද්‍රිතයි
14 විනයාදාහ මිශ්‍ර-මුද්‍රණයෙහි යෙදී තිබේ
15 ආචරිය වංශ දීපනී-ගාථා

තවත් අඛ්‍යාලඞ්කරණයද ග්‍රන්ථ රාශියක් තිබේ.

මේඛවට-තත්ප්‍රධාන ශිෂ්‍යයා,

පමුණුවේ බුඛදත්ත සථවිර.
(බුඞ්දත්ත)

ශ්‍රී බුඞ්ධ වර්ෂයෙන් 2476 ඉල්මස
අවනවවක්ලත් සොම්දින
1932 නොවැම්බ්‍ර මස 21, පානදුරේ
වලපල ශ්‍රී සඞ්ඝෝදය පිරිවෙණදීය.

සුද්ධිපත්‍රය.

පිට.	පෙළ.	අසුඛ.	සුඛ.
3	7	කාරය	කාරනය
8	15	පදය	පදයද
11	14	සූත්‍රානනයාගේ	සූත්‍රානනාඒපයේය සනයාගේ
21	30	නිබබත්තනති	නිපජ්ජති
30	17	ආවට්ටියනති	ආවට්ටියනති
57	7	ශිලිෂ්ට	ශ්ලිෂ්ට
62	7	ශ්‍රෝතශ්‍රෝති හෙතුවෙන්	ශ්‍රෝතහෙතුවෙන්
64	7	ශබරූප	සඛරූප
67	14	රඤ්ජිතං	ආරඤ්ජිතං
72	8	පවත්තිතෝ	පවත්තතෝ
76	11	රූපාති	රූපිනී
94	9	අසම්ං	අසම්
99	22	කම්මසමඤ්ඤත	කම්මසඤ්ඤත
102	6	සත්ප්‍රුෂෝපනිශ්‍රය	සත්පුරුෂොපනිඃශ්‍රය
105	11	නෛයග්‍යානික	නෛයර්‍යාණික
144	2	අකාවං	අකාමං
172	12	ප්‍රත්‍යයවෙක්ෂා	ප්‍රත්‍යවේක්ෂා
182	23	දුකඛසම්භවය	දුකඛය සම්භවයය
187	23	අභිඤ්ඤාවී	අභිඥාවී
188	2	සවාභාවවූ	සවභාවවූ
190	7	මෙරමා විසින්	මෙරමා සිත්
218	24	අලොභයට	අලොභය
,,	8	ඒකානනතායි	එකත්තනතායි
224	9	මයා යතු එකත්තනතායි	මෙය අධිකයි.
224	11	එකත්තනතායෙනි	එකත්තනතායි මෙනි
244	13	අඝං, මේ ආඝතති නොමේ;	අඝං සම්මප්පධානා, මේ සම්මප්පධානා නොමේ;

මේගත් පරිශීලනය පෙළබඳ හෙළබඳ වියතුන්ට අත් බැවින් සුදුපත දික් නොකෙරෙම්.

නෙත්තිසාරට්ඨකථා
නම්
නෙත්තිව්‍යාඛ්‍යා.

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.

ව්‍යාඛ්‍යාරම්භය.

වන්දෙ මුනින්දමසමං කරුණාමන්දිරං
ධම්මං තදුභව වරඤ්ච ගණඤ්ච සාරං
සඞ්ඝිත්තභාසිතවිභාගකරානමග්ගං
කච්චායනඤ්ච භන්තෙ පණමේ හරුච.

ඉති යං වන්දනාජාතං-සාවෙරෙ රතනත්තයෙ
පුඤ්ඤඤ්ච තෙනෙතජ්ජා භන්තා-අන්තරායෙ භවාමිධ.

මහාකච්චායනත්ථෙර පණීතං යං මතොදයං
නෙත්තිප්පකරණං සද්ධු සාසනට්ඨි විනිච්ඡයං.

ධම්මපාල මහාථෙර රචිතා චට්ඨවණ්ණනා
අඤ්ඤයුච්චසතී අඤ්ඤෙඤ්ඤහි රචිතො පට්ඨවණ්ණනා.

තථාපෙට්ඨ නදිස්සන්ති සීහළාය නිරුත්තියා
තදට්ඨ වණ්ණනාදීනි තඟහන්ථාපිව දුල්ලභා.

තස්මා සඞ්ඝම නෙත්‍යට්ඨ කාමෙහි අභියාචිතො
ආණතෙනාව මම්වෙර මහාථෙරෙන යොගිනා.

නිච්චාරඤ්ඤ විහාරෙන සික්ඛාකාමෙන ධීමතා
සිරිසුමනාභිධානෙන තදණත්තිං ගරුංකරං.

සාසනට්ඨිති කාමොහං නිස්සායසස්ස ච්ණ්ණනා
කරිස්සං දීපභාසාය නෙත්තිසාරට්ඨදීපනිං.

යස්මා පඤ්චනිකායස්මා සාධකා තට්ඨදීපිතා
තස්මා පඤ්චනිකායට්ඨ කථාපෙ'ට්ඨ හජන්තුවෙ.

උත්තානත්ථ පදුත්ථ මදස්සෙත්වාන පාඨසො
වණ්ණයිස්සං තතොසා "යං කිඤ්චය්‍යාසඞ්ඛප වණ්ණ්‍යා"ති.

සෙනානාම්‍ය වාත්‍රිංශවර මහාපුරුෂ ලක්ඛණොපසොභිත කල්ප ශතසහශ්‍රොපරිප්‍රාතුර්භූත **පඨමාභිනීහාර සම්පත්ත රාජොභිනීහාරමහාඤාණෙන්** වහන්සේගේ පාදපද්ම මකරන්ද සදෙවමනුස්ස පිතප්‍රීති සම්වර්ධන සන්තාන සම්භාවනවැ කල්ප ශත සහශ්‍ර ප්‍රමිත සමයානන්තරයෙක්හි අභිනීහාර සමාචිණ්ණයෙන් යථාධිප්පායානයෙන් මදිය ශාක්‍යමුනීන්ද්‍රයාණන් සමයෙහි කසසින් බම්බුණ්ඩගොතැ ඉපිද වැඩිප්‍රාප්තවැ වෙදඤ්ඤව පාරගතවැ නිජ ශ්‍රොතපථප්‍රාප්ත තථාගත සත්කීර්ති ඝොෂාකර්ණයෙන් ප්‍රමුදිත හෘදයාන්තිකවැ **තථාගතයන්** වෙත සම්ප්‍රාප්තවැ ලබ්ධලද්ධ ධම්ම ශ්‍රවාදයෙන් සන්තුෂ්ටවැ ශාසනාවතීර්ණවැ අශෙක්ෂාභිඥ ප්‍රතිසම්භිදාදි ගුණසංඝ සඞ්ගතවූ යම් ඒ **මහාක්ෂීණාශ්‍රව** ශ්‍රමණයන් භාග්‍යවතුන් වහන්සේ විසින් "**එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජන්තානං යදිදං මහාකච්චායනො**"යි භාෂිතාර්ථ විභජනයෙන් අග්‍රස්ථානයෙහි තබනු ලැබූ සේක්ද ඒ මේ මහාකාත්‍යායන සථවිරපාදයාණෝ සමධිගත සථානාන්තරරූපකෘත්‍ය සම්පාදනයක් කරණු කැමැත්තෝ "**සච්චවාඛ්‍ය සච්ඡ ශාසනාඤ්ඤ** සංවණ්ණොපායභූත ඝොඛ්‍ය කාර පඤ්චනය අඤ්ඣාරඹ මූලපද සඞ්ඛ්‍යාත ත්‍රයත්‍රිංශත් අඞ්ග සඞ්ගත **සඞ්ඝබන්ධ නෙතතියාඝත්‍රය** ශරීරකොට **සංග්‍රහවාර විභාගවාර** සඞ්ඛ්‍යාතවාර පරිච්ඡේදවයකින් සම්ලඞ්කෘතවැ නෙත්ති ග්‍රන්ථය හදුරණුවෝ ප්‍රථමකොට ඉෂ්ටදෙවතා සෙනාත්‍ර ප්‍රණාම මුඛයෙන් "**සංලොකො පූජයතෙ**" යන ආදි භාථාවාරයෙන් සඞ්ග්‍රහවාරය ආරම්භකළෝ....

සඞ්ග්‍රහවාරය.

(1) **යං ලොකො පූජයතෙ-සලොකපාලො සදෙවා නමස්සති ච තස්ස නරවරස්ස-විදූහි ඒසෙය්‍යං සාසනවරං**....

"සලොකපාලො ලොකො සදෙවා යං පූජයතෙ නමස්සතිව, තස්ස නරවරස්ස එතං සාසනවරං විදූහි ඒසෙය්‍යං"යි සාවයව ක්‍රියා කාරකපද සම්බන්ධ යොජනාය....

සලොකපාලො, ලොපල් සිව්මහරජුන් හෝ ඉන්ද්‍ර-යාම-වරුණ-කුවෙරාදීන් සහිතවූ, නොහොත් ලොකපාලයෝයයි ප්‍රකට ක්ෂත්‍රිය වාතුම්මහාරාජික ශක්‍රසුයාම සන්තුසිත සුනිම්මිත පරනිම්මිත වසවත්ති මහාබ්‍රහ්මාදීන් සහිතවූ, අෙහෝ නොහොත් නිරිඔත්තප්ප සඞ්ඛ්‍යාත ලොකපාල ධම්මයෙන් සම්භාවනවූ; **ලොකො**, ශ්‍රද්ධා ප්‍රඥාදි ගුණාන්විත සත්ත්වසමූහතෙමේ; **සදෙවා**, දිවාරූ කැමකලැ, නොහොත් අභිනීහාරයෙහි පටන් ශාසනාන්තර්ධානය

දක්වා ඉන් ඔබ්බෙහි හෝ; **යං**, (අනඤ්ඤසාධාරණ මහාකරුණා සබ්බඤ්ඤුතඤාණාදි ගුණ විශෙෂ යොනහෙයින් සකල ලොකයා විසින් පූජනීය වන්දනීයවූ) යම් නරොත්තමයෙකුට; **පූජඤ්ච**, ආමිෂයෙන් හා ප්‍රතිපත්තියෙන් පූජාකෙරේද; **නමස්සති ච**, ලාභ කුලාවාප්තිබාදිය නොතකා වන්දනීයත්වය තකා කාවිසි මුනි තෙදෙරින් නමසකාර කෙරේද; **තස්සනරවරස්ස**, ඒ නරශ්‍රෙෂ්ඨ ශාක්‍යසිංහයාණන් වහන්සේගේ; **එතං සාසනවරං**, (හාරය පටිඨාන ක්‍රමයෙන් විභාගකරණු ලබන) ශ්‍රෙෂ්ඨතරවූ මේ නවාඞ්ග ශාස්තෘශාසනය; **විදූහි**, (ඛන්ධායතන ධාතු ඉන්ද්‍රිය පටිච්චසමුප්පාද සච්ච සතිපට්ඨානාදි සවභාව ධර්ම නිර්ණයෙහි සමර්ථවූ) පණ්ඩිතයන් විසින්, **ඤෙය්‍යං**, සම්භාවයෙන් දතයුතු.

අවසාන්විය.

මෙහි-පූර්වාර්ධයෙහි විනිය පාදය- "සලොකපාලො සදෙවමනුස්සෙසු"-යි ඇතම්හු බණිත්, හේ අසොභනයි; අපරාර්ධයෙහි ප්‍රථම පාදය, "තං තස්සසාසනවරං"යිද, "තස්සෙතං සාසනවරං" යිද- තවත් ඇදුරෝ බණිත්, මෙයින් පළමු ඇදුරන්ගේ මතයෙහි- "සලොකපාලො ලොකො යං සාසනවරං පූජයතෙ. නමස්සති ච තං සාසනවරං විදූහි ඤෙය්‍යං"යි- යොජනා කටයුතු; මෙහි ලොකපාල ශබ්දයෙන් භාග්‍යවතුන් වහන්සේද වාච්‍යයි; "තස්සෙතං සාසනවරං"-යි- බිණිමෙහි-මාත්‍රාධිකත්වයෙන් ඡන්දොවෘත්ති භෙදයවේ, "විදූහිතෙය්‍යං"යිද පඨනය කෙරෙත්, සවසන්නානයන්හි පැමිණවිය යුතුය යනාදීයි.

"සලොකපාල සහල සත්වලොක තෙමේ සබ්බඤ්ඤුතාඤ්ඤාදි අනෙකගුණ සම්භාවනාවූ යම් නරොත්තමයෙකුට තද්ගුණානුස්මරණයෙන් ආමිෂවසතු පූජාවෙන් හෝ ප්‍රතිපත්ති පූජාවෙන් හෝ හැමකලැ සකසා පුදන්නේද වඳින්නේද පූජනීය වන්දනීයවූ ඒ නරොත්තමයාණන් වහන්සේගේ තියුණු නුවණට හොඳුරුවූ ප්‍රාඥයන් විසින් දතයුතුවූ ඒ මේ සාසනවරය මෙහි ආරම්භ කටයුතුවූ හාරනය පට්ඨාන විභාරාත්මක නෙත්තිප්‍රකරණයාගේ ගොචරස්ථානය වන්නේ"යි- පළමුකොට දතයුතු අදහස දක්වා ඒ සාසනවරයාගේ අප්‍රමෙය්‍යගුණ සඞ්ඛ්‍යාත නෙත්තිප්‍රකරණය ආරම්භ කෙරෙම්- එය සත්පුරුෂවූ තෙපි මනාකොට අසව් මෙනෙහි කරව්"යි-ග්‍රන්ථකර්තෘන්ගේ ආශය ප්‍රතිඥයි.

සම්බන්ධාවසි.

"සලොකපාලොලොකො" යනු විශෙෂණ. විශෙෂිතව්‍යත්ව යෙන් යොජනායි, "ලොකො පූජයතෙ නමස්සති ච"යනු කතෘකාරක ආඛ්‍යාත ක්‍රියා භාවයෙන් යොජනායි; ඒ එසේ මැයි- පරමාර්ථ හෙයින් අවිද්‍යමානවුවද සම්මුතිප්‍රඥප්ති වශයෙන් පැණවියයුතුවූ චිත්තසන්තානයෙහි පවත්නාවූ හදවත ඇසුරුකළාවූ චෙතනාතපාද සඞ්ඛ්‍යාත ලොකතෙමේ සුදුසු පරිදිදෙන් හෙතු ප්‍රත්‍යය අධිපතිප්‍රත්‍යය. සහජාතප්‍රත්‍යයාදි වශයෙන් ප්‍රත්‍යය වූයේ පූජන නමස්සන ක්‍රියාවන් නිපදවානුයි- කතෘත්වයෙන් ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්නත්වයෙන් යොජනා කටයුතු; "යංපූජයතෙ-නමස්සති ච" යනු පූජන නමස්සන ක්‍රියාවන් හා වාචකවචනී යත්වයෙන් සම්බන්ධ හෙයින් කර්මාපෙක්ෂකාඛ්‍යාත ක්‍රියාවන් හා යොජනායි, ඒ එසේමැයි- පූජන වන්දන වෙතනාවන්ට අරමුණු වශයෙන් යං යනු වචනීයයි, තත්වෙතනාව වාචකයි; යංනරවරං-යන්තෙන් වාච්‍යවූ පරමාර්ථ හෙයින් අවිද්‍යමානවූද ප්‍රඥප්ති වශයෙන් පැණවියයුතුවූ සන්තාන වශයෙන් පවත්නාවූ ලොවී ලොවුතුරා ගුණසහිතවූ සකල පඤ්චකඛ ආරම්මණ ප්‍රත්‍යයත්ව යෙන්ද චෙතනාව ප්‍රත්‍යයොත්පන්නත්වයෙන්ද යොදාගතයුතු; 'තස්සනරවරස්ස" යනු විශෙෂණ විශෙෂිතව්‍යත්වයෙන් යොජනා කටයුතු; "පූජෙතබ්බස්සවෙව නමස්සිතබ්බස්සව තස්සනරවරස්ස සාසනවරං" යනු ජඤ්ඤජනක භාවයෙන් යොජනා කටයුතු; "විදූහිඤ්ඤෙය්‍යං" යනු කතෘකාරක කෘදන්ත ක්‍රියායොග හෙයින් යොජනා කටයුතු; මෙහි විදූහි යන්තෙන් සම්මුතිප්‍රඥප්ති සන්තාන යෙහි පවත්නාවූ නවාභිනවාසන්න ශාසනයෙහි සමෙමාභන්නාසක ශ්‍රුතමය චින්තාමය භාවනාවිත හෘදයවයතු නිශ්‍රිත චිත්තෙතපා දය හෙතු අධිපති සහජාතාදි ප්‍රත්‍යයත්වයෙන් නිපදවනලද ප්‍රත්‍යය ධර්මයකි, ඤා. ධාත්වර්ථ සඞ්ඛ්‍යාතාවබොධත්වය ප්‍රත්‍යයොත්පන්න ධර්මයකි, එබැවින් ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්නත්වයෙන් යොජනාකටයුතු; "ඤෙය්‍යං සාසනවරං" යනු ප්‍රාඥයන්විසින්ම නියුණු නුවණින් දතයුතු සාසනවරය-යි- විශෙෂ්‍ය කටයුතු හෙයින් විශෙෂණ විශෙෂ්‍යත්වයෙන් යොජනාකටයුතු; "එතං සාසනවරං" යනුද විශෙෂණ විශෙෂ්‍යත්වයෙන් හෙත මේ සාසන වරය වක්ෂ්‍යමාන නෙත්තිප්‍රකරණයාගේ හොවර ස්ථානය-යි- යොජනා කටයුතු.

යොජනාව විභාවයි.

සං, සී- පූජනනමස්සන ක්‍රියායෙන් සෘජුව අනියමිත ශ්‍රෙෂ්ඨ වාචක ප්‍රයොගවන්න සඞ්ඝනාමොපයොග නිදේශයි; සඞ්ඝනාම හෙයින් විග්‍රහරහිතයි, "ලොකියතනි එත්ථපුඤ්ඤපුඤ්ඤානි තබ්බිපාකොවාති ලොකෝ"-සී- යුහෙයින් සත්ථනිකාය දිළිබඳවූ කුසලාකුසලඤාණයේ හා තව්පාකඤාණයේද පැවැත්මට ආධාරවූ සත්ථසමූහයා ලොකනම්; "පූජයතෙ"- යනු ආඛ්‍යාත ක්‍රියා නිදේශයි, "ලොකං පාලෙන්තී"ති ලොකපාලා සහලොකපාලෙහි යොවත්තතෙ සෝ සලොකපාලෝ"සී- සාහිත්‍යාර්ථ සහශබ්ද සමාස යොග හෙයින්- "**සලොකපාලෝ සං පූජයතෙ සලොකපාලෝ සං නමස්සති, ලොකෝ සං පූජයතෙ ලොකෝසං නමස්සති**" යී-ප්‍රත්‍යෙක සම්බන්ධාපෙක්ෂකත්වයක් ගම්‍යමාන බැවින් "**සලොකපාලෝ**"යනු පරස්පර සාපෙක්ෂක තුල්‍යරූප මෙලත සඞ්ඛ්‍යාත සමාන ක්‍රියාඞ්ගත්ව පරිදීපක ප්‍රථමෙක වචන විශෙෂණ නිදේශයි; "**සද්ද**"යනු පූජනනමස්සන ක්‍රියානුයොග කාල වාචක විකල්පනාම සඤාමය්‍යාර්ථ නිෂ්පන්නාවය්‍යය නිදේශයි; "**නමස්සති**"යනු ආඛ්‍යාත ක්‍රියා නිදේශයි; **ච**. යනු සම්පිණ්ඩනාර්ථ අව්‍යය නිදේශයි, "**තස්ස**"- යනු පූජන නමස්සන ක්‍රියායෙන් නියමිත ප්‍රසිද්ධාර්ථ වාචක ප්‍රයොගවත් සඞ්ඝනාම සම්බන්ධාර්ථ විශෙෂණ ෂෂ්ඨි නිදේශයි; **එතං**- යනු නෙත්‍යාවඃඝ්‍රීයන් විසින් විභාග කටයුතු හාරනය පටන්න විචාරණ ගොචරකොටැ පවත්නා පඤ්ඤාපනී ශාසන පරාමර්ශණය කරණ ප්‍රයොගවත් සඞ්ඝනාම ප්‍රථමෙක වචන නිදේශයි; "සාසති එතෙනාති සාසනං"- යන නිර්වචන වාක්‍යයෙහි- **එතෙන**. යන කරණවචනයෙන් සකල වෙනෙය ජනයන්ට නෙත්‍යෝපදෙශ විෂයකොටැ ඇති නවාඞ්ග ශාස්තෘ ශාසනයෙන් ඓහලෞකික පාරලෞකික පරමාර්ථයන් දක්වා සුදුසු පරිද්දෙන් අනුශාසනා කිරීම දක්වන හෙයින් ශාසනානුශාසන ක්‍රියානුසාරයෙන් වෙනෙය ජනයන්ගේ අවබොධ ප්‍රතිපත්ති ප්‍රතිවෙධයට කාරණ කරණ භාවයෙන් (එතෙන- යන පදයෙන්) දක්වනලද නවවිධ සූත්‍රාන්තය සාසන නම්වේ;- නවද බුඞ්ගාදි දෙශකයන්ගේ මුවෙන් නික්මගිය ශබ්ද නවක රූපකලාප සඞ්ඛ්‍යාත දෙශනා ශබ්දයද- ඒ ශබ්ද නවකය උපදවන දෙශනාඥාන සම්ප්‍රයුක්ත චිත්තෙන්ත්පාදයද- "**සාස**- අනුසිට්ඨියං" යන ධාතුහුගේ මුඛ්‍යාර්ථයි, ඒ මුඛ්‍යාර්ථොපනිශ්‍රය ප්‍රත්‍යයෙන් වෙනෙය ජනයන්ගේ අර්හාවබොධ ප්‍රතිපත්ති ප්‍රතිවෙධාදිය කාරණොපචාරාර්ථයි; එතෙන- යන කරණ පදයෙන් කියනලද ශාසනසඞ්ඛ්‍යාත නාමප්‍රඥප්තීහුගේ කරණාර්ථ ශක්ති සඞ්ඛ්‍යාත උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තිය ඵලූපචාරාර්ථයි, "සාසතීති" යන මෙහි ඉති ශබ්දයද ඒ

නාම ප්‍රඥප්තිහුගේ එම උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තිය හෙතුභාව යෙන් පරාමෘෂ්ණය කෙරේ, ඒ උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියට සාධාරණතොවූ නාමප්‍රඥප්ති තොමෝ යු. ප්‍රත්‍යයාර්ථයි. "එකන්ත නීයාන්තාතෙන උත්තමතෙන ච වරං, වරිතබ්බන්ති වා වරං"යි. වරශබ්දයාගේ නිර්වචන හෙයින්- පඤ්චාපත්තිශාසනයවූකලි ආර්ය්‍ය ඵලදායකවශයෙන් මාර්ගප්‍රාප්තියට හෙතුබැවින් නීයාන්තාර්ථයෙන්ද ශ්‍රාවකාදීන් විසින් උපදවාලිය නොහැකි බැවින් අනන්‍ය සාධාරණ උත්තමාර්ථයෙන්ද- වර නම්වේ, "සාසනඤ්චතං වරංචාති සාසනවරං" මේ සමාසවාක්‍යානන්තර ච ශබ්දයෙන් ශබ්දශක්ති භෙදයද සං- ශබ්දයෙන් අර්ථභෙදයද දක්වයි; "යථාසභාවතො කාමං කාමථලානි කුසලාදිභෙදෙ ධම්මෙ තත්ථ්‍ඨඤ්ච සත්ථුසාසනං විදන්ති ජානන්ති සීලෙනාති විදූ" භෙහි විදූහි, යනු පදච්ඡෙදය විග්‍රහයි, ඤාතබ්බන්නිඤ්ඤෙය්‍යංයි- ඤා ධාතුවෙන් නිඃපඤ්චමිය වශයෙන් ආරම්මණික ඤාණය කියනලදී, සප්තාමිපචාර වශයෙන් සාසනයාගේ ආරම්මණ ප්‍රත්‍යය භාවය දක්වනලදී, ඉති ශබ්දයෙන් ආරම්මණ ප්‍රත්‍යය භාවය පරාමෘෂ්ණය කරණලදී, ඉති ශබ්දයෙන් පරාමෘෂ්ණය කරණලද ඒ ආරම්මණ ප්‍රත්‍යයත්වයට ආධාරවූ සාසනවරය ණාණ ප්‍රත්‍යයාර්ථයි, ඤාතුමරහතීති වා ඤෙය්‍යං; නරති අත්තානං උච්චට්ඨානං නෙතීති නරෙ,-නරති වෙනෙය්‍ය අරියමගනං නයතීති වා නරෙ-නරෙ ච සෙ වරොවාති-නරවරෙ තස්ස නරවරස්ස; මෙහි විශෙෂාර්ථ විභාගය උක්තාකාරයෙන් දතයුතු.

නිර්වචන නිර්දෙශාර්ථය.

සරූපාර්ථ විභාගය මෙසේ දතයුතු:-

සලොකපාල ලොකයා විසින් පූජනීය වන්දනීයවූ අනන්‍ය සාධාරණ සර්ව්ඥතාඥානාදි අනෙක ගුණ සමන්විතවූ සාසනවර දෙසකවූ භාග්‍යවතුන් වහන්සේ සං- යන පදයාගේ සරූපාර්ථයි. ලොකපාලයන් සහිතවූ ශ්‍රද්ධාශීලාදි සමන්විත සත්ත්වසමූහතෙමේ සලොකා- යන පදයාගේ සරූපාර්ථයි. පූජකයන් පිළිබඳ පූජා සඞ්ඛ්‍යාත චිත්තෙත්පාදය- පූජයන්ති. යන ක්‍රියාපදයාගේ මුඛ්‍ය වශයෙන් සරූපාර්ථයි. එලූපචාර වශයෙන් ඒ චිත්තෙත්පාදයට ආරම්මණ ප්‍රත්‍යයෝපනිශ්‍රයවූ උක්තප්‍රකාර සකල බුද්ධගුණයෝ සරූපාර්ථයි. පූජන ක්‍රියාසාධක සලොකපාල ලොකයා- කි විභක්ති ප්‍රත්‍යය සම්බන්ධ සරූපාර්ථයි. ශ්‍රේෂ්ඨ ලොකපාල සහිතවූ පූජන කර්මස්ථ ක්‍රියාසාධක සත්ත්වසමූහතෙමේ- සලොකපාල- යන පදයාගේ සරූපාර්ථයි. අභිනීහාර කාලයේ පටන් ශාසනානන්ත

ඕන කාලය දක්වා කාල විසෙසය- **සදා**- යන පදයාගේ සරූපාර්ථයි. **නමස්සන්ති**- යන පදයාගේ සරූපාර්ථය- **පූජයතෙ**- යන පදාර්ථය සමානයි. "අයං සලොකපාලො ලොකො පූජයති චෙව නමස්සතිච"-යි- සමුච්චයාර්ථය- **ච** ශබ්දයාගේ සරූපාර්ථයි; ජනකවූ නරවරයාණන්ගේ ජන්‍යවූ සාසනවරය හා එක්වූ ජන්‍ය ජනක සම්බන්ධය **තස්ස** යන පදයාගේ මුඛ්‍යසරූපාර්ථයි. කාරණය පධ්‍යාන විසයකොටැ ඇති **ශාසනය** එකා යන පදයාගේ සරූපාර්ථයි. පඤ්ඤාපති ශාසනවරය තමා සවපර සන්තානයන්හි පැවැත්වීම් ආදි වසයෙන් අවබොධයට සමර්ථවූ ප්‍රාඥවූ කල්‍යාණ පුථුජ්ජන සොතාපන්නාදි පුද්ගල සමූහතෙමේ-**විඤ්ඤූ**-යන පදයාගේ සරූපාර්ථයි. නියුණු තුවණින් දතයුතු සාසනවරය **නෙය්‍යං**- යන පදයාගේ සරූපාර්ථයි. සාසනවර ජනක භාග්‍ය වතුන් වහන්සේ **නරවරස්ස**- යන පදයාගේ සරූපාර්ථයි.

සරූපාර්ථ විභාගයි.

තවද- මෙහයෙහි- "පූජයතෙ-නමස්සති"- යන ක්‍රියාපද වයෙන් පූජන නමස්සන ක්‍රියාවන්ට හෙතුවූ සද්ධාඤාණාදි අපරිමිත ලෞකික ලොකොත්තර බුඩගුණ සමූහය ප්‍රකාශ කරණලදී.- "තංසාසනවරංඤෙය්‍යං" යන්නෙන් පඤ්ඤාපති ප්‍රතිපත්ති ප්‍රතිවෙධ සඞ්ඛ්‍යාත ත්‍රිවිධ ශාසන සම්බන්ධවූ සවාකඛාතතාදි සකල ධර්මගුණ සමූහයද- විදූහි- යන පදයෙන්, සුපටිපන්නතාදි සකල සඞ්ඝගුණ සමූහයද- ප්‍රකාශකරණලදී.

"යංලොකො-පෙ-තං තස්ස සාසනවරං"යි- සාකුසවාරවැ පඨිතකලැ- "සලොකපාලො ලොකො-යස්ස නරවරස්ස-නෙත්තිනයෙන සංවණ්ණෙණ තබ්බං යං සාසනවරං පූජයතෙ චෙව නමස්සති ච, තස්ස ලොකපාලස්ස නරවරස්ස සද්ධුනො තං පූජෙතබ්බං නමස්සිතබ්බඤ්ච විදූහෙව විඤ්ඤුතබ්බං එතං සාසනවරං නෙත්තිප්පකරණ විසයනති ඤාතබ්බං"යි යොජනා-කටයුතු.

තවද:-

"සබ්බපාපස්සඅකරණං-කුසලස්ස උපසම්පදා
සචිත්තපරියොදපනං-එතං බුඩ්ධානසාසනං".

යනු වදාළ හෙයින් අනොඩාර වශයෙන්-ශ්‍රැතමය ඥානවිෂය කොට පවත්නා- **පඤ්ඤාපති සඞ්ඛ්‍ය**-චින්තාමය ඥානවිෂයකොටැ පවත්නා ආකාර පරිච්ඡෙදිකා දෘෂ්ටිනිධ්‍යානක්ෂාන්තියෙන් ගතයුතු ආකාරයයි කියනලද විමුක්තායතන විශෙෂ සඞ්ඛ්‍යාත ප්‍රඥ

පතති සබ්භීඝ-විපස්සනා ඤාණාදීන් සහගියාවූ භාවනාමය ඥාන විෂයකොටැ පවත්නා ප්‍රතිවෙධ **සබ්භීඝ**- යන ධර්මත්‍රය-අධිශීල-අධිචිත්ත- අධිප්‍රඥා සඞ්ඛ්‍යාත ත්‍රිශික්ෂාවෙන් සඞ්ගෘහීත හෙයින් ත්‍රිවිධ බුද්ධශාසනවරඝයි- කියයුතුය; එසිනුදු- ශ්‍රැතමය ඥාන ගොචර පර්‍යාපන්ති සබ්භීඝ ඉතර ශාසන ධර්මවයට පත්වීමට උපාය වන බැවින්ද- සකල ශාස්‍ත්‍රයට මූල්බැවින්ද- අභිප්‍රේත ප්‍රකරණයට ගොචර බැවින්ද- මෙහි- **සකල නවාඞ්ග පර්‍යාපන්ති සබ්භීඝම ශාසනවරඝ**-යි- දතයුතු.

ප්‍රථමගාථා වර්ණනායි.

---

(2) **මාදඝපදුනි සුත්තානං-නං සබ්බං ඛ්‍යඤ්ජනඤ්ච අඤ්ඡාච නං විඤ්ඤේය්‍යං උභයං-ඉමා අඤ්ඡා ඛ්‍යඤ්ජනං කතමං.**

සුත්තානං, සූත්‍රසඞ්ඛ්‍යාත සකල බුද්ධවචනය; **මාදඝපදුනි**, "ෂට්විධ ඛ්‍යඤ්ජනපද ෂට්විධාර්‍ථ පදවශයෙන්" දෙලොස්පද කෙනෙක් වෙති; **නං සබ්බං**, "පිටකත්‍රය සඞ්ඛ්‍යාතවූ" ඒ සකල සූත්‍රය ඛ්‍යඤ්ජනඤ්ච, ෂට්විධ ඛ්‍යඤ්ජන පදය; **අඤ්ඡා ච**, ෂට්විධාර්‍ථයද, වේ; නොහොත්-**නං සබ්බං සුත්තානං**-ප්‍රථම ගාථාවෙහි "**ඝාඝනවරඝ**"යි, කියනලද- ඒ සකල සූත්‍රාන්තය ඛ්‍යඤ්ජනඤ්ච; ඛ්‍යඤ්ජන පද ෂට්කයද; **අඤ්ඡා ච**, ෂට්විධ අර්‍ථපද සමූදයදැයි; **මාදඝපදුනි** දෙලොස් පදකෙණෙක් වෙති; **අඤ්ඡා**, එහි ෂට්විධ අර්‍ථතෙමේ **ඉමා**, කවරේද?; ඛ්‍යඤ්ජනං, ෂට්විධ ඛ්‍යඤ්ජන තෙමේ; **කතමං**, කවරේදැයි; **නං උභයං**, ඒ ඛ්‍යඤ්ජනපද අර්‍ථපද සමූදය වය; **විඤ්ඤේය්‍යං**, දතයුතු.

"නවාඞ්ග පර්‍යාපන්ති ශාසන සඞ්ඛ්‍යාත සූත්‍රය දෙලොස්පද කෙනෙක් වෙති. නොහොත් ප්‍රථම ගාථාවෙහි. **ඝාඝනවරං** යන්නෙන් දක්වන්නේද ඒ සියලු බුද්ධවචනය. ෂට්විධ ඛ්‍යඤ්ජනපද සමූදයද. ෂට්විධ අර්‍ථපද සමූදයද-යි-අර්‍ථප්‍රතිපාදකපද දෙලෙසෙක් වෙති, එහි ෂට්විධ අර්‍ථපද සමූදය කිමෙක්ද? ඛ්‍යඤ්ජනපදසමූදය කිමෙක්දැයි- "තත් ඛ්‍යඤ්ජනාර්‍ථපද සමූදය වය මතු නිර්දේශවාරුව ඝානයෙහි වක්ෂ්‍යමාන ක්‍රමයෙන් ඝරූපවශයෙන් දතයුත්තේය" යනු භාවයි.

පජ්ජති අත්ථෝ එතෙහී"ති පදුනි, ඛ්‍යඤ්ජන පදයෝයි; පජ්ජන්ති ඤායන්තී'ති වා-පදුනි, අර්‍ථපදයෝයි; අත්තත්ථ පරත්ථාදි භෙදෙ, අත්ථෙසුවෙති'ති, වෙනෙය්‍යජ්ඣාසයානුලොමෙන සුවුත්තානාවෙත්ථ අත්ථා'ති, අත්ථෙසවති පඝවති'ති, සුදති අත්ථෙ පඝඝරති'ති, සුට්ඨුඅත්ථෙතාඝති රකඛතීති, සුත්තඝභාඝතත්තාවාති, **සුත්තානං**, කියනලදමැයි:-

"අත්ථානං සූචනතෝ සුවුත්තතෝ සවණතෝ ච සුදනතෝ
සුත්තානා සුත්තසභාගතෝව සුත්තං සුත්තන්ති අක්ඛාතන්නි"ඇ

මෙයින් විශෙෂනය වශයෙන් සූත්‍රපිටකය කියනලදී. "ද්වාදස පදානි සුත්තං"යන මේ නෙත්තිවිෂයෙහි සාමාන්‍යයෙන් පිටකත්‍රය කියනලදයි දතයුතු.ඇ

මෙසේ **සාසනවරයකි**, කියනලද සූත්‍රානන්තයාගේ පඤ්ඤාපනි භාවය- ඒ පඤ්ඤාපනිය අවිඛ්‍යඤ්ජන භාවයෙන් දතයුතුබවද- දක්වා දැන් ඒ සූත්‍රානන්තයාගේ විවරොපාය වූ **නෙත්තිප්‍රකරණය** පදුද්ධි විභාග වශයෙන් දක්වන්ට "**සොළසහාරනෙත්තී**" යනාදිය කීහ.

(3) **සොළසහාරා නෙත්තී-පඤ්චනයා සාසනස්ස පරිසෙට්ඨි අට්ඨාරසමූලපදා-මහාකච්චායනෙන නිද්දිට්ඨා.**ඇ

මහාකච්චායනෙන, පූජ්‍ය කාත්‍යායන ස්ථවිරපාදයන් වහන්සේ විසින්; **සොළසහාරා**, දෙසනාදි ඖඛධවිධ හාරක්‍රමයක් ඇත්තීවූ; **පඤ්චනයා**, නන්ද්‍යාවර්තාදි නය පසක් ඇත්තීවූ; **අට්ඨාරසමූලපදා**, අටළොස් මුල්පදයක් ඇත්තීවූ; **සාසනස්ස පරිසෙට්ඨි**, සකල නවාඞ්ග ශාස්තෘ ශාසනයාගේ අවිපරෙක්ෂණය කරන්නීවූ; **නෙත්තී**, නෙත්තිතෝ මෝ; **නිද්දිට්ඨා**, දක්වනලද්දීය.ඇ

"හාරියන්ති එතෙහි එත්ථවා සුත්තගෙය්‍යාදිවිසයා අඤ්ඤඤ්ඤ සංසග්ග විපල්ලාසා'ති- **හාරා**, හරන්ති වා සයං තා'ති- හරණමත්ත මෙව වා-'ති, හාරා; අථවා හරීයන්ති වොහරීයන්ති ධම්මසංවණ්ණන්නක ධම්ම පටිග්ගාහකෙහි ධම්මස්ස දූනග්ගහණ වසෙනා'ති- හාරා; හාරා විසා'ති වා හාරා; අථවා- හාරයන්ති. අඤ්ඤඤ්ඤාදීනං අපනමං කරොන්ති ආචික්ඛන්තී'ති- හාරා; සොතූජනචිත්තස්ස හරණතෝ රමණතොවා හාරා, සොළසහාරා **එතිසසා'ති සොළසහාරා**; වෙනෙය්‍යසත්තෙ අරියධම්මං නයන්ති'ති **නෙත්තී**; නයනන්ති තායා'තිවා **නෙත්තී**; අථවා නීයන්ති එත්ථ පතිට්ඨාපෙත්වා වෙනෙය්‍යා නිබ්බානං සම්පාපීයන්තී'ති නෙත්තී; නයන්ති සඞ්කිලෙස වොදානානි විභාගතෝ ඤාපෙන්තී'ති **නයා**, නීයන්ති වා තානි එතෙහි එත්ථවා'ති නයා; නයනමත්තමෙවවා'ති නයා; නයන්ති වා සයං ධම්මකථිකෙහි උපනීයන්ති සුත්තත්ථපවිචයත්ථන්නති නයා අථවා, නයාවියා'ති නයා; පරියත්ති අත්ථස්ස නයනතෝ සඞ්කිලෙසතෝ යමනතොවා- නයා; පඤ්චනයා එතිසසාති **පඤ්චනයා**; පරිසමන්තතෝ අත්ථමෙසති ගවෙසතී"ති **පරිසෙට්ඨි**, "සාසනස්ස පරිසෙට්ඨී"ති, අලුත්තසමාසෝ; මූලන්ති පතිට්ඨහන්ති, එත්ථ එතෙහී'ති වා **මූලානි**, නයානං පට්ඨාන භාගානඤ්ච, පතිට්ඨා,

නට්ඨානඤ්ච නිත්‍යමේවා;අට්ඨාරස මූලපදානි එතිස්සාති අට්ඨාරස මූල පදා, මහන්තා ච සෝ කච්චායනෝ චා'ති-මහාකච්චායනෝ; තේන මහාකච්චායනේන; "කච්චානගොත්තේන නිද්දිට්ඨා"සිද- බෙණෙත්.

මෙසේ මේ ගාථායෙන් හාරත්‍යය මූලපද වශයෙන් ප්‍රකරණාර්ථයන් සඞ්ග්‍රහකොට නෙත්තිවිසයෙහි හා ඛ්‍යඤ්ජනාදී සමුදය සඞ්ඛ්‍යාත සූත්‍රයෙහිද විභාග දක්වනු පිණිස "හාරාබ්‍යඤ්ජන විචයෝ" යනාදිය කිහ.

(4)හාරා ඛ්‍යඤ්ජන විචයෝ-සුත්තස්ස නයා නයෝව සුත්තනිද්දෙසා උභයං පරිගහේත්වා වුච්චති සුත්තං සට්ඨිසුත්තං.

හාරා, ෂොඩශහාරයෝ; සුත්තස්ස, සූත්‍රාන්තයාගේ; ඛ්‍යඤ්ජන විචයෝ; මූලපද නිබාරණානන්තරයෙන් ඛ්‍යඤ්ජන වාරයෙන්ම අර්ථ විභාරණ සංඛ්‍යාත සංවණ්ණනාවෝ වෙති නයා නාම නයා; නාස්‍යා වටට නිපුණබල සීඝවිඤ්ඤේය්‍ය සංඛ්‍යාත ත්‍රිවිධ අර්ථක්‍රමයෝ; සුත්තනිද්දෙසා, අර්ථවාරයෙන්ම සූත්‍රාර්ථාවබෝධය විසඳකොට ඇත්තාහ; පරිගහේත්වා, සූත්‍රාර්ථ නිබාරණ වශයෙන් හාත්පසින් ගන්නාලද; හෙවත් සර්ව්‍රප්‍රකාරයෙන් සූත්‍රයෙහි ගොදනලද; උභයං, හාරනයවය; සට්ඨිසුත්තං; සූත්‍රාන්තානුරූපවැ; සුත්තං, හාරනය පට්ඨානසංඛ්‍යාත නෙත්ති සූත්‍රය; වුච්චති, කියති;වණ්ණනාකෙරෙති, හොත්- උභයපරිගහේත්වා, ෂොඩශහාර අර්තනය සංඛ්‍යාත ලක්ෂණවයෙන් පරිග්‍රහීතවූ; සුත්තං, නෙත්තිසූත්‍රතෙමේ; සට්ඨිසුත්තං, පිටකත්‍රයානුරූපවැ; වුච්චති, සූත්‍රාර්ථ වණ්ණනාකෙරේ.

මෙහි "හාරාබ්‍යඤ්ජන විචයෝ" යනු හා "නයාතයෝව සුත්තනිද්දෙසා" යනුද ප්‍රකෘති විකෘති භෙදයෙන් හෝ වචන විපර්‍යාසයෙන් හෝ සැලකියයුතු. වුච්චති, යනු දිවාදිගණික භෙයින් කර්තෘකාරකයි.

"විචිනිතබ්බා විචිනනංවා විචයෝ, ඛ්‍යඤ්ජනෙහි විචයෝ= ඛ්‍යඤ්ජනවිචයෝ, සුත්තස්ස අත්ථෝ, පරිසමන්තතෝ ගහිතං පයෝජිතන්ති පරිගහේත්වා; අනතික්කමමසුත්තං සට්ඨිසුත්තං, යානි යානි සුත්තානි වා සට්ඨිසුත්තං.

මෙසේ හාරනයලක්ෂණයෙන් සකල සූත්‍රාන්තය වණ්ණනා කට යුතුබව දක්වා දැන් ඒ නෙත්තිසංවණ්ණනාවට විෂයවූ පර්‍යාපන්ති ධර්මය ප්‍රකාරාන්තරයකින් නියමකොට දක්වනු පිණිස "සාවෙව දෙසනා" යනාදි ගාථාව කිහ-

(5) සා චෙව දෙසනා සං ච දෙසිතං උභයමේව විභාවෙතුකාමෝ තත්‍රාස්ස මාතුපුබ්බි-ඞ්ගමතාවට්ඨ සුත්තන්තන්ත පරියෙට්ඨි"ති.

සාවථවදෙසනා, අථයන් ගොවරකොට කරනලද පරිවෙඡද ඇති බ්‍යඤ්ජන ප්‍රබන්ධ සඞ්ඛ්‍යාතවූ යම් දෙසනාවක්වේද, **සඤ්ඤුදෙසිතං**, ඒ දෙසනාවෙන් ප්‍රබෝධිතවූ තදථසඞ්ඛ්‍යාත යම් දෙසිතයක්වේද; **ඉමඤං එව**, ඒ මේ දෙශනා දෙශිත වයම; **විඤඤුඤ්ඤ්‍යං**, "ඒ දෙශනා දෙශිතාථයන් විමුක්තාගතන ශීඝ්‍රයෙන් පුහුණුකරන්නවුන්ට තත්ප්‍රාගුණ්‍යය අනුපාද පරිනිර්ඵණය අවසන්කොට ඇති සම්පත්තීන්ගේ පැමිණීමට හෙතුවිනබැවින් එකාන්තයෙන්" දතයුතුය; නොහොත්- තදුභය විනිර්මුක්තවූ කිසිම ඤෙය්‍ය ධර්මයක්හු නැති බැවින් ඒ දෙසනා දෙසිතඵය අවබොධ කටයුතුමය; **තත්‍ර**, ඒ අවබොධ සිද්ධියෙහි; **අයං**, මේවක්ෂ්‍යමානවූ; **නවවිධ සුත්තනන්න පරිඡෙථෝ**, සූත්‍රගෙය්‍යාදි නවවිධ ශාස්තෘ ශාසනයාගේ අථවිචාරණ සඞ්ඛ්‍යාතවූ; **අනුසුබ්බී**, භාරතයන්ගේ අනුක්‍රමය වන්නීය; නොහොත්- **නවවිධසුත්තනන්න පරිඡෙදී**, සූත්‍රගෙය්‍යාදි නවවිධ සූත්‍රාන්තයාගේ; (**සාම්‍යථී** යෙහි ප්‍රථමාදි), **අයං අනුසුබ්බී**, මේ භාරතයාහු ක්‍රමයයි; නොහොත්-**අනුසුබ්බී**, වක්ෂ්‍යමාන භාරතය සම්බන්ධ අනුක්‍රමයෙන්, (**කරණාථී**යෙහි ප්‍රථමාදි.) **අයං නවවිධසුත්තනන්න පරිඡෙථෝ**, මේ නෙත්තිය-නවවිධ සූත්‍රාන්තයාගේ අථපයෙජ්ජණය වන්නීය.

"**සම්මුති පරමත්ථ දෙසෙති එතායා**"ති **දෙසනා**, දෙසතිත්ථ දෙසනාය පබොධයිත්ථා'ති දෙසිතං.

තවද- මේ සඞ්ග්‍රහවාරයෙහි නෙත්තිශාසන්‍රය- "**වාදසපදානි සුත්තං**"- යී- සූත්‍රවාරයෙන් ආරබ්ධ හෙයින් සූත්‍ර විභාගය භානෙත්ති ප්‍රකීර්ණක විනිශ්චයද- නෙත්ති පාළිමුත්තකවිධි වසයෙන් මෙහි සැකෙවින් දැක්විය යුතුය.

"**සුත්තනානි සාමඤ්ඤවිධි විසෙසවිධයෝ පරෙ**
සනිමිත්තා නි රුළ්හත්තා සඤ්ඤාඤෙඤ්ඤඤ නාඤඤතෝ"යී,-

යූහෙයින් **සුත්තං**- යනු සියලුම බුදුවදනට සාමාන්‍ය නාමයකි, අන්‍යගෙය්‍යාදීහු සඟාථකත්වාදි තද්භාව නිමිත්තන සහිතවැ ඒ ඒ අරුත්හී බැසැ පවත්නා බැවින් විශෙෂවිධිහුයි, "**එත්තකං තස්ස භගවතෝ සුත්තාගතං සුත්තපරියාපන්නං**"- **සාවත්ථියං සුත්තවිභඞ්ගෙ**" යනාදි තන්හි විනය පඤ්ඤාපනියෙහිද, "**සකවාදෙ පඤ්චසුත්තසතානි**" යනාදිතන්හි අභිධම් පඤ්ඤාපනියෙහිද, සූත්‍රව්‍යවහාරය දක්නාලද බැවින් සාමාන්‍ය වශයෙන් සකල බුද්ධවචනයෙහි සූත්‍රනාමය පවත්නේය; විශෙෂ වශයෙන් සඟාථකත්වය තද්භාව නිමිත්තකොටැ, **ගෙය්‍ය** නාමයද, ගාථාරහිත පුවත්ත විසඥ්ජනභාවය තදභාව නිමිත්තකොටැ, **වෙය්‍යාකරණ**

නාමයද; ධම්මපදාදි කෙවලගාථා ප්‍රබන්ධය තද්භාව නිමිත්ත කොටැ, **ගාථා** නාමයද, සෞමනස්‍යඤ්ඤානමයිකගාථාචූර්ණිකා ප්‍රබන්ධය තබ්භාව නිමිත්තකොටැ, **උදාන** නාමයද, "වුත්තංහෙතං භගවතා වුත්තමරහතාති" යනාදි කථනාකාරය තද්භාවනිමිත්ත කොටැ, **ඉතිවුත්තක** නාමයද; "චත්තාරෝ මේ භික්ඛවෙ අච්ඡරියා අබ්භුතා ධම්මා" යනාදි වශයෙන් අද්භූතත්වය පහළකිරීම තදභාව නිමිත්තකොටැ, **අබ්භුතධම්ම** නාමයද- භාග්‍යවතුන්වහන්සේගේ ඝටගියදවසැ සදෘශාර චඤ්ඊානුභාව ප්‍රකාශක චරිත ප්‍රබන්ධය තදභාවනිමිත්තකොටැ, **ජාතක** නාමයද; ඇතම් සූත්‍රානන්තයන්හි ප්‍රශ්න විසර්ජනත්වයක් හා සගාථකත්වයක් විද්‍යමාන නමුදු ධර්මාර්ථ වෙද සඛ්‍යාත සෞමනස්‍ය සහගත ධර්මඥාන ලාභය බාහුල්‍ය වශයෙන් තදභාව නිමිත්තකොටැ, **වෙදල්ල** නාමයද, තත්තත් ධර්ම ප්‍රදෙශයන්හි ආරූඪකරනලදී, ඒ මේ ගෙය්‍යාදි සංඥාරොපණය සූත්‍රාඛ්‍යයෙන් අන්‍යවූ විශෙෂවිධි නම්.....

තවද- මේ නවාඞ්ගසඞ්කර පරිකාර විභාගයෙහි- "ගෙය්‍ය ඛ්‍යාදි නිමිත්ත රහිතවූ යම් සූත්‍රයෙක් වේද- එය විශෙෂසංඥා පරිහාරයෙන් සාමාන්‍ය සංඥාහුගේ පැවැත්මෙන් සූත්‍රාඛ්‍යවේද? එසේ ඇතිකලද- "සගාථකං සුත්තං ගෙය්‍යං, නිග්ගාථකං සුත්තං වෙය්‍යාකරණං"යි කී හෙයින්- සූත්‍රාඛ්‍යය සිඛ්නොවේහුයි- වොදනාව- "සගාථකං සුත්තං"- යනාදිය අවසථාකොටැ ඇත්තීම නොවේද? නොවේමැයි, එබඳු වොදනාවක්හුගේ පැමිණීමට අනවකාස පරිද්දෙන් "ගාථාවිරහෙසති පුච්ඡා විස්සජ්ජනාභාවො වෙය්‍යාකරණස්ස තබ්භාව නිමිත්තං"යි අවසථා සොධනය ප්‍රථමු කොටැ කල හෙයිනි; තවද- "ගාථා බැවින්" මඞ්ගලසූත්‍රාදීන්ට සූත්‍රාඛ්‍ය සඞ්ග්‍රහය නොවෙයි- යමක් කියනලදද, ඒ කීමත් එසේ නොවෙයි, සූත්‍රනාමය ඒ දෙශනා ප්‍රදෙශයන්හි නිරවශෙෂයෙන් බැසැඟත් බැවිනි, බුදුමුවෙන් නික්මුණුද පටන් මඞ්ගලසූත්‍රාදීන්ට සූත්‍රභාවය ආරූඪවූයේමය. ඒ මඞ්ගලසූත්‍රාදිය ධම්මපදබුඛවංසාදියමෙන් ගාථානාමයෙන් ප්‍රකටනොවීය, සූත්‍රභාවයෙන්ම ප්‍රකට වීය, එහෙයින්ම අට්ඨාවෙහි "සුත්තනාමකං"යි නාමග්‍රහණය කරනලදී; මඞ්ගලසූත්‍රාදිය "ගාථාඝනිත බැවින් ගෙය්‍යාඞ්ග සඞ්ග්‍රහය වියයුතු"යි- යමක් කියනලදද- හෙද නොවේ, යම්හෙයකින් සහභාවය වනාහි මුඛ්‍යාර්ථයෙන් අන්‍ය අප්‍රධානාර්ථයක් සම්භාවිත්‍ය වන්නේද එහෙයිනි, "ගාථාහි සහ යං වත්තතෙ තං සගාථකං"යි- හත්කලැ ගාථාහි යන්නෙන් වාච්‍ය ගාථාවන් යං- යන්නෙන් වාච්‍යමුඛ්‍යාර්ථ සඛ්‍යාත දෙශනා ප්‍රදෙශයෙන් බිහිවීය. යුතුය, වහිරඞ්ගාර්ථයක් අන්තරඞ්ගාර්ථයක් හා සම්බන්ධකිරීම සහ

යොගයාගේ ඵලය බැවිනි, තවද- ගාථාසමූහය එකි එකි ගාථා වකින් අන්‍යප්‍රදේශයෙක් වෙයි. එහෙයින්- ඒ ගාථාසමූදය වස යෙන් එසේ කියයුතු නොවේද? හෙද යුතුනොවේ, අවයවයෙන් වෙන්වූ කිසිම සමූදයක් නැති බැවිනි. උභතෝ විභඞ්ගාදීන්හි සගාථක ප්‍රදේශාදීන්ට ගෙය්‍යාඞ්ග සංග්‍රහවිය යුතුයයි. යමක් කියතලදද හෙද එසේ නොවේ- ඒ සගාථක ප්‍රදේශයන් ජාතකාදි අන්‍ය දේශනා ප්‍රදේශයන් කෙරෙන් හෙතපෑ හෙයිනි; මෙසේ "සුත්තනන්ති සාමඤ්ඤවිධි" යනාදි ගාථාවෙහි විනිශ්චය සැකෙවින් දතයුතු.

නෙත්තිපාළිමුත්තකඅ ප්‍රකිණ්ණක විනිශ්චය කෙසේදයත්? සකල නෙත්ති ශාස්ත්‍රය ශාසනාර්ථ පර්‍යේෂණ භාවයෙන්ද **අෂ්ටමාගීයට පැමිණවීම්** වශයෙන්ද- **විමුක්තිරස** වශයෙන්ද- යන එකිඑකි අර්ථයක්හුගේ වශයෙන් එක්වැදුරුම්වේ. **ව්‍යඤ්ජනවිචාර අර්ථවිචාර** වශයෙන්ද- **සංග්‍රහවාර විභාගවාර** වශයෙන්ද- **ධර්ම්‍යාර්ථ විනයාර්ථ සංවර්ණනා** වශයෙන්ද- **ලෞකිකාර්ථ ලෝකෝත්තරාර්ථ සංග්‍රහ** වශයෙන්ද- **රූපධර්ම් අරූපධර්ම් පරිග්‍රාහක** වශයෙන්ද- **ලක්ෂණ ලක්ෂ්‍ය** වශයෙන්ද- **ප්‍රවෘත්ති නිවෘත්ති වචන** වශයෙන්ද- **සභාග විසභාග නිර්දේශ** වශයෙන්ද- **සාධාරණධර්ම් අසාධාරණධර්ම් විභාග** වශයෙන්ද- යන එකිඑකි දුකාර්ථ වශයෙන් ද්විවිධ වේ,- **භාරනඤපඨානභෙද** වශයෙන්ද- **උද්දේශ නිර්දේශ ප්‍රතිනිර්දේශ** වශයෙන්ද- **මූලගීති අනුගීති සංගීතිභෙද** වශයෙන්ද- **විනය සූත්‍ර අභිධර්ම් යන පිටකත්‍රයාර්ථ විභාග** වශයෙන්ද- **උගඝටිතඤ්ඤූ විපචිතඤ්ඤූ ඤෙය්‍ය** යන පුද්ගලත්‍රික නිර්දෙශ වශයෙන්ද- **ආදිකල්‍යාණ මජ්ඣෙකල්‍යාණ පරියොසාන කල්‍යාණ විභාග** වශයෙන්ද- **ඤාතීරණ ප්‍රහාන** යන පරිඥාකථන වශයෙන්ද- **භාවභාගීය විසභාගීය සමුච්ඡෙද ප්‍රහානාභිසමයදෙශ** වශයෙන්ද- **ත්‍රිශික්ෂා සංග්‍රහ** වශයෙන්ද- **ත්‍රිවිධ සංක්ලෙශ විසෝධන** වශයෙන්ද- යන එකිඑකි ත්‍රිකාර්ථ විභාගහෙයින් ත්‍රිවිධවේ. **චතුර්විධ ප්‍රතිසම්භිදා විභාග** වශයෙන්ද- **එකත්ත නානත්ත අබ්‍යාපාර එවං ධම්මතා** යන චතුර්විධනය දර්ශන වශයෙන්ද- **ධර්ම් අර්ථ දේශනා ප්‍රතිවෙධ** යන චතුර්විධ ගම්භීරතා වශයෙන්ද- යන එකි එකි චතුෂ්කාර්ථ විභාග හෙයින් චතුර්විධවේ. **පඤ්චනිකායාර්ථ** විචාරණ වශයෙන්ද- **අභිඥා පරිඥා ප්‍රහාන භාවනා සච්ඡිකිරිය** යන ධර්ම් විභාග වශයෙන්ද- **පඤ්චඤ්ඤන්ධ නිර්දේශ** වශයෙන්ද- **පඤ්චඤාණ පරිවෙජ්ද** වශයෙන්ද- යන එකි එකී පඤ්චකාර්ථ

විභාග වශයෙන් පඤ්චවිධවේ; **ඤාරමම්මණ** විභාග වශයෙන් හා **ඤාණසම්පයුත්ත** විභාග වශයෙන්ද ෂට්විධවේ; **සපනවිඤ්ඤාණ සම්පත්ති** පරිවෙජ්ද වශයෙන් සප්තවිධවේ; **සූත්‍රනෙඝ්‍යාදි** නවාඞ්ග නිර්දේශ වශයෙන් නවවිධවේ; **ලෝභ දෝස මෝහ අලෝභ අදෝස අමෝහ කාමසහගත චිත්තසම්ප්‍රයුක්ත මනෝකම්ම සද්ධින්ද්‍රිය විරියින්ද්‍රිය සතින්ද්‍රිය සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය** යන චතුර්දශ සූත්‍රාධිෂ්ඨාන විභාග හෙතින් ද්‍යුදුස්වැදෑරුම්වේ; **ශාසන ප්‍රස්ථාන** භෙදයෙන් ශොඩශවිධ හෝ අෂ්ටවිංශත් ප්‍රකාරවේ; **ධර්මස්කන්ධ** වශයෙන් සුවාසූදහස් ආකාරවේ; නවාඞ්ගසංකරභාව විනිශ්චය හා නෙත්තිප්‍රකීර්ණක විභාගයයි.

සඞ්ග්‍රහවාරාදී වර්ණනාදි.

තත්‍රා, "සොළසහාරානෙත්තී"යන ඒ සංග්‍රහගාථාවචනයෙහි; **සොළසහාරා**, සොළොස්හාරයෝ; **කතමෙ**, කවරහුද? **දෙසනා**, ආශ්වාදාදීන් දැක්වීම ලක්ෂණ කොටැ ඇති දෙසනාහාරය; **විචයෝ**, පදප්‍රශ්නාදීන් සෙවීම ලක්ෂණකොටැ ඇති විචයහාරය; **යුත්ති**, හාරසම්බන්ධ භූම්හොවරාදීන්ගේ යුක්තායුක්ති පරීක්ෂා කිරීම ලක්ෂණකොට ඇති යුක්තිහාරය; **පදට්ඨානෝ**, ඒ ඒ ධර්මයන්ගේ ආසන්න කාරණයන් විචාරණය කිරීම ලක්ෂණකොට ඇති පදට්ඨානහාරය; **ලක්ඛණා**, භාෂිත ධර්මයෙහි තත්සදෘශ ලක්ෂණවූ අභාෂිත ධර්මයන් සංග්‍රහකිරීම ලක්ෂණකොට ඇති ලක්ෂණහාරය; **චතුබ්‍යූහෝ**, නිර්වචන අභිප්‍රාය නිදාන පූර්වාපරානුසන්ධිසංඛ්‍යාත චතුර්විධාර්ථයන් සම්පිණ්ඩනය කිරීම ලක්ෂණකොට ඇති චතුබ්‍යූහහාරය; **ආවට්ටෝ**, දෙශනාගෘහීත ධර්මයන් සභාගවිසභාග වශයෙන් ආවර්තනය කිරීම ලක්ෂණකොට ඇති ආවර්තහාරය; **විභත්ති**, සංකෙලෙශවොදාන ධර්මයන් සාධාරණ අසාධාරණ පදස්ථාන භූමිවශයෙන් විභාගකිරීම ලක්ෂණකොට ඇති විභත්තිහාරය; **පරිවත්තනෝ**, සූත්‍රයෙහි දක්වන්නාවූ ධර්මයන්ගේ ප්‍රතිපක්ෂ වශයෙන් පරිවර්තනය කිරීම ලක්ෂණකොට ඇති පරිවර්තනහාරය; **වෙවචනෝ**, එකාර්ථයක් සම්බන්ධවැ බොහෝ පර්‍යායශබ්ද ප්‍රයෝග ලක්ෂණකොට ඇති වෙවචනහාරය; **පඤ්ඤත්ති**, එකිඑකී ධර්මයක්හුගේ අනෙක ප්‍රඥප්තියෙන් පැණවියයුතු ආකාරය ප්‍රකාශකිරීම ලක්ෂණකොට ඇති ප්‍රඥප්තිහාරය; **ඔතරණා**, ප්‍රතීත්‍යසමුත්පාදාදි වාරයෙන් සූත්‍රාර්ථයාගේ අවතරණය කිරීම ලක්ෂණකොට ඇති ඔතරණහාරය; **සෝධනා**, සූත්‍රයෙහි පඤ්චප්‍රශ්නාරම්භයන්ගේ ශොධනය කිරීම ලක්ෂණකොටඇති සෝධනහාරය; **අධිට්ඨානා**, සූත්‍රාගත ධර්මයන්ගේ අවිකල්ප වශයෙන් සාමාන්‍ය විශෙෂ නිර්ධාරණ ලක්ෂණකොට ඇති අධිට්ඨානහාරය;

පරිකඛාරෙති, සූත්‍රාගත ධර්මයන්ගේ පරිසඛාර සංඛ්‍යාත හෙතු ප්‍රත්‍යයෙන් නිඛාරණයකොටැ වර්ණනා කිරීම ලක්ඛණකොටැ ඇති පරිකඛාරහාරය; **සමාරොපනා**, සූත්‍රාගත ධර්මයන්ගේ පදසථාන වෙවචන භාවනා ප්‍රහාන සමාරොපන විචාරණය ලක්ඛණකොටැ ඇති සමාරොපනහාරය; **ඉති**, යන මොවුහු වෙති.

තස්ස, ඒ යථොකතහාරොද්දෙසයාගේ; **අනුගීති**, උකතාර්ථයාගේ සුඛග්‍රහණය පිණිස තදර්ථසමර්පිණඛ්‍යානයෙන් පසුවකියනලද ගාථා මෙසේයි.

6. දෙසනා —පෙ— පරිවත්තනතොා
7. වෙවචනතොව —පෙ— සමාරොපනතොව සොළස
8. එතෙසොළස —පෙ— නයවිභත්තී'ති

දෙසනා, දෙසනාහාරය; විචයතා, විචයහාරය; යුත්තී, යුත්තිහාරය; පදට්ඨානතොව, පදට්ඨානහාරය; ලක්ඛණතා, ලක්ඛණහාරය; චතුබ්‍යූහතා, චතුබ්‍යූහහාරය; ආවට්ටතා, ආවට්ටහාරය; විභත්තී; විභත්තිහාරය; පරිවත්තනතොා, පරිවත්තනහාරය; වෙවචනතොව, වෙවචනහාරය; පඤ්ඤත්තී, පඤ්ඤත්තිහාරය; ඔතරණතොව, ඔතරණහාරය; සොධනතා, සොධනහාරය; අධිට්ඨානතා, අධිට්ඨානහාරය; පරිකඛාරතා, පරිකඛාරහාරය; සමාරොපනතොව, සමාරොපනහාරය; යන සොළස, සොළසෙක්වෙති;

අත්ථතා, දෙසනාදි පදාර්ථ වශයෙන් හා ලක්ඛණාදි වශයෙන්; අසඞ්කිණ්ණා, සඞ්කර රහිතවූ; **එතෙසඤ්ච සොළසහාරානං**, මෙකී සොළොස් හාරයෝ; **පකිත්තිතා**, ප්‍රකාශකරන ලදහ; **එතෙසං**, මේ සොඞ්ඵහාරයන්ගේ; තථා, "යම් ආකාරයකින් අසඞ්කර වේද" එපරිදිදෙන්; **විත්ථාරනයා**, විසතරහෙයින් පවත්නාවූ; නොහොත් විසතර ක්‍රමයෙන් සම්බාහනවූ; **නයවිභත්තී**, න්‍යාය වශයෙන් බෙදීම; **භවති**, වේ; (නොහොත්) මෙහි මතුදක්වනු ලබන්නේවේ.

අයති පවත්තති නය විභත්තී'ති අත්‍ථා, විත්ථාරෙන අත්‍ථා, විත්ථාරනත්‍ථා; විත්ථාරා නත්‍ථා අස්සාති වා විත්ථාරනත්‍ථා, නයෙන ඤායෙන විභත්තති නය විභත්තති, "ඇතම් පොතක මේගත නැත.

දෙසීයති සංවණ්ණීයති සුත්තතෙථා එතායාති දෙසනා; දෙසනාත්‍ථ සත්තවරණතොවා දෙසනා; විවීයතති එතෙන එත්ථ වා පදපඤ්හාදයෝ විවිති එව වා නෙත්තති විචයෝ; යුඤ්ජී

තබ්බා යුඤ්ජනං වා යුත්ති- යුත්තියා විචාරණා යුත්ති, උත්තර පදලොපෝ; පදඤ්ච පදෙසුවා ඨානං කාරණං පදට්ඨානං, පද ට්ඨානස්ස විචාරණාය යුත්තෝ පදට්ඨානෝ; ලක්ඛීයන්ති එතෙන එත්ථ වා එකලක්ඛණා ධම්මා අවුත්තාපි එකව්වනෙනාති ලක්ඛණං; විය්‍යූහීයන්ති විභාගෙන පිණ්ඩීයන්ති එතෙන එත්ථ වාති බ්‍යූහෝ වත්තුන්නං නිබ්බචනාදීනං බ්‍යූහෝ එත්ථා'ති වත්තබ්‍යූ හෝ; ආවට්ටීයන්ති එතෙන එත්ථවා සභාග විසභාගා ධම්මා- නෙසං ආවට්ටනන්තිවා ආවට්ටෝ; විභජ්‍යන්ති එතෙන එත්ථ වා සාධාරණා සාධාරණ සඞ්කිලෙස වොදාන ධම්මානං භූමියෝ විභ ජනං වා එතෙසං භූමියාති විභත්ති; පටිපක්ඛවසෙන පරිවත්තී යන්ති ඉමිනා එත්ථවා සුත්තෙන වුත්තධම්මා පරිවත්තනං වා තෙ සන්ති පරිවත්තනෝ; විවිධං වචනං එකස්සත්ථස්ස එකමෙත්ථාති වා විවචනං විවිධං වුච්චති අත්ථෝ එතෙන්‍යාති වා විවචනං විව චනමෙව වෙවචනෝ; පකාරතෝ පභෙදතෝ වා ඤ්ඤපියන්ති ඉමිනා එත්ථවා අත්ථාති පඤ්ඤත්ති; ඔතරීයන්ති අනුපපවෙසී යන්ති එතෙන එත්ථවා සුත්තාගතා ධම්මා පටිච්චසමුප්පාදාදීසූති ඔතරණෝ; සොධීයන්ති සමාධීයන්ති එතෙන එත්ථවා සුත්තෙන පද පදත්ථපඤ්හාරම්භාති සොධනෝ; අධිසීයන්ති අනුපපවත්තී යන්ති එතෙන එත්ථවා සාමඤ්ඤ විසෙසභූතා ධම්මා විනා විකප්පෙ නාති අධිට්ඨානෝ; පරිකරොති අභිසඞ්ඛරොති ඵලන්ති පරිකඛා රෝ පරිකඛාරං වා ආචික්ඛති පරිකඛාර සහචරණතොවාති" පරි කඛාරෝ; සමාරොපීයන්ති එතෙන එත්ථවා පදට්ඨානාදිමුඛෙන ධම්මාති සමාරොපනෝ; සබ්බත්ථභාවසාධනවසෙනාපි නිබ්බව නත්ථෝ යොජෙතබ්බා.

හාරවිභඞ්ග වණ්ණනා.

මෙසේ ඡොඩශහාරයන් සරූපවසයෙන් උපුටා දක්වා- දැන් අනතුරුව පඤ්චනය සංග්‍රහය සරූප වසයෙන් උපුටා දක්වනු පිණිස "තත්ථ කතමෙ පඤ්චනයා" යන නිද්දාරණ නිද්දාරණී යාතමක කථෙතු කම්‍යතා ප්‍රශන වාක්‍යය තැබූහ.

තත්ථ, "පඤ්චනයා" යන ඒ සංග්‍රහගාථා වචනයෙහි; **පඤ්ච නයා**, නයපස; **කතමෙ**, කවරහුද?; **නන්දියාවමටවා**, "තාදිගුණා අවිජ්ජුවෙන් සංකෙලෙසපාක්ඛික සූත්‍රාර්‍ථයාගේද- සම්ථ විදර්‍ශනා වෙන් වොදනපාක්ඛික සූත්‍රාර්‍ථයාගේද චතුරාර්‍යසත්‍ය යොජනා වාරයෙන් පැමිණවීම ලක්ඛණකොට ඇති" නන්දියාවට්ටනයය; **නිප්පක්ඛලා**, "අකුසල මූලයන් හා සංකෙලෙසපාක්ඛික සූත්‍රාර්‍ථයා

ගේද- කුසලමූලයන් හා වොදානපාක්ෂික සූත්‍රාර්ථයාගේද- චතුස් සත්‍ය යොජනා වාරයෙන් පැමිණවීම ලක්ෂණකොට ඇති තිපුකඛලනයය; සීහවික්කීළිතෝ, විපල්ලාසයන් හා සක්කායකෙලේස පක්ෂයාගේද- ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් හා සකලවොදාන පක්ෂයාගේද- චතුසත්‍ය යොජනා වශයෙන් පැමිණවීම ලක්ෂණකොට ඇති, සීහවික්කීළිතනයය; දිසාලොචනෝ, ඒ ඒ අර්ථනය සම්බන්ධවූ දිසාභූත ධර්මයන් අර්ථනය හා යොදා ප්‍රථමාදි දිශාවශයෙන් බැලීමට උපකාරවූ දිසාලොචනනයය; අඞ්කුසෝ ඉති, ඒ ඒ නය සම්බන්ධී දිශාභූතධර්මයන්ගේ පැමිණවීම ලක්ෂණකොට ඇති; අඞ්කුසනයය,- යන මොවුහුවෙති.

තස්ස, ඒ නයොදෙශයාගේ; **අනුගීති**, උක්තාර්ථසංග්‍රහ ගාථා ගාථා මෙසේයි.

9 **පඨමෝ නන්දියාවට්ටෝ-පෙ-තතියෝ තස්ස ලක්ඛණෝ.**
10 **දිසාලොචන මාභංසු-පෙ-සම්බන්ධපකාසනා ඉමා'ති.**

පඨමෝ, යොජනා භෙයින් ප්‍රථමවූ; **නන්දියාවට්ටෝ**, නන්දියාවට්ටනයද; **දුතියෝ**, දෙවැනිවූ; **තිපුකඛලෝව**, තිපුකඛලනයද; **තතියෝ**, තුන්වැනිවූ; **සීහවික්කීළිතෝ නාම නයලක්ඛණෝ**, සීහවික්කීළිත නම් නයලකුණද; **චතුත්ථෝ**, සතරවැනිවූ; **උත්තමෝ**, ප්‍රවරවූ; **දිසාලොචනෝ නාමං**, දිශාලොචන නයද; **ආභංසු**, කීහ; **පඤ්චමා**, පස්වැනිවූ; **අඞ්කුසෝනාම**, අඞ්කුස නම් නයද යන; **සම්බන්ධනයා**, සූත්‍රාර්ථයන් පමුණුවන සියලු ක්‍රමයෝ; **පඤ්ච**, පසෙක්; **ආභතා**, නෙත්තිනය වශයෙන් ආවාහුය.

"නන්දියාවට්ටස්ස විය ආවට්ටෝ එතස්සාති නන්දියාවට්ටෝ" යනු නිර්වචනභෙයින් නන්ද්‍යාවර්ත නම් රාජමන්දිරයාගේ අබ්භන්තරස්ථ ප්‍රධානාවයවයෙන් බාහිරාවර්තීය පවත්නාමෙන් මේත්‍රායද ආමුක්තකාංඝික චතුස්සත්‍ය සංඛ්‍යාත අබ්භන්තර ප්‍රධානාර්ථයෙන් සංක්ලේශ පාක්ෂික සූත්‍රාර්ථයන් හා වොදානපාක්ෂික සූත්‍රාර්ථයන්ද යොදා පමුණුවන බැවින් නන්ද්‍යාවර්ත නම්; එභෙයින් කීහ:-

"දක්ඛිණාභුගතා ලිඳත්‍රඤං සත්පශ්චිමා මුඛම්
පූජනීයොත්තරවජ්‍රාඤං නන්ද්‍යාවර්තං වදන්තිතන්"ති.

ඇතැම් කෙණෙක් නදීශ්‍රොතා වතීයසිද- තවත් කෙණෙක් චතුසුදු පුෂ්පයාගේ ආවර්තීයසිද කියත් විමසාගතයුතු; නන්දියා තණ්හාය පමොදස්ස වා ආවට්ටෝ නන්දියාවට්ටෝ, නන්දියී කියන ලද තෘෂ්ණාවගේ (නොඑහොත්) ප්‍රමොද්‍යයාගේ ආවර්තීය (පෙරළීම භෝ) නන්ද්‍යාවර්ත නම්. "නිහි අවශයෙහි ලොභාදීහි සඞ්කිලෙස

පකතිඅලොපාදීහි ච වොදාන පකතිසුසකලොපා යොහතොති නිපුසකතලොපා" ඇතු නිවීවන ඔබින් ලොපාදි ත්‍රිවිධ අවයවයෙන් යංසඤ්ඤ පඤ්ඤායෙහිද- අලොපාදි ත්‍රිවිධ අවයවයෙන් වොදාන පඤ්ඤායෙහිද උදාහරිතාදී දෙන විශෙෂයෙන් යොහන ඇත්තේ වේදාතී නිපුසකතල නාම.....

"සිහසහගතචෙතා සීහාසිත්‍රිතං දෙසනා වත්තමමහුතො වීහා රේ එසාති සීහවික්කීලිතං" ඇතු නිවීවන ඔබින් විගතත්‍රයතා ජවපරාකුමාදී විශෙෂයෙහිග කෙසින් සිහාසනමාන ඇති හංස වතුන්වහන්සේගේ සීඝ්‍රවිහා සංඛ්‍යාත දෙශනාවිඛකාමී විහරණය මේ නාමයෙහිග සිත්‍රිතයේදැයි සිහවික්කීලිත නම්; "බලවිසෙස යොගදීපනතො වා සීහවික්කීලිතාදිසො නසො සීහවික්කීලි තතා; ත්‍රිබාදිබල විශෙෂයොගතග ප්‍රභාගහකර්ණ කෙසින් හෝ සිංහ විජිතිත ඇතුළු නාමයෙහොමේ සිහවික්කීලිත නම්; සිහරදෙකු සිව් දෙනම පැමෙ ස්ඵුරාම්ද්ඔක් මෙන් හංස්‍යවතුන් වහන්සේ විසින් වතුර්විධ විපස්සීාග ඛණ්ඩන් හා තවිරාවධ ඛණ්ඩන් ප්‍රභාගකෙරෙ මුන් පවත්වනලද දෙශනා විජාමහනග දක්වන්නාවූ නාමග සිහ විකීලිත්‍රියයයි දතයුතු.....

"දිසාඤ්ඤෙ කුසලාදි ධමෙම ආලෙඛයති එතෙනාති දිසා ලෙඛසො" ඇතු නිවීවන ඔබින් කඤ්ඤාවසීාදි අවීනයත්‍රයාගේ දිසාසඤ්ඤාග කුසලාදි ධණ්ඩන් මේ නයක්‍රමග කරණකොටගෙන බලාතුයි දිසාලෙඛය නම්.....

"සබ්බං ආලෙඛිතබ්බානං සෙසං ධමමානං අවීනයතතග යොජ නෙසු සමානයසාසනා අංකුසොවියාති අංකුසො" ඇතුකෙසින් දිසාලෙඛන නාමයෙහින් එසේ බලතලද ඒ ඒ දිසාධණ්ඩන්ගේ අවීනයත්‍රග හා සෙදීමෙන් පමුණුවන කෙසින් අකුස්සක් (හෙන්වූ වස්) වැනිතුයි අඩකුස නම්.....

නාමොදෙදග වණීනාසි.

මෙසේ පස්නග සරූප වසයෙන් උපුවා දක්වා- දැන් අට ලොස් මුල්පදයන් සරූප වසයෙන් උපුවා දක්වනු පිණිස "**නාම කතමානි**" ඇතාදිග තැබුග.....

නාම, "අටඨාරස මූලපදා" ඇත ඒ සංග්‍රහ ගාථා වචනයෙහි; **අටඨාරස මූලපදානි**, පිටකත්‍රය සංඛ්‍යාත නවාඞග සාසනාශාසනා ගතවූ අවලොස් මුල්පදයෝ; **නාමානි**, කවරහුද?; **කුසලානි**, කුසලපාක්ෂිකවූ; **නවපදානි**, නවපද නොවෙක්ද; **අකුසලානි**

අකුසල පාක්ෂිකවූ; නවපදානි, නවපද කෙණෙක්ද වෙති; තත්ථ ඒ කුසලාකුසල අවලොස් පදයන් අතුරෙහි; අකුසලානි නවපදානි, අකුසල නවපදයෝ; කතමානි, කවරහුද?; තණ්හා, පරිතස්සනලක්ඛණවූ තෘෂ්ණාවය; අවිජ්ජා, අවිදිතකරණ ලක්ෂණවූ අවිද්‍යාවය; ලෝභෝ, ලුබ්ධන ලක්ෂණවූ ලොභය; දෝසෝ, දුස්සන ලක්ෂණවූ ද්වේෂය; මෝහෝ, මුයහන ලක්ෂණවූ මොහය; සුභසඤ්ඤා, අසුභයෙහි සුභය යි පවත්නා සුභසංඥාවය; සුඛසඤ්ඤා, අසුඛයෙහි සුඛය යි පවත්නා සුඛසංඥාවය; නිච්චසඤ්ඤා, අනිත්‍යයෙහි නිත්‍යය යි පවත්නා නිත්‍යසංඥාවය; අත්තසඤ්ඤා ඉති, අනාත්මයෙහි ආත්මය යි පවත්නා ආත්ම සංඥාවය- (යන මොවුහුවෙති;) තත්ථ, යම් ධර්මාවිපදසමූදායක් කෙරෙහි; සම්බන්ධා අකුසලපක්ඛා, සියලු අකුශල පක්ෂය; සඞ්ගහෝ, සවජාතීය වශයෙන් සඞ්ග්‍රහයට; සමොසරණං, එක්ව බැසගැණීමට; ගච්ඡති, පැමිණේද; (ඒ මේ අවිජ්ජාදි නවපදයන් කෙරෙහිය)... තත්ථ, ඒ අවලොස් මූලපදයන් අතුරෙහි; කුසලානි නවපදානි, කුසල්වූ නවපදයෝ; කතමානි, කවරහුද?; සමථෝ, ප්‍රත්‍යනික ධර්මයන් සන්සිඳවීම ලක්ෂණකොටඇති සමථය; විපස්සනා, අනිත්‍යාදි විවිධාකාර වශයෙන් බැලීම ලක්ෂණකොට ඇති විදර්ශනාවය; අලොභෝ, ලොභයට ප්‍රතිපක්ෂවූ අලොභය; අදෝසෝ, ද්වේෂයට ප්‍රතිපක්ෂවූ අද්වේෂය; අමොහෝ, මොහයට ප්‍රතිපක්ෂවූ අමොහය; අසුභසඤ්ඤා, අසුභයෙහි අසුභයයි පවත්නා අසුභසංඥාවය; දුක්ඛසඤ්ඤා, දුකෙහි දුකය යි පවත්නා දුක්ඛසංඥාවය, අනිච්චසඤ්ඤා, අනිත්‍යයෙහි අනිත්‍යය යි පවත්නා අනිත්‍යසංඥාවය; අනත්තසඤ්ඤා ඉති, අනාත්මයෙහි අනාත්මය යි පවත්නා අනාත්ම සංඥාවය; (යන මොවුහුවෙති) තත්ථ, යම් පදසමූදායක් කෙරෙහි; සම්බන්ධා කුසලපක්ඛා සියලුම කුසල පක්ෂය; සඞ්ගහෝ, සවජාතීය වශයෙන් සඞ්ග්‍රහයට සමොසරණං, එක්ව බැසගැණීමට; ගච්ඡති, පැමිණේද? (ඒ මේ සමථාදි නවපදයන් කෙරෙහිය)...

තත්‍ර, ඒ අවලොස් මුල්පද උදෙස්හි; ඉදං උද්දානං, උක්තාවීය විප්‍රකීර්ණභාවයෙන් නොනස්නාසේ රක්තා සඞ්ග්‍රහවචනය මේයි.

11 තණ්හාච අවිජ්ජාපිච-පෙ-කිලෙසභූමි නවපදානි...

12 සමථෝච විපස්සනාච-පෙ-ඉන්ද්‍රියභූමි නවපදානි...

13 නවඞ්ගිව පදෙති කුසලා-පෙ-භවන්ති අට්ඨාරසමූලපදානී'ති...

තණ්හාච, තණ්හාපදය; අවිජ්ජාපිච, අවිජ්ජාපදය; ලොභොච ලොභපදය; දෝසොච, දෝසපදය; මොහොච, මොහපදය;

තථෙව, එසේම; චතුරෙව විපල්ලාසා, සුභ- සුඛ- නිච්ච-අත්ත භාව- යන සිව් විපල්ලාසපදයෝද; යත, නවපදානි, නවපදයෝ; කිලෙසභූමි, සියලු කෙලෙසුන්ගේ බැසගැනීමට ආධාරස්ථාන හෙයින් කෙලෙසභූමීහු වෙති.

සමථොව, සමථය; විපස්සනාව, විපස්සනාය; යානිචතානි තීණි කුසලමූලානි; අලොභ- අදොස- අමොහ- යන යම් ඒ තුන් කුසල්මුල් කෙනෙක් වෙද්ද; (ඔවුහුද) චතුරො සතිපට්ඨානා, සිව් සිවටන්හුද; යත-නවපදානි, නවපදයෝ; ඉන්ද්‍රියභූමි, විමුකති පරිපාචන ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන්ගේ බැසගැනීමට ආධාරස්ථාන හෙයින් ඉන්ද්‍රියභූමීහු වෙති.

කුසලා,අනවජ්ජ සුඛවිපාකවත් කුසල ධම්මයෝ;නවහි පදෙහි, නවපද කෙනෙකුන් සමඟද; **අකුසලාඅබ්‍යාකතා,** සාවද්‍ය දුඃඛවිපාකවත් අකුසලාව්‍යාකෘත ධම්මයෝ; **නවහි ච,** නවපදයක් සමඟද; **යුජ්ජන්ති,** යෙදෙත්; **එතෙඛා මූලපදා,** මෙකී මූල්පදයෝම; **අඨාරසමූලපදානි භවන්ති,** අට්ලොස් මූල්පදයෝ නම්වෙත්.

"කොසල්ලසම්භූතට්ඨෙන කුච්ඡිතානං වා පාපධම්මානං සලනතො විඛංසනතෝ කුසානං වා රාගාදීනං ලවනතෝ කුසං විය වා ලවනතෝ කුසෙන වා ඤාණෙන ලාතබ්බතෝ පවත්තෙතබ්බතෝ"ති **කුසලානි,** තපපටිපක්ඛතෝ අකුසලානි; තසති පරිතසතී'ති **තණ්හා,** අවිත්තිං දිත්තති විත්තිං වා තවිත්තති විජ්ජාපටිපක්ඛා'ති වා- **අවිජ්ජා,** ලුබ්භනානි තෙන සයං වා ලුබ්භති- ලුබ්භනමත්තමෙව වා'ති; **ලොභෝ,** දුස්සනානි එතෙන- දුස්සනමත්තමෙව වා'ති; **දොසෝ,** මුය්හනානි එතෙන මුය්හනමත්තමෙව වා'ති; **මොහෝ,** අසුභෙ සුභනානි පවත්තා සඤ්ඤා; **සුභසඤ්ඤා,** එවං සුඛසඤ්ඤාදයොපි; සං එකතෝ ගණ්හනං **සඞ්ගහෝ,** තං;සං එකතෝ ඔසරණං **සමොසරණං,** තං; පච්චනික ධම්මෙ උඩ්ඩවාදිකෙ නීවරණෙ තදඞ්ග දික්ඛමනවසෙන සමෙතීති **සම්පයුත්තා;** සංඛරෙ අනිච්චාදිහි විවිධෙහි ආකාරෙහි පස්සති එතායාති **විපස්සනා;** අලොභාදයෝ ලොභාදි පටිපක්ඛාව; අසුභෙ අසුභනානි පවත්තා සඤ්ඤා අසුභසඤ්ඤා; එවං දුක්ඛසඤ්ඤාදයොපි, වුත්තනයෙනෙව අත්ථස්ස විපකිණ්ණතෝ නාසෙතුං අදත්වා උඩ්ඩං දානං රක්ඛණං උදානං, භවනානි පවත්තනානි එත්ථා'ති- **භූමි,** කිලෙසානං භූමි- **කිලෙසභූමි;** සද්ධාදීනං ඉන්ද්‍රියානං භූමි- **ඉන්ද්‍රියභූමි.**

උද්දෙසවාර වණ්ණනා නිට්ඨිතා.

මෙසේ උකතප්‍රකාරයෙන් කාරණය මූලපදයන් අතිසංක්ෂේ පොද්දෙශ වශයෙන් දක්වා දැන් සංක්ෂේප නිද්දේශ වශයෙන් දක් වනුවෝ- "තත්ථසඞ්ඛේපතෝ" යනාදිය කීහ; තත්ථ, ඒ සඞ්ග්‍රහ උද්දෙශපාඨයෙහි; සඞ්ඛේපතෝ, සැකෙවින්; (කකුළුවාලිමෙන්) ඒනෙත්ති, තෙතිස් අවයවයෙන්යුත් නෙත්තිතෝමෝ, නිත්තිතා, ප්‍රකාශකරනලදී; විශෙෂ නිද්දේශ වශයෙන් මෙසේ දතයුතු.

14 අස්සාදාදීනවතා-නිස්සරණම්පිච ඵලං උපායොච,
ආණත්තිච භගවතෝ-යොගීනං දෙසනා හාරෝ.

"යෙන භාසිතත්ථ සංවණ්ණනා විසෙසෙන සුත්තෙන ආගතා- අස්සාදෙ- ආදීනවෝ-නිස්සරණං- ඵලං- උපායෝ- යොගීනම ත්ථාය භගවතෝ ආණත්තිච්චාති ඉමෙ ච ධම්මා දස්සිතා සංවණ්ණිතා- සංවණ්ණනාවසෙන සඞ්ගහිතා- සඞ්ගහං සංවණ්ණනා විසෙසෝ දෙසනාහාරෝ නාමාති" සම්බන්ධත්ථයොජනා.

1 අස්සාදෙ, සුඛසොමනස්ස වෙදනා ඉෂ්ටාරම්මණතාලක්ඛණා විපල්ලාස සංඛ්‍යාත ආශ්වාදයද; ආදීනවතා, සපීතෙභූමික සංඛාරයන් කෙරෙහි උපදනා නිබ්බින්දනාකාර ලක්ෂණවූ ආදී නවයද; නිස්සරණම්පිච, නිස්සරණසංඛ්‍යාත ආර්‍යමාර්ගඵ හා නිර්‍වාණයද; ඵලං, පූර්‍වභාග ප්‍රතිපත්ති භූත ශුද්ධිවිමුක්ති සංඛ්‍යාත දෙශනා ඵලය හා දිව්‍යමනුෂ්‍යාදිවණ්ණාදිඵලසමාපත්තියද; උපායොච, ආර්‍යමාර්ගයට පදස්ථානවූ පූර්‍වභාගප්‍රතිපදාවද; භගවතෝ, භාග්‍යවතුන් වහන්සේගේ; යොගීනං, සිව්සස් කමටහන්හි යෙදුනාවූ වෙනෙය ජනයන්ගේ අර්ථය දිණීස; ආණත්තිච, මෙසේ පිළිපදුව සි කරණ්ලද නියමයද, යන- මඞ්ගවිභාග ලක්ෂණකොට ඇත්තේ; දෙසනාහාරෝ, දෙශනාහාර නම්.

එහි, "අස්සාදීයතීති අස්සාදෙ, සුඛං සොමනස්සං ඉට්ඨාරම්මණභාවං, අස්සාදෙති එතාය එතෙහීති වා අස්සාදෙ; තණ්හා විපල්ලාසාව; ආදීනං අනිච්ඡාපණභාවං වාති පවත්තතීති ආදීනවෝ, සොඑව ආදීනවතා; නිස්සරති එතෙනාති නිස්සරණං, "අරියමග්ගෝ" නිස්සරතීති වා නිස්සරණං; "නිබ්බානං" ඵලති නිබ්බත්තතීති ඵලං; පච්චයසාමග්ගිං උපගන්ත්වා අයති පවත්තතති ඵලමෙතෙනාති උපායෝ, උපඅයති අරියමග්ගසම්පං ගච්ඡති එතෙනාති වා උපායෝ; "ආණාරහස්ස භගවතෝ වෙනෙය්‍යානං එවං පටිපජ්ජථාති" ආණාපනං ආණත්තීති.

ත්‍රිවිධවූ හෝ පඤ්චවිධවූ වෙදනාවද- තෙභූමික සංඛාර යෝද- තණ්හාවද-චතුර්විධ විපල්ලාසයෝද-මෙහි ආශ්වාදනම්;

ආශ්වාදයෙහි කී ලක්ෂණවත් ධර්මයන් හැර දුක්ඛවේදනාව හා- ත්‍රිවිධ දුක්ඛ දුක්ඛතාවයද- නොහොත් සකල ත්‍රෛභූමික සංස්කාරයෝද- ආදීනව නම්; කරණකාරකාර්ථයෙහිවූ නිස්සරණ ශබ්දයෙන් වාච්‍යවන ආශාවිමාශීඝද- කර්තෘකාරකාර්ථ නිස්සරණ ශබ්දයෙන් වාච්‍යවන නිර්වාණයද- නිස්සරණ නම්; ශ්‍රුතමය ඥානය- අර්ථධර්මවේදය- පූර්වභාග ප්‍රතිපත්ති සංඛ්‍යාත ෂට්විශුද්ධි භූය, යන මෝක්ෂ ප්‍රත්‍යක්ෂ දෙශනාඵල නම්; එතෙණෙහි මාර්ගාවබෝධය නොවන්නාහට කලකින් මාර්ගාවබෝධයට ධර්මහේතුවක්වේද- සම්පත්තිභව ප්‍රතිලාභයට ධර්මහේතුවක්වේද- ඒ මේ හේතුව ඵලනමැයි දතයුතු- ආශාවිමාශීඝට ආසන්න කාරණයවූ පූර්වභාග ප්‍රතිපදාව උපාය නම්; පූර්වභාග ප්‍රතිපදාව වනාහී පළමු පළමුවූවා පසුපසුවූ ප්‍රතිපදාවන්ගේ පැමිණීමට උපායවන බැවින් පරම්පරාවෙන් මාර්ගනිර්වාණාවබෝධයට හේතුවන හෙයින් උපායයි කියනු ලැබේ; ඵලාධිගමයට හේතුවූ ප්‍රතිපත්තියද උපාය නම්, ආර්ණත්තිය සුබෝධයි.

මේකී අස්සාද ආදීනව නිස්සරණ ඵල උපාය ආර්ණත්ති, යන ෂට්විධ ධර්මාර්ථයන් විභාගකිරීම් ලක්ෂණකොට ඇති ප්‍රවචනාර්ථ සංවර්ණනා විශේෂය ඥානභාජන නම්.

(1) මෙකී අස්සාද නම් "යංභික්ඛවේ පඤ්චුපාදානක්ඛන්ධේ පටිච්ච උප්පජ්ජති සුඛං සෝමනස්සං අයං පඤ්චසු උපාදානක්ඛන්ධේසු අස්සාදෝ"- යනු වදාළ හෙයින් සුඛසෞමනස්ස- යන වේදනාවය අස්සාද නම්,- තවද- "සෝ තදස්සාදෙති- තං නිකාමෙති"යිද, "රූපං අස්සාදෙති අභිනන්දති, තං ආරබ්භ රාගෝ උප්පජ්ජති"යිද, "සංයෝජනීයෙසු භික්ඛවේ ධම්මෙසු අස්සාදානුපස්සිනෝ"යිද, වදාළහෙයින් ඉෂ්ටාරම්මණයද; "අස්සාදෙති එතායාති අස්සාදෝ"යි නිර්වචන හෙයින් ඉෂ්ටාරම්මණාශ්වාදයෙහි ඉවහල්වූ ඥානාඛ්‍යාවිද; සුභ සුඛ ධ්‍රුව අත්තභාව විපල්ලාසයෙන් මුළාවූ සත්ත්වයෝ අනිෂ්ටාරම්මණයන්ද- ඉෂ්ටාකාරයෙන් ගන්නෝය. එබැවින් සිව්විපල්ලාසයෝද අස්සාදනම්; ඒ මේ සුඛ සෞමනස්ස ඉෂ්ටාරම්මණ තණ්හා විපල්ලාස විභාගයෙහි "ඡයිමේ ආවුසෝ වේදනා කායා"යි ධර්මසෙනාපතිසැරියන් මාහිමියාණන් වහන්සේ වදාළ නයින්- අෂ්ටාත්තරශතසුඛවේදනා සමූහයක් හා එපමණම සෞමනස්සවේදනා සමූහයක්ද, විභාගකටයුතුය. ත්‍රෛභූමික සංස්කාර සඞ්ඛ්‍යාත ඉෂ්ටාරම්මණ විභාගය- ධර්ම සඞ්ගණී රූපකණ්ඩ නික්ඛේප කාණ්ඩාදියෙහි වදාළ නයින් දතයුතුය. තෘෂ්ණා විභාගය- සතිපට්ඨාන විභඞ්ග සඞ්ගීතියෙස වදාළ

විභඞ්ග නික්ඛේපකණ්ඩාදියෙහි වදාළ තණ්හා නිදෙස වසයෙන් දතයුතුය. විපල්ලාසවිභාගයෙ- සුභ සඤ්ඤාදීන්ගේ හා වාෂෂ්ටි දෘෂ්ටීන්ගේද ප්‍රභෙද වශයෙන් දතයුතුය.

(2) "ආදීනං අනිච්චකප්පණං වාති පවත්තතීති ආදීනවෝ"යි යූහෙයින් කෘපණ මනුෂ්‍යයකු වැනි තෘෂ්ණාමූලික ධර්මයෝ අනිත්‍ය සභාවාදිවශයෙන් ආදීනව නම්; "යං භික්ඛවෙ පඤ්චුපාදානක්ඛන්ධා අනිච්චා දුක්ඛා විපරිණාම ධම්මා අයං පඤ්චසු උපාදානක්ඛන්ධෙසු ආදීනවෝ"යි- වදාළහෙයින් දුඃඛසත්‍ය නිර්දේශයෙහි ඇතුළත් ජාත්‍යාදීන්ගේද- අනිත්‍යාදි දෙසාලිස් ආකාරයන්ගේද වශයෙන්ආදීනවය විභාගකොට දැක්විය යුතුය.

(3) "නිස්සරති එතෙනාති නිස්සරණං, අරියමග්ගෙනා; නිස්සරතී'තිවා නිස්සරණං, නිබ්බානංයි; ආර්‍යමාර්ග නිර්‍වාණ වශයෙන් නිස්සරණය දැක්විය යුතුය; එහි- ආර්‍යමාර්ග සඞ්ඛ්‍යාත නිස්සරණය සත්තිස්බෝපැකි දහම් වසයෙන් හා එහි ඇතුළත් කෘත්‍යානුපස්සනාදීන්ගේ වසයෙන්ද විභාගකටයුතුය. නිර්‍වාණ සඞ්ඛ්‍යාත නිස්සරණයාගේ වත්‍යානි නිස්සරණීය වශයෙන් විභාගකටයුත්තක් නැත, පරීත්‍ය වශයෙන් සොපාදිසෙස නිරුපාදිසෙස භෙදයෙන් හා වාර ආරම්මණ විඤ්ඤාණ ඵස්ස වෙදනා සඤ්ඤා චෙතනා තණ්හා චිතක්ක විචාර ධාතු කසිණායතන අසුභ චත්තාරිංසාකාර ඛණ්ඩ ආයතන අට්ඨාරසධාතු තිහව ඛ්‍යාත අපපමඤ්ඤා ආරුප්ප වාදසපටිච්චසමුප්පාදඞ්ග යනාදි සඞ්ඛත ධර්මයන්ගේ නිස්සරණ භාවයෙන්ද විභාග කටයුතුය.

(4) ඵල නම් පුණ්‍යඝමස්කාර හෙතුකොට ඇති ආයු වණ්ණ සුඛ බල යස පරිවාර ආධිපත්තෙය්‍ය සම්පත්ති උපධිසම්පත්ති චක්කවත්ති දෙවරජ්ජාදිරි චතුවක්කඝසම්පත්ති ආදිය හා සීලසම්පද, සමාධිසම්පද, පඤ්ඤාසම්පද, තිවිජ්ජා ඡළභිඤ්ඤා චතුපටිසම්භිදා, සාවකබෝධි පච්චෙකබෝධි සම්මාසම්බෝධි යන සකල සම්පත්ති විශෙෂය ධර්මදෙශනා ශ්‍රවණයෙන් උපදනා ශ්‍රද්ධාදීන් හෙතුකොට ඇති බැවින් දෙසනාඵල නමැයි දතයුතු; උපාය ආණත්තීහු නිර්‍වචනාර්ථ හෙයින් සුගමයහ.

(1) දෙශනාහාරනිර්දේශ වර්ණනාව.

---

15 යංපුච්ඡිතසුත්ත—පෙ—විභඞ්ගෝ'ති නිද්දිට්ඨා.

"භවඞ්ගසාසන සඞ්ඛාතස්ස සුත්තස්ස- අථවා සුත්තෙන ආගතා පුච්ඡා විස්සජ්ජනානුගීති පදපුබ්බාපර අස්සාදාදීනව නිස්සරණ

එවූපායාණත්තියෝ- යෙන සංවණ්ණනා විසෙසෙන විචිනිතබ්බා භවන්ති සවායං සංවණ්ණනා විසෙසෝ විචයහාරෝ නාමාති"අත්ථ යොජනා.

(2) **සුත්තස්ස**, සූත්‍රාගත හෙයින් තත් සම්බන්ධීවූ; **සංපුච්ඡිතං**, අදිටඨ්ජොතනාදි යම්පුච්ඡාවක්; (**විචයමානා**, සොයනු ලබන්නීද;) **සංවිස්සජ්ජිතං**, එකංසබ්‍යාකරණාදීවූ යම් විසජ්ජනාවක්; (විචියමානා, සොයනු ලබන්නීද;) මෙහි "යංපුච්ඡිතං විස්සජ්ජිතං" යනු ලිඞ්ග විපරිනාමයෙන් "යාපුච්ඡිතා යාවිස්සජ්ජිතා"යීද; විචය මානා යනු පාඨශෙෂ වශයෙන්ද ගතයුතු; වශබදය අවුකන සමූ චචයාර්ථ හෙයින් මෙහි නොකී පදවිචය හා පුබබාපරවිචය සඞ්ග්‍රහ කෙරේ; **යාවඅනුගීති**, උකතාර්ථයම කැවත සංග්‍රහකොට දක් වන්නාවූ හෝ පුවජාවට අනුරූපව දක්වන්නාවූ යම් සඞ්ග්‍රහ ගාථාවක් වේද; එය සොයනු ලබන්නීද; **සුත්තස්ස**, සූත්‍රානත යාගේ; **යෝ පවිචයෝ**, දෙශනාහාරයෙහි කී ආශ්වාදාදීන් සම්බ න්ධීවූ යම් සෙවීමෙක්වේද, මෙතෙමේ; **විචයෝහාරෝ ඉති**, විචය හාරයයි; **නිද්දිට්ඨා**, දක්වනලදී.

මෙහි අපරාඞ්ගත "සුත්තස්ස"යන පුනරුක්ත පදයෙන් දෙශ නාහාරයෙහි කී ආශ්වාදාදීන් සම්බන්ධකෙරේ.

මේ විචයහාරයෙන් "**පදවිචය- පුවජාවිචය- විස්සජ්ජනා විචය- පුබබාපරවිචය- අනුගීතිවිචය- අත්‍ථාදවිචය- ආදීනව විචය-නිස්සරණවිචය-ඵලවිචය- උපායවිචය- ආණත්තිවිචය-** යන එකාදශ විචයාර්ථයක් දක්වයි.

(1) එහි සූත්‍රාගත සකල පදයන්ගේ පිළිවෙළින් ව්‍යඤ්ජන අර්ථවශයෙන් සෙවීම පදවිචය නම්.

(2) මේ පුවජාව-"**අදිටඨ්ජොතනා- දිටඨසංසන්දනා-අනුමති- කථෙතුකම්‍යතා- සත්තාධිඨානා- ධම්මාධිඨානා- එකාධිඨානා- අනෙකාධිඨානා- සම්මුතිවිසයා- පරමත්ථවිසයා- අතීතවිසයා- අනාගතවිසයා-පච්චුප්පන්නවිසයා**"යි යනාදි වශයෙන් ප්‍රශන පරිඝාකිරීම පුවජාවිචය නම්.

(3) මේ විස්සජ්ජනය "**එකංසබ්‍යාකරණය- විභජ්ජබ්‍යාකර ණය- පටිපුවජාබ්‍යාකරණය- ඨපනය- සාවසෙසය- නිරවසෙසය සඋත්තරය- නිරුත්තරය- ලෞකියය- ලෞකුත්තරය**" යනාදි වශයෙන් විස්සජ්ජනය පරීඝාකිරීම විස්සජ්ජනවිචය නම්.

(4) මේ ප්‍රශනය "**මේහාසමවෙයි- මේහා නොසම්වේයයි**" පුවජිතාර්ථය පමුණුවා පූර්වාපර සංසන්දනය කොට සෙවීම පුබබා පරවිචය නම්.

(5) මේ අනුගීතියං- උභතොපි සංග්‍රහං- අනුභතොපි සංග්‍රහං උභයාපි සංග්‍රහං- කුසලාපි සංග්‍රහං- අකුසලාපිසංග්‍රහං-යනාදි වශයෙන් සෙවීම අනුගීතිවිචය නම්.

(6) සුඛවෙදනාව ඉට්ඨාරම්මණානුභවන ලක්ඛණය යනාදි වශයෙන්ද- තණ්හාව ආරම්මණ ග්‍රහන ලක්ඛණය යනාදි වශයෙන්ද- විපල්ලාසයන් විපරීත ග්‍රහන ලක්ඛණය යනාදි වශයෙන්ද- අවශිෂ්ට සම්පත්තෙහුමක ධම්මයන්ගේ සවකීය සවකීය ලක්ඛණාදි වශයෙන් දෙවිසිත්‍රික මාතෘකාවන්හිද- එක්සිය දෙසාලිස් දුක මාතෘකාවන්හිද- ලැබෙන පදවශයෙන් ඒ ඒ ආඛ්‍යාදීන් විශෙෂය නිඛ්‍රාරණය කිරීම අසඝාදවිචය නම්.

(7) දුක්ඛවෙදනාව අනිෂ්ටානුභවන ලක්ඛණය යනාදි වශයෙන්ද- දුක්ඛසත්‍ය සම්බන්ධී ධම්මයන්ගේ ප්‍රතිසන්ධි ලක්ඛණය යනාදි වශයෙන්ද- අනිත්‍යතාදීන් අවසවත්තනාදි වශයෙන්ද- සකල ලෞකික ධම්මයන් සංකෙලෙශභාගිය- ඨානභාගිය- භාවාදි වශයෙන්ද- ආදීනව ප්‍රවෘත්තීහුගේ ලාමකතාවය නිඛ්‍රාරණය කිරීමෙන් ආදීනවවිචය දතයුතු.

(8) කායානුපස්සනාදි පූර්ණභාග ප්‍රතිපද, විභාග විශෙෂ නිඛ්‍රාරණ වශයෙන් ආගම්මාගීයාගේද- පඨමාග විභාග විශෙෂ නිඛ්‍රාරණ වශයෙන් නිබ්බාණයාගේද- නිස්සරණවිචය දතයුතු.

(9) ඒ ඒ සූත්‍රදෙශනාවෙන් සාඛ්‍ය ඵලයාගේද- තදුපාය යාගේද- ඒ ඒ තන්හි කරණලද විධාන වචනයාගේද- විභාග නිඛ්‍රාරණ වශයෙන් ඵල උපාය ආගතින්ගේ- විචය දතයුතු.

(2) විචයහාරනිද්දෙශ වණ්ණනාදි.

---

16 සබ්බසංහාරානං —පෙ— යුත්තී'ති නිද්දිට්ඨා.

'යාවතා- සබ්බසං සොළසන්නං හාරානං පවත්තනට්ඨාන භූතා ඛ්‍යඤ්ජන සඞ්ඛාතා භූමි, යොව සුත්තන්ත සඞ්ඛාතො ගොචරො,- තෙසං භූමිගොචර සඞ්ඛාතානං ඛ්‍යඤ්ජනට්ඨානං යුත්තී අයුත්තිපරික්ඛා විචාරණ සඞ්ඛාතො සංවණ්ණනා විසෙසො යුත්තිහාරො"ති නිද්දිට්ඨොති- අට්ඨයොජනා.

සබ්බසං හාරානං, සියලු සොළොස් හාරයන් පිළිබඳවූ; **භූමි**, පැවැත්මට ආධාරස්ථානවූ අක්ෂරපද වාක්‍ය ප්‍රබන්ධ සඞ්ඛ්‍යාත යම් ව්‍යඤ්ජනභූමියක් වේද; **යො ච ගොචරෝ**, භාෂිතාවූ සඞ්ඛ්‍යාතවූ යම් ගොචරයෙක් වේද; **තෙසං**, ධම්මාවූසඞ්ඛ්‍යාතවූ ඒ

භූමිගොචරයන්ගේ; **සුත්තානුලෝමනිපදිකඛා**, සතරමහා අපදෙසයන් හා අවිරුඬාකාරයෙන් තත් තත් සූත්‍රාගත ධර්මාදී සඛ්‍යාත භූමිගොචරයන්ගේ යුක්ති අයුක්ති විචාරණය යම් නෙත්තිහාර වර්ණනාවකින් කරණු ලබන්නීද- ඒ අර්ථ වර්ණනා විශෙෂ තෙමේ; **සුත්තනිහාරෙ ඉති**, යුක්තිහාරයයි; **නිද්දිට්ඨා**, දක්වන ලදී.

එහි-අක්ඛරපද වාක්‍ය ප්‍රබන්ධ සඛ්‍යාත භූමිහුගේ යුක්තායුක්ති විචාරණය නම්:- ඒ ඒ සූත්‍රපාඨයන්ගේ සභාව නිරුක්ති භාවය හා අභිප්‍රෙතාර්ථභාවය- සතරමහා අපදෙසයන් හා යුතුද අයුතුද යන සෙවීමයි, එසේම තත් තත් සූත්‍රපාඨාදී ප්‍රබන්ධය- සංවර ප්‍රහාණ ප්‍රඥප්ති සමථ සඛ්‍යාත චතුර්විධ විනයාදී, සතිපට්ඨාන, සම්මප්පධාන ඉද්ධිපාද, ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, මග්ගඞ්හසඛ්‍යාත සප්තවිධ සූත්‍රාදී චිත්තවෙතසික රූප නිර්වාණ සඛ්‍යාත චතුර් විධ අභිධර්මාදියන් හා අවිලොම විලොමත්වය මහා අපදෙසතයින් විමසීම ගොචරයාගේ යුක්තායුක්ති විචාරණයයි.

(3) සුත්තනිහාරනිද්දෙස වර්ණනායි.

---

17 ධම්මං දෙසෙති—පෙ—පදට්ඨානෙ.

ජිනො යං කුසලාකුසලාදි ධම්මං දෙසෙති, තස්ස ධම්මස්ස යඤ්ච පදට්ඨානභූතං ධම්මං නිද්ධාරෙතබ්බං සියා, තං තං පදට්ඨානඤ්ච, තථෙව යත්තකා ධම්මා වුත්තා භගවතා තෙසං සබ්බෙසං ධම්මානං යං යං පදට්ඨානං සියා, තං තං නිද්ධාරෙත්වා කථෙතබ්බං තස්ස තස්ස ච පදට්ඨානස්ස යඤ්ච යඤ්ච පදට්ඨානං සියා තං තං පදට්ඨානඤ්ච නිද්ධාරෙත්වා කථෙතබ්බන්ති, ඤ්‍යුපකො යො සං වණ්ණනා විසෙසො-සච්චං ඛාරො පදට්ඨානෙ'ති- නිද්දිට්ඨා'ති අත්ථයොජනා.

ජිනො, ජිතපඤ්චමාර සර්වඥතෙමේ; **ධම්මං**, කුශලාකුශලාදි යම් ධර්මයක්; **දෙසෙති**, වෙනෙය ජනයාහට ප්‍රකාශකෙරේද; **තස්ස ච ධම්මස්ස**, ඒ දෙශිත ධර්මයාගේ; **යං**, තස්සූත්‍රාගතවූ හෝ අනාගතවූ හෝ යොනිසොමනසිකාරාදි යම්කරුණක්; **පදට්ඨානං**, ආඝන්නාහෙතු වේද; (හෙද දෙශනා කෙරෙයි, ඒ ආඝන්නා හෙතුව ලැබෙන ලැබෙන පරිද්දෙන් නිර්ධාරණය කටයුතුය යනු ශෙෂාර්ථයි.) **ඉති**, මේ ආකාරයෙන්; **සාවසබ්බධම්මා**, තස්සූත්‍රා ගතවූ යම්තාක් සර්වධර්මයෝවෙත්ද; (ඒ සකල ධර්මයන්ගේ ලත් ලත් සුදුසු පරිද්දෙන් ආඝන්න කාරණය නිර්ධාරණය කටයුතුය යනු

ශෙෂාපීයි.) නොහොත් යාවසබ්බධම්මා, තයසූත්‍රාගත ධර්මයට යමක් ආසන්න කාරණය වේද-ඒ ආසන්න ධර්මයට තවත් ආසන්න කාරණයෙක් වේද, මෙසේ ලැබෙන ලැබෙන පරිද්දෙන් යම් තාක් තයසූත්‍රාගත සකල ධර්මයන්ගේ ආසන්න හෙතු ලැබේද-ඒතාක් පදට්ඨාන නිද්ධාරණ විචාරණය කටයුතුය; එසෝ හාරෝ, මෙසේ සූත්‍රාගත ධර්මයන්ගේ පදස්ථාන ධර්මපරම්පරා නිද්ධාරණ ලක්ෂණකොට ඇති මේහාරතෙමේ; පදට්ඨානෝ, පදට්ඨානනම්...

මෙහි "යාවසබ්බධම්මා" යන්නෙහි සබ්බශබ්දය ප්‍රදෙශ සථීා එයි, සථීසථීාපී නොවේ, එහෙයින් ප්‍රථමාපේක්ෂාවිකල්පයෙහි සූත්‍රාගත ධර්මයන්ගේ වශයෙන් ප්‍රදෙශාපී විෂයකොට පවත්නා මේ සබ්බ ශබ්දය තීයාපී විකල්පයෙහිද පදට්ඨාන පදට්ඨානික ධර්මනිද්ධාරණයෙන් තත් තත් ප්‍රකරණ පරිච්ඡින්න ධර්මග්‍රහණ හෙයින් ප්‍රදෙශාපේක්ෂාවිෂයකොට පවත්නේමැයි, අනවශෙෂ ධර්මයන් විෂය කොට පවත්නේ නොවෙයි... තං තං සුත්තාගතා තං තං පකරණ පරිච්ඡින්නාවා සබෙබ ව තෙ ධම්මා චා'ති සබ්බධම්මා; යත්තකා සබ්බධම්මා යාව සබ්බධම්මා'යි නිච්චනයි...

(4) පදට්ඨානහාරනිද්දෙශ වණ්ණනායි.

---

18 වුත්තඤහි එකධම්මෙ —පෙ— ලක්ඛණෝ නාම...

යත්ථ කත්ථචි භගවතා වුත්තෙන එකසම්ං ධම්මෙ දිට්ඨෙ සති-තෙන ධම්මෙන යෙ කෙචි ධම්මා සාහචරියාදිවසෙන සමාන ලක්ඛණා භවන්ති, තෙපි සබෙබ ධම්මා තත්ථ වුත්තා භවන්තී'ති- ඉදුප කොහාර සංවණ්ණනා විසෙසෝ ලක්ඛණෝ නාම හාරෝ'ති-නිද්දිට්ඨා'ති- අත්ථයොජනා...

වුත්තඤහි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම්කිසි සූත්‍රප්‍රදෙශයෙක්හිලා වදාරණලද්දාවූ; එකධම්මෙ, එක්ධර්මපදයක් පෙළඅටුවා වන්හි දක්නාලදකලැ; එකලක්ඛණා, සූත්‍රාගත තද්ධර්මය හා සාහචර්‍යාදියෙන් සමාන ලක්ෂණ ඇත්තාවූ; යෙ කෙචි ධම්මා, යම්කිසි ධර්මයෝ වෙත්ද; සබ්බෙ, ඒ සියලු ධර්මයෝ; වුත්තා භවන්ති ඉති, කියනලද්දෝ වෙත්යයි නොහොත් එහිලා කියයුත්තෝ වෙත් යි; සොහාරෝ, යථොක්තාපේක්ෂාපකවූ ඒ මේ හාර සංවර්ණනා විශෙෂ තෙමේ; ලක්ඛණෝ නාම, ලක්ෂණහාරනාමය නම්වේ...

"එකධම්මෙ වුත්තඤහි යෙකෙචිධම්මා එකලක්ඛණා සබෙබ වුත්තා භවන්ති, සොහාරෝ ලක්ඛණෝ නාම"යීද- පදයොජනා

වශයෙන් අරුත් බෙණෙති, ධම්මාභිසමයය ප්‍රවත්තොදයෙන් පසුවූ හෙයින් පූජාඵල විකල්පය යුත්තියුත්තයය කී හැටේ.

මේ ලක්ෂණහාරයෙහි- "සාහචරියත්ත- සමානකාරත්ත- සමානහෙතුත්ත- සමානඵලත්ත- සමානාරම්මණත්ත" යනාදීන්ගේ දිසයෙන් එකලක්ෂණත්වය දතයුතු. එහි-

(1) "නානත්තනකායා නානත්තසඤ්ඤිනො" "නානත්තසඤ්ඤානං අමනසිකාරා" යනාදිතන්හී සංඥාසාහචරියත්වයෙන් සංඥාසහගත ධර්මයෝ ගන්නාලදහ.

(2) "දදං මිත්තානි හනති" යනාදිතන්හී සමානකාරත්වය යෙන් මිත්‍රඝ්නන්න කෘත්‍යසාධක ප්‍රියවචන අර්ථචරියා සමානාත්මතා- යන ධර්මයෝ ගනුලබත්.

(3) "ඵස්සපච්චයා වේදනා" යනාදි තන්හී සමානහෙතුත්වයෙන් සංඥදීහුද ගනුලබත්.

(4) "අවිජ්ජාපච්චයා සඞ්ඛාරා" යනාදි තන්හි සමානඵලත්වයෙන් තෘෂ්ණා උපාදානාදීහුද නිඛාරණය කරණු ලබත්.

(5) "රූපං අස්සාදෙති- අභිනන්දති- තං ආරබ්භ රාගො උප්පජ්ජති" යනාදිතන්හී සමානාරම්මණත්වයෙන් තත්සම්ප්‍රයුක්ත වෙදනාදීහුද නිඛාරණ කටයුත්තාහ.

අර්ථ ප්‍රකරණ ලිඛිත ශබ්දානන්තර සන්නිධාන සාමර්ථ්‍යාදි වශයෙන්ද- තත් තත් ධර්මයන්ගේ සමාන ලක්ෂණත්වය දතයුතු.

(5) ලක්ෂණහාරනිද්දේශ වර්ණනායි.

---

19 නෙරුත්තකම්භිප්පායෝ — පෙ — චතුබ්භූහෝ.

"තස්මිං තස්මිං පාවචනප්පදෙසෙ-සන්දිස්සමානානි සුත්තපද නිබ්බචනං තං තං සුත්තදෙසකානං බුද්ධාදීනම්භිප්පායෝ දෙසනා නිදානං පුබ්බාපරානුසන්ධි චා'ති ඉමානි චත්තාරි සම්පිණ්ඩිතානි ව්‍යඤ්ජන වාරෙන ඒන සංවණ්ණනා නයෙන විභාවියනති, සවායං සංවණ්ණනා විසෙසෝ චතුබ්භූහෝ නාරෝ'ති නිද්දිට්ඨෝ'ති, අත්ථයොජනා.

ව්‍යඤ්ජනං, ව්‍යඤ්ජනවාරයෙන්; නෙරුත්තං, නිරුත්ති සඞ්ඛ්‍යාත පදනිර්වචනයද; අභිප්පායෝ, සූත්‍රදෙශකවූ බුද්ධාදීන්ගේ තත් තත් දෙශනා පර්‍යාපන්නවූ අදහසද; දෙසනානිදානාදිං, දෙශනා ප්‍රවෘත්ති නිමිත්තද; පුබ්බාපරානුසන්ධි, සූත්‍රයාගේ පූර්ව

භාගඤ හෝ අපරභාගඤ සංසන්දනඤකොට කීමද; නොහොත් සංගීති වශයෙන් පූර්වාපරවූ සූත්‍රාන්තරයන් හා වර්ණනා කරනු ලබන සූත්‍රයාගේ සංසන්දනය කිරීමද- පූර්වපදය හා පරපදයාගේ හෝ සම්බන්ධකිරීමද- යන මේ ඝතරදෙනාගේ ප්‍රකාශ කිරීම ලක්ෂණකොට ඇති;එසෝ හාරෝ, මේ හාරතෙමේ;චතුබ්‍යූහෝ, චතුබ්‍යූහ නම්වේ.

මෙහි අථ යනු පදපූරණාර්ථයි; බ්‍යඤ්ජනං යනු කරණාර්ථයෙහි ප්‍රථමෛක වචනයි.

නිස්සෙසතෙන වුච්චති පදත්ථෝ එතෙනා'ති නිරුත්තං- නිරුත්තමෙව නෙරුත්තං, සූත්‍රගත සභාව නිරුත්ති සම්බන්ධවූ නාමාදිපදයන්ගේ නිර්වචන සංඛ්‍යාත විග්‍රහාර්ථ ප්‍රකාශකිරීම නෙරුත්ත නම්.

අත්තනි අධිපයති බුජ්ඣති එතෙන අධිකිච්චපායීයති බුජ්ඣීයතී'ති වා අධිප්පායෝ; ධර්මදෙශක බුද්ධ බුද්ධශ්‍රාවකයන්ගේ ඒ ඒ සූත්‍රදෙශනා කිරීමෙහිදී එහි පිහිටවියයුතු අදහස අධිප්පාය නම්.

නිස්සෙසතෙන දෙති ඵලමනෙනා'ති නිදානං, දෙසනාය නිදානං දෙසනා නිදානං; දෙශනා ප්‍රවෘත්තියට හෙතු අධ්‍යාත්මික බාහිර නිමිත්ත දෙසනානිදාන නම්.

පුබ්බෙන අපරං පුබ්බාපරං, අනුසන්ධි එකතෝ ඛෙති ධාරෙති එතෙනා'ති අනුසන්ධි,පුබ්බාපරස්ස අනුසන්ධි පුබ්බාපරානුසන්ධි; සූත්‍රයාගේ පූර්වභාගඤ හා අපරභාගඤ ගැළපීම හෝ සඞ්ගායනා වශයෙන් පූර්වාපරවූ අන්‍යසූත්‍රයන් හා වර්ණනාකරනු ලබන සූත්‍රයාගේ ගැළපීම හෝ පූර්වාර්ථපදය හා අපරාර්ථ පදයාගේ සංසන්දනය කිරීම හෝ පුබ්බාපරානුසන්ධි නම්.

(6) චතුබ්‍යූහහාරනිර්දේශ වර්ණනායි.

20 එකමහි පදත්ථානෙ-පෙ-සෝ හාරෝ.

"පරක්කමධාතු ආදීනං පදත්ථානභූතෙ එකමහි ආරම්භධාතු ආදිකෙ ධම්මෙ දෙසනාරුළ්හෙහි විසභාගතාය වා සෙසකං පදත්ථානං පරියෙසති, දෙසනාය සරූපතෝ අගහණෙන වා සෙසකං පදත්ථානං පරියෙසති, යෙන සංවණ්ණනා විසෙසෙන පරියෙසිතා යොජෙතෙතා දෙසනං පමාදාදීනං පදත්ථානභූතෙ කොසජ්ජාදිකෙ පරිපක්ඛෙ ආවට්ටෙති, සොසංවණ්ණනා විසෙසෝ ආවට්ටෝ හාරෝ නාමා"ති නිද්දිට්ඨත්තා අත්ථයොජනා.

පදට්ඨානෙ, පරකතමධාතු ආදීන්ව ආසන්නාසන්නවූ; එකමහි, ආරම්භධාතු ආදි එක් ධම්මයක්හු; (දෙශනාරූඪවූකලැ) පදට්ඨානං තවිසභාගතවයෙන් හෝ එහිලා සරූප වසයෙන් නොගැන්මෙන් හෝ පමාදදීන්ව ආසන්නාසන්නවූ; සෙසකං, අවශෙෂ ධම්මාන්තර යක්; පම්හසඤ්ඤී, දෙසකතෙමේ තදෙශනාවෙහි සංවණ්ණනාවෙහි යොදනුපිණිස ධම්ඥනයෙන් ගවෙසනය කෙරේද; පටිපක්ඛ, ප්‍රතිපක්ෂ ධම්මයන් නොහොත් ප්‍රමාදදීන්ව ආසන්නාකාරණවූ කොසජ්ජාදි ප්‍රතිපක්ෂ ධම්මයන් කෙරෙන්; ආවට්ටති, තදෙශනාව ආවර්තනය කෙරේද, නෙවත් ප්‍රතිපක්ෂ ධම්මයන් කෙරෙන් කරකවා වෙන්කොට ගණ්නේද; සෝ ආවට්ටෝ භාරෝ නාම, දෙසනාවෙහිලා ගන්නාලද ධම්මයන් සභාග විසභාග වසයෙන් ආවර්තනය කිරීම නෙවත් විසභාග ධම්මයන් කෙරෙන් සභාග ධම්මයන්ද- සභාගධම්මයන් කෙරෙන් විසභාග ධම්මයන්ද- කුසලයන් කෙරෙන් අකුසලයන්ද-අකුසලයන් කෙරෙන් කුසලයන්ද-කරකවා හරවා වෙන් කිරීම ලක්ෂණකොට ඇති ඒ සංවණ්ණනා විශෙෂතෙමේ ආවට්ට හාර නම්වේ.

"ආවට්ටීයතීති එතෙන එත්ථ වා සභාග විසභාගාධම්මා-තෙසං ආවට්ටනත්තා වා ආවට්ටෝ"යි- නිර්වචන කෙයින් මේ සංවණ්ණනා විශෙෂය ඉවහල්කොටැ නොකොත් මේ සංවණ්ණනා විශෙෂයෙහිලා අන්‍යොන්‍ය සභාගවූද විසභාගවූද ධම්මයෝ ආවර්තනය කරණු ලැබෙත්නු යි නෙවත් විසභාග ධම්මයන් කෙරෙන් සභාග ධම්මයෝද සභාගධම්මයන් කෙරෙන් විසභාග ධම්මයෝද ආවර්තනය කොට කරකවා වෙන්කොට ගනුලබත්නු යි හෝ ඒ සභාග විසභාග ධම්මයන්ගේ එසේ වෙන්කිරීම ආවට්ට නම්වේ, මෙහි විස්තර විභඞ්ග විනිශ්චයෙහි පළවේ.

(7) ආවට්ටහාරනිද්දෙශ වණ්ණනාය.

---

21 ධම්මක්ඛන්ධ පදට්ඨානක්ඛං -පෙ- නෙත්තියා විභත්තී'ති.

(යෙන සංවණ්ණනා විසෙසෙන)- කුසලාදිසභාව ධම්මස්කන්ධ- දානසීලාදි පදට්ඨානස්කන්ධ පුථුජ්ජනභූමි දස්සනභූමි භාවනාභූමි ආදිකං භූමි විසෙසස්කන්ධ සාධාරණෙ අසාධාරණෙ ච ධම්මෙ-විභජතෙ, සච්චං සංවණ්ණනා විසෙසො විභත්තිහාරො ඉති නෙත්තියාති අත්ථයොජනා.

ධම්මස්කන්ධ, කුසලාදි වශයෙන් අනෙකවිධවූ සවභාව ධම්මයද; පදට්ඨානස්කන්ධ, දානසීලාදි මතු ගුණවිශෙෂාධිගමයට කාරණස්කන්ධයද;

භූමිඤ්ච, පෘථග්ජනභූමි දර්ශනභූමි ආදි භූමිවිශෙෂයද; සාධාරණෙව, "දස්සනෙන පහාතබ්බා" යනාදි නාමවසයෙන් හෝ පුථුජ්ජන සොතාපන්නාදි වසතු වශයෙන් හෝ සාධාරණධර්ම යන්ද; අසාධාරණෙව, තව්පරීත වශයෙන් අසාධාරණධර්මයන්ද; විභජතෙ, යම්බඳු සංවර්ණනා විශෙෂයකින් විභාගකෙරේද; හෙවත් කථනය කෙරේද; අයං හාරෝ, මේ සංවර්ණනා විශෙෂ තෙමේ; විභත්තී ඉති, විභත්තිහාරයයි; නෙත්තියා, අවබොධයට පැමිණවියයුතු.

මේ සූත්‍රයෙහි වදාළ කුශලධර්මයෝ වාසනාභාගීයහ, මේසූත්‍ර යෙහි වදාළ කුශලධර්මයෝ නිබ්බෙධභාගීයහ යනාදිවසයෙන් හා මේ සූත්‍රයෙහි වදාළ අකුශල ධර්මයෝ සංකෙලෙසභාගීයහ යනාදි වසයෙන් කුශලාකුශල ධර්මයන්ද, මේ ශීලය මේ මහග්ගතගුණ විසෙසයට පදට්ඨානය, මේ ශීලය මේ ධ්‍යානය මේ ලොකොත්තර ගුණයට පදට්ඨානය යනාදිවසයෙන් පදට්ඨානකාරණයද, දර්ශන මාගීයෙන් ප්‍රහාතව්‍ය කෙලෙසයන්ට පෘථග්ජන පුද්ගලතෙමේ භූමිය, උපරිමාගීත්‍රයෙන් ප්‍රහාතව්‍ය කෙලෙසයන්ට ශ්‍රොතාපන්නාදි පුද්ගලයෝ භූමියයි යනාදිවසයෙන් භූමිවිසෙසයද, කාමරාග ව්‍යාපාද කෙලෙසයෝ පෘථග්ජන ස්‍රොතාපන්න පුද්ගලයන්ට සාධාරණයහ යි සාධාරණ ධර්මයන්ද, ඒ කෙලෙසයය අනාගාමී ක්ෂීණාශ්‍රවයන්ට අසාධාරණයහ යි- අසාධාරණ ධර්මයන්ද- ඒ ඒ ආකාරයෙන් විභාගකොට දක්වන හාරක්‍රමය විභත්ති නම්වේ.

(8) විභත්තිහාරනිද්දෙශ වණ්ණනා යි.

---

22 කුසලාකුසලෙ -පෙ- පරිවත්තනෙනාහාරෝ නාම.

(යසම්ංසුත්තෙන) භාවිතබ්බ අනවජ්ජ කුසලධර්මෙම නිද්දිට්ඨ කථිතෙ, පහාතබ්බ සාවජ්ජ අකුසලෙ ධර්මෙම නිද්දිට්ඨ කථිතෙ, තෙසං ධම්මානං පටිපක්ඛ විපරීතධර්මෙම යෙන සංවණ්ණනා විසෙසෙන පරිවත්තෙතති, සඞ්ඛං සංවණ්ණනා විසෙ සො පරිවත්තනතො හාරො නාමා'ති අත්ථයොජනා.

භාවිතෙව, භාවිතාකටයුතුවූද; පහීනෙව, පහකටයුතුවූද; කුසලාකුසලෙ ධර්මෙම, අනවද්‍ය සාවද්‍ය ධර්මයන්; නිද්දිට්ඨ, කිකලෑ; (වැණුකලෑ) පටිපක්ඛ, ඒ කුශලා කුශල ධර්මයන්ට ප්‍රති පක්ෂවූ විපරීත ධර්මයන්; පරිවත්තනති, පෙරළාගන්නේද; පරි වත්තනනොහාරෝ නාම, ඒ මේ අර්ථසංවර්ණනාවිශෙෂය පරිවර්තන හාරකම්.

මෙහි "සම්මාදිට්ඨිසස්ස පුරිසපුග්ගලස්ස මිච්ඡාදිට්ඨි නිජ්ජිණ්ණා භවති" ඉත්‍යාදිවසයෙන්ද, "පාණාතිපාතා පටිවිරතස්ස පාණාති පාතෝ පහීනෝ" ඉත්‍යාදි වසයෙන්ද, භුඤ්ජිතබ්බා කාමා -පෙ- කාමෙහි වෙරමණී තෙසං අධමෙමා ඉත්‍යාදිවසයෙන්ද, ප්‍රතිපක්ෂ ධර්මයන්ගේ පරිවර්තනාකාරය විභාවනයෙහි ප්‍රකාශවන්නේයි.

(9) පරිවර්තනහාරනිද්දේශ වර්ණනායි.

---

23 වෙවචනානි -පෙ- සොහාරෝ.

යෝ සුත්තන්තවිදූ ධම්මඤ්ච කුසලෝ බහුස්සුතෝ, එකධම්මස්ස එකස්ස පදඤ්ඤස්ස සුත්තෙන වුත්තානෙව බහූනි එව වෙවචනානි පරියායවචනානි- යෙන සංවණ්ණනා විසෙසෙන ඤාතානි, ඤාතීහි ව එකසම්බන්ධයුත්ත එව පදඤ්ඤේ යොජේති, තස්ස යොජකස්ස සුත්තන්තවිදුනෝ සෝ සංවණ්ණනා විසෙසෝ වෙවචනෝ හාරෝ'ති නිද්දිට්ඨෝ'ති අත්ථයොජනා.

යෝ සුත්තන්තවිදූ, සූත්‍රසඞ්ඛ්‍යාත නවාඞ්ග ත්‍රිපිටක බුද්ධවචනයෙහි දක්ෂවූ යම් ධර්මකථිකයෙක් නෙමේ; **එකධම්මස්ස, එකපදඤ්ඤයක්** සම්බන්ධව; **සුත්තෙන**, නවාඞ්ග ශාස්තෘශාසන සඞ්ඛ්‍යාත සූත්‍රාගතයෙහි; **වුත්තානිනු**, කියනලද්දාවූම; **බහූනි නු වෙවචනානි**, බොහෝවූම පර්‍යායශබ්දයන්; **ඤාතානි**, දනීද හෙවත් විවාරාද; **දැන එකපදඤ්ඤයෙක්හි** යොදාද; **සෝ හාරෝ**, එකාර්ථයක් සම්බන්ධව බොහෝ පර්‍යායශබ්ද යොජනා සඞ්ඛ්‍යාතවූ ඒ අර්ථවර්ණනාහාර ක්‍රමතෙමේ; **වෙවචනෝ නාම**, වෙවචනහාර නම් වන්නේය.

පිටකත්‍රය දන්නාවූ යම් ධර්මකථිකයෙක් තෙමේ යම් අර්ථවර්ණනාහාර ක්‍රමයක් ආශ්‍රය කිරීමෙන් එකපදඤ්ඤයක් සම්බන්ධව සූත්‍රාගතයෙහි කියනලද්දාවූ බොහෝවූ පර්‍යායශබ්දයන් ප්‍රකාශ කෙරේද- එසේ එකාර්ථයෙක්හි බොහෝ පර්‍යායශබ්දයන්ගේ යෙදීම ලක්ෂණකොට ඇති ඒ අර්ථවර්ණනා ක්‍රමය **වෙවචනහාර** නම්.

"විවිධානි එකසම්බන්ධයුත්ත එව වචනානි විවචනානි- විවචනානි එව වෙවචනානි" මෙහි **නු** ශබ්දය අවධාරණාර්ථ හෙයින් වෙවචනහාර යොජනාවෙහි බොහෝවූම පර්‍යායශබ්දයෝ කියයුත්තාහුය. සවලපයක් නොකියයුතුය යනු දක්වයි, එම **නු** ශබ්දය "සුත්තෙනවුත්තානි" යනු හා ද සම්බන්ධවන හෙයින් ඒ පර්‍යායශබ්දයෝ සූත්‍රාගතවූවෝම දක්වනලදහ.

(10) වෙවචනහාරනිද්දේශ වර්ණනායි.

---

24 එකං භගවා ධම්මං-පෙ-පඤ්ඤත්තිහාරෝ.

"භගවා එකං ඛන්ධාදිධම්මං නික්ඛිපපභවාදිනාහි විවිධාහි පඤ්ඤත්තීහි යෙන පඤ්ඤාපෙතබ්බාකාරෙන දෙසෙති, සවායං පඤ්ඤාපෙතබ්බාකාරෝ යෙන සංවණ්ණනාවිසෙසෙන විභාවීයතෙ, සවායං සංවණ්ණනාවිසෙසෝ පඤ්ඤත්තිහාරෝ නාමාති ඤෙය්‍යෝ"ති අත්ථයොජනා.

භගවා, භාග්‍යවත්තෙමේ;එකං ධම්මං, සකඛාදි එක් ධර්මපදයක්; විවිධාහි, නික්ෂෙප ප්‍රභවාදි අනෙකවිධවූ; පඤ්ඤත්තීහි, පැණවියයුතු ආකාරයෙන් නොහොත් අසඞ්කරවශයෙන් හැඟවීමෙන්; දෙසෙති, ප්‍රකාශකෙරේද; සෝ ආකාරෝ, ඒ විවිධ ප්‍රඥප්තියෙන් පැණවියයුතු ආකාරය; පඤ්ඤත්තිහාරෝ නාම ඉති, ප්‍රඥප්තිහාර නමැති ඤෙය්‍යෝ, දතයුතු.

මෙහි- නික්ඛිපපඤ්ඤත්ති- පභවපඤ්ඤත්ති- පරිඤ්ඤා පඤ්ඤත්ති- පහානපඤ්ඤත්ති- භාවනාපඤ්ඤත්ති- සච්ඡිකිරියා පඤ්ඤත්ති- නිරොධපඤ්ඤත්ති- නිබ්බිදාපඤ්ඤත්ති ආදිවශයෙන් ප්‍රඥප්තීන්ගේ විවිධභාවය දතයුතු. එහි

පඤ්චසකඛ- ෂඩායතන, වාදශායතන, අෂ්ටධාතු, අෂ්ටාදශධාතු, දශවිධ ඉන්ද්‍රියාදි සංඛතධර්මයන් පිළිබඳ පිඛනාලක්ෂණය දුකයයි පැණවීම නික්ෂෙප ප්‍රඥප්ති නම්.

"කබලිඞ්කාරෙ වෙ හිකඛවෙ ආහාරෙ අත්ථි රාගො-අත්ථි නන්දි-අත්ථි තණ්හා- පතිට්ඨිතං තත්ථ විඤ්ඤාණං විරූළහං, යත්ථ පතිට්ඨිතං විඤ්ඤාණං විරූළහං- අත්ථි තත්ථ නාමරූපස්ස අවක්කන්ති, යත්ථ අත්ථි නාමරූපස්ස අවක්කන්ති, අත්ථි තත්ථ සඞ්ඛාරානං බුද්ධි" යන මේආදිය දුකඛ සමුදය දෙදෙනාගේ ප්‍රභවප්‍රඥප්තිනම්;"කබලිඞ්කාරෙ වෙ හිකඛවෙ ආහාරෙ නත්ථි රාගො"යන්නාදිය දුඃඛ සත්‍යයාගේ පරිඥ ප්‍රඥප්තියද- සමුදයාගේ ප්‍රහාන ප්‍රඥප්තියද- මාර්ගයාගේ භාවනා ප්‍රඥප්තියද-නිරොධයාගේ සච්ඡිකිරියා ප්‍රඥප්තියද- ශ්‍රැතමය ඥානයාගේ නික්ෂෙප ප්‍රඥප්තියද- අනඤ්ඤතඤ්ඤස්සාමීතීන්ද්‍රියයාගේ සච්ඡිකිරියා ප්‍රඥප්තියද- ධර්මචක්‍රයාගේ පවත්තන ප්‍රඥප්තියද වේ. මෙහි විසතර හාරවිභඞ්ගයෙහි ප්‍රකාශ වන්නේය.

(11) ප්‍රඥප්තිහාරනිද්දෙශ වණ්ණනා.

---

25 යෝ ච පටිච්චුප්පාදෙ-පෙ-ඔතරණෝ නාම අයං හාරෝ.

"යෝ පටිච්චසමුප්පාදෙ ච- යෙ ඉන්ද්‍රිය ඛන්ධා ච- යානි ධාතු ආයතනානි ච- යෙන සංවණ්ණනාවිසෙසෙන නිද්ධාරිතානි, එතෙහි පටිච්චසමුප්පාදින්ද්‍රිය ඛන්ධධාතුආයතනෙහි- සුත්තාගත පදත්ථ මුඛෙන නිද්ධාරියමානෙහි ච- යෝ සංවණ්ණනා විසෙසෝ ඔතරති ඔගාහති, පටිච්චසමුප්පාදාදිකෙ තත්ථ වාචාවසෙන ඤාපකවසෙන වා අනුපවිසති, සවායං සංවණ්ණනා විසෙසෝ ඔතරණෝ හාරෝ නාමා"ති. අත්ථයොජනා.

යෝ ච පටිච්චුප්පාදෙ, චාදශපදිකවූ යම් ප්‍රත්‍යයාකාර ධර්ම සමූහයෙක් වේ ද; **ඉන්ද්‍රියඛන්ධා ච**, යම් දෙවිසි ඉන්ද්‍රිය ධර්මයෙක් හා පවසනු ඛන්ධ ධර්මයෙක් වේද්ද; **ධාතු ආයතනානි ච**, යම් අටළොස් ධාතුවෙක් හා චාදශායතන වෙණෙක් වේද්ද; **එත්ථ**, සූත්‍රාගත පදාර්ථමුඛයෙන් නිද්ධාරණය කරණු ලබන පටිච්චසමුප්පාද ඉන්ද්‍රියඛන්ධධාතු ආයතන යන මේ ධර්මවාරයෙන්; **යෝ**, යම් සංවර්ණනා ක්‍රමයෙක්; **ඔතරති**, පටිච්චසමුප්පාදාදීන්හි බැසගනීද- ඇතුළත්වේද; **යෝ ඔතරණා හාරෝ නාම**, ඒ සංවර්ණනාක්‍රම තෙමේ ඔතරණහාර නම්වේ. මෙහි ච ශබ්දයෙන් සූන්‍යතා මුඛාදීන්ගේ සඞ්ග්‍රහය වේ. ඉන්ද්‍රියානි ච ඛන්ධාච- ඉන්ද්‍රිය ඛන්ධා, ධාතුයෝ ච ආයතනානි ච- ධාතුආයතනා.

මෙහි ඔතරණය කෙසේදයත්?- "උඩං අධෝ සබ්බධි විපස්සනෙනා" යන මෙහි අසෙඛ විමුක්තිය දක්වයි; එය ම අසෙඛ පඤ්චේන්ද්‍රිය යි; එහෙයින් ඉන්ද්‍රියයන් හා ඔතරණය වේ; ඒ ඉන්ද්‍රිය යෝ ම අසෙඛපඤ්චේන්ද්‍රියයෝ වෙති. එහෙයින් පඤ්චේන්ද්‍රියයන් හා ඔතරණය වේ. ඒ මේ අසෙඛ පඤ්චේන්ද්‍රියයෝ ම විද්‍යා නම්- "විජ්ජුප්පාදා අවිජ්ජානිරොධෝ-අවිජ්ජා නිරොධා සඞ්ඛාරනිරොධෝ -පෙ- දුක්ඛක්ඛන්ධස්ස නිරොධෝ හොති"යි වදළහෙයින්- පටිච්ච සමුප්පාදයන් හා ඔතරණය වේ; එම අසෙඛ පඤ්චේන්ද්‍රියයෝ සීලක්ඛන්ධ- සමාධික්ඛන්ධ- පඤ්ඤක්ඛන්ධයන් හා සඞ්ගෘහීත හෙයින් ගුණධර්ම සඞ්ඛ්‍යාත සකන්ධයන් හා ඔතරණය වේ; එම අසෙඛපඤ්චේන්ද්‍රියයෝ අනාශ්‍රවවූ භවසංඛ්‍යාතයට හෙතුකොටූ සංඝකාරයන් කෙරෙහි ඇතුළත් වූහ. ඒ සංඝකාරයෝ ධම්මධාතු වෙහි ඇතුළත් වෙති-එහෙයින් ධාතූන් හා ඔතරණය වේ; ඒ ධම්ම ධාතුව ධර්මායතනයෙහි ඇතුළත් විය. එහෙයින් ආයතනයන් හා ඔතරණයවේ; විසතර විභඞ්ගයෙහි පහළවන්නේය.

(12) ඔතරණහාරනිද්දෙස මණ්ඩනා නිට්ඨිතා.

26 **විසයජ්ඣත්තමහි -පෙ- සොධනෝ නාම.**

"යස්සං ගාථායං ආරුළ්හෙන පඤ්හෙන සුත්තන්තං විචිනිතුකාමෙන අත්ථෝ භගවතා විසයජ්ඣත්තං විසයජ්ඣත්තමහි යං සුත්තන්තං ආරබ්භ අධිකිච්ච සා ගාථා පුච්ඡිතා පුච්ඡනත්ථාය වා ඨපිතා, තස්ස සුත්තන්තස්ස යෙන සංවණ්ණනාවිසෙසෙන සුද්ධාසුද්ධපරිකප්පාවිචාරණා සියා, සෝ සංවණ්ණනාවිසෙසෝ සොධනෝ හාරෝ නාමාති අත්ථෝ යොජනා.

ගාථායං, යම් ගාථායෙක්හි; (ආරූඪවූ) **පඤ්හෙන**, ප්‍රශ්නයක් හෙවත් දනුකැමැති අර්ථයක්; **විසයජ්ඣත්තමහි**, බුදුන් විසින් විසඳූ කලැ; **යං** ආරබ්භ, යම් අර්ථයක් අරභයා; පුච්ඡිතා, එහෙය පුළුවුස් නාලද්දීද; **සුද්ධාසුද්ධ පරිකප්පා**, ඒ අර්ථය සම්බන්ධවූ පදරමහාදීන්ගේ සොධිත අසොධිත භාවය විචාරණය කිරීමක් වේද; **අයං හාරෝ**, ඒ අර්ථවිභාජනා ක්‍රමතෙමේ; **සොධනෝ නාම**, සොධන නම් වන්නේය. ගාථාදි දෙශනා ප්‍රදෙශයන්හි ඇතුළත් කොටැ පුළුවුස් නාලද දනුකැමැති ධර්මාර්ථයක්හු විසඳූකලැ ඒ සූත්‍රාර්ථයාගේ පද ආරම්භාදිය ශුද්ධාශුද්ධදැයි සෙවීම කරන හාරක්‍රමය සොධන නමැයි දතයුතු- මෙහි විස්තර හාරවිභඞ්ගයෙහි ප්‍රකාශවන්නේයි.

(13) සොධනහාරනිද්දෙශ වණ්ණනායි.

---

27 **එකත්තනානාය ධම්මා -පෙ- අධිට්ඨානෝ.**

යෙ දුක්ඛාදයෝ ධම්මා එකත්තනානාය සාමඤ්ඤෙන සුත්තෙන නිද්දිට්ඨා, යෙ වාපි දුක්ඛාදයෝ ධම්මා- ජාතිපි දුක්ඛාත්‍යාදිනා වෙමත්තනානාය විසෙසෙන නිද්දිට්ඨා තෙ දුක්ඛාදයෝ ධම්මා නෙව විකප්පයිතබ්බා විවිධාකාරෙන වා අඤ්ඤමඤ්ඤසංසග්ගාරොපණෙන වා පක්ඛපාත වසෙන වා න කප්පෙතබ්බා න මඤ්ඤිතබ්බාති, දසෙනෙනා සංවණ්ණනාවිසෙසා අධිට්ඨානෝ හාරොති අත්ථ යොජනා.

යෙ ධම්මා, දුඃඛසත්‍යාදියෙහි ඇතුළත්වූ යම් ධර්මකෙණෙක්; **එකත්තනානාය**, දුක්ඛං සමුදයෝ යනාදි සාමාන්‍ය වශයෙන්ද; අපිච, නොහොත්; **යෙ ධම්මා**, ආර්‍යසත්‍යප්‍රතිපන්නවූ යම් ධර්මකෙනෙක්; **වෙමත්තනානාය**, ජාති- ජරා- කාමතණ්හා- භවතණ්හා යනාදි විශෙෂ වශයෙන්ද; **නිද්දිට්ඨා**, යම් යම් සූත්‍රාන්තයන්හි දක්වනලද්දාහු වෙද්ද; **තෙ**, ඒ සාමාන්‍ය විශෙෂ ධර්මයෝ; **නවිකප්පයිතබ්බා**, සාමාන්‍ය විශෙෂ විකල්පන වශයෙන් නොවිකල්පියයුත්තාහ; (හෙවත් විවිධාකාරයෙන් හෝ අන්‍යොන්‍ය සංසර්ග

රොපණයෙන් හෝ එක් පක්ෂයෙක්හිම පැමිණවීම් වසයෙන්හෝ කල්පනා නොකටයුත්තාහුය) **එසොහාරෝ**, සූත්‍රාගත සාමාන්‍ය විශෙෂ ධර්මයන් අවිකල්පන වශයෙන් නිර්හාරණ කිරීම ලක්ෂණ කොට ඇති මේ අර්ථසංවර්ණනා ක්‍රමතෙමේ; **අධිට්ඨානෙනා**, අධිට්ඨාන නම් වන්නේයි.

"එකස්ස සමානස්ස භාවෝ එකත්තං, එකත්තමෙව එකත්තතා තාය එකත්තතාය, විසිට්ඨා මත්තා විමත්තා විමත්තා එව වෙමත්තං, වෙමත්තස්ස භාවෝ වෙමත්තතා තාය වෙමත්තතාය"

අද හෙට අනිද්දා යනාදිවසයෙන් ව්‍යවහාර සාමාන්‍යකාල යෙහි අද උදය අදසවස යනාදි වසයෙන් ව්‍යවහාර කරණුලබන විශෙෂකාලය අදහෙට යනාදි සාමාන්‍ය කාලයෙන් බැහැරකොට කල්පනා නොකටයුතුවූවාක් මෙන් දුක්ඛං යන සාමාන්‍ය ව්‍යවහාරයෙන් ජාතිදුක්ඛා- ජරාදුක්ඛා- මරණදුක්ඛං යනාදි විශෙෂ ව්‍යවහාරය බිහිකොටැ හෙවත් දුඃඛසත්‍යයෙන් බැහැරකොට කල්පනා නොකටයුතුය සී තරයේ ඉටාගතයුතුබව උගන්වන උප දෙශය අධිට්ඨානහාර නම්.

(14) අධිෂ්ඨානහාරනිද්දෙශ වණ්ණනායි.

---

18 **යෙ ධම්මා යං ධම්මං -පෙ- පරික්ඛාරෙ**

"අවිජ්ජාදිකා යෙ පච්චයධම්මා සඞ්ඛාරාදිකං යං ඵලධම්මං- සහජාතපච්චයභාවෙන පරම්පරපච්චයභාවෙන ච ජනයන්ති, තස්ස සඞ්ඛාරාදිඵලස්ස පච්චයං පරික්ඛාරභූතං පුරිමුප්පන්න- අවිජ්ජාදිකං අසාධාරණං ජනකහෙතුං- අයොනිසො මනසිකාරාදිකං සාධාරණඤ්ච පච්චය හෙතුං- අවත්ථාපෙත්වා සුත්තතො නිද්ධාරෙත්වා වණ්ණෙතබ්බාකාරෙ- යෙන සංවණ්ණනාවිසෙසෙන දස්සිතො සවායං පරික්ඛාරෙ හාරෙ නාමාති-අත්ථයොජනා.

යෙ ධම්මා, අවිද්‍යාදි යම් ප්‍රත්‍යය ධර්මයෙනෙක්; **යං ධම්මං**, සංස්කාරාදි ප්‍රත්‍යයොත්පන්නවූ යම් ඵල ධර්මයක්හු; **පච්චයා**, සහජාත ප්‍රත්‍යය වශයෙන්ද; **පරම්පරෙනා**, පරම්පර ප්‍රත්‍යයන්ව යෙන්ද; **ජනයන්ති**, නිපදවක්ද; **හෙතුං**, ඒ සංස්කාරාදි ඵලයට ප්‍රත්‍යය සඞ්ඛ්‍යාත පරිෂ්කාරවූ පළමු පහළවූ අවිද්‍යාදි අසාධාරණ ජනකහෙතුවද- අයොනිසො මනසිකාරාදි සාධාරණ ප්‍රත්‍යය හෙතුවද; **අවත්ථාපෙත්වා**, සූත්‍රයෙන් නිර්හාරණය කොටැ හෙවත් ගෙනහැර දක්වා; (ප්‍රකාශ කරන්නාවූ) **එසා හාරෝ**, මේ අර්ථ වර්ණනා ක්‍රමතෙමේ; **පරික්ඛාරෝ**, සූත්‍රාගත ධර්මයන්ගේ පරිෂ්කාර සංඛ්‍යාත හෙතු ප්‍රත්‍යයන් ගෙනහැර දක්වන හෙයින් පරිෂ්කාර නම් වන්නේයි.

"අවිජ්ජාදීහු අවිජ්ජාදීන්ට අසාධාරණ හෙතුයි; අයොනිසො මනසිකාරාදිය සාධාරණ ප්‍රත්‍යය යි; "අසාධාරණ ලක්ඛණො හෙතු සාධාරණලක්ඛණො පච්චයො යි"- දැක්වූ හෙයිනි.

(15) පදිට්ඨානහාරනිද්දෙස වණ්ණනාය.

29 යෙ ධම්මා සමූලා -පෙ- සම්මාරොපණා හාරොති.

"බුඬමුනිනා- යෙ සීලාදයො ධම්මා- යෙසං සමාධිආදීනං ධම්මානං මූලානි- යෙ ච රාග විරාගවෙතොවිමුත්ති සෙක්ඛඵල කාමධාතු සමතික්කමනාදිකා ධම්මපද, අනාගාමි ඵලඤ්ඤාය සමානඤ්ඤාති ච පකාසිතා හොන්ති, තෙ සමානඤ්ඤ වාචකා සද්ද, අඤ්ඤමඤ්ඤවෙවචනභාවෙන සම්මාරොපයිතබ්බානි- දැසෙනෙනා සංවණ්ණනා විසෙසො සම්මාරොපණා හාරො නාමාති අත්ථ යොජනා.

මුනිනා, බුඬමුනීන් විසින්; යෙ ධම්මා, ශීලාදීවූ යම් ධම් කෙණෙක්; සමූලා, යම් සමාධි ආදි ධර්මයන්ට මූල්වූවෝයයි; පකාසිතා, ප්‍රකාශකරණ ලද්දාහුද; තෙ, ඒ ධර්මයෝ; සම්මාරොපයිතබ්බා, ඒ සමාධි ආදි ධර්මයන්ගේ පදස්ථාන වශයෙන් ආරොපණ කටයුත්තාහුය; යෙ ච එකත්ථා, සමානාර්ථවත්වූ හෙවත් "රාගවිරාග චෙතොවිමුත්ති සෙක්ඛඵල කාමධාතු සමතික්කමනාදි අනාගාමි ඵලාර්ථ වශයෙන් එකාර්ථවත්වූ යම් ශබ්දවාක්‍යයෝත්; පකාසිතා, ප්‍රකාශකරණ ලද්දාහුද; තෙ, ඒ ශබ්දවාක්‍යයෝත්; සම්මාරොපයිතබ්බා, අන්‍යොන්‍ය පර්‍යාය වචන වශයෙන් ආරොපණ කටයුත්තාහ; එසොහාරා, සූත්‍රාගත ධර්මයන්ගේ පදට්ඨාන-වෙවචන- භාවනා- පහාන, සම්මාරොපණ විචාරණ ලක්ෂණකොට ඇති මේ අර්ථ වර්ණනා ක්‍රමතෙමේ; සම්මාරොපණා, සම්මාරොපණ නම් වන්නේයි.

මෙහි සම්මාරොපණය- පදට්ඨාන- වෙවචන- භාවනා-පහාන වශයෙන් චතුර්විධවේ.

(1) කායික වාචසික සුචරිතය සීලස්කන්ධයි; මනොසුචරිත යෙහි සම්මාදිට්ඨිය පඤ්ඤාස්කන්ධයි; සීලස්කන්ධය සමාධිස්කන්ධයට පදට්ඨානයි; සමාධිස්කන්ධය පඤ්ඤාස්කන්ධයට පදට්ඨානයි; සීල සමාධිවය සමථයට පදට්ඨානයි; පඤ්ඤාස්කන්ධය විපස්සනාවට පදට්ඨානයි; සමථය- රාගවිරාග චෙතොවිමුත්තියට පදට්ඨානයි; විපස්සනාව අවිජ්ජා විරාග පඤ්ඤාවිමුත්තියට පදට්ඨානයි; මේ ආදි ආකාරයෙන් ඒ ඒ ධර්මයන්ගේ පදට්ඨාන සම්මාරොපණය කටයුතු.

(2) රාගවිරාගචෙතෝ විමුත්තිය- සෙඛඵලයි; අවිජ්ජාවිරාග පඤ්ඤාවිමුත්තිය, අග්ගඵලයි; චෙතෝවිමුත්තිය කාමධාතු සම තික්කමනයි; පඤ්ඤාවිමුත්තිය, තෙධාතුසමතික්කමනයි; (මේ වෙවචන නයයි)- පඤ්ඤින්ද්‍රිය- පඤ්ඤාබල- අධිපඤ්ඤාසික්ඛා- පඤ්ඤාසික්ඛාති ධම්මවිචය අමෝහ- යනාදිය ප්‍රඥාවට පර්‍යායෙ කෙසින් වෙවචනයි, මේ ආකාරයෙන් වෙවචන සමාරොපණය කටයුතු.

(3) "කායෙ කායානුපස්සිනෝ විහරතෝ- චත්තාරෝ සති පට්ඨානා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, චතූසු සතිපට්ඨානෙසු භාවියමානෙසු චත්තාරෝ සම්මප්පධානා භාවනා පාරිපූරිං ගච්ඡන්ති" යනාදි වසයෙන් භාවනා සමාරොපණය කටයුතු.

(4) "කායෙ කායානුපස්සී විහරන්තෝ- අසුභෙ සුභන්ති විපල්ලාසං පජහති, කබලිඞ්කාරෝ චස්ස ආහාරෝ පරිඤ්ඤං ගච්ඡති" යනාදි ආකාරයෙන් ප්‍රහාන සමාරොපණය කටයුතු.

(16) **සමාරොපණහාරනිද්දෙසෝ නිට්ඨිතෝ.**

ඡොඩෙතහාර නිද්දෙසාදී වණ්ණනා නිමි.

---

30 තණ්හඤ්ච -පෙ- නන්දියාවට්ටෝ

යෝ අත්ථ සංවණ්ණනානයවිසෙසෝ සුත්තාගතං අත්ථතෝ නිද්ධාරණ වසෙන ගහිතං වා තණ්හඤ්ච අවිජ්ජඤ්ච සුත්තාගතෙන අත්ථතෝ නිද්ධාරණවසෙන වා ගහිතෙන සමථෙන විපස්සනාය ච සචෙච්ඡි යොජෙත්වා වොදානපක්ඛං නෙති, සවායං සංවණ්ණනා නයවිසෙසෝ **නන්දියාවට්ටෝ** නාමා"ති- අත්ථයොජනා.

තඤ්ච, මූලපද නිද්ධාරණ වාරයෙන් ධම්මීථියන් විභාගකරණ යම් අර්‍ථසංවණ්ණනානය විශෙෂයෙක් තෙමේ; **තණ්හඤ්ච**, වෘත්ත මූලිකතෘෂ්ණාව්‍ය; **අවිජ්ජඤ්ච**, වෘත්තමූලික අවිද්‍යාව්‍ය; **සමථෙන**, සමථසංඛ්‍යාත සමාධියෙන්ද; **විපස්සනාය**, විදර්‍ශනා සඞ්ඛ්‍යාත ප්‍රඥාවෙන්ද; **සචෙච්ඡි**, අවිද්‍යාතෘෂ්ණාවන් සමුදයසත්‍යය සමඟද ඉතර තෙභූමික ධර්‍මයන් දුඃඛසත්‍යය සමඟද- සමථ විදර්‍ශනා වන් මාර්‍ගසත්‍යය සමඟද- එසින් පත්විය යුතු අසඞ්ඛත ධාතුව නිරොධසත්‍යය සමඟද; **යොජෙත්වා**, යොදා; **නෙති**, වොදාන මාර්‍ගයට පමුණුවාද; **අයං නයෝ**, තෘෂ්ණා අවිද්‍යාවන් සමථ විදර්‍ශනා කර්‍මස්ථානයෙන් දුරීලකොටැ, චතුරාර්‍යසත්‍යයන් හා

යොදු වොදුනපක්ෂයට හෙවත් අනුපාදු පරිනිබ්බාණයට පමුණුවන අයුරු දක්වන්නාවූ මේ නය විශෙෂතෙමේ;නන්දියාවටටා, නන්දියාවටට නම් වේ. නොහොත්, යෝ, නයභූමිසඞ්ඛ්‍යාතවූ යම් සංවණ්ණනා විශෙෂයෙක්; තණ්හක්ඛව, යම් සූත්‍රයෙක්හි සරූපවශයෙන් දක්නාලද හෝ අවිවශයෙන් නිබ්බාරණය කරණලද හෝ තෘෂ්ණාවත්; අවිජ්ජක්ඛව, එසේවූම අවිද්‍යාවත්; සවෙහි යොජනිත්වා, සමුදය දුඃඛසත්‍යයන් සමග යොදු;නෙති,සංකෙලෙසපක්ෂයට පමුණුවාද; සමථෙන, සූත්‍රාගතවූ හෝ නිබ්බාරණයකොට ගන්නාලද්දාවූ හෝ සමථයෙන් (සමාධියෙන්); විපස්සනාය, එසේම විදර්ශනා ප්‍රඥාවෙන්; සවෙවහි යොජයිත්වා, මාර්ග නිරොධ සත්‍යයන් හා යොදු; නෙති, සූත්‍රාර්ථය වොදුනපක්ෂයට පමුණුවාද; අයං නයෝ, මේ නය විශෙෂතෙමේ; නන්දියාවටෙවා, නන්‍යාවතී නම් වේ. මේ අර්ථ විකල්පවය පෙළ අට්ඨවාතය හා සසඳා විමසා ගතයුතු.

(17) නන්‍යාවතීනයනිද්දෙශ වණ්ණනායි.

---

31 **යෝ අකුසලෙ-පෙ-තිපුක්ඛලං තං නයං ආහු.**

යෝ (අත්ථසංවණ්ණනානයෝ) සබෙබපි අකුසලධම්මෙ අත්ත නො මූලභූතෙහි ලොභදෙසමොහෙහි සඞ්ග,සබෙබපි චතුභූමකෙ කුසලෙ ච ධම්මෙ අත්තනො මූලභූතෙහි අලොභාදීහි සඞ්ග, භූතං තථං අවිතථං අරියසච්චං නෙති, පාපෙති තසිදං අත්ථසංවණ්ණනාවිසෙසං තිපුක්ඛලමිති, ආහූති- අත්ථොජනා.

යෝ, යම් අර්ථවණ්ණනානය විශෙෂයෙක්; **අකුසලෙ**, වාදය විත්තෙනාතපාද සඞ්ගෘහීත සකල අකුශල ධර්මයන්ද; **සමූලෙහි**, සඞ්කීය ලොභදෙසමොහ සඞ්ඛ්‍යාත මුල්සමග; **කුසලෙ ච**, චාතුර්භූමික සකල කුශල ධර්මයන්ද; **කුසලමූලෙහි**, අලොභාදි ත්‍රිවිධ කුසලමූලයන් සමග; **භූතං**, පරමාර්ථ හෙයින් විද්‍යමානවූම; **තථං**, පරමාර්ථ සත්‍යභාවයෙන් තත්ත්වාකාරවූම; **අවිතථං**, විසංවාදන රහිතහෙයින් එකාන්තසත්‍යවූම, ආර්‍යසත්‍ය සඞ්ඛ්‍යාත වොදුනපක්ෂයට; **නෙති**, පමුණුවාද; **තං නයං**, එබඳු සංවණ්ණනානය විශෙෂය; **තිපුක්ඛලං ආහු**, සසරපැවැතුන් වඩනා තුන් අකුසල් කුසල්මුල් අනුපාදු පරිනිර්‍වාණ සඞ්ඛ්‍යාත පුෂ්කලත්වයට (පාරිශුද්ධිභාවයට) පත්කරණ උපාය දක්වන හෙයින් තිපුක්ඛල නමැ-සී-කිහ. භූතං තථං අවිතථං යන පදත්‍රය අකුසල කුසල පදයන්ට විශෙෂණකොටැ අර්ථවිකල්පයක් අට්ඨවාවෙහි දක්වා ඇත; විමසිය යුතු.

(18) තිපුක්ඛලනයනිද්දෙශ වණ්ණනායි.

---

32 **යෝ නෙති විපල්ලාසෙහි -පෙ- සිහවික්කීළිතං ආහු**

යෝ (අත්ථසංවණ්ණනානයෝ) සුභසුඛනිච්ච අත්තභාව සඞ්ඛා තෙහි චතූහි විපල්ලාසෙහි සඞ්කිලෙසධම්මෙ ච සඞ්ඛාදීහි ඉන්ද්‍රියෙහි පටිපත්ති පටිවෙධ සඞ්ඛාතෙ සඞ්මෙ ච සඞ්කිලෙසපක්ඛං වොදානපක්ඛඤ්ච පාපෙති සඞ්මත්තයඤ්ඤූ පණ්ඩිතා තාදිසං අත්ථසංවණ්ණනා නයං සීහවික්කීළිතං ආහූති - අත්ථයොජනා

යෝ, යම් අර්ථසංවර්ණනානයක විශෙෂයෙක් තෙමේ; **විපල්ලාසෙහි**, සුභසුඛනිච්චඅත්තභාවසඞ්ඛ්‍යාත චතුර්විධ විපල්ලාසයෙන්- **කිලෙසෙ**, සංකෙලෙශ ධර්මයන්ද; **ඉන්ද්‍රියෙහි**, ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයෙන්; **සඞ්මම්ම**, ප්‍රතිපත්ති ප්‍රතිවෙධ සඞ්ඛ්‍යාතයන්ද; **නෙති**, අර්ථසංවර්ණනා වශයෙන් සංකෙලෙශ පක්ෂයට හා වොදානපක්ෂයට පමුණුවන්නේද; **නයඤ්ඤූ**, සඞ්ඛ්‍යාත නයදත් ප්‍රාඥයෝ; **එතං නයං**, සිව්විපල්ලාසයෙන් කෙලෙශ ධර්මයන් සංකෙලෙශපක්ෂයටද ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයෙන් ප්‍රතිපත්ති ප්‍රතිවෙධ ධර්මයන් වොදානපක්ෂයටද පත්කරවීම ලක්ෂණකොටඇති ඒ මේ අර්ථනයවූ කලි; **සිහවික්කීළිතං ආහු**, සිහවික්කීළිත නමැ-යි කීහ.

ත්‍රාසනභාවාපගත ජවපරක්කමාදි ගුණවිසෙසයොගයෙන් සීහායමාන භාග්‍යවතුන් වහන්සේගේ වික්‍රීඩිතසඞ්ඛ්‍යාත දෙශනා වාංකමීයෙන් පහළවූ විහරණය විපල්ලාසයන් හා තත්ප්‍රතිපක්ෂ ධර්මයන් දක්වන බැවින් සීහායමාන භාග්‍යවතුන් වහන්සේගේ වාංකමීවික්‍රීඩිතය මේ න්‍යායයෙහි ඇත්තේකු යි හෝ පඤ්චබල දසබලාදි බලවිසෙසයොග පරිදීපනභෙයින් සීහවික්කීළිත සමානත්වයෙන් යුත් න්‍යායක්‍රමය හෝ සීහවික්කීළිතය-යි- කීහෙයින් භාග්‍යවතුන් වහන්සේගේ අසීතධර්මදෙශනා විලාශයෙන් සංකෙලෙශ ධර්මයන් හා වොදාන ධර්මයන් සඞ්ග්‍රහකොට දක්වන න්‍යායක්‍රමය සීහවික්කීළිත නමැයි දතයුතු.

(19) **සිහවික්කීළිතනයනිද්දෙශ වණ්ණනායි.**

---

33 **වෙය්‍යාකරණෙසු යි යෙ -පෙ- දිසාලොචනං ආහු**

තහිං තහිං වෙය්‍යාකරණෙසු තස්ස තස්ස නයස්ස දිසාභූතා යෙ යෙ කුසලාකුසලා ධම්මා වුත්තා තෙ තෙ කුසලාකුසලෙ දිසාභූතෙ ධම්මෙ විත්‍ථෙනෙනෙව ඔලොකයතෙ, තාදිසමොලොකන මෙව දිසාලොචනනයමිති- ආහූති අත්ථයොජනා

නඤ්ං නඤ්ං භවඝ්‍යාඛ්‍යාරණෙසු, නන්දියාවට්ටාදි අවිභාගත්‍රය යොජනා වාරයෙන් ඒ ඒ සූත්‍රාවි විසජ්ජනයන්හි; **යෙ කුසලා කුසලා**, වොදනියවූද සංකෙලෙස ඝාඛ්‍යාතවූද යම් ධර්මයෝ; **වුත්තා**, සූත්‍රයෙන් නිඛ්ඛාරණයකොටැ දිඝාවසයෙන් කියනලද්දාහුද; (ඒ ධර්මයන්) **මනසාඑව**, ඥානසම්ප්‍රයුක්ත චිත්තයෙන්ම; **ඔලොකඝනෙ**, පඨම දුනියාදි දිඝාවසයෙන් බලාද; (පරීක්ෂා කෙරේද); **නංඛු**, ඒ දිඝාවසයෙන් බැලීමම; **දිඝාලොචනං ආහු**, දිඝාලොචන නයයි- කිහ. මෙහි ඛු- යනු අවධාරණාවි නිපාත හෙයින් කුසලාකුසල ධර්මයන් නන්දියාවට්ටාදි ඒ ඒ අවිභාගය යන්හි ලා ප්‍රථමාදි දිඝාවශයෙන් පරීක්ෂාකිරීම මුත් අන්කිසි අරුත් වැණුම් ආදියක් දිඝාලොචන නොවනබව දැක්වූහ.

(20) **දිඝාලොචනනයනිද්දෙශ වණ්ණනායි.**

---

34 **ඔලොකෙත්වා -පෙ- අයං නයෙඝා අඞ්කුසෙඝා නාම.**

තං තං නයදිඝාභූතෙ කුසලාකුසලෙ ධම්මෙ දිඝාලොචෙත්වා සුත්තතො උඛරිත්වා යං සමානගතං කරොති අයං සමානගත සඞ්ඛාතො නයො අඞ්කුසෙඝා නාමා ති යොජනා.

යං, යම්හෙයකින්; **සබ්බෙ කුසලාකුසලෙ**, දිඝාභූත කුශල අකුශල සඞ්ඛ්‍යාතවූ සමීධර්මයන්; **දිඝාලොචනෙන**, දිඝාලොචන නයින්; **ඔලොකෙත්වා**, ප්‍රථමාදි දිඝාභාවයෙන් පරීක්ෂාකොවැ; **උක්ඛිපිඝ**, සූත්‍රයෙන් උපුවා; **සමානෙති**, තත් තත් නය යොජනා වශයෙන් සමකොවැ නෙනහැර දක්වන්නේද; **අයං නයෙඝා**, තත් තත් නය දිඝාභූත ධර්මයන්ගේ **සමානගත** සඞ්ඛ්‍යාතවූ මේ ව්‍යවහාරනයතොමෝ; **අඞ්කුසෙඝා නාම**, අකුස්සක් වැනි හෙයින් අඞ්කුස නම් වන්නේයි. අඩෙක විජ්ඣනට්ඨානෙ උඞ්ඩෙතා අඝති අනෙනා පවිඝතී'ති අඞ්කුසෙඝා; නෙන්ද්‍රවයි.

(21) **අඞ්කුසනයනිද්දෙශ වණ්ණනායි.**

නයනිද්දෙශාවි විභාග නිමි.

---

35 **සොළසහාරා-පෙ-නිද්දිට්ඨ සුත්තතං.**

තත්ථ- සොළසහාරා ඛ්‍යඤ්ජනපරියෙට්ඨිභාවතො සංවණ්ණනබ්බසුත්තෙන සංවණ්ණනාභාවෙන පඨමං යොජෙතබ්බා, යොජෙනෙන ච නිද්දිට්ඨහාරානුක්කමෙනෙව යොජෙතබ්බා න උපපවි

පාටියා හාරසංවණ්ණනානුක්කමෙන සංවණ්ණෙතබ්බං සුත්තං පඨමං සංවණ්ණෙතුං පවජ්ජා දිසාලොචනෙත ඔලොකෙත්වා අඩ්කුසනාදයෙන තෙත්වා තීහි අත්ථනයෙහි නිද්දිසෙති අධිප්පායත්ථ යොජනා.

සොළසහාරා, දෙසනාදි සොළොස් හාරයෝ; පඨමං, පළමු කොට "බ්‍යඤ්ජන පරියෙසන බැවින් උපලිද්ධවෙළ හැර අනුක්‍රම යෙන් සංවණ්ණනා කටයුතු සුතුරෙහි යොදලිය යුත්තාහ" යොජෙතබ්බායි- සෙසයි; දිසාලොචනතෝ, නැවත දිසාලොචන නසින්; දිසාවිලොකෙත්වා, දිසාභූත ධම්මයන් බලා; අඩ්කුසනා, අඩ්කුසනයින්; සංඛිප්පිස, හකුළුවා; තීහි නයෙහි, නන්දියාවට- තිපුකඛල- සිහව්‍යාකිළිත යන තුන්නයින්; සුත්තං, වණ්ණනාකට යුතු සුතුර; නිද්දිසෙති, දක්වන්නේමැයි.

අරුත් වැණියයුතු සුතුරෙහි පළමුකොට අක්ඛරපදාදි ව්‍යඤ්ජනානුසාරයෙන් ආගමාදාදි සූත්‍රාර්ථයන් විභාගකටයුතු හෙයින් තත්කෘත්‍යසාධක ඉඩඉහාරයන් ඝථාක්‍රමයෙන් පළමුකොට යොදා නැවත දිසාලොචන නසින් දිසාභූත ධම්මයන් පරීක්ෂා කොටැ අඩ්කුසනයින් සංකෙලෙස පක්ෂයට හෝ වොදානපක්ෂයට හෝ පමුණුවා නන්දියාවර්තාදි අර්ථනයත්‍රයෙන් අර්ථවිභාග දක්වන්නේයි.

(22) හාරනයඉඩ්ජනාකාරයි.

---

36 අක්ඛරංපදං -ඉඩ- එත්තාව බ්‍යඤ්ජනං සඛ්ඛං.

අක්ඛරං, විභක්ත්‍යන්තනාමයට නොපත් ශබ්ද සවරූපානාගත අක්ෂරය; පදං, නාමාඛ්‍යාතොපසර්ග නිපාත සඞ්ඛ්‍යාත චතුර්විධ පදය; බ්‍යඤ්ජනං, පදසමුදායාතමක වාක්‍යය; නිරුත්තිං, ආකාරාභිහිත නිර්වචන සඞ්ඛ්‍යාත නිරුක්තිය; තථෙව, එසේම; නිද්දෙසො, නිර්වචන විසතරකිරීමය; ආකාරඡට්ඨවචනං, මේ නිද්දිස ගාථාබන්ධයෙහි සවැනිතැන යොදනලද ආකාරය යන; සඛ්ඛං බ්‍යඤ්ජනං, සකල බ්‍යඤ්ජනපද ඡවිකය; එත්තාව, මෙපමණෙක් මැයි.

එහි- 1 නක්ඛරති නසඤ්චලතී'ති- අක්ඛරං යි- අකාරාදිවණ්ණ සමුදායෙහි එකි එකී වණ්ණයක් සඞ්කීය සවකීය ස්ථාන කරණ ප්‍රයත්නාදියෙන් බිඳිවැ ඉකාරාදි මය්‍යාදවකට නොඑසිනුයි- සංක්‍රමණය නොවෙනුයි- අක්ඛර නම්; ඒ මේ අක්ෂරසමුදාය, සවර, බ්‍යඤ්ජන, හ්‍රස්ව, දීර්ඝ, ගුරු, ලඝු, සිථිල, ඛනිත, සංඥී, අස

වණ්ණ, වගී, අවගී, සොෂ, අසොෂ, ආදි විවිධ භෙදයෙන් සභාව නිරුත්තියෙහි දක්වා ඇත- තත්ප්‍රභෙද තත් තත් ශබ්දලක්ෂණික ග්‍රන්ථාගත ක්‍රමයෙන් දතයුතු.

2 පජ්ජති අත්ථෝ එතෙනාති පදං-සී සාමාන්‍ය නිර්වචනයෙන් නාම- ආඛ්‍යාත- උපසර්ග- නිපාත- වසයෙන් පදසතර කොටසෙක් දක්වනලදී- එහි- **නරෝ- නාරී- රූපං- රූපකඛා සාඛා- ඵලං- ඵලස්සා- වෙදනා- චින්තං-** යනාදි සත්‍ප්‍රධාන ශබ්ද සමූදාය නාමපදයි; හෙද ශබ්දලක්ෂණ සන්දර්භයෙහි අර්ථ රූපි නාමවශයෙන් දෙවැදෑරුම්වේ; පුල්ලිඟ නපුංසක වශයෙන් තෙවැදෑරුම්වේ; සාමඤ්ඤගුණක්‍රියා යදිච්ඡානාම වශයෙන් සිව් වැදෑරුම්වේ; නාමනාම- ඇබ්බනාම- සම්භසනාම- තද්ධිතනාම- කිතනාම- වශයෙන් පස්වැදෑරුම්වේ; පරමාර්ථනාම ප්‍රඥප්ති විශයෙහි "ඛන්ධපඤ්ඤත්ති- ආයතනපඤ්ඤත්ති- ධාතුපඤ්ඤත්ති- සච්චපඤ්ඤත්ති- ඉන්ද්‍රියපඤ්ඤත්ති- පුග්ගලපඤ්ඤත්ති"යි සඳහන් කරුම්වේ; එසේම- "විජ්ජමානපඤ්ඤත්ති- අවිජ්ජමානපඤ්ඤත්ති- විජ්ජමානෙන අවිජ්ජමානපඤ්ඤත්ති- අවිජ්ජමානෙන විජ්ජමානපඤ්ඤත්ති- විජ්ජමානෙන විජ්ජමානපඤ්ඤත්ති- අවිජ්ජමානෙන අවිජ්ජමානපඤ්ඤත්ති"යිද- "උපාදාපඤ්ඤත්ති- උපනිධාපඤ්ඤත්ති සමොධානපඤ්ඤත්ති- උපනික්ඛිත්තපඤ්ඤත්ති- තජ්ජාපඤ්ඤත්ති සන්නිධිපඤ්ඤත්ති"යිද සඳහන් කරුම්වේ. මෝවුන්ගේ විනිසඳහම් විමසා දතයුතු.

"**භවති- භවන්ති- භූසති- වෙදයති**" යනාදි ක්‍රියා ප්‍රධාන ශබ්දසමූදාය ආඛ්‍යාතපදයි; ඒ මේ ආඛ්‍යාතපදයවූකලි වර්තමානාදි අෂ්ටවිභක්තී භෙදවී නාමධාතු ධාත්වර්ථප්‍රත්‍යයාදීන් හොවර කොටැ දක්වනලද අෂ්ටගණික සකර්මක අකර්මකධාතූන්ගේ භාක්තීය කර්මී භාවකාරකයන්ගේද වශයෙන් මාගධිශබ්ද ලක්ෂණයෙහි දැක්වූ ආකාරයෙන් දතයුතු.

නාමාඛ්‍යාතයන්ගේ අර්ථ විශෙෂාවබොධයට හෙතු වශයෙන් ධාතූන්ගේ පූර්වභාගයෙහි පවත්නා-ප-පරා-යනාදි විංශතිඋපසර්ග ශබ්දසමූදාය "නාමාඛ්‍යාත මුපෙචව තදත්ථං සජෙජන්තී"ති උපසඟහා-සී නිර්වචන කෙසින් උපසර්ග නම්; ධාත්වර්ථබාධක- ධාත්වර්ථ විශෙෂක-ධාත්වර්ථානුවර්තක වසයෙන් උපසර්ග ප්‍රවෘත්තිය ත්‍රිවිධවේ; නිත්‍යෝපසර්ග අනිත්‍යෝපසර්ගය-සී වර්ගීවශයෙන් විවිධවෙති; ප්‍රශංසාර්ථයෙහි- සු- අභි- ශබ්දවයද- ඉක්මවීමෙහි- අති- ශබ්දයද, ගත්‍යර්ථයෙහි- ප- අධි- ශබ්දවයද- අල්පාර්ථ සම්භාව්‍ය නිසා අනු මති සම්භවයාර්ථයන්හි- අපි- ශබ්දයද උපසර්ගසංඥා නොලබන බැවින් අනිත්‍යෝපසර්ගයෝ-සී; සෙස්සෝ නිත්‍යෝපසර්ගයෝ-සී.

ක්‍රියාවන්ගේ හා ද්‍රව්‍යයන්ගේ සරූප විශෙෂ ප්‍රකාශයට හෙතුවූ "ච-වා-ඉති-එවං" යනාදිශබ්ද සමූදය "පදදිමජ්ඣතෙන නිපතන්තී"ති, නිපාතා-යි නිර්වචන හෙයින් නාමාඛ්‍යාත පදයන්ගේ ආදිමධ්‍යාවශානයෙහි යථාලාභ වශයෙන් හෙත් නුයි නිපාත ය-යි දක්වනලදී; නිපාතයෝද ප්‍රකෘති නිපාත-නිඝණ්ඨුනිපාත-යි දෙවැදෑරුම්වෙති; එහි ධාතුප්‍රත්‍යය සංයොගයෙන් අඝිඩවූ සභාව නිරුත්ති සඞ්ඛ්‍යාත මාගධිභාෂා ප්‍රභවයෙහි පටන් ව්‍යවහාරප්‍රාප්තවූ- ච- නා- වා- මා- යනාදීහු ප්‍රකෘති නිපාතයෝ-යි; ධාතු ප්‍රත්‍යය නාමප්‍රත්‍යය සමාසයොගාදියෙන් සිඬවූ- "ගණනතුං- ඤත්වා- ඉතෙනා- තතෙනා- අජ්ජ- සජ්ජු- අඩිත්ථ- පචචත්තං- යනාදීහු නිෂ්පන්න නිපාතයෝ-යි.

මෙකී නාමාඛ්‍යාතොපසර්ගී නිපාතසංඛ්‍යාත චතුර්විධ පද සමූදය නවාඞ්ග ශාසනා ශාසනාඪ ප්‍රකාශයෙහි අත්‍යන්තොපකාරී හෙයින් ව්‍යඤ්ජනපද ෂට්කයෙහි ඇතුළත්කරණලදී.

3 "පදනිහිතං අත්ථං ඛ්‍යඤ්ජයතී"ති- ව්‍යඤ්ජනං, වාක්‍යං-යි නාමාදිපදයෙන් කියනලද අර්ථය විශෙෂයෙන් ප්‍රකාශනෙරේ නුයි, ඛ්‍යඤ්ජන නම්. ආඛ්‍යාත සහිතවූ අව්‍යය සහිතවූ කාරක සහිතවූ විසෙසන සහිතවූ පදසමූදය සංඛ්‍යාත වාක්‍යයයි; පදමාත්‍ර ශ්‍රවණයක් ඇතිකලැද අධිකාර වශයෙන් ගන්නාලද අන්‍යපදයන් හා සම්බන්ධකොටැ අර්ථසම්පාදනය කෙරේනුයි, වාක්‍යයම අර්ථප්‍රකාශයකෙරේ; එබැවින් අර්ථප්‍රකාශයෙහි ව්‍යඤ්ජන සඞ්ඛ්‍යාත වාක්‍යයම ප්‍රධාන වන්නේය.

4 "පදෙහි වාක්‍යස්ස විභාගො ආකාරො" වාක්‍යාවයවවූ හෝ වාක්‍යවශයෙන් විභාගකටයුතුවූ හෝ ආඛ්‍යාතාදි පදයෙන් වාක්‍යයාගේ විභාගය ආකාරනම්; ආකාරාර්ථය මෙසේ ගත්කලැ පදආකාර දෙදෙනාගේ වෙනස කෙසේ දතයුතුද? නොනිමියාවූ හෝ විභාග නොකරණලද්දාවූ හෝ වාක්‍යයෙහිවූ එකි එකී විභක්‍ත්‍යන්තාවයවයක් පදනම්; උච්චාරණ වශයෙන් නිමවන ලද්දාවූ හෝ විභාගකරණු ලබන්නාවූ හෝ වාක්‍යයෙහි පදාවයව සමූදය ආකාරනමැයි- පදආකාරදෙදෙනාගේ විශෙෂය දතයුතු ප්‍රකෘති ප්‍රත්‍යය ලොපාදෙශාදි වශයෙන් අක්ෂර විභාගය ආකාර යයි- ඇතමිහු කියත්. අක්ෂරපද වාක්‍යයන් සභාව නිරුත්තියට එකඟවැ අනුකූලවැ නැබීම ආකාරය-යි තවත් ඇදුරෝ කියත්; විමසාගතයුතු.

5 "ආකාරාභිහිතං නිබ්බචනං නිරුත්තී" ආකාර ලක්ෂණයෙන් ප්‍රකාශකරණ ලද්දාවූ ශබ්දලක්ෂණ ක්‍රමයෙන් පදවිභාග සඞ්ඛ්‍යාතවූ නිර්වචනය නිරුත්ති නම්.

6 "නිබ්බචන විත්ථාරෙ නිරවසෙස දෙසනත්තා නිද්දෙසො" නිදීවන සංඛ්‍යාත වාක්‍යවිභාගය නිරවශෙෂාර්ථයන් දක්වන බැවින් නිද්දීශ නම්.

මේකි අක්ඛර පද ව්‍යඤ්ජන ආකාර නිරුත්ති නිද්දෙස යන ෂට්විධ ව්‍යඤ්ජනපදයෙන් සඞ්ග්‍රහ කොකරණලද එකද ව්‍යඤ්ජන පදයෙක් නවාඛ්‍ය ශාස්ත්‍ර ශාසනයෙහි නොමැතියි.

(23) ෂට්විධ ව්‍යඤ්ජනපද නිද්දීශ විභාගයි.

---

37 **සඞ්ඛාසනා පකාසනා-පප-අත්ථා කම්මඤ්ච නිද්දිට්ඨං.**

සඞ්කාසනා, සැනෙවින් දැක්වීමය; **පකාසනා**, පළමුකොට දැක්වීමය; **විවරණා**, විස්තරකිරීමය; **විභජනා**, විභාගකිරීමය; **උත්තානීකම්මං**, ප්‍රකටකිරීමය; **පඤ්ඤත්තති**, ප්‍රකාරයෙන් දැන්වීමය යන; **එවමාදි**, මෙකී අරුත්සපදයෙන්ම; **අත්ථා**, සූත්‍රාර්ත්ත පඨවීපබන්ධ ලෞකික ලොකොත්තරාදි අර්ථයද(හන්නාලද්දේවේ.) **කම්මඤ්ච**, උද්ඝාටනාදි කර්මයද හෙවත් උග්ඝටිතඤ්ඤු ආදි වෙනෙය ජනයන්ගේ චිත්තසන්තාන ප්‍රබොධන ක්‍රියා සඞ්ඛ්‍යාත උග්ඝටන- විපචන- නයන- යන කර්ත්‍රර්ථද; **නිද්දිට්ඨං**, දක්වන ලදී.

යම්සූත්‍රාර්ථයක් කරණකොටගෙන උග්ඝටිතඤ්ඤු පුද්ගලයාගේ චිත්තසන්තාන ප්‍රබොධන ක්‍රියා සංඛ්‍යාතවූ උද්ඝාටන කර්මයාගේ නිපදීමක් වේද ඒ සූත්‍රාර්ථතෙමේ සඞ්ඛාසන පකාසනා කාරවේ. යම් සූත්‍රාර්ථයක් කරණකොටගෙන විපචිතඤ්ඤු පුද්ගලයාගේ චිත්තසන්තාන ප්‍රබොධනක්‍රියා සඞ්ඛ්‍යාතවූ විපඤ්චන කර්මයාගේ නිපදීමක් වේද ඒ සූත්‍රාර්ථතෙමේ විවරණ විභජනා කාරවේ. යම් සූත්‍රාර්ථයක් කරණකොටගෙන නෙය්‍යපුද්ගලයාගේ චිත්තසන්තාන ප්‍රබොධන ක්‍රියා සංඛ්‍යාත නයනකර්මයාගේ නිපදීමක් වේද ඒ සූත්‍රාර්ථතෙමේ උත්තානීකම්ම පඤ්ඤත්ති ආකාර වේය-යි, සම්බන්ධ කටයුතු.

"සංඛිත්තෙනත්ථ කාසීයතෙ දීපීයතෙ'ති සඞ්ඛාසනා, පඨමං කාසීයතෙ දීපීයතෙ'ති පකාසනා, විත්ථාරෙන වරීයතෙ වරණං වා විවරණා, විසෙසෙන භාජීයතෙ භාජනං වා විභජනා, අත්‍රුත්තානං උත්තානානං කරීයතෙ අත්‍රුත්තානස්ස උත්තානං කරොති එතෙනා'ති වා උත්තානීකම්මං, පකාරෙහි ඤාපනං පඤ්ඤත්ති, විභජනා ච උත්තානීකම්මඤ්ච පඤ්ඤත්ති ච විභජත්‍රුත්තානීකම්ම පඤ්ඤත්තීති.

මෙහි ෂට්විධ අර්ථපදයන්ගේ ෂට්විධ ව්‍යඤ්ජනපදයන් හා සම්‍යොගය මෙසේ දතයුතු.

"ඉදං දුක්ඛන්ති මේ භික්ඛවේ චාරාණසියං -පෙ- ලොකස්මිං, තත්ථ අපරිමාණා අක්ඛරා අපරිමාණා පදා අපරිමාණා ව්‍යඤ්ජනා අපරිමාණා ආකාරා නෙරුත්තා නිද්දෙසා -පෙ- තත්ථ භගවා අක්ඛරෙහි සඞ්ඛාසෙති, පදෙහි පකාසෙති, ව්‍යඤ්ජනෙහි විවරති, ආකාරෙහි විභජති, නිරුත්තීහි උත්තානී කරොති, නිද්දසෙහි පඤ්ඤපෙති, තත්ථ භගවා අක්ඛරෙහි ච පදෙහි ච උගඝාටෙති, ව්‍යඤ්ජනෙහි ච ආකාරෙහි ච විපඤ්චයති, නිරුත්තීහි ච නිද්දසෙහි ච විත්ථාරෙති" යන දෙසනාහාර විභඞ්ගපාලියෙන් දතයුතු.

(24) ෂට්විධ අර්ථපද නිද්දේශ වණ්ණනායි,

---

38 තිණ්ණං ච නයානං-පෙ-සමායුත්තෙහා.

අත්ථස්ස, ප්‍රවචනාර්ථසම්බන්ධීවූ; අනූනා, ඌනානතිරික්තරහිතවූ; තිණ්ණං ච නයානං, නන්දියාවට්ට තිපුක්ඛල සීහවික්කීළිත යන නෙත්‍යාර්ථනයත්‍රයද; ජජ්ජඳුනි ච, සඞ්කාසනාදි ෂට්විධ නෙත්‍යාර්ථ පදයෝද; ඛණ්ණානි, සංඛ්‍යාවශයෙන් දක්වන ලද්දාහුය. නවහි පදෙහි, මෙහි නවවිධ අර්ථපදයන් හා; භගවතෝ, භාග්‍යවතුන් වහන්සේගේ; වචනස්සතෙත්ථ, සකල ප්‍රවචනාර්ථතෙමේ; සමායුත්තෙහා; එක්වයෙදුනේයි. ඒහා නොයෙදුනු කිසිම ජිනවචනාර්ථයෙක් නැත්මැයි සේයි. මෙහි "තයෝ ච නයා"යි කිවමනා වුවද ලිඞ්ගව්පල්ලාසහෙතුවෙන් තීණි ච නයාසි දැක්වූහ.

සකල සම්බුද්ධවචනය තමා චතුස්සත්‍ය ප්‍රකාශක බැවින්ද, අර්ථනයත්‍රයත් චතුස්සත්‍ය යොජනා වශයෙන් පවත්නා බැවින්ද, සප්ප්‍රවචනාර්ථ තෙමේ අර්ථනයත්‍රය හා සඞ්ග්‍රහකරණ ලද්දේම සංකාසනාදි ආකාර විශෙෂය ගොචරකොට පවත්නේවේ. එහෙයින් "නවහි පදෙහි භගවතෝ වචනස්සතෙත්ථා සමායුත්තෙහා"යි කීහ.

39 අත්ථස්ස නව පදානි-ව්‍යඤ්ජනපරිසෙඛතා චතුබ්බීස, ඵහඤං සඞ්ඛපඤ්ඤා-නෙතත්තිංසා එතතිකා නෙතත්තිති.

අත්ථස්ස, සූත්‍රාර්ථසම්බන්ධීවූ; නවපදානි, ඇතොකත නවපදයෝද; ව්‍යඤ්ජන පරිසෙඛතා, සූත්‍රාගත ව්‍යඤ්ජනාර්ථ සංවණ්ණනා සම්බන්ධීවූ; චතුබ්බීස, සොළසහාර ෂට්විධ ව්‍යඤ්ජනපද විවිධකම් නය යන සූචිපදයෝද; (මෙහි කියනලදහ.) ඵහඤං, නවවිධ

අවීපදයන්හා සුවිසි ඛ්‍යඤ්ජනපදයන්ද යන දෙකොටස; **සඞ්ඛ්‍ය පමාණා**, සම්පිණ්ඩනයකොටැ දක්වන්නහුගේ සංඛ්‍යාප්‍රමාණය, **නෙත්තිංසා**, තෙතිසෙකි; **නෙත්තී**, නෙත්ති අවයවයෝ; **එත්තිකා**, මෙපමණක්මය; මෙසින් මිදුනාවූ නෝ ඌනාතිරික්තවූ කිසිම නෙත්තිපදවීථියෙක් නැත්තේමැයි සේයි.

නෙත්තිනිද්දේසෝ විභාවිතෝ.

මෙසේ උක්තප්‍රකාරයෙන් උද්දෙස නිද්දේස වශයෙන් දක්වනලද ත්‍රයස්ත්‍රිංශත් නෙත්‍යවයවයන් අතුරෙහි "**සොළසහාරා පඨමං**" යනුවෙන් හාරනය සම්බන්ධ දෙශනා ක්‍රමයෙන්ම හාර විභාගය පළමුකොට දක්වනලද හෙයින් එහි අනුක්‍රමය මෙසේ දතයුතු.

(1) ධම්දෙශනාහුගේ නිශ්‍රයඵල තදුපාය ශරීරසංඛ්‍යාත ආශ්වාදාදීන් ප්‍රකාශකිරීම සභාවකොට ඇති බැවින් ප්‍රකෘතියෙන්ම සකල සූත්‍රයන්ට අනුරූපයයි මොනවට අවබොධවන හෙයින්ද අනිකුත් විවයහාරාදීන්ට පිහිටවන හෙයින්ද **දෙශනා හාරය** පළමුකොට දක්වනලදී.

(2) පුවජාවිස්සජ්ජන පුබ්බාපරානුගීතීන් හා දෙශනාහාරයට පදවීථියන්ගේ පවිවය සභාව දැක්වීම උචිතහෙයින් දෙශනා හාරයට අනතුරුව **විවයහාරය** දක්වනලදී.

(3) විවයහාරයෙන් පරීක්ෂාකරණලද පදවීථියන්ගේ යුත්තා යුත්ති විචාරණය යුතුබැවින් විවයට අනතුරුව **යුත්තිහාරයද**;

(4) යුත්තායුත්ත පදවීථියන්ගේම සම්ප්‍රාපනියට අනුරූපවූ හෙතුපරම්පරා නිබ්බාරණය ලක්ඛණෘකාට ඇති පදඛ්‍යාන විත්තනය කටයුතුම හෙයින් යුත්තියට අනතුරුව **පදඛ්‍යානහාරයද**;

(5) යුත්තායුත්තවූ හෙතුපරම්පරා වශයෙන් පරිගෘහීත සභාව ඇත්තාවූම සරූප වශයෙන් නොකියන ලද්දාවූ ධම්මයන්ගේ සමාන ලක්ඛණතාවයෙන් ගැනීම කටයුතුයයි දක්වනු පිණිස පදඛ්‍යානයට අනතුරුව **ලක්ඛණහාරයද**;

(6) අවී වශයෙන් නිබ්බාරණය කරණලද ධම්මයන්ගේද නිජීවනාදිය කියයුතුය. සරූප වශයෙන් සූත්‍රාගත ධම්මයන්ගේ පමණක් නොවේ-ය-යි දක්වනු පිණිස ලක්ඛණයට අනතුරුව **චතුබ්‍යූහහාරයද**;

(7) එසේ වතුබ්‍යූහනාරයෙන් නීජීවන අභිප්‍රාය නිදුන වචනයන් හා සූත්‍රාගත පදවීයන්ගේ සූත්‍රානන්තර සංසන්දන සංඛ්‍යාත පූර්වාපර විචාරය දැක්වූ කල්හි ඒ ධර්මයන්ගේ සභාග විසභාග ධර්මාන්තරාවතීනය සුවසේ දක්වන්නට හැකි බැවින් වතුබ්‍යූහයට අනතුරුව ආවට්ටහාරයද;

(8) සභාග විසභාග ධර්මයන්ගේ ආවතීනය නියෝග කළ කල සාධාරණ අසාධාරණ වශයෙන් සංකෙලෙශ වොදාන ධර්මයන් ගේ පදට්ඨාන වශයෙන් හා භූම්වශයෙන්ද විභාගය සුවසේ යොදාලිය හැකි බැවින් ආවට්ටයට අනතුරුව විභත්තිහාරයද;

(9) විභත්තිහාර විභඞ්ගයෙහි "කතමෙ ධම්මා සාධාරණා වෙ ධම්මා සාධාරණා නාමසාධාරණා වත්‍රුසාධාරණා"යනු ආරම්භ කොට "මිච්ඡත්ත වශයෙන් නියත සත්වයන්ට හා එසේ අනියත සත්වයන්වද දර්ශන මාර්ගයෙන් ප්‍රහාතව්‍ය කෙලෙශයෝ සාධාරණ යෝය; පුහුදුන්ට හා සෝවාන් පුගුලන්ටත් කාමරාග ව්‍යාපාද යෝ සාධාරණයෝය"යි ආදි ක්‍රමයෙන් සභාග විසභාග පර්‍යාය වත් ධර්මයන්ම විභාගකෙරෙයි; සාවද්‍ය අනවද්‍ය ධර්මයන් සප්‍රතිභාග රහිත නොසින් ඒ ධර්මයන් විභාගකළකල සූත්‍රාගත ධර්මයන් සුවසේ ප්‍රතිපක්ෂ ධර්මයන් කෙරෙන් පෙරළාගතහැකි බැවින් විභක්තියට අනතුරුව පරිවර්තනහාරයද;

(10) ප්‍රතිපක්ෂ ධර්මයන් කෙරෙන් පෙරළාගන්නාලද ධර්මයෝද පර්‍යාය වචනයෙන් අවබෝධ කරවුත්තාහුයයි- දක්වනු පිණිස පරිවර්තනයට අනතුරුව වවත්ථානහාරයද;

(11) පර්‍යාය වශයෙන් ප්‍රභාශකරණලද ධර්මයන් ප්‍රභෙද නොසින් ප්‍රඥප්ති වශයෙන් විභාගකිරීම සුවසේ දැනීමට උපකාර බැවින් වෙවචනයට අනතුරුව පඤ්ඤත්තිහාරයද;

(12) ප්‍රභව පරිඤ්ඤා ප්‍රඥප්ති විභාගවාරයෙන් ප්‍රතීත්‍යසමුත්පාද සත්‍යාදි ධර්මවිභාගය කළකල සූත්‍රාගත ධර්මයන්ගේ ප්‍රතීත්‍ය සමුත්පාදාදි වාරයෙන් අවධාරණය දක්වන්නට හැකිබැවින් පඤ්ඤත්තියට අනතුරුව ඔතරණහාරයද;

(13) ධාත්වායතනාදීන් කෙරෙහි බිස්වනලද සූත්‍රාගත පදවීයන්ගේ ප්‍රශ්නාරම්භ විශොධනය සුවසේ සම්පාදනය කළහැකි බැවින් ඔතරණයට අනතුරුව සෝධනහාරයද;

(14) සූත්‍රාගත පදවීයන්ගේ විශොධනය කළකල එහි ලභ්‍යමාන සාමාන්‍ය විශෙෂභාවය සුකරවන්නේය-යි දක්වනු පිණිස සොධනයට අනතුරුව අධිට්ඨානහාරයද;

(15) සාමාන්‍ය විශෙෂ සංඛ්‍යාත සාධාරණ අසාධාරණ ධර්මයන් අවබොධකළකලැ ඒ ධර්මයන්ගේ පරිෂ්කාර සංඛ්‍යාත සාධාරණ අසාධාරණ සවරූපවූ ප්‍රත්‍යයහෙතු රාශිහුගේ ප්‍රභෙදය සුවසේ අවබොධ කළහැකි බැවින් අධිඨානයට අනතුරුව පරිකර්මාරම්භයද;

(16) අසාධාරණවූද සාධාරණවූද හෙතු දැක්වූ කලැ ඒ හෙතුහුගේ සඛකිය ඵලයෙහි හෙතුඅාකාරය එම හෙතුඵල ධර්මයන්ගේ ප්‍රභෙද වශයෙන් දෙශනා ආකාරය හා භාවෙතව්‍ය ප්‍රහාතව්‍ය ධර්මයන්ගේ භාවනා ප්‍රහානයන්ද හෙතහැර දක්වා කථනය කළ කලැ සූත්‍රාර්ථය මොනවට තදර්ථාවබොධය පිණිස පවත්නාහෙයින් පරිකර්මාරම්භයට අනතුරුව සම්මර්ශනා භාරය දක්වනලදී.

මේ ශොඛශභාරයන්ගේ අනුක්‍රමයට කරුණුයි.

පඤ්චවිධනය ක්‍රමයන් තමා උශ්ඝටිතඤ්ඤූආදි වෙනෙය ජනයන් තුන්දෙනා යොදුගත් බැවින් නන්දියාවට්ටාදි අර්ථනය යොපදෙශයාගේ ක්‍රමය ඒ පුද්ගලයන්ගේ ක්‍රමයෙන්ම දතයුතුය. දිසාලොචන අංකුශ යන ඉතරනයවය අර්ථ නයත්‍රයාගේ භූමි වශයෙන් බැලීම හා එහි පමුණුවාලීම්ද සාධක බැවින් ඒ ආකාරයෙන් උදෙශක්‍රමය දතයුතුය; අර්ථනයත්‍රය සහිතවූ ශොඛශභාරයන් පිළිබඳවූ මෙ පමණවූ ප්‍රකාර විශෙෂයෙන් නිර්ධාරණය කරණු ලබන සූත්‍රාර්ථතෙමේ වෙනෙය ජනයන්ගේ අනුත්තරවූ ප්‍රථමාවස්ථාභූමිය අවබොධයට ප්‍රමාණවන්නේයි- දතයුතු. එහෙයින් "දසසහභූමි සවණ්ණුපත්තිඅත්ථා හි තෙත්තිපකරණ දෙසනා" යනු කීහ.

තවද "යත්තකා හි සුත්තසස සංවණ්ණනාවිසෙසා සබ්බෙ තෙ තෙත්තිඋපදෙසාඅත්තනා" යනුකීහෙයින් සූත්‍රාර්ථ වර්ණනා කරන්නහු විසින් සුත්තසමුට්ඨාන, අධිප්පාය, පදත්ථාදිසංවර්ණනා විශෙෂයෝද නෙත්තුපදෙශයන්හි ලා කියයුත්තාහුය; හේ කවරහු ද යත්?

"සමුට්ඨාන සංවණ්ණනා- අධිප්පාය සංවණ්ණනා--පදත්ථ සංවණ්ණනා- විධිඅනුවාද සංවණ්ණනා-නිගමන සංවණ්ණනා-පයොජනසංවණ්ණනා- පිණ්ඩත්ථ සංවණ්ණනා- අනුසන්ධිසංවණ්ණනා- වොදනා සංවණ්ණනා- පරිහාර සංවණ්ණනා- උපොගසාට සංවණ්ණනා- පදවිගහ සංවණ්ණනා- පදත්ථවාලත සංවණ්ණනා- පචවුපඨාන සංවණ්ණනා" යනාදීහුද "එකනාළිඝා කථා- වතුරසසා කථා- නිසින්නවත්තිකා කථා" යන ත්‍රිවිධකථාවෝද- දතයුත්තාහ.

එහි-දෙශනාපාළිය කියා එකි එකි පදයක්හුගේ අර්ථකථනය **එතනාළිකා** නම්; ප්‍රතිපක්ෂවාදය දක්වා ඊට උපමා දක්වා සවපක්ෂය දක්වා ඊට උපමා දක්වා අර්ථනිර්ණය කිරීම **චතුරස්සා** කථානම්; විසභාග ධර්මයන්ගේ වශයෙන් ම අවසානයට පැමිණ නැවත සභාග ධර්මයන්ගේ වශයෙන් අවසානයට පැමිණීම **නිස්සන්නවත්තනිකා** නම්.

තවද- මෙහි **හෙතුඵලභූම් උපනිසා සභාග විසභාග, ලක්ඛණාදීහුද** දතයුත්තාහ. එහි **හෙතු** නම් කාරණයයි- හෙද "පච්චයහෙතු-කාරකහෙතු-සම්පාපකහෙතු- ඤාපකහෙතු- හෙතුහෙතු උත්තමහෙතු- සාධාරණහෙතු- අසාධාරණහෙතු- සභාගහෙතු- අසභාගහෙතු- අජ්ඣත්තිකහෙතු- බාහිරහෙතු- ජනකහෙතු- පරිග්ගාහකහෙතු- සමනන්තරහෙතු- පරම්පරහෙතු- සහජාත හෙතු- අසහජාතහෙතු- සාසවහෙතු- අනාසවහෙතු- ආදිවශයෙන් අනෙකවිධවේ.

ඵලඤ්ච ප්‍රත්‍යයොත්පන්න වශයෙන් එක්වැදෑරුම් වේ; "නිබ්බත්තිතබ්බ - අධිගන්තබ්බ- ඤාපෙතබ්බ-පත්තබ්බ- පච්චුප්පන්න විපාක ක්‍රියා වචනඤ්ච- නිබ්බාන- සභාගහෙතු නිබ්බත්තන- අසභාගහෙතු නිබ්බත්තනාදි" වශයෙන් අනෙකවිධ වේ.

භූමිහුද- "සාසවභූමි-අනාසවභූමි-සංඛතභූමි- අසංඛතභූමි-දස්සනභූමි-භාවනාභූමි-පුථුජ්ජනභූමි-සෙක්ඛභූමි- අසෙක්ඛභූමි-සාවකභූමි- පච්චෙකභූමි- සම්මාසම්බුද්ධභූමි- ඣානභූමි- අසමාහිතභූමි- පටිපජ්ජමානභූමි- පටිපන්නභූමි- පඨමභූමි- දුතියභූමි-තතියභූමි- චතුත්ථභූමි- කාමාවචරභූමි- රූපාවචරභූමි- අරූපාවචරභූමි- ලොකුත්තරභූමි" ආදිවශයෙන් අනෙකවිධ වේ; යම් ධර්මතෙණෙක් ඒ ඒ භාරනයක්‍රමයන්ට ආධාර වශයෙන් සූත්‍රයන්හි නිර්ධාරණය කරණු ලැබෙත්ද ඒ ධර්මයෝත් භූමිහුයයි දතයුතු.

උපනිසා නම් බලවත් හෙතුවයි, උපනිශ්‍රය ප්‍රත්‍යය යි දතයුතු. තවද ලෞකිකවූ තත් තත් සමය සිද්ධාන්තයන්හි හෘදය සංඛ්‍යාත අභ්‍යන්තරයද උපනිසායයි- කියනු ලැබේ. මේ නෛයර්‍යානික සමයෙහිද මේ න්‍යායක්‍රමය මොනවට ග්‍රහණය කරන්නාවූ ධර්මකථිකයෝ තත් තත් සූත්‍රාගත ධර්මවාරයෙන් සකල භාරනය යොජනායෙහි සමර්ථයෝ වෙද්ද- එහෙයින් නෙත්තිනය හෘදය සථාන නම් වේ. ඒ මේ නෙත්ති හෘදය නම් කිමෙක්ද? ශොඩශහාර අෂ්ටවිංශති ප්‍රභෙද ප්‍රසථාන විභඞ්ග සහිතවූ නෙත්තිස්වැදෑරුම්වූ ප්‍රකරණ පඤ්චියාගේ නිමිත්ත විභාග සහි

තව අසඞ්කර වසයෙන් ව්‍යවස්ථාකරනලද යම් මේ විෂයසථාන යෙක් වේද, හේ නෙත්තිහාරදස නම් වේ. හෙද දෙසනාහාරස ආශ්වාදාදි විෂයකොට ඇත්තේස යනාදි ක්‍රමයෙන් දතයුතු.

තවද- විශෙෂයෙන් පදට්ඨාන පටිකඛාර හාරයෝ හෙතු වශ යෙන්ද, දෙසනාඛ්‍යස චතුබ්‍යූහ සමාරොපන හාරසයෝ හෙතු ඵලවශයෙන්ද, ඒවවචන, පඤ්ඤත්ති, ඔතරණ, සෝධනහාර යෝ ඵලවශයෙන්ද, විභත්ති හාරය හෙතුභූම වශයෙන්ද, පරි වත්තනාහාරස විසභාග වශයෙන්ද, ආවට්ටහාරය සභාග විස භාග වශයෙන්ද, ලක්ඛණ යුත්ති අධිට්ඨාන හාරයෝ තය වශ යෙන්ද යොදලිය යුත්තාහුය.

නෙත්තිනිද්දෙසප්‍රකිණ්ණක විනිශ්චයයි.

නෙත්තිප්‍රකරණාගත සඞ්ග්‍රහ උද්දෙස නිද්දෙස වාරත්‍රයාදී වණ්ණනා මාරසයන් ශ්‍රී සද්ධම්මොදස සාරිවෙණ්ඩ ගණ වාචකාචාරස්‍ය උපසෙන සථවිරපාදයන් විසින් විරචිත නෙත්තිසාරත්ථදීපනී නම්වූ නෙත්තී ව්‍යාඛ්‍යානයෙහි ප්‍රථම පරිච්ඡේදය සමාප්තයි.

මෙසේ ඡොඩෂහාරාදීන් සුවසේ ග්‍රහණ ධාරණාදිය පිණිස හාථාබඞ්ග වශයෙන් සඞ්ඛෙප කෙසින් දක්වා තදනන්තරව ඡොඩෂහාරයන් ප්‍රතිනිදේශ වශයෙන් විභාගකොට දක්වනු පිණිස "තත්ථ කතමා දෙසනාහාරෝ" යනාදිය ආරම්භකරණ ලදී.

තත්ථ, ඒ ඡොඩෂහාරයන් අතුරෙහි; දෙසනාහාරෝ, දෙස නාහාරතෙමේ; කතමොව, කවරේ ද යත්? "අස්සාදාදීනවතා" යනාදි හාථාවයි; "අඤ්ඤං දෙසනාහාරං කිං දෙසෙති?" යන අනුයොගයෙහි "අස්සාදං දෙසෙති, ආදීනවං දෙසෙති, නිස්සරණං දෙසෙති, ඵලං දෙසෙති, උපායං දෙසෙති, ආණත්තිං දෙසෙති" යනු වෙය්‍යාකරණයි; දෙසෙති, සංවණ්ණනා කෙරෙයි, විස්තර කෙරෙයි- යන අර්ථයි.

කොතැන්හි ආවාවූ ආශ්වාදාදීන් මේ හාරතෙමේ වණ්ණනා කෙරේද යන අනුයොගය මෙනෙහි කොට දෙශනාහාරයෙන් වණ්ණනා කටයුතු ධර්මයන් දක්වන්නාවූ මහාකාත්‍යායන සථවිර

පාදයෝ "ධම්මං වෝ භික්ඛවෙ දෙසිස්සාමි" යනාදිවූ සකල පර්‍යාපන්නධර්මයන් සඞ්ග්‍රහකරන්නාවූ භාග්‍යවතුන්වහන්සේගේ ත්‍රිවිධ දෙසනාව එකදෙසයකින් දැක්වූහ.

භික්ඛවෙ, මහණෙනි; **ආදිකල්‍යාණං**, ශීලබුබ්සුබුබ්ධතා-උග්ඝටිතඤ්ඤූ චිත්තඥ සංඛ්‍යාත හෙතුවියෙන් ආදි කල්‍යාණවූ; **මජ්ඣෙකල්‍යාණං**, සමාධි ධම්මප්පුධම්මතා විපඤ්චිතඤ්ඤූ චිත්තඥ සංඛ්‍යාත හෙතුවියෙන් මජ්ඣෙකල්‍යාණවූ; **පරියොසාන කල්‍යාණං**, ප්‍රඥා සංඝ සුප්පටිපන්නතා නෙය්‍ය පුග්ගල චිත්තඥ සංඛ්‍යාත හෙතුවියෙන් පරියොසාන කල්‍යාණවූ; **සාත්ථං**, ලෞකික ලොකොත්තරාදි අර්‍ථ සම්පත්තියෙන් හෝ සංකාසනාදි ෂඩාකාර අර්‍ථ පද සමායොගයෙන් අර්‍ථ සහිතවූ; **සබ්‍යඤ්ජනං**, සිපිල ඛනිතාදි දශවිධ ව්‍යඤ්ජන සම්පත්තියෙන් හෝ අක්ඛරපදාදි ෂඩාකාර ව්‍යඤ්ජනපද සමායොගයෙන් සව්‍යඤ්ජනවූ; **කෙවලපරිපුණ්ණං**, පරිපූර්‍ණවාලිය යුත්තක් අවිදුමන් හෙයින් හෝ ශීලාදි පඤ්චවිධ ධර්මස්කන්ධයෙන් පිරිහිය හෙයින් හෝ කෙවල පරිපූර්‍ණවූ (සියලු ආකාරයෙන්ම පිරිහියාවූ) **ඛ්‍රහ්මං**, සුත්තගෙය්‍යාදි ධර්මයක්; **වෝ**, තොපට; **දෙසිස්සාමි**, කියන්නෙමි; **පරිසුද්ධං**, ඉවත්කටයුත්තක් නුගේ අභාවයෙන් හා චතුරොඝ නිස්සරණය පිණිස පවත්නා හෙයින්ද- ලොකාමිසයෙන් නොමුසුහෙයින්ද පරිසුද්ධවූ; **ඛ්‍රහ්මචරියං**, ශ්‍රෙෂ්ඨචර්‍යාව නොහොත් ශ්‍රෙෂ්ඨ බුද්ධාදි ආර්‍යයන්ගේ චර්‍යාවක්වූ ශාසනමාර්‍ගී ඛ්‍රහ්මචර්‍යාව; **පකාසෙස්සාමි**, දක්වන්නෙමි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසනාකරන ලද්දාවූද ප්‍රකාශකරන ලද්දාවූද ශික්ෂාත්‍රය සංගෘහීත ශාසනධර්මයතෙම සම්බන්ධවූ ආශ්වාදාදීන් දර්‍ශන වශයෙන් පවත්නේද එකී ආශ්වාදාදිහු දෙසනාහාරයට විෂයවූවාහු යම් යම් දෙසනාපාඨයෙක්හි විශෙෂ සහිතව කියනලද්දාහුද ඒ ඒ තැනින් උපුටා උදාහරණ වශයෙන් මෙහි හෙනහැර දක්වනු පිණිස "**තත්‍ථ කතමෙ අස්සාදා**" යනාදිය ආරබ්ධයි.

තත්‍ථ, ඒ අස්සාදාදීනවතා යනාදි ගාථාවෙහි දක්වනලද විෂය විෂයිභෙදවූ ආශ්වාදාදීන් අතුරෙහි; අස්සාදෙ කතමෙ, ආශ්වාදතෙමේ කවරේ ද යත්?

"කාමං කාමය මානස්ස -පෙ- යදිච්ඡති"

මේ ආශ්වාදයි; **කාමං**, ආශ්වාදනය කරයුතු රූපාදි වස්තු **කාමය**; **කාමයමානස්ස**, කැමතිවන්නාවූ; **තස්ස**, ඒ කාමියාට

යාගේ; **එතං**, ඒ කැමතිවියයුතුවූ වස්තුව; **චෙ සඞ්ඛ්‍යකිනි**, ඉදින් ඉවූ වේ ද; **මච්චෝ**, ඒ රූපාදීන් පතන සත්වතෙමේ; **සං ඉච්ඡති**, යම්බඳු රූපාදි වස්තුවක් කැමැත්තේද; **ලබා**, ඒ වස්තුව ලැබ; **අඛා**, ඒකාන්තයෙන්; **පිනිමත්තෝ හොති**, පිනාගිය සිතැත්තේ වේ. විෂයසංඛ්‍යාත ආශ්වාදය මෙසින් දක්වනලදී.

තත්ථ කතමෝ ආදීනවෝ, ඒ දෙශනාහාරයෙහි ආ ආදීනව තෙමේ කවරේ ද යත්?

"තස්ස වෙ -පෙ- රූපපති"

මේ ආදීනවයි; **කාමයානස්ස**, රූපාදිවස්තුකාමයන් කැමති වන්නාවූ; **ඡන්දජාතස්ස**, කාමයෙහි හටගත් ඡන්දය ඇත්තාවූ; හෙවත් සිතැ උපන් කාමච්ඡන්දය ඇත්තාවූ; **තස්ස ඡන්තුනෝ**, ඒ සත්වයාගේ; **තෙ කාමා**, ඒ වස්තුකාමයෝ; **පරිහායන්ති**, යම් කලක යම්හෙයකින් පිරිහෙද්ද; (එකලැ) **සල්ලවිද්ධෝ ඉව**, යටු ලකින් හෙවත් ඊතලයෙකින් විදිනාලද මුවෙකුමෙන්; **රූපපති**, ඒ සත්වතෙමේ දෙම්නසින් පීඩාවට පැමිණේ.

"කාමයති ඉච්ඡතීති" කාමයානෝ, අථවා යායති ගච්ඡතීති යානෝ, කාමෙන යානෝ කාමයානෝ, තස්ස, ඡන්දෙ ජාතෝ යස්ස සෝ ඡන්දජාතෝ, විසෙසණපර ඡළඩ්ඩබහුව්‍රීහිසි; තස්ස, සලති පවිසතීති සල්ලෝ, විජ්ඣිත්වතෙති විද්ධෝ, සල්ලෙන විද්ධෝ සල්ල විද්ධෝ.

තත්ථ කතමං නිස්සරණං, ඒ දෙශනාහාරයෙහි දැක්වූ ආශ්වාදදීන් අතුරෙහි නිස්සරණ තෙමේ කවරේද?

"යෝ කාමේ පරිවජ්ජෙති -පෙ- සමතිවත්තති"

මේ නිස්සරණයි; යෝ, යම් පුද්ගලයෙක් තෙමේ; කාමේ, වස්තුකාමයන්; පරිවජ්ජෙති, ඡන්දරාග විසකම්භනයෙන් හෝ සමුච්ඡේදයෙන් දුරු කෙරේද; (කෙසේදයත්?) **සප්පස්ස**, සර්පයා කුගේ; **සිරෝ**, ශීර්ෂය; **පදා ඉව**, පාදයෙන් බැහැරකරන්නාක් මෙනි; **සතෝ**, සතිසම්පන්නවූ; **ඉමා**, ඒ පුද්ගලතෙමේ; **ලෝකෙ** රූපාදි ලොකයෙහි; **ඉමං විසත්තිකං**, මේ තෘෂ්ණාව; **සමතිවත්තති**, මොනවට ඉක්ම වන්නේය.

මෙහි **පාදා** යී- කිවමනා තැන ඡ්‍රශ්වව පදා යී ද; **සිරං** යී- කිව මනාතැන මනොගණහෙයින් ඔකාරව සිරෝ යී ද සිඩසි.

මාගීනිජීර්ණ සංඛ්‍යාත විවිධ නිස්සරණයන් අතුරෙන් මාගී සංඛ්‍යාත නිස්සරණය මේ හයින් දක්වනලදී.

විෂය විෂයි සංඛ්‍යාත විවිධ ආශ්වාදයන් අතුරෙන් "කාමං කාමයමානස්ස" යනාදියෙන් විෂය ආශ්වාදය දක්වා දැන් විෂයී ආශ්වාදය දක්වනු පිණිස තත්ථ කතමෙ කාමා අස්සාදා, යනු අනුයොගකොටැ- "ඛත්තෝ වත්තුං -පෙ- අනුගිජ්ඣන්තී"යි- විෂයී ආශ්වාදය දැක්වූහ. තත්‍ර නාමාති, යම් සත්ත්වයෙක් තෙමේ; ඛත්තෝ, කෙත්ය; වත්තුං, වත්ය; ගිරණ්ඩං, අමුරන්ය; වා, නොහොත්; ඝරාවාසං,ගෙරිඅස්ය;දූසෙපාතිං, දූස් පුරිස්ය;පේසෙති,මාගමුන්ය; බන්ධු, නැයන්ය; (යන) පුථූ කාමෙ, නානාවිධ කාමවස්තූන්; අනුගිජ්ඣති, ගිජ්ජුකෙරේද; නැවත නැවත පතාද; අයං අස්සාදා, යම් මේ කෙත් වත් ආදිය පිළිබඳ ගිජ්ජුකමක් වේද-මේ ආශ්වාදයි.

තවද- දුක්ඛදෞමනස්සාදි වශයෙන් අනෙකවිධ ආදීනවයන් අතුරෙන් දුක්ඛදෞමනස්සසංඛ්‍යාතං ආදීනවං යට ගසින් දක්වා දැන් දුඃඛසංඛ්‍යාත ආදීනවය අනුයොග වශයෙන් දක්වනු පිණිස තත්ථ කතමෙ ආදීනවා "අබලා -පෙ- නාවං භින්නමිවොදකං"යි- දක්වූහ.

අබලා, කුශලයෙන් ප්‍රහාතව්‍ය නොයෙන් අබලසංඛ්‍යාතවූ කෙලෙශයෝ; නං, කෙත් වත් ආදි වස්තුකාමයෙහි ගිජුවූ ඒ පුද්ගලයා; බලිසඤ්ඤිනි, අනිභවනය කෙරෙත්;පටිසඤ්ඤා, සිංහව්‍යාඝ්‍රාදි ප්‍රකට උපද්‍රවයෝ හෝ කායදුශ්චරිතාදි අප්‍රකට උපද්‍රවයෝ;එනං, කාමයෙහි ගිජුවූ කාමයන් සොයන්නාවූ ඒ පුද්ගලයා; මදයන්ති, මඩින්; තණ්හා, තත් ප්‍රකට අප්‍රකට උපද්‍රවයෙන් මඩනාලද නොයෙන්; නං, ඒ පුද්ගලයාකරු; දුක්ඛං, ජාතිජරා ආදි දුක; අනුඑති, අනුවයේ; (කෙසේදයත්?) භින්නං, බිඳිගියාවූ; නාවං, නැව කට; උදකං ඉව, ජලය වැදගන්නාක් මෙනි; අයං ආදීනවෝ, තෘෂ්ණා දුශ්චරිත සංකෙලෙශ හෙතුකොට ඇති මේ ජාත්‍යාදි දුක්ඛානුබන්ධිය ආදීනව නම් වේ.

මාගණිඒාණ සංඛ්‍යාත විවිධ නිස්සරණයන් අතුරෙන් මාගී නිස්සරණය යට දක්වා දැන් නිඒාණ නිස්සරණය දක්වනු පිණිස "තත්ථ කතමං නිස්සරණං" යනාදිය ආරබ්ධයි.

"තස්මා ජන්තු -පෙ- සිඛාව පාරගූ"ති

තස්මා,යම්හෙයකින් කාමයෙහි ගිජුවූවාහට යටකී දුක්ඛානුබන්ධිය පවත්නේද එහෙයින්; සදා, පුබ්බරත්ත අපරරත්ත සංඛ්‍යාත සෑම කාලයෙහි; සතා, ජාගරියානුයොගයෙන් සමෘති ඇත්තාවූ; ජන්තු, ප්‍රාණිසත්වතෙමේ; කාමානි, කාමයන්; පරි

වජ්ජයෙ, විසභාගතා වශයෙන් හෝ සම්භෙජ්ද වශයෙන් රූපාදි වසතුකාමයෙහි සමීප්‍රකාරයෙන් කෙලෙශකාමය නො උපදවා පහ කරන්නේද; **න**, ඒ කාමයන්; **පනාස**, හැර; **ඔඝං**, චතුර්විධ කෙලෙශොඝය; **තරෙ**, ආර්‍යමාර්ගයෙන් එතරකාරන්නේය; (කෙසේදයත්?) **සාවං**, උදකභරිත තැවක්; **සිඤ්චා**, ජලය ඉස දමා සැහැල්ලුකොට; **පාරගූ ඉව**, පරතෙරට පැමිණෙන සුල්ලෙකු මෙනි; **ඉදං නිස්සරණං**, කාමප්‍රහාණ වාරයෙන් චතුරොඝයෙන් එතරව අනුපාදිශෙෂ නිර්වාණධාතුවෙන් පිරිනිවීමක් වේද; මෙය නිස්සරණ නම් වේ.

තත්‍ථ, ඒ ආශ්වාදාදීන් අතුරෙහි; **ඵලං**, දෙශනාඵලය; කතමං කථං? "ධම්මං භණෙ -පෙ- ධම්මචාරිං" ධම්මං, දානාදිමය කුශලධර්මතෙමේ; ධම්මචාරිං, අප්‍රමාදව ධර්මයෙහි හැසිරෙන පුද්ගලයා; **භණෙ**, එකාන්තයෙන්; **රක්ඛති**, දෘෂ්ටධාර්මික සාම්පරායික සංඛ්‍යාත විවිධ අනර්ථයෙන් රක්නේය; (කෙසේදයත්?) **වස්සකාලෙ**, වස්කාලය; **මහන්නං ජන්තූනං සථා**, මහත් සත්ත්ව ධරණ පුරුෂයෙකු නො තෙමා ඒ සත්තෙමේ රක්නාක් මෙනි; **සුචිණ්ණා ධම්මා**, මොනවට පුරුදුකරණලද සුචරිත ධර්මයෙහි; **එසා ආනිසංසා**, මේ අනුසසෙකි; ධම්මචාරී, ධම්මචාරී පුද්ගලතෙමේ; **දුග්ගතිං**, දුගතියට; **නාභිවජ්ජති**, නො පැමිණේ; **ඉදං ඵලං**, මේ ඵලයි.

තත්‍ථ කතමෙ උපායෙ, තත් දෙශනාහාරයෙහි දක්වූ උපාය කවරේද?

සබ්බෙ සංඛාරා අනිච්චාති -පෙ- දුක්ඛාති -පෙ- සබ්බෙ ධම්මා අනත්තාති යදා -පෙ- විසුද්ධියාති.

සබ්බෙ සංඛාරා, කර්මචිත්තෙන්‍ද්‍රියාහාර යෙන් සංස්කරණය කරනලද සමීසංස්කාරයෝ; **අනිච්චා ඉති**, අනිත්‍යය හ යි; **දුක්ඛා ඉති**, දුක්ඛ දුක්ඛ විපරිණාම දුක්ඛ සංඛාර දුක්ඛභාවයෙන් දුක් වන්නාහ යි; **සබ්බෙ ධම්මා**, සමීසංස්කෘත ධර්මයෝ හෝ චාතුර්භූමික ධර්මයෝ; **අනත්තා ඉති**, නිත්‍ය සාර සුඛසාර ආත්මසාර රහිතභාවයෙන් කාරකවේදක සවාභාවික ආත්මරහිතයෝය යි; **යදා**, යම් කලෙක; **පඤ්ඤාය**, අනත්මානුපස්සනා සංඛ්‍යාත විදර්ශනා ප්‍රඥාවෙන්; **පස්සති**, දක්නේද; **අථ**, එකල්හි; **දුක්ඛෙ**, නිබ්බිදානුපස්සනා සංඛ්‍යාත විදර්ශනා ඥානයට හොඳුරුවූ පඤ්චුපාදානස්කන්ධ දුඃඛයෙහි; **නිබ්බින්දති**, කලකිරීමට පැමිණේ; **එසා**, යථොක්ත ලක්ෂණවත් මේ නිබ්බිදානුපස්සනාඥානය; **විසුද්ධියා**, විසුද්ධිසංඛ්‍යාත ආර්‍යමාර්ගඵල හෝ අවවත්ත විසුද්ධි

සංඛ්‍යාත අමෘතධාතුවට; මඤ්ඤතා, උපායවන්නේය; අයං, ත්‍රිලක්ඛණාකුපසසනා චාරයෙන් සකල සසරවැටෙහි උපදනා මේ නිබ්බිදානුලොමය; උපායඤ්ඤා, විසුඬ්ධිගම හෙතුභාවයෙන් උපාය නම් වේ.

තත්‍ථ, දෙසනාහාරගතවූ ඒ ආශ්වාදාදීන් අතුරෙහි; ආණත්‍තති ආණත්‍තියං; කතමා, කවරිද?:- "චක්ඛුමා විසමානීව ...පෙ... පරිවජ්ජයෙ"ති:-

චක්ඛුමා, ඇසැති මිණිසෙක් තෙමේ; පරක්කමෙ විජ්ජමානෙ දැඩිවැර ඇතිකලැ; විසමානි ඉව, විෂමභූමි ප්‍රදෙශයන් හෝ විෂම ව්‍යාලසත්වාදීන් හරින්නාක් මෙන්; පණ්ඩිතො, නුවණැති සත්ව තෙමේ; ජීවලොකසමිං, දිව්‍යමත්තා මෙලොවදී; පාපානි, ලාමක දුශ්චරිතයන්; පරිවජ්ජයෙ, හරණේසී; අයං, මේ; ආණත්‍තති, දුශ්චරිත පරිවර්ජනානුඥා සංඛ්‍යාත ආණත්‍තියයි.

මෙසේ ඒ ඒ සූත්‍රයන්හි වෙන් වෙන් වශයෙන් ආවාවූ ඵල උපාය ආණත්‍තීන් දක්වා දැන් එක්තැනකම ආ ඔවුන් දක්වනු පිණිස; "සුඤ්ඤතො ලොකං"යනාදි මොඝරාජ විස්සජ්ජන ගාථාව දක්වත්:- "සුඤ්ඤතො ...පෙ... එවං මච්චුතරො සියා"හි, එහි, "මොඝරාජ සුඤ්ඤතො ලොකං ආවෙක්ඛස්සු"යි විධානහෙයින් ආණත්තියි; "සදා සතො"යි, උපායයි; "අත්තානුදිට්ඨිං ඌහච්ච එවං මච්චුතරො සියා"යි ඵලයි.

මොඝරාජය! සක්කායසංඛාර ලොකය අවසවත්තීතිය සැලකීමෙන් හෝ නිස්බව මෙනවට බැලීමෙන් හෝ සුන්වසයෙන් බලව; සදා, හැමකලැ; සතො, සිහිඇත්තේ; අත්තානුදිට්ඨිං, විංශති වස්තුක සක්කායදෘෂ්ටිය; ඌහච්ච, උපුටාහැර; එවං, එපරිද්දෙන්; මච්චුතරො සියා, මරුගේ විසය ඉක්මවන්නෙක් වන්නේසී. මෙසේ ආශ්වාදාදීන් සවරූපවශයෙන් උදාහරණ කොට දක්වා දැන් ඒ ආශ්වාදාදීන්හි පුද්ගල විභාගවශයෙන් දෙශනා විභාගය දක්වනු පිණිස "තත්‍ථ භගවා උග්ඝටිතඤ්ඤුස්ස පුග්ගලස්ස නිස්සරණං දෙසෙති" යනාදිය දක්වූහ; එහි පඨවී සුඛමයි. "උග්ඝටිතං ඝටිතමත්තං උද්දිඨ මත්තං ජානාතීති උග්ඝටිතඤ්ඤූ" උද්දෙශමාත්‍රයෙන් ප්‍රභෙද සහිතවූ විස්තර සහිතවූ අර්ථය අවබොධ කරන්නේය යන අර්ථයි; "උග්ඝටිතං උච්චලිතං ජානාති ති වා උග්ඝටිතඤ්ඤූ" දෙශනාකරනු ලබන ධර්මය දෙශකයා කෙරෙන් එකෙණෙහිම භාජනයකට මාරුකොට ගන්නාලද්දක් මෙන් අවබොධ කරන්නේය; අථවා, උග්ඝටිතෙ චලිතමත්තෙන ආසයෙ ධම්මං ජානාති අවබුජ්ඣතී"ති උග්ඝටිතඤ්ඤූ, බුඩ්ධාවෙණික ධර්මදෙසනා ශ්‍රොතපථ ප්‍රාප්තවීමෙන් ශාස්වතාදී අධ්‍යාශය චලිතවූ

කෙණෙහි ම ධර්මාවබෝධය කරන්නේ නුසි හෝ උග්ඝටිතඤ්ඤූ නම්; ඔහට නිස්සරණය දෙශනා කරයි; එපමණකින් ම ඔහුගේ අර්ථසිද්ධිය වන්නේ යි. "විපචිතං විත්ථාරිතං නිද්දිට්ඨං ජානාතීති විපචිතඤ්ඤූ" විපඤ්චිතඤ්ඤූ-යි- කෙවිත් පාඨයි; "පච විත්ථාරෙ, යනු ඉකාරානුබන්ධ රහිතවත් යෙදෙන බැවින් හා සුඛෝච්චාරණ ශික්ෂාව භාවයෙන්ද විපචිතඤ්ඤූ-යි- ඡේකසම්මතයි" "විපචිතං වා මත්තං සනිකං ධම්මං ජානාතීති විපචිතඤ්ඤූ" "නෙතබ්බා ධම්මස්ස පටිනිද්දෙසෙන අත්ථං පාපෙතබ්බාති නෙය්යා- මුදින්ද්‍රියතාය වා පටිලෝමගහණතෝ නෙතබ්බා අනුනෙතබ්බාති නෙය්යා.

"කතමෝ ච පුග්ගලෝ උග්ඝටිතඤ්ඤූ? යස්ස පුග්ගලස්ස සහ උදාහටවෙලාය ධම්මාභිසමයෝ හොති අයං වුච්චති පුග්ගලෝ උග්ඝටිතඤ්ඤූ; කතමෝ ච පුග්ගලෝ විපචිතඤ්ඤූ? යස්ස පුග්ගලස්ස සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථේ විභජිය මානෙ ධම්මාභිසමයෝ හොති අයං වුච්චති පුග්ගලෝ විපචිතඤ්ඤූ; කතමෝ ච පුග්ගලෝ නෙය්යෝ? යස්ස පුග්ගලස්ස උද්දෙසතෝ පරිපුච්ඡතෝ යොනිසෝ මනසිකරොතෝ කල්‍යාණමිත්තෙ සෙවතෝ භජතෝ පයිරුපාසතෝ අනුපුබ්බෙන ධම්මාභිසමයෝ හොති; අයං වුච්චති පුග්ගලෝ නෙය්යෝ" පදපරම පුද්ගලයා මෙය ප්‍රතිවෙධයට භාජනනොවන බැවින් මෙහි නොගන්නා ලදී.

තවද මේ දෙශනාහාරගත ධර්මයන්අතුරෙහි "අස්සාදෙ,- ආදීනවෝ, නිස්සරණං, අස්සාදෙ ච ආදීනවෝ ච; අස්සාදෙ ච නිස්සරණං ච, ආදීනවෝ ච නිස්සරණං ච, අස්සාදෙ ච ආදීනවෝ ච නිස්සරණං ච, යන සප්තවිධ ප්‍රස්තාර ක්‍රමයන් අතුරෙන් තුන්වැනි සවැනි සත්වැනි ක්‍රමයෝ උග්ඝටිතඤ්ඤූ ආදි තුන්දෙනා හික්මවීමෙහි සම්භවෙතීන් මෙහි ගන්නා ලදහ. ඉතිරි සතර නොගන්නා ලදී; තනිකොට කියනලද ආශ්වාදයෙන් හෝ, ආදීනව යෙන් හෝ, තදුභයෙන් හෝ වෙනෙය විනයනයක් නොවන්නේමය. කෙලෙස් දුරුකිරීමක් එහි නොකිහෙයිනි; පස්වැනි තැන ද ආදීනවය නොකියන හෙයින් නිස්සරණයට උපාය නොවන්නේමය භාග්‍යවතුන් වහන්සේගේ විමුත්ති රසකොට ඇති දෙශනාව විමුත්තිය හා තදුපායමාර්ගය ආමිෂණය නොකොට නො පවත්නීමය. එහෙයින් මෙකී චතුර්විධ ප්‍රස්තාරගත ක්‍රමයෝ උපුටා නොගන්නා ලදහ. තවද පදපරමයාගේ වශයෙන් පවත්නා සංකෙලෙශ භාගියවූ හෝ- වාසනා භාගියවූ හෝ- තදුභය පක්ෂයෙහි ඕවි දෙශනාවක් හෝ-සූත්‍රෙකදෙශික ගාථාවක් හෝ-

මෙකි නයක්‍රමයන්ට උදාහරණ වශයෙන් උපුටාගත්තේද එසේ ඇතිකල්හි සත්තයම ගන්නේයි; වෙනොග විනයනඤ්ච: ඔවුන්ගේ සිත්සතන්හි ආර්‍යාමාගීය නිපදවීමයි; එය යථොක්ත ත්‍රිවිධ ක්‍රමයෙන්මුත් අනිකකින් නොහැකි බැවින් අනිකුත් සිව්නය මෙහි නොකියන ලදුයි දතයුතු.

තවද- පෙථකොපදෙශයෙහි "අස්සාද- ආදිකව, අස්සාද-නිස්සරණ, ආදිකව- නිස්සරණ, අස්සාද- ආදීනව- නිස්සරණ, ඵල-උපාය; ඵල- ආණත්ති; උපාය- ආණත්ති; යන දුකතික වශයෙන් ප්‍රකාශවන දෙශනාපාළිය සාධකකොටැ දක්වනලදී.

මෙසේ යම් පුද්ගලයන්ගේ වශයෙන් දෙශනාවිභාගය දක්වන ලද්දේද ඒ පුද්ගලයන් ප්‍රතිපදා විභාග වශයෙන්විභාග කොට දක්වන්ට "චතූහාකාරෙහි පඤ්ඤා" යනාදිය දක්වනලදී:-

තත්‍ර, ඒ වෙනෙග ජනයන් තුන්දෙනා කෙරෙහිලා විභාග කවයුතුවූ; පටිපදා, සමථවිදර්ශනා ප්‍රතිපත්තිහු; චතූහාකාරෙහි, "දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා- දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා- සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා- සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා"යි- සංඛ්‍යාවශයෙන් සතරෙක්වෙති; පුග්ගලා, වෙනෙග පුද්ගලයෝද; චතූහාකෙ, "තණ්හාචරිතා මන්දා- තණ්හාචරිතෝ උදත්තෝ- දිට්ඨිචරිතෝ මන්දා- දිට්ඨිචරිතෝ උදත්තෝ"යි, සතරදෙනෙක් වෙති.

මන්දා, මන්දීසංඛ්‍යාත අවිද්‍යාවෙන් සමන්විතවූ මොහාධිකවූ; තණ්හාචරිතෝ, තෘෂ්ණාවෙන් නිපන් චරිත ඇති පුද්ගලතෙමේ නිස්සයෙහි, උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් පවත්නාවූ; සතිපට්ඨානාදිකා, සතිප්‍රස්ථාන ධර්මයන්ගෙන් උපලක්ෂිතවූ; ඉන්ද්‍රියාධිකතාය ඉන්ද්‍රිය අධිකකොට ඇති ආර්‍යාමාගීයෙන්; දුක්ඛාය, නිවරණාදි ප්‍රත්‍යනීකධර්ම සමුදාචාරයාගේ බලවත් හෙයින් දුක්වූ; දන්ධාභිඤ්ඤාය, අපිරිසිදු නුවණැති බැවින් ශීඝ්‍රප්‍රවෘත්ති රහිත අභිඥ ඇත්තාවූ; පටිපදාය, ප්‍රතිපත්තියෙන්; නීයන්ති, සසරදුකින් බැහැරයේ; උදත්තා, උදාර ප්‍රඥාවන්තවූ; තණ්හාචරිතෝ, තෘෂ්ණාවෙන් නිපන් චරිතවත් පුද්ගලතෙමේ; නිස්සයෙහි, උපනිශ්‍රය ප්‍රත්‍යයවශයෙන් පවත්නාවූ; ඣානාදිකා, ධ්‍යානධර්මයන්ගෙන් උපලක්ෂිතවූ; සමාධින්ද්‍රියාධිකතාය, සමාධීන්ද්‍රියාධික ආර්‍යාමාගීයෙන්; දුක්ඛාය, එසේම දුක්වූ; ඛිප්පාභිඤ්ඤාය, පිරිසිදු නුවණැති බැවින් ශීඝ්‍රප්‍රවෘත්ත අභිඥ ඇත්තාවූ; පටිපදාය, ප්‍රතිපත්තියෙන්; නීයන්ති, සසරදුකින් බැහැරයේ; මන්දා, මොහාධිකවූ; දිට්ඨිචරිතෝ, දෘෂ්ටියෙන් නිපන් චරිත ඇත්තාවූ පුද්ගලතෙමේ; නිස්සයෙහි,

උපනිශ්‍රය ප්‍රත්‍යයවූ; සම්මප්පධානෙනි, සම්‍යක් ප්‍රධාන ධර්මයන් ගෙන් උපලක්ෂිතවූ, විරිසින්ද්‍රියෙන, විරිසින්ද්‍රියාධික ආයස්මිංගී යෙන්; සුඛාය, ප්‍රත්‍යනිකධර්ම සමුදාචාර පිඩාරහිත හෙයින් සුඛ සහගතවූ; දන්ධාභිඤ්ඤාය, අවිරිසිදු තුවණැති බැවින් ශීඝ්‍රප්‍රවෘත්ති රහිත අභිඥ ඇත්තාවූ; පටිපදාය, ප්‍රතිපත්තියෙන්; නියාති, වට දුකින් බැහැර යේ; ඉදමත්ථකා, උදාර ප්‍රඥවන්තවූ; දිට්ඨිවරිතො, දෘෂ්ටිචරිත පුද්ගලතෙමේ; නිස්සයෙති, උපනිශ්‍රය ප්‍රත්‍යයවූ; සවෙවති, චතුස්සත්‍ය ධර්මයන්ගෙන් උපලක්ෂිතවූ; පඤ්ඤින්ද්‍රියෙන, පඤ්ඤින්ද්‍රියාධික ආයස්මිංගීයෙන්; සුඛාය, එසේම සුඛසහගතවූ; ඛිප්පාභිඤ්ඤාය, ශීඝ්‍රප්‍රවෘත්තඅභිඥවත්වූ; පටිපදාය, ප්‍රතිපත්ති යෙන්; නියාති, භවදුකින් බැහැර යේ; උභො තණ්හාචරිතා, මන්ද උදාත්ත යන තෘෂ්ණාචරිත පුද්ගලයෝ දෙදෙනා; සමථ පුබ්බඞ්ගමාය, සමථසංඛ්‍යාතසමාධිය පෙරටුකොට ඇත්තාවූ; විපස්සනාය, විදර්ශනා උපනිශ්‍රයෙන්; රාගවිරාගාය, රාගප්‍රහාණය කරන්නීවූ මාංගීප්‍රඥවෙන්; අරහත්තඵලසමාධිය පිණිස; නිඝාතති, පමුණුවනු ලබත්; උභො දිට්ඨිචරිතා, මන්ද උදාත්ත යන දෘෂ්ටිචරිතයෝ දෙදෙනා, විපස්සනා පුබ්බඞ්ගමාය, විදසුන් පෙරටුකොට ඇති; සමථෙන, සමාධි උපනිශ්‍රයෙන්; අවිජ්ජාවිරාගාය, අවිද්‍යාප්‍රහාණය කරන්නීවූ අර්හත්මාංගී ප්‍රඥවෙන්; පඤ්ඤාවිමුත්තිඵලාය, අර්හත්ඵල ප්‍රඥව පිණිස; නිඝාතති, පමුණුවනු ලබත්.

මෙකී ප්‍රතිපදා චතුෂ්කයාගේ හා පුද්ගල චතුෂ්කයාගේ සංක්ෂේප විභාගය මෙසේ දතයුතු:- ප්‍රතිපදා චතුෂ්කය- සමථ විදර්ශනා ප්‍රතිපත්තිවශයෙන් දෙවැදෑරුම් වේ. සමථ පක්ෂයෙහි පඨවිකසිණාදීන්හි පළමුකොටම, පඨවි, පඨවි, යන ආදි වශ යෙන් පවත්නා මනස්කාරයෙහි පවත් යම්තාක් කලකින් ධ්‍යානොපචාරය පහළ වේ ද- ඒ තාක් පවත්නා ප්‍රඥව සමථ භාවනා ප්‍රතිපදා නම්; උපචාරයෙහි පවත් අර්ණාධ්‍යානය දක්වා පවත්නා ප්‍රඥව අභිඥකම්. සමහර තෙණෙකුගේ මේ ප්‍රති පදාව නිවරණාදි ප්‍රතිපක්ෂධර්ම සමුදාචාර බලයෙන් දුක්වන් නීය. ප්‍රතිපක්ෂ ධර්මයන්ගේ සමුදාචාර බලහීන හෙයින් සමහර තෙණෙකුගේ ප්‍රතිපදාව සුඛ වේ. අභිඥවද සමහර තෙණෙ කුගේ තුවණ අපිරිසිදු හෙයින් අශීඝ්‍ර ප්‍රවෘත්තිවශයෙන් දන්ධ වේ. කිසිවෙකුගේ තුවණ පිරිසිදු බැවින් ශීඝ්‍රප්‍රවෘත්ති වශයෙන් ඛිප්පාභිඤ්ඤා-වේ; විදර්ශනා වශයෙන් කෙසේදයත්? යම් යෙ කොට උපාදා රූපයන් පරිග්‍රහණය කෙරේද අරූපධර්මයන්

පරිග්‍රහණය කෙරේද; රූපාරූප ධර්මයන් පරිග්‍රහණයට පැමිණ දුකින් කලානතවෙමින් පරිග්‍රහණය කෙරේද; ඔහුගේ ප්‍රතිපදාව දුක්වන්නීය. එසේ පරිග්‍රහණය කරණලද රූපාරූප ධර්මයන් ඇත්තහුගේ විදර්ශනාපරිවාරයෙන් මාර්ගඥානයාගේ පහළවීම සනිකාව සිදුවන බැවින්- දන්ධාභිඤ්ඤා- නම්; යමෙක් රූපාරූප ධර්මයන් පරිග්‍රහණය කොටැ නාමරූපධර්මයන් දුකින් මඩනාලදුව ව්‍යවස්ථා කෙරේද- නාමරූපධර්මයන් ව්‍යවස්ථා කොට විදසුන්පිරිවෙසැ වෙසෙමින් විරහලෙකින් මාර්ගඥානය උපදවන්නේද ඔහුගේ ප්‍රතිපදාවද දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා නම් වන්නීය. අනිකෙක් නාමරූප ව්‍යවස්ථාව කොට තත් ප්‍රත්‍යය පරිග්‍රහණය කරණුගේ දුකසේ පීඩාවෙමින් පරිග්‍රහණයකොට විදසුන් පිරිවෙසැ වෙසෙමින් විරහලෙකින් මාර්ගඥානය උපදවා ගන්නේද; මෙසේත් දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා නම් වේ. මේ ක්‍රමයෙන් අනිකුත් ප්‍රතිපදාත්‍රයාගේ විභාගයද දතයුතු.

"තණ්හාය නිබ්බත්තිතං චරිතං එතස්සා"ති තණ්හාචරිතෝ, තණ්හාය වා පවත්තිතෝ චරිතෝ තණ්හාචරිතෝ"- ලෝභාධ්‍යාශය ඇත්තේයි; "මන්දියා අවිජ්ජාය සමන්නාගතෝති මන්දෝ" මෝහාධික පුද්ගලයායි; "උළාරං ඵලං දෙතී'ති උදෝ"- පව්වය සංඛ්‍යාත ප්‍රඥාවයි; "අත්තනි නිබ්බත්තෙතෝති අත්තෝ- උදෝ අත්තෝ යස්ස සෝ, උදත්තෝ. දිට්ඨිචරිතෝ උදත්තෝ, උග්ඝටිතඤ්ඤූ, තණ්හාචරිතෝ මන්දෝ ඤෙය්‍යෝ, ඉතරෙ වෙපි විපචිතඤ්ඤූ.

මෙහි ප්‍රථම ප්‍රතිපදාවට තෘෂ්ණා චරිතත්වය හා මන්ද ප්‍රඥා චරිතත්වයද හෙතුයි; සතීන්ද්‍රිය උපායයි, නිර්‍යාණය සකල ප්‍රතිපදාවන්ගේම ඵලයයි, විතීයප්‍රතිපදාවට තෘෂ්ණාචරිතත්වය හා උදාත්ත ප්‍රාඥත්වයද හෙතුයි; විරියින්ද්‍රිය උපායයි; තෘතීය ප්‍රතිපදාවට දෘෂ්ටි චරිතත්වය හා මන්දප්‍රාඥත්වය ද හෙතුයි; සමාධින්ද්‍රිය උපායයි; චතුර්ථප්‍රතිපදාවට දෘෂ්ටිචරිතත්වය හා උදාත්ත ප්‍රාඥත්වය ද හෙතුයි; පඤ්චේන්ද්‍රිය උපායයි; මෙසේ ප්‍රතිපදාත්‍රයාගේ හෙතු උපාය ඵල විභාගදතයුතු.

උභෝ තණ්හාචරිතා යනාදියෙහි- "රඤ්ඤෝ තස්ස රාගෝ සෝ විරජ්ජති එතායාති රාගවිරාගා, තාය, පටිප්පස්සද්ධිවසෙන

පටිපක්ඛතො විමුච්චතීති විමුත්ති, තෙන වා විමුත්තෙන තතො විමුච්චනන්ති වා විමුත්ති, සමාධි; වෙතසො ච තං විමුත්ති වාති වෙතොවිමුත්ති, වෙතසො පටිපක්ඛතො විමුත්ති විමොක්ඛාතිපි වෙතොවිමුත්ති; වෙතසි වා ඵලවිඤ්ඤාණෙ විමුත්තීති වෙතො විමුත්ති- වෙතසො වා ඵලවිඤ්ඤාණස්ස පටිපක්ඛතො විමුත්ති විමොක්ඛා එතසමින්ති වෙතොවිමුත්ති- සමාධියෙව.

තත්ථ, ඒ චතුර්විධ පුද්ගලයන් අතුරෙහි; **යෙ**, යම් තෘෂ්ණා චරිත පුද්ගලයෝ දෙදෙනෙක්; **සමථපුබ්බඞ්ගමෘහි**, සමාධිය පූර්ව ඔහමකොට ඇති; **පටිපදාහි**, ප්‍රථම විතිය ප්‍රතිපදාවෙන්; **නිය්‍යන්ති** සසරදුකින් බැහැර යෙද්ද; **තෙ**, ඒ පුද්ගලයෝ; **නන්දිරාගවසෙට්ඨා නානසෙන**, නන්දිරාගවතී නම් අමිනසින්; **භාවිතබ්බා**, ගම්කර විය යුත්තාහ; **යෙ**, යම්දෘෂ්ටිචරිත පුද්ගලයෝ දෙදෙනෙක්; **විපස්සනාපුබ්බඞ්ගමෘහි**, විදසුන් පෙරටුකොට ඇත්තාවූ; **පටිපදාහි** තෘතීය චතුර්ථ ප්‍රතිපදාවෙන්, නිය්‍යන්ති, වටදුක ඉක්ම යෙද්ද; **තෙ**, ඒ පුගුලෝ; **සිඛරිකඤ්ඤිත්‍රතනයෙන**, සිඛරිකඤ්ඤිත්‍රා නම් අරුත් නසින්; **භාවිතබ්බා**, පැමිණිය යුත්තාහ.

මෙසේ ප්‍රතිපදාවිභාගවශයෙන් වෙනෙක්ජන විභාගය දක්වා දැන් ඤාණවිභාග වශයෙන් දක්වනු පිණිස- "සවායං හාරො කත්ථ සමභවති" යන ආදිය කිහ.

සො අයං හාරො, ඒ මේ දෙශනාහාර තෙමේ; **කත්ථ**, කොතැන්හී; **සමභවති**, වණ්ණිතා කටයුතු ධර්මයන් වර්ණිතා කිරීම් වශයෙන් සිඳ වේද; ලැබේද? යස්ස, අෂ්ටදුශටක්ෂණයෙන් තොරවූ ශ්‍රවණධාරණාදි සම්පත්තියෙන් සම්භාවනාවූ යම් වෙනෙය පුද්ගලයෙකුගට; **සත්ථා වා**, ධර්මස්වාමීවූ ශාස්තෘන් වහන්සේ හෝ; **ගරුඨානියො**, ගරුතනවයුතුවූ; **අඤ්ඤතරො සබ්‍රහ්මචාරී වා**, එක්තරා සබ්‍රහ්මචාරී නමක් හෝ; **ධම්මං දෙසෙති**, දහම් දෙසයි ද; **සො**, ඒ පුද්ගල තෙමේ; **තං ධම්මං**, ඒ දෙශිතධර්මය; **සුත්වා**, අසා; **සඞ්ඛං**, "සම්මාසම්බුද්ධො වත සො භගවා යො එවරූපං ධම්මං දෙසෙති" යනාදිය මෙනෙහි කිරීමෙන් බුදුන්කෙරෙහිද; "සවාකඛාතො වතායං ධම්මො යො එවං එකන්තපරිපුණ්ණො එකන්තපරිසුද්ධො" යනාදි වශයෙන් ධර්මය කෙරෙහිද- "සුපටිපන්නො වතායං භගවතො සාවකසඞ්ඝො" යනාදි වශයෙන් සංඝයා කෙරෙහිද-අවල ශ්‍රද්ධාව; **පවිලහති**, සිරසින්සතන්හි නැවත නැවත පහළකෙරේද; **තත්ථ**, ඔපාක්‍රමණයෙන් අසන්නලද ප්‍රගුණකරන්නලද- ඒ ධර්මයෙහි; **යා වීමංසා**, පාඤ්ඤා පාඤ්ඤාවී විචාරණ සඞ්ඛ්‍යාතවූ යම් වීමංසාඥාන යක් වේද; **උස්සහනා**, "යථොකත වීමංසනයෙහි හැකිලීමට

ත්තොපැමිණ උත්සාහයෙන් උපසඵම්භ කරන ලද්දිවූ ධම්මය පිළිබඳ ධාරණ පරිවඨසාධන" යම් ප්‍රඥාවක් වේද; තුලනා, "තුලන වස යෙන් හෙවත් දෘශ්‍යමාන පදයෙන් පදූනනරයන් හෝ දෙසනා වෙන් දෙසනානනරයන් හෝ සසඳ බලා ගන්නා" යම් ඥානයක් වේද; උපපරික්ඛා, සිවිමිහ අපදෙස්හිලා පෙළ පෙළඅරුත් නැවත නැවත විමසන ඥානයක් වේද; අයං, විමංසාදි ආකාර වශයෙන් පහළවන මේ ප්‍රඥාතොමෝ; සුතමයී සඤ්ඤා, ශ්‍රැතශ්‍රැති කෙතුවෙන් උපදනා හෙයින් ශ්‍රැතමය ප්‍රඥානම්; නාමා, එපරිද්දෙන්; සුතෙන නිස්සෘතෙන, ශ්‍රැත සඨ්ඨාපනිධම්ය- තොහොත්- පඨ්ඨාපනිධම් ශ්‍රවණය උපනිශ්‍රය කෙතුවෙන්; ඝා විමංසා, "ඉදං සිලං අයං සමාධි ඉමෙ රූපාරූපධම්මා ඉමෙ පඤ්ච ඛන්ධා"යනාදි වශයෙන් ඒ ඒ ධම්මයන්ගේ සභාව විමසන යම් ප්‍රඥාවක් වේද; තුලනා, "ඒ ධම්මයන්ගේම වචනාර්ථය හැර සභාව සරස ලක්ඛණය තුලනය කොට කිරා ගන්නාක් වැනිවූ" යම් ප්‍රඥාවක් වේද; උපපරික්ඛා, "ඒ ධම්මයන්ගේම සවලක්ඛණය නොහැර අනිත්‍යතාදි වශයෙන් බිඳීයාම ආ සප්‍රත්‍යයාදි ආකාරයන්ද තකා විතක්ක නැවත නැවත පරීක්ෂාකරන" ප්‍රඥාවක් වේද; මනසානුප්පෙක්ඛණා, "එසේ උපපරීක්ෂිත ධම්මයන් ශරීරමත් වූවන් මෙන් වැටහෙන කල මේ ධම්මයන් මෙසේය යි- උපනිධ්‍යානක්ෂමවූවන් කොටැ ගිනින් නැවත නැවත බැලීමක් වේද; අයං, මෝතොමෝ; චින්තාමයී පඤ්ඤා, "ශ්‍රැතධම්මයන්ගේ අවි නිධ්‍යානයෙන් උපදනා හෙයින්" චින්තාමයී ප්‍රඥානම්; යම්හෙයකින් ශ්‍රැතමයී ප්‍රඥාව ශ්‍රැත ධම්මයාගේ ධාරණපරිවය සංඛ්‍යාත උත්සාහයෙන් පහළවන්නීද- එහෙයින් එහි උස්සාහනා යන පදය කීත. චින්තාමයී ප්‍රඥාව එසේ නූපදනා බැවින් මෙහි ඒ පදය නොකියනලදී.

ඉමාහි තිස්සි පඤ්ඤාහි, මෙතුවූ, සුතමයී චින්තාමයී යන මේ විවිධ ප්‍රඥාවෙන්; මනසිකාර සම්පයුත්තානඤ්ච, රූපාරූප ධම්මයන් පරිග්‍රහ ආදි මනස්කාරයෙහි යුතකප්‍රයුක්තවූ පුද්ගලයාහට; දස්සනභූමිඤ්ච වා, පළමුකොට නිවන් දක්නා හෙයින් දර්ශනභූමි සංඛ්‍යාත ශ්‍රොතාපත්තිමාගීය හොවරකොටැ හෝ; භාවනාභූමිඤ්ච වා, උපරි මාගීත්‍රය සංඛ්‍යාත භාවනාභූමිය හොවරකොටැ හෝ; ඤාණං, "දිට්ඨිවිසුද්ධි- කඞ්ඛාවිතරණ විසුද්ධි- මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධි- පටිපදාඤාණදස්සන විසුද්ධින් සම්පාදනය කිරීමෙන් විදසුන්හි උත්සාහ කරන්නාහට" ඤාණදස්සනවිසුද්ධි සඞ්ඛ්‍යාතවූ යම් ආර්ය්‍ය මාගී ඥානයක්; උප්පජ්ජති, පහළ වේද; අයං, මේ ප්‍රඥාතොමෝ; භාවනාමයී පඤ්ඤා, භාවනාවෙන් උපන් ප්‍රඥානම්.

පරමත්තකානඤ්ඤා, සවිසයාභිපත්තකයෙන් අන්‍යවූ බුඩබුඩ ශ්‍රාවකයන් කෙරෙන් අසනලද දෙශනාශබ්ද ශ්‍රවණ ප්‍රත්‍යයෙන්. නොහොත් පරතොඝොෂ ප්‍රත්‍යය ඇත්තාවූ ප්‍රඥතොමෝ; **සුත්තමයී පඤ්ඤා නාම**; **පච්චත්තඤාණසමුඞ්ගතා**, තමතමා කෙරෙහි හටගත්තාවූ; **යොනිසො මනසිකාරණ**, තත් තත් ධර්මයන්ගේ සභාව පරිග්‍රහණාදීවූ උපායෙන් පැවැති මනසිකාරය; **චින්තාමයීපඤ්ඤා නාම**; **පරතොඝොසෙන**, පරතොඝොෂ සම්පත්තියෙන්ද; **පච්චත්තඤාණසමුඞ්ගතෙන**, තමතමා කෙරෙහි පහළවූ; **යොනිසො මනසිකාරෙන** ච, උපායමනසිකාරයෙන්ද; **ඤාණං**, යම්බඳුවූ මාගීඥානයක්; **උප්පජ්ජති**, පහළ වේද; **මේ භාවනාමයී පඤ්ඤා නාම**; **යස්ස**, යම්පුද්ගලයෙකුගේ (චිත්තසන්තානයෙහි); **ඉමා තිස්සො පඤ්ඤා**, "සුතමයී චින්තාමයී" යන මේ ප්‍රඥාවෝ දෙදෙන; **අත්ථි**, ඇත්තාහුද- හෙවත්- පහළවන්නාහුද; **අයං**, මේ පුද්ගලතෙමේ "ශ්‍රැතමය චින්තාමය ඥානයෙන් ආශය ප්‍රයොග ප්‍රබොධය නිපදවා උදෙදෙශමාත්‍රයෙන් චතුස්සත්‍යාවබොධ කරනහෙයින්" **උග්ඝටිතඤ්ඤූ නාම**; **යස්ස**, යම් පුහුලෙකුගේ (සිත්සතන්හි) "ශ්‍රැතමය ප්‍රඥාව පවත්නීද; චින්තාමයප්‍රඥාව නොපවත්නීද; මේ පුහුලතෙමේ චින්තාමය ඥානයෙන් ආශයපරිග්‍රහණය නොකොටැ උදෙදෙශනිර්දේශයෙන් අවබොධකරන හෙයින්" **විපඤ්චිතඤ්ඤූ නාම**; "යම් පුහුලෙකුගේ සිත්සතන්හි ශ්‍රැතමයප්‍රඥාවත් චින්තාමය ප්‍රඥාවත් නැත්තීද; මේ පුද්ගලතෙමේ ශ්‍රැතමයඥානයෙනුත් චිරත බැවින් නිරවශෙෂ වශයෙන් විස්තරදෙශනාවෙන් පැමිණවියයුතු හෙයින්" **නෙය්‍ය නාම**.....

මෙසේ උක්තප්‍රකාරයෙන් දෙශනාපටිපදා ඥානවිභාග හෙයින් දෙශනාහාරයෙන් විභාගකටයුතු පුද්ගලත්‍රය විභාගකොට දැන් ඒ දෙශනාහාරයෙහි පවත්වනලද බුදුන්ගේ ධර්මදෙශනාවෙන් දෙශනාහාරය උපුටා යොදා දක්වන්නට "**සාසං ධම්මදෙසනා**" යනාදිය ආරබ්ධයි.....

සා අසං ධම්මදෙසනා, "ධම්මං වො භික්ඛවෙ දෙසෙස්සාමි" යනාදි වශයෙන් දෙශනාහාරයාගේ විෂය භාවයෙන් තබනලද ඒ මේ ධර්මදෙශනාපාළිතොමෝ, **කිං**, කවර පිණ්ඩාර්ථයක්; **දෙසනා**, දක්වයිද? (කථෙතුකම්‍යතා ප්‍රශ්නයයි) **දුක්ඛං**, අනෙකොපද්‍රවාධිෂ්ඨානභාවයෙන් ලාමකබැවින් සා අඥානජන පරිකල්පිත-ධ්‍රුව- ශුභ- සුඛ- ආත්මභාව- රහිතහෙයින් තුච්ඡබැවින් ද තෘෂ්ණාවර්ජිත ත්‍රෛභූමික ධර්මසමුදය සංඛ්‍යාත දුක්ඛයද; **සමුදයං**, අවශෙෂ ප්‍රත්‍යය සමවායඇතිකල දුක්ඛොත්පත්තියට හෙතුවූ

තණ්හාප්පමුඛා සාසව කුසලාකුසල සංඛ්‍යාත සමුදයද; නිරෝධං, සමේහති ශූන්‍යත්වයෙන් සංසාරවාරක සංඛ්‍යාත දුක්ඛරෝධයාගේ අභාවය හි කියන නිරෝධයද; මග්ගං, මධ්‍යමප්‍රතිපද සංඛ්‍යාත ආර්‍යමාර්ගයද යන; චත්තාරි සච්චානි, චතුරාර්‍යසත්‍යයන් (දක් වන්නේය) එහි ආදීනවය ද ඵලය ද දුඃඛසත්‍යයි; ආශ්වාදය සමුදයයි, නිස්සරණය නිරෝධයි; උපාය මාර්ගයි; මේ ශබ්දරූප වශයෙන් චතුරාර්‍යසත්‍යයෝයි.

ඉදං ධම්මචක්කං, චතුස්සත්‍ය වශයෙන් යම් මේ සාමුක්කංසික ධර්මදේශනාවක් වේද මෙය දම්සකයි.

මෙසේ චතුස්සත්‍ය ධර්මයෝ යම් සූත්‍රයෙක්හි යම්රූප වශයෙන් ආවාහුද; එහි ආගතක්‍රමයෙන් ද- යම් සූත්‍රයෙක සම්රූප වශයෙන් නොආවාහුද එහි අරුත්හෙයින් උපුවා ආශ්වාදාදීහු හෙතැනැර දැක්විය යුත්තාහ. යම් සූත්‍රයෙක ආශ්වාදාදීහු සම්රූප වශයෙන් ආවාහුද එහි කියයුත්තක් නැත; යම්තැනක නොආවාහුද එහි අරුත් වශයෙන් උපුවා ඒ ආශ්වාදාදීන්ගේ වශයෙන් සිව්සස් හෙතැනැර දැක්විය යුතුය.

ඒ ධර්මදේශනාව දම්සකබව සත්‍යවිභඞ්ගසූත්‍ර වශයෙන් දක් වනු පිණිස "ඡඵාභි භගවා" යනාදිය කීහ.

"භික්ඛවෙ මේ බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා ලොකසම්මිං කෙනචි වා අපපවත්තියං අනුත්තරං "ඉදං දුක්ඛං ඉති" ධම්මචක්කං පවත්තිතං"-සි- වාක්‍යපදයොජනායි.

"මහණෙනි මාවිසින් බාරාණසී නගරයාගේ අවිදූරස්ථානයෙහි වූ ප්‍රත්‍යක්ෂබුඩ සංඛ්‍යාත ඍෂින් අහසින් බස්නාතැනක් බැවින් ඉසිපතන නම්වූ මිගදාය වනයෙහිදී මහණෙකු විසින් හෝ බමුණෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ බඹෙකු විසින් හෝ ලොව කිසිවෙකු විසින් හෝ ප්‍රතිශෙධ නොකටහැකිවූ නොහොත් නොපැවැත්විය හැක්කාවූ අප්‍රතිභාගවූ තෘෂ්ණාවර්ජිත මේ ත්‍රෛභූමික ධර්මසමූහය සකල වෘත්තදුඃඛයාගේ අධිෂ්ඨානභාවයෙන් හා දුඃඛදුඃඛාදිභාවයෙන් ද දුඃඛාර්‍යසත්‍යය වන්නේය-යි" ධර්මචක්‍රයක් පවත්වනලද්දේද; යනු පදානුක්‍රම භාවාර්ථයි.

"සතිපට්ඨානාදිධම්මා එව පවත්තනතොයෙව චක්කානීති ධම්මචක්කං, අථවා චක්කානීති ආණා- ධම්මතො අනපෙතත්තා ධම්මඤ්ච තං චක්කං චා'ති ධම්මචක්කං, ධම්මෙන ඤායෙන චක්කානීතිපි

ධම්මවක්කං, "බොධිපල්ලඞ්කා නිසින්නස්ස හි වතූසු සච්චේසු උප්පන්නං ඤාණසංකාරං පටිවේධඤාණම්පි ඉඤ්ජනේ නිසින්නස්ස ඤාණසංකාරස්ස සච්චදේසනාය පවත්තනකදේසනාඤාණම්පි ධම්මචක්කං නාම" යනු සාරත්ථදීපනී පාඨයි.

තත්ථ, ඒ වතුස්සත්‍ය දේශනාවෙහි; **අපරිමාණා පදා**, පෙ. "අප්‍රමාණ පදයෝද- අප්‍රමාණ අක්ෂරයෝද- අප්‍රමාණ ව්‍යඤ්ජන යෝද- අප්‍රමාණ ආකාරයෝද- අප්‍රමාණ නිරුත්තිහුද- අප්‍රමාණ නිදේශයෝද- වෙති.

එතස්ස එව අත්ථස්ස, මේ වතුස්සත්‍ය සංඛ්‍යාත අර්ථය සඞ්ඛේපයි; **සඞ්කාසනා**, සැකෙවින් පළකළයුතු ආකාරය; **පකාසනා**, පළමුකොට ප්‍රකාශකටයුතු ආකාරය; එසේම විවරණය- විභජනය- උත්තානීකරණය- පඤ්ඤත්තිය- යන; **ඉති**, මේ මේ ව්‍යඤ්ජනපද අර්ථපද ආකාර වශයෙන් ද; **ඉදං දුක්ඛං අරිය සච්චං**, මේ දුඃඛාර්ය සත්‍යය දනයුතු; **අයං**, කාමතෘෂ්ණා ආදි ප්‍රභෙදවූ මේ තෘෂ්ණාව; දුඃඛසමුදය යි දනයුතු; **අයං**, සකල සඞ්ඛත ධර්මයෙන් බැහැරවූ මේ අසඞ්ඛත ධාතුතොමෝ; **දුක්ඛ නිරෝධා**, ඝෂ්ඨාකත දුඃඛයාගේ අනුත්පාද නිරෝධප්‍රත්‍යය බැවින් දුක්ඛනිරෝධ නම්; **අයං**, සම්‍යක්දෘෂ්ටි ආදි මේ අෂ්ටාඞ්ග සමූහතෙමේ; **දුක්ඛනිරොධගාමිනිපටිපදා**, දුඃඛනිරෝධසංඛ්‍යාත නිර්වාණයට අරමුණු වශයෙන් අභිමුඛවූ බැවින් දුඃඛනිරෝධ ගාමිනී ප්‍රතිපදා නම්.

මෙසේ "ඤාණසංකාරනිද්දෙසං" යනාදි ග්‍රන්ථයෙහි ව්‍යඤ්ජන ඡක්ක- අර්ථඡක්ක- වශයෙන් යම් දෙළොස්පද කෙණෙක් කියන ලදද- එයම, "ධම්මං වෝ භික්ඛවෙ දෙසිස්සාමි" යනාදියෙන් දේශනාඅාරයට විෂය දැක්වීම් වශයෙන් ඡඡක්කපරියායදේසනාව එකදෙසයකින් දක්වා- දම්සක් පැවතුන් සුතුරෙන් තදර්ථ සංගෘහීතභාවදර්ශනවාරයෙන් සකල බුද්ධවචනයාගේ ම වතුස්සත්‍යදේශනා භාවය හා තත් ප්‍රවචනාර්ථයාගේ ද වතුස්සත්‍යභාවය ප්‍රකාශකරණුයේ- "ඉදං දුක්ඛන්ති මෙ භික්ඛවෙ" යනාදි වශයෙන් සච්චවිභඞ්ග සූත්‍රය උදෙසයෙන් දක්වා- "**තත්ථ අපරිමාණා පදා**" යනාදි වශයෙන් ව්‍යඤ්ජනාර්ථ පදයන් විභාගකෙරෙමින් ඒ දම්සක තමා දෙළොස්පදයක්බව දක්වා- දැන් ඔවුන්ගේ අන්‍යෝන්‍ය විෂයී විෂය භාවයෙන් සම්බන්ධභාවය දක්වනු පිණිස "**තත්ථ කතමා අරියසච්චසඞ්කාසනතා**" යනාදිය කියත්.

එහි පද අවයවග්‍රහණ වාරයෙන් පදග්‍රහණයද- පදඝත්කලෑ පදාර්ථබොධය මනාකි හන්නාලද පළමු සූත්‍රකුණ පිළිබඳව වන්

නේය; තවද- එහි පදද්වයට් ගැනීමෙන් මෙන් පදග්‍රහණයාගේ පදද්වයවය ග්‍රහණයෙන් ද- පදවිග්‍රහණයාගේ විශෙෂ සථිර පිහිටීමක් වන්නේනුයි "අක්ඛරයි සංඛාෂෂති" යනු කිහ; යම්හෙයකින් අක්ෂරයෙන් සැකෙවින් දක්වනු ලබන අර්ථය පදවශාතයෙනි වාක්‍යය තමා නොනීම් බැවින් පදයෙන් ම ප්‍රකාශකරන ලද්දේවේ ද, එහෙයින් "ෂදෙහි ෂඛාෂෙති" යනු කිහ; එසේම වාක්‍යාවශාතයෙහි එම අර්ථය විවෘතකරන ලද්දේ වේ ද, එහෙයින් ඛ්‍යඤ්ජනාහි විවරති" යනු කිහ; යම් හෙයකින් ආකාරයෙන් වාක්‍යභෙදය කළකලැ එම අර්ථය විභාගකරන ලද්දේ වේ ද- එහෙයින් "ආකාරෙහි විභජති" යනු කිහ; එසේම වාක්‍යාවයවයන්ගේ එක එකක් බැගින් නිර්වචන විභාගය කළකලැ තදර්ථය ප්‍රකටවන්නේ නු සි, "නිරුත්තීහි ලක්ඛාණි ඛාශති" යනු කිහ; කරනලද නිර්වචනවිභාගඇති වාක්‍යාවයවයෙන් විසතරවශයෙන් නිරවශෙෂයෙන් දෙශනාකරනලදකලැ වෙනෙය ජනයන්ගේ චිත්තපරිතොෂණය හා ශ්‍රුතයාගේ තීක්ෂණභාවය ද කරණලද්දේ වේ නු සි, "නිද්දෙශෙන් ෂඤ්ඤෙති" යනු කිහ; තවද මෙහි "අක්ඛරයි එව සංඛාෂෂති" යනු නො දක්වා "අක්ඛරෙහි සංඛාෂෂති ශෙව" යනුවෙන් අවධාරණය අර්ථාරූඪකළ හෙයින් අර්ථ පදයන්ගේ අනෙකවාක්‍ය විෂයතාවය ද දක්වනලදී; එහෙයින් එකානුසන්ධික සූත්‍රයෙහි අර්ථපද ෂට්කය ම ද- නානානුශන්ධික සූත්‍රයන්හි අනුසන්ධියක් අනුසන්ධියක් පාසාද- අර්ථපද සයක් සයක් නිධාරණය කටයුත්තාහ. සත්‍යවිභඞ්ග සූත්‍රාගත සත්‍යාකාර වතුෂ්කයෙහි ම විභාගය උක්තප්‍රකාරයෙන් දතයුතු.

නම්, ඒ ඛ්‍යඤ්ජනාර්ථ පදයන් අතුරෙහි; භගවා, භාග්‍ය වතුන්වහන්සේ; අක්ඛරෙහි ච, අක්ෂරයන් කරණකොටගෙන ද; පදෙහි ච, පදයන් කරණකොටගෙන ද; උග්ඝාටෙති, අදහස් කරනලද අර්ථය සැකෙවින් දක්වන්නේය; එසේම ඛ්‍යඤ්ජනයන් කරණකොටගෙනද- ආකාරයන් කරණකොටගෙන ද; විපඤ්ච යති, උද්දිෂ්ටාර්ථය නිර්දිෂ්ට කරන්නේය; නිරුත්තියෙන් හා නිද්දෙශයෙන්; විත්ථාරෙති, විසතරකරන්නේ ය; තාවතා, ඒ උද්ඝාටනාදීන් අතුරෙහි; උග්ඝාටනා, උද්ඝාටනය; ආදි, පඨමාපත්ති ශාසනයාගේ ආදිභාගය වේ; විපඤ්චනා, විපඤ්චනය; මජ්ඣං, මධ්‍යභාගය වේ; විත්ථාරණා, විසතරකිරීම; පරියොසානං, පරියොසානය වේ; ෂෂාසනං ධම්මවිනාශෂා, නවාඞ්ග පඨමාපත්ති ශාසනාර්ථ සංඛ්‍යාත ඒ මේ ධර්මවිනයතෙමේ; උග්ඝාටිතඤ්ඤානා, උද්දෙශකරනු ලබන්නේ; උග්ඝටිතඤ්ඤුං පුග්ගලං, උග්ඝටිතඥපුද්ගලයා; විනෙති, ආඨ්‍යමාගීයට පමුණුවති; එහෙයින් ඒ උද්දෙශකිරීම ආදි කල්‍යා

ණය යි කිහ; **විසම්ඵස්සනතා**, නිදේශකරනු ලබන්නේ; **විසවිත සත්තුං සුඛහලං විඤ්ඤා හි**"යි සේයි; **විසඨාරියඤතා**, ප්‍රතිනිදේශ කරනුලබන්නේ; "**නෙය්‍යං සුඛහලං විඤ්ඤා හි**"යි-සේයි; **ජ පදුනි අඤ්ඤා**" යනාදිය ප්‍රකට යි; "**ධම්මං ඤවා සිකඛාඤව දෙසිස්සාමි**" යනාදියෙහි- **කෙවලං** ඉති, කෙවලං යනු; **ලොකුත්තරං**, ලොකොත්තරය; ලෞකික ධර්මයෙන් අම්ශ්‍රය යන අර්ථයි; **පරිපුණ්ණං** යනු, සම්පූර්ණවූ නොඅඩුවූ අධිකනුවූ යන අර්ථයි; **පරිසුද්ධං**, යනු, නිර්මලවූ සකල කෙලෙසමලයෙන් පහවූ- විශෙෂයෙන් පිරිසිදුවූ- සකලගුණ විශෙෂයන්ට ආස්‍රයනවූ- යන අර්ථයි; **ඉදං**, ශික්ෂාත්‍රය සඞ්ගෘහීතවූ මේ ශාසන බ්‍රහ්මචර්‍යාව; **තථාගතපදං ඉතිපි**, තථාගත නම්වූ ගන්ධහස්තිනුගේ ප්‍රතිපත්ති දෙශනාගමනින් කෙලෙස් වනලැහැබ මැඩගිය මහය යි ද; **තථාගත නිසෙවිතං ඉතිපි**, තථාගතයන් වහන්සේ විසින් ගොචරභාවනා ආසෙවනයෙන් භජනයකරන ලද්දේය යි ද; **තථාගත රක්ඛිතං ඉතිපි**, තථාගතයන් වහන්සේගේ මහාවජ්‍රඥන සර්ව්වඥතාඥන සංඛ්‍යාත දන්තයෙන් ප්‍රදලනය කරනලද ස්ථානය යි ද; **වුච්චති**, කියනු ලැබේ; **අඤ්ඤා ච**, යම්හෙයකින් තථාගත පදදිභාවයෙන් කියනු ලැබේද එහෙයින්ම; **එතං බ්‍රහ්මචරියං**, මේ ශාසනබ්‍රහ්මචර්‍යාව; **පඤ්ඤපෙති**, යථොක්තප්‍රකාරයෙන් ප්‍රකට වේ; එහෙයින් ම භාග්‍යවතුන්වහන්සේ "ධම්මං ඤවා සිකඛාඤව දෙසිස්සාමි" යනාදිය වදාළසේක.

අයං ධම්මදෙසනා, මේ ධර්මදෙශනා තොමෝ; **කෙසං**, කවර කෙණෙකුන්ට ද යත්? **සෙඛානං**, චතුස්සත්‍ය කර්මස්ථාන භාවනා වෙහි යුක්තප්‍රයුක්තවූවන්ට ය; ඔවුහු මේ දෙශනාහාරය ප්‍රයොග කෙරෙත් මැයි- එහෙයින්ම ආයුෂ්මත් **මහාකාත්‍යායන** ස්ථවිර තෙමේ "**අස්සාදාදීනවතා**" යනාදි ගාථාව වදාළසේකි; **දෙසනා හාරෙ**, දෙශනාහාර තෙමේ; **නියුත්තෙතා**, පාළියෙන් ආශ්වාදාදි පදවීයන් නිර්ධාරණය කොටැ යොදා නිමවන ලද්දේය.

දෙසනාහාරවිභඞ්ගොති වණ්ණිතොති.

දෙශනාහාරවිභඞ්ගයට අනතුරුව විචයහාර විභඞ්ගය දක්වනුවෝ "**තත්ථ කතමෙ විචයා හාරෙ**"යනු අනුයොග කළෝ; "**යං පුච්ඡිතං ච විස්සජ්ජිතං වාති ගාථා**" යනු- විස්සජ්ජිතයි; මෙතැන් පටන් අප්‍රකට පදවීපමණක් දක්වීමෙන් විනිශ්චය කරනු ලැබේ; **අයං විචයෙ හාරෙ**, මේ අර්ථවර්ණනා විශෙෂ සංඛ්‍යාත විචයහාර විභඞ්ගතෙමේ; **කිං විචිනති**, කිනම් විශයක්

සෙවීම කෙරේද?; **පදං**, නවවිධ සූත්‍රානන්තයාගේ නිගමනය දක්වා සකල චතුර්විධ පදසමුදය; **විචිනති**, සෙවීමකෙරේ; **පඤ්හං**, "අදිඨජොතනාදීවූ ද- සන්තාධිඨානාදී වූ ද- සම්මුතිවිසයාදිවූ ද- අතීතවිසයාදිවූ ද" ප්‍රශ්නවිභ ගය; **විවිනති**, සොයයි; **විස්සජ්ජනං** "එකංස බ්‍යාකරණ විස්සජ්ජනාදීවූ ද- සාවසෙස බ්‍යාකරණ විස්සජ්ජනාදීවූ ද- සඋත්තර බ්‍යාකරණ විස්සජ්ජනාදීවූ ද- ලොකිය බ්‍යාකරණ විස්සජ්ජනාදීවූද" විස්සජ්ජන විභාගය; (විචිනති) පුබ්බාපරං විචිනති, පූර්‍වාපර සංසන්දනය කොට විචින්තය කෙරේ; **අස්සාදං**, ආශ්වාදක තෘෂ්ණාදිය හා- ආශ්වාදනය කටයුතු සුඛාදිය ද; **ආදීනවං**, "දුක්ඛදුක්ඛ විපරිණාමදුක්ඛ සඞ්ඛාරදුක්ඛාදි වශයෙන් පවත්නා" නිබ්බින්දනාකාර ආදීනවය ද; **නිස්සරණං**, මාගී නිර්‍වාණ වශයෙන් පවත්නා නිස්සරණය ද; **ඵලං**, දෙශනාඵලය ද; **උපායං**, අනිච්චානුපස්සනාදි වශයෙන් පවත්නා උපාය ද; **ආණත්තිං**, පාපපරිවර්‍ජිත ආණත්‍යාදි වශයෙන් කරනලද නියොගය ද; **අනුගීතිං**, වුත්තානුගීති හා වුච්චමානානුගීති ද; **සබ්බං නව සුත්තාගමං**, සූත්‍රගෙය්‍යාදි සකල නවාඞ්ග සූත්‍රාන්තයන්; **විචිනති**, "ආහච්චවචන- අනුසන්ධිවචන- නීතත්ථවචන- නෙය්‍යත්ථ වචන- සඞ්කිලෙසභාගියාදි වශයෙන්" සෙවීමකෙරේ; **කථා**, යම් ආකාරයකින් ප්‍රශ්නවිචය ව්‍යවස්ථාකටයුතු වේ ද ඒ ආකාරය; **කිං භවේ**, කෙබඳුවන්නේ ද; **කථා**, යම් පරිද්දකින්; **ආයස්මා අජිතො**, ආයුෂ්මත් අජිතමානවකතෙමේ; **පාරායනෙ**, අජිත සූත්‍රාදි ශොඞශ සූත්‍රාඞ්කිත පාරායන වගීයෙහි ලා; **භගවන්තං**, භාග්‍යවතුන් වහන්සේ අතින්; **පඤ්හං පුච්ඡති**, පැණක් විචාරයි;

තෙනසුතං පෙ මහබ්භයනන්ති

ලොකෙ, ආර්‍යවර්‍ජිත සත්වතෙමේ; **කෙන**, කිනම්හෙතුවකින්; **නිවුතෙතා**, වසනලද්දේ වි ද? **කෙන**, කිනම් හෙතුවකින්; **නපපකාසති**, සත්වතෙමේ ප්‍රකට නොවේ ද; **අස්ස**, ඒ සත්වයාගේ; **අභිලෙපනං**, මක්කටාභිලෙපයක් වැනි ඇලීමට හෙතුව; **කිං**, කිමෙක්ද? **තස්ස**, ඒ සත්වයාගේ; **මහබ්භයං**, මහබියට කරුණ; **කිංසු**, කිමෙක්ද? **බ්‍රූහි**, වදාළ මැනවැ යි- **ආයස්මා අජිතො**, ආයුෂ්මත් අජිතතෙමේ; **ඉති**, මෙසේ විචාරේය මෙහි "**කෙන සත්තු නිවුතෙතා, කෙනස්සු නපපකාසති, කිස්සාභිලෙපනං කිංසු තස්ස මහබ්භයං**" යන මේ සිව්පද කෙණෙක් විචාරණ ලද්දාහුය; ඒ පදවතුෂ්කය එකම ප්‍රශ්නයකි, කුමක්හෙයින්ද? නිවාරණ- අපපකාසන- අනිලෙපන- මහාභය- සංඛ්‍යාත චතුර්විධ අර්‍ථයෝම එකම සත්වලොකයා කෙරෙහි පිහිටි ගුණාර්‍ථයෝ ය; එහෙයින්

ප්‍රධාන භාවයෙන් එකම ලොකවසතුව අයත් කොට පවත්නාහුය. ඒ එසේමය; "කෙනසසු නිවුතො ලොකො" යන්නෙන් ලොකයාගේ අධිෂ්ඨාන හෙතු විචාරයි. "කෙනසසු නපපකාසති" යන්නෙන් ලොකයාගේ අප්‍රකටභාවයට හෙතුවිචාරයි; "කිසසානිලෙපනං බ්‍රූසි" යන්නෙන් ලොකයාගේ අනිලෙපයට හෙතු විචාරයි; "කිංසු තසස මහබ්භයං" යන්නෙන් ලොකයාගේ මහබ්භයට හෙතුවිචාරයි.

"කිලෙසලොකස- භවලොකස- ඉන්ද්‍රියලොකස"යි- සත් ලොව තෙවැදෑරුම් වේ; එහි රාගාදිකෙලෙස් බහුල බැවින් කාමාවචරසත්ත්වසමූහයා කෙලෙසලොක නම්; ධ්‍යානාභිඥානාධිකත්වයෙන් රූපාවචර සත්ත්වසමූහයා භවලොක නම්; අනෙකඥාසමාධිබාහුල්‍යයෙන් පරිශුද්ධ ඉන්ද්‍රියයන් ඇති බැවින් අරූපාවචර සත්ත්වසමූහයා ඉන්ද්‍රියලොක නම්; (නොහොත්) කෙලෙසිම කිලෙසයි; විපාකදුකයි; ඒ විපාකදුක බොහෝකොට ඇති ආපායික සත්ත්වසමූහයා කිලෙසලොක නම්; එයින් අන්‍ය සත්ත්වසමූහයා සම්පත්තියෙන් වැඩෙන බැවින් භවලොක නම්; විමුක්ති පරිපාචක ශ්‍රද්ධාදි ඉන්ද්‍රියෙන් යුත් සත්ත්වසමූහයා ඉන්ද්‍රියලොකනම්; කෙලෙසසකඛාදි පඤ්චාපන්න ධම්මවශයෙන් ලොකසංඥව පවත්නා බැවින් ආඥායෝ මෙහි නොගන්නා ලදහ. එහි විසඳීම:-

අවිජ්ජාය නිවුතො ... පෙ ... දුක්ඛමසස මහබ්භයනති.

අජ්ඣත්ත, එම්බා අජිතය; **ලොකො**, සත්ත්වලොකතෙමේ; **අවිජ්ජාය**, ධම්මසභාව වසාලීම ලක්ෂණකොට ඇති අවිද්‍යාවෙන්; **නිවුතො**, වසනලද්දේය; **විවිච්ඡා**, විචිකිච්ඡා හෙතුවෙන් හා; **පමාදා**, ප්‍රමාදහෙතුවෙන්; **නපපකාසති**, ප්‍රකටනොවේ; **ජප්පා**, ජප්පා සංඛ්‍යාත තෘෂ්ණාව; **අසස**, ඒ ලොකයාගේ; **අනිලෙපනං**, සිලෙසලාක්ෂාඛයයි- හෙවත් මක්ඛකථාලෙපයක් සමානයයි; **බ්‍රූමි**, කියම්; **මහබ්භයං**, මහබ්භයට හෙතුව; **දුක්ඛං**, දුකය-යි, (බ්‍රූමි, කියම්සි) **භණවා**, භාග්‍යවතුන් වහන්සේ; **ඉති**, මෙසේ විසඳ වදාළසේක.

ඉමානි චත්තාරි පදානි, "කෙනසසු නිවුතො ලොකො" යනාදීවූ මේ වාක්‍යයෝ සතරදෙන; **ඉමසමිං චතූසු පදෙසු**, "අවිජ්ජාය නිවුතො ලොකො" යනාදි මේ වාක්‍යසතරින්; **විසසජ්ජිතානි**, විසඳනලද්දාහුය; "පඨමං පඨමෙන" යනාදි අනුක්‍රමයෙනි; ඒ එසේමැයි, කෙනසසු නිවුතො ලොකො යන ප්‍රශ්නයෙහි- අවිජ්ජාය නිවුතො ලොකො-යනු විසසජ්ජනා යි; ලෝවැසිතෙමේ නීවරණයෙන් වැසීගියේමය; ඒ එසේමැයි- රහතුන් හැර සකලසත්ත්වයෝ අවිද්‍යානීවරණයෙන් යුක්තවූවෝමය; එහෙයින් "සබ්බසත්තානං"

යනාදිය වදාළයේක; එහි අවි සුගමයි- සඞ්ඝාණෙතා, කරුණු වශයෙන්- "කෙනසසු නාපජ්ඣායති" යන ප්‍රශ්නයෙහි, විච්ඡා පමාදෑ නාපජ්ඣායති" යනු විසඳන්නාහි; යම් සත්වයෙක් නීවරණ යෙන් වැසීගියේද- හෙතෙමේ සැකයට පැමිණේ; සැකකරණුයේ ඇදහියයුතු බුබාදීන් නො අදහයි; නො අදහන්නේ අකුසල් පහකිරීමටත් කුසල් සෑහැත් සෑහැත් කරගැණීමටත් උත්සාහ නො කෙරේ; හෙතෙම මෙලොව ප්‍රමාදයෙහි යෙදී කුසලධර්මයන් නො උපදවයි; ඔහු විසින් නො උපදවනලද ඒ කුශලධර්මයෝ ඔහු ලෞකික ලොකොත්තර සම්පත්තියෙන් ප්‍රකට නො කෙරෙත් මය; එහෙයින් භාග්‍යවතුන් වහන්සේ දූරෙ සන්තා ...පෙ... සන්තෙ වාහි" යනු වදාළසේක:- නිම්මණතා පබ්බතා ඉව- දුරසිටියාවූද ඇසැත්තවුන්ට පෙණියන්නාවූ හිමවත්පර්ව මෙන්; දූරෙ, දූරස්ථානයෙහි සිටින්නාවූද; සන්තානා, සත්පුරුෂයෝ; සඞ්කාසන්ති, ශීලගුණාදියෙන් ප්‍රකට වෙත්; රත්තිං, රෑ; ඛින්නා, අහසට දමනලද; සර ඝට්ඨා, ඊතල මෙන්; එත්ථ, මේ ලොකයෙහි; අසන්තානා, ගුණවිරහිත අසත්පුරුෂයෝ; නාදිසා නති, විවිකිත්සා ප්‍රමාදාදි හෙතුවෙන් සත්පුරුෂයන් විසින් නො දක්නා ලැබෙත්; තථා, ඒ පූර්වෝක්ත සත්පුරුෂයන්; කිත්තියා ච, කීර්තියෙන් ද; ඤාණෙන ච, ඥානයෙන් ද යන; ගුණෙහි, ගුණයෙන්; සඞ්ඛාතෙ සන්තෙහි, අන්‍ය සත්පුරුෂයෝ ප්‍රකටකෙරෙත්...

එසිනුදු- "කෙනසසු නාපජ්ඣායති" යන විතීය වාක්‍යයාගේ විසඳුමාව යොදා නිමවන ලද්දීය..."කිස්සානිලෙපනං බ්‍රූසි"යන ප්‍රශ්නයෙහි ජප්පානිලෙපනං බ්‍රූමි, යනු විසඳුමායි; තෘෂ්ණාව ජප්පා නමැ යි කියනු ලැබේ; ඝා, ඒ තෘෂ්ණාතොමෝ; අභිලීම්පති, ලොකයා මත්තෙහි ලිම්පනය කෙරේය යි; කත්ථං, කෙසේ නැගේ ද යත්? සෙය්‍යථා, යම්පරිදුකින් තෘෂ්ණාව අභිලෙප කෙරේ ද ඒ ආකාරය; භාග්‍යවා, භාග්‍යවතුන් වහන්සේ ආහ, "රත්තනා ...පෙ... නරං" යනුවෙන් වදාළසේක:- රත්තනා, රාගසංඛ්‍යාත තෘෂ්ණාවෙන් ඇලීගිය සත්තතෙමේ; අත්ථං, කාරණඵලය ද; නජානාති, නොදනී; රත්තනා, රාගසම්බන්ධී පුද්ගලතෙමේ; ධම්මං, පල දරණ කරුණ ද; න පස්සති, නො දක්නේ ය; සං, යම් කලෙක; රාගො, රාගතෙමේ; තමං, රජනීය වස්තූන් සොයන සත්වයා; සහතෙ, මඩනේ ද; තදා, එකල්හී; අන්ධංතමං හොති, ඔහුගේ සිත දැඩිඅඳුරු වේ...

ඝා අයං තණ්හා, ඒ මේ තෘෂ්ණාතොමෝ; ආයූහති බහු ලෙස පුණ්‍යඵලයෙහි, රූපාදි ආරම්මණයන්හි ඇල්ම බොහෝකොට

ඇති පුද්ගලයාගෙට; එවං, එසේ; අභිජප්පා ඉති, නැගිසිටින්නීය; ඉතිභවා, මේ කාරණයෙන්; තත්‍ථ, ඒ තෘෂ්ණාවෙහි; ලෝකෝ, සත්ත්වලෝකතෙමේ; අභිලිම්පතීති නාම භවති, ලිම්පිතවූයේ වේ.

මෙහි කත්‍රා යනු කරණාර්‍ථයෙහි භුම්‍ර ප්‍රත්‍යය යි. "කිංසු තස්ස ... පෙ ... විඤ්ඤජ්ජතා" යනාදිය සුගමයි. ඉති, ඒ එසේ මැ යි; සබ්බෙ සත්තා, සකලසත්ත්වයෝ; දුක්ඛස්ස, දුකට; උබ්බිජ්ජන්ති, බිය වෙත්; දුක්ඛෙන සමං, දුක හා සමවූ; ඡන්දං නාම්පි, බියක් නැත; වා පන, එසෙයින්; උත්තරිතරං, දුකට වඩා අධිකතරයෙක්; කුතෝ, කොහිද? දුක්ඛතා, දුක්ඛස්වභාවයෝ; තිස්සෝ, තුණෙක් වෙති; "දුක්ඛ දුක්ඛතාවස- සංඛාර දුක්ඛතාවස- විපරිණාම දුක්ඛතාවස- යන මොවුහු යි.

තත්‍ථ, ඒ ත්‍රිවිධ දුක්ඛතාවයන් අතුරෙන්; ලෝකෝ, ලෝවැසි තෙමේ; ඔධිසෝ, මහ්‍යීාදුවශයෙන් හෙවත් කොටස් වශයෙන්; කදාචි කරහචි, කිසි යම් කලෙක; දුක්ඛදුක්ඛතාය, සුවපරිපක්‍රම මූලිකවූ කායික දුඃඛයෙන්; මුච්චති, මිදේ; විපරිණාම දුඃඛයෙන් ද එසේ මිදේ; ඊට කරුණු කිම? "ලොකයෙහි නිරොගීවූද දීඝායුඇත්තාවූ ද- බොහෝ සත්වයෝ ඇත්තාහ; ඔවුහු නිරොගිභාවය හෙතුකොට දුක්ඛදුක්ඛතාවයෙන් මිදෙත්; දීඝායුතාවය හෙතුකොට විපරිණාමදුක්ඛයෙන් මිදෙත්; අනුපාදිශෙෂ නිර්‍වාණධාතුවෙන් සංස්කාර දුඃඛතාවයෙන් මිදෙත්; "උපාදියතීති- උපාදි උපාදිස්ස සෙසං- උපාදිසෙසං, නත්‍ථි උපාදිසෙසං එතිස්සාති-අනුපාදිසෙසා" තාය-

සවන්ති සබ්බධි ... පෙ ... පිහිතා තරං

සොතා, තෘෂ්ණා අභිධ්‍යා ව්‍යාපාදාදි කෙලෙශශ්‍රෝතයෝ; සබ්බධි, තෘෂ්ණාදීන්ට ආරම්මණවූ රූපාදි සර්‍වායතනයන්හි; සවන්ති, වහනයවෙති; සොතානං, ඒ තෘෂ්ණාදි ශ්‍රෝතයන්ගේ; කිං නිවාරණං, කිනම් ධර්‍මසමූහයක් ආවරණ වන්නේද?; සොතානං, එම ශ්‍රෝතයන්ගේ; සංවරං, ආවරණය; බ්‍රූහි, වදාළ මැනව්; කෙන, කිනම් හෙතුවකින්; සොතා, තෘෂ්ණාදි කෙලෙශශ්‍රෝතයෝ; පිහිතා, සිදියත්ද?; ආයස්මා අජිතෝ, ආයුෂ්මත් අජිත තෙමේ; ඉති, මෙසේ විචාළේය.

මෙහි පුච්ඡිතපද සතරෙකි; ඔවුහු ප්‍රශ්නදෙකෙකි; කත්‍ථමා, කුමක් හෙයින ගත්? හි, යම් හෙයකින්; ඉමෙ, මේ ගතින් ගත් කාලද සම්‍යක්ප්‍රඥා සංඛ්‍යාතවූ මේ ධර්‍මයෝ දෙදෙනා; බහාධිවචනෙන, බොහෝ කරුණු අධිකාරකොට පැවැති වචනයෙන්; පුච්ඡිතා, විචාරණ ලදහුය; එතෙසින් ම ප්‍රශ්නදෙකෙකි.

එවං සමාපන්නස්ස, එසේ ඤාති ව්‍යසනාදීවූ හෝ ප්‍රාණවධාදීවූ ඵෙහලෞකික පාරලෞකික ආපදාවෙන් සම්මාකාරයෙන් මඩනාලද්දාවූ ද; **එවං සංකිලිට්ඨස්ස**, එසේ ම ආපදාවන් නිමිත්ත කොට ඇති දසවිධ කෙලෙශවසනාවෙන් කිළිටිවූ ද, **ලෝකස්ස**, සත්ත්වයාගේ; **වොදානං**, පිරිසිදුව ද; **වුට්ඨානං**, වුට්ඨානසඞ්ඛ්‍යාත මාගීඵද; **කිං ඉති**, කිමෙක්දැ යි- විචාරයි; "වොදයති සුජ්ඣති එතෙනාති- වොදානං; **සමථවිපස්සනා**; වුට්ඨාති එතෙන නිමිත්ත තො පවත්තිතො වාති- වුට්ඨානං; **අභිසමයෙහා**, "සවනති සඞ්ඛධි සොතා" යන්නෙහි; **අභිජ්ඣා බ්‍යාපාද ඛහුලස්ස**, කාමච්ඡන්ද බ්‍යාපාදයන් අධිකකොට ඇත්තාවූ; **අසමාහිතස්ස**, නානාරම්මණයන්හි වික්ඛිත්ත චිත්තසන්තාන ඇත්තාහට; **සවන්ති**, පවතිත්; "තත්ථ ඣානාදිඵෙහි පටන්- ඉදං වුට්ඨානං" යනු අවසන්කොට සුගමයි.

තත්ථ විස්සජ්ජනා- යානි -පෙ- පිපිහරෙති.

"අජිත ලොකසම්මිං යානි සොතානි සවන්ති තෙසං සොතානං නිවාරණං සති- තමෙව සතිං තෙසං සොතානං සංවරං බ්‍රූමි එතෙ පඤ්ඤාය පිපිහරෙ- ඉති භගවා ආහ" යනු යොජනාය.

තෙසං සොතානං, ඒ තෘෂ්ණා ආදි ස්‍රොතයන්ගේ; **නිවාරණං**, වැලැක්මට හේතුවූයේ; **සති**, කුශලාකුශල ධර්මයන්ගේ ගතිය මොනවට සොයන්නාවූ විදර්ශනා සම්ප්‍රයුක්ත සමාධි තොමෝය; **පඤ්ඤාය**, රූපාදි ආරම්මණයන්හි අනිත්‍යාදීන්ගේ ප්‍රතිවෙධය සිඳකරන ඥාණප්‍රඥාවෙන්; **පිපිහරෙ**, පහළවන්ට නොදීම් වශයෙන් මුල්සිඳ හරණ්නුය.

කායගතාය සතියා, කායගියාසී; **භාවිතාය**, බැවුකලැ; **බහුලීකතාය**, බෝකළකලැ; **චක්ඛු**, ඇහැදැස; **මනාපිය්‍යෙසු රූපෙසු**, මනවඩන රූපාරම්මණයන්හි; **න ආවිඤ්ඤති**, සිත් සතන් හෝ පුඟුලා ඇද නොගනී; **අමනාපිය්‍යෙසු**, මනනොවඩන රූපාදීන්හී; **න පටිඝඤ්ඤති**, නොහැපේ; (සොතාදියද මෙසේමැයි,) **කෙන කාරණෙන**, කිනම් හෙතුවකින්ද?; **ඉන්ද්‍රියානං**, ඉඳුරන් තමා; **සංවුතනිවාරිතත්තා**, සංවරණයෙන් වලකාලූ බැවිනි; **කෙන**, කුමකින්; **නු**, ඒ ඉඳුරෝ; **සංවුතනිවාරිතා**, සංවරණයෙන් නිවාරණය කරන ලද්දෝදැ?; **සතිආරක්ඛෙන**, සිහියෙන් රැකීමෙනි; **පඤ්ඤාය**, මාගීඥානයෙන්; **අනුසයා**, කාමාදි අනුශය කෙලෙශයෝ; **පහීයන්ති**, පහවෙත්; අනුශය ප්‍රහාණයවූකලැ, **පරියුට්ඨානා**, නැවත නැවත නැගී සිටින කෙලෙස් පහවෙත්; **කිස්ස**,

කිඤ්චි හෙතුවිකින් ද යත්? අනුසයස්ස අප්පහීනත්තා, අනුසය පහවූ බැවිනි; තං සත්තා, හේ මෙසේ දනයුතු:- ඛණ්ඩවණ්ණස්ස රුක්ඛස්ස, කඳැනි තරුහුගේ; අනවසෙසසමූලුබ්බණේ කතෙ, සියලු මුල් උදුරාදැමීම කළ කලැ; පුප්ඵඵලූ පල්ලවඛුර සන්තති, මල්පල ළපලු අඟුරු පරම්පරාව; සම්මුච්ඡිතත්තා භවති, අතිසයින් සුන්වූවා වේ ද; එවං -පෙ- හොන්තු, එපරිදිදෙන් අනුසය ප්‍රහාණ වූකලැ; (පඤ්ඤාහතසන්තතියෙ,-නැවත නැවත නැඟී සිටින කෙලෙස් පරපුර; සම්මුච්ඡිතත්තා, අතිසයින් සුන්වූවා; ඡිදනිතා, විසතලද්දී; පටිච්ඡන්නත්තා භවති, පිළිසන්වූවා වේ; කත්ථ, කුමකින් ද යත්?, පඤ්ඤාය, ප්‍රඥාවෙනි; "තෙත්තාහ -පෙ- රෙති" මෙ කී ප්‍රශ්නවිසඳ ජිනයන්හි තෘෂ්ණාදි ස්‍රොතයන්ගේ සංවරණය හා වසාලීම නොදන්නහු විසින් හෝ එහි සැකැත්තහු විසින්හෝ සංවරණය හා වැසීම විවාළයුතු බැවින් ධම්මාධිට්ඨාන පුච්ඡාය හි- පුච්ඡාවිච්ඡය ද- සමෘති ප්‍රඥාවන් විසඳලියයුතු බැවින් ධම්මාධිට්ඨාන විස්සජ්ජනාය හි- විස්සජ්ජනාවිච්ඡය ද දනයුතු; එහි ප්‍රශ්නයන් අතුරෙහි ද- "කෙනස්සු නිවුතෝ ලෝකෝ" යනාදි ප්‍රශ්නය- නීවරණ- විචිකිච්ඡා- පමාද- ජපප- යන මොවුන්ගේ වශයෙන් සිව්වැදෑරුම්වූයේ ද- ලොකාධිට්ඨාන වශයෙන් එකම ප්‍රශ්නය හි- කියනලදි; එසේ ඇතිසලැ "සවන්ති සබ්බධි සොතා" යනාදි ප්‍රශ්නය ද- සංවර පිධානයන්ගේ වශයෙන් දෙවැදෑරුම්වූයේ ද- එකාථී වශයෙන් ගන්නා ලද්දාහුගේ අධිට්ඨාන වශයෙන් එකම ප්‍රශ්නය හි කියයුතුය- නොමෙහෝ ස්‍රොතයන් බොහෝ බැවින් බහුප්‍රශ්නය හි ද කියයුතුය; එසේ ස්‍රොතයන් ආවරණය නො කොටැ සංවර පිධානයන්ගේ වශයෙන් "සවන්ති සබ්බධි සොතා" යනාදියෙහි දෙපැනෙහි හි කියනලදි; ඒ අනුසාරයෙහා ම "කෙනස්සු නිවුතෝ ලෝකෝ" යනාදියෙහි ද- ලොකාමිෂාණය නොකොට නීවරණාදි චතුර්විධ ධම්මයන්ගේ වශයෙන් සිව්පැනක් හි ද කියයුතුය- යනු නයදැක්වීනයි.

තවද දෙශනා නාලුයෙහි කියනලද ධම්මයාගේ අග්‍රහණිග්‍රහණය නොකොට තමාවිසින් රචනාකරනලද නියාමයෙන් ම විවාරයි; ප්‍රශ්නය පිළිබඳව පැනක් නො තබා ප්‍රතිඥ ද නො කොට හදුල ධම්මයාගේ අනුසන්ධිග්‍රහණය කිරීමෙන්ද විවාරයි; එහෙයින් ඒ ධම්මයාගේ අනුසන්ධි පුච්ඡාවිච්ඡයාකාරය දක්වන්ට "පඤ්ඤාය චෙව සතී ච" යනාදි ගය දැක්වූහ.

පඤ්ඤාය චෙව -පෙ- උපරූපක්ඛතීති.

මාදිස, නිදුකාණන් වහන්ස; සඤ්ඤාවෙව, "යම්බදු ප්‍රඥාව කින් අනුඥය ප්‍රහාණයෙන් ශ්‍රොතනිරොධය කියනලදද ද" ඒ මේ ප්‍රඥාව ද; සතීව, "යම්බදු සමාධියකින් පරියුඨාන ප්‍රහාණයෙන් ශ්‍රොතනිරොධය කියනලදද" ඒ මේ සමාධියද; නාමඤ්ච, ඒ ප්‍රඥා සමාධීන් හා පහළවූ අවශෙෂ නාමධර්ම ද; රූපඤ්ච, රූපසමූහයාද; ඉමං, මෙ කී ඔහුල්ල; කඞ්ඛී, කොතැන්හිදී; උපරුජ්ඣති, නිරුඬ වන්නේ ද? යන- ඉමං, මේ කරුණ; භෝ, මාවිසින්; පුච්ඡථ, පුළුවුස්නාලද- හාග්‍යවතුන් වහන්සේ; සඛ්‍රෑහි ඉති, වදාළමැනවැයි; ආයස්මා අජිතෝ, ආයුෂ්මත් අජිතතෙමේ විචාළේය.....

අජිත, එවඞ්ඛා අජිතය, ඉමං ඉමං පඤ්හං, යම් මේ පැනක්; මං අපුච්ඡි, මා විචාළේ ද; කිං, කට; ඉමං, ඒ පැන; වදාමි, කියමි; ඉමස්මිං, යම් අනුපාදිශෙෂ නිර්‍වාණ ධාතුවෙක්හි; විඤ්ඤාණස්ස, ප්‍රතිසන්ධි විඤ්ඤනයාගේ; නිරෝධෙඛෝ, ඉදිරිපසු නොවැ එකෙණෙහි නිරුඬවීමෙන්; නාමඤ්ච, නාමයත්; රූපඤ්ච, රූපයත්; අවසෙසං නිරවශෙෂව; උපරුජ්ඣති, නිරුඬවන්නේ ද; එත්ථ, මේ අනුපාදිශෙෂ නිර්‍වාණය ගොචරකොටගෙන; ඉමං, මේ නාමරූපවය; උපරුජ්ඣතීති ඉති, නිරුඬවන්නේය-යි වදාළසේක; අයං, මේ ආයුෂ්මත් අජිතතෙමේ; පඤ්හං, මේ ප්‍රශ්නයෙහි ලා; අනුසන්ධිං පුච්ඡති, අනුසන්ධි විචාරයි; අනුසන්ධි විචාරනුයේ කුමක් විචාරන්නේ ද යත්? අනුපාදිශෙෂ නිර්‍වාණ ධාතුව හා නිරුඬකටයුතුවූ සඞ්ඛතවූ දුක්ඛ සමුදය මඟඟ සංඛ්‍යාතවූ තුන් සස් ද විචාරයි, නිරොධසත්‍යය අසංඛතවන්නේය, ඒ තුන් සස් අතුරෙහි සමුදයසත්‍යය දස්සනභූමියෙහි හා- භාවනාභූමියෙහි ද යන විභූමියෙහිදී පහවන්නේය; දර්‍ශනභූමියෙහිදී "සක්කායදිට්ඨි- විචිකිච්ඡා- සීලබ්බත පරාමාස" යන ත්‍රිවිධ සංයොජනයෝ පහවෙත්; භාවනා භූමියෙහිදී "කාමච්ඡන්ද- ව්‍යාපාද- රූපරාග- අරූපරාග- මාන- උද්ධච්ච- අවිජ්ජා" යන සපතසංයොජනයෝ නිරවශෙෂයෙන් පහවෙත්; සංයොජනඅන්ට ගොචරවූ- කාම රූපාරූපසංඛ්‍යාත තෙධාතුක ලොකයෙහි මෙකී දසවිධ සංයොජනයෝ ඔරම්භාගිය පසෙක් ද උඩමහාගිය සසෙක්දැ යි දසයෙක් වෙති; ඒ දසසංයොජනඅන් අතුරෙහි සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බත පරාමාස යන තුණ "තමන් පෙර අවබොධ නොකරකලද නිර්‍වාණධර්මය අවබොධ කරන්නෙමි යි- උපදනා ඥානය ප්‍රධානකොට ඇති අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියඤාණ සහායකොට ඉවා නිරුඬවෙති; (කාමච්ඡන්ද ව්‍යාපාද- රූපරාග- අරූපරාග- මාන- උද්ධච්ච- අවිජ්ජා- යන සත විතිය- තෘතීය- චතුර්‍ථ- මාගීත්‍රයෙහි හා ප්‍රථම- විතීය- තෘතීය- ඵලත්‍රයෙහි ද- උපදනා අඤ්ඤින්ද්‍රිය ඥාන සහාය කොට නිරවශෙෂයෙන් නිරුඬවෙත්.....

යං පන, යම්බඳු ඉන්ද්‍රිය ඥානයක් හෙතුකොට ගෙන; **මේ**, "සම්මුතිසච්චවසයෙන් මාගේ ය යි සම්මතවූ පරමාර්ථ සත්‍යහෙයින් නියකජාතිනාමසංඛ්‍යාත- සකාත්මපඤ්ඤත්තිය පිළිබඳවූ හෝ" මාගේ; **ජාති**, සකාත්මප්‍රාතුර්භූත සංඛ්‍යාත ජාතිතොමෝ; **බිණ්ණා ඉති**, අනුත්පාදනිරෝධ වශයෙන් ගෙවීගියා ය යි; **එවං**, මෙසේ **ජානාති**, දනීද; **ඉදං**, මෙකී ඥානහෙතුක ඉන්ද්‍රිය ඥානය; **ඛයෙ ඤාණං**, ජාතික්ෂය සංඛ්‍යාත අර්හත්වයෙහි පැවැති ක්ෂයඥාන නම්; **ඉමස්ස නාණස්ස**, මේ ජාතිසභාවය පිණිස නොහොත් මේ සොළොස්කිස පිණිස; **අපරං**, අන්‍යසකනම් පඤ්ඤත්තියෙක්; **න ඉති**, නොවන්නේය යි, **පජානාති**, ප්‍රත්‍යවෙක්ෂා ඥානයෙන් දන්නේද; **ඉදං** මෙබඳුවූ ඉන්ද්‍රියඥානය; **අනුප්පාදෙ ඤාණං**, නැවත පිළිසිඳ ගැනීම වළකාලන රහත්පලෙහි පවත්නා ඥාන නම්; **ඉමානි තීණි ඤාණානි**, කෘත්‍යභෙද හෙයින් දෙවැදෑරුම්වූ මේ ඥානයෝ; **අඤ්ඤාතාවින්ද්‍රිය නම්**; **තත්ථ**, ඒ ඉන්ද්‍රිය ඥානයන් අතුරෙහි; **සඤ්ඤං**, **අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය සංඛ්‍යානං**වූ; යම්ඥානයක් වේ ද; **සඤ්ඤං**, **අඤ්ඤින්ද්‍රිය සංඛ්‍යානං**වූ; යම්ඥානයක් වේ ද මේ ඥානයෝ දෙදෙන; **අග්ගඵලං**, අග්‍රඵල සංඛ්‍යාතවූ; **අරහත්තං**, රහත් බවට; **පාපුණනත්ථං**, පැමිණෙන්නහුගේ නොහොත් පැමිණෙන කල්හි; **නිරුජ්ඣනත්ථි**, නිරුඬවෙත්; එහිදු "යම් ක්ෂයඥානයක් වේ ද යම් අනුත්පාද ඥානයක් වේ ද- මෙකී ඥානයෝ දෙදෙනා-සභාව වශයෙන් එකම ප්‍රඥාවකි- එසේ ද වුවත් අරමුණු සලකුණු වශයෙන් නාමවශයක් ලබත්.

"බිණ්ණා මෙ ජාති" යනු දන්නාහට පහළවන ඥානය; **ඛයෙ ඤාණං**, යන නාමයද "නාපරං ඉත්ථත්තාය" යනු දන්නාහට පහළවන ඥානය; **අනුප්පාදෙ ඤාණං**, යන නාමයද ලබන්නේය; **සා**, ශ්‍රොතපිඨාන කෘත්‍යසාධකවූ ඒ ප්‍රඥතොමෝ; **පජානනාකාරෙන**, ප්‍රකාරයෙන් ජානනාථ හෙයින්; ප්‍රඥනම්; යථාක්‍රමයෙන් නුවණින් දක්නාලද අරමුණට; **අභිලාපනාකාරෙන**, බැසගන්නා හෙයින්- සතිනම්; "පඤ්ඤුවෙව සති ච" යනු අනුසන්ධි පුච්ඡායෙහි විවාදලක්ෂණ මෙකී නයින් දතයුතු.

"අනුසන්ධියති දෙසනා එතායාති- අනුසන්ධි" අනතුරුගයෙහි දැක්වූ පරියුට්ඨානානුසයපහාණ කෘත්‍යයන් හා ප්‍රඥාසමාධීන් ගලපා විවාළහෙයින්ද මෙම පැන **අනුසන්ධිපුච්ඡා** නම්.

අනාශ්‍රිත සම්මාශ්‍රවයාගේ; චලිතං නත්ථි, කම්පාවෙක් නැත; චලිතෙ අසති, කම්පාවක් නැතිකලැ; පස්සද්ධි, කායචිත්තයන්ගේ බරහැරීම වේ; පස්සද්ධියා සති, කායචිත්තයන්ගේ බරහැරීම ඇති කලැ; නති නතොති, රූපාදි ආරම්මණයන් කෙරෙහි නැමීමක් නෙවත් ඇලීමක් නොවේ; නතියා අසති, එබඳු නැමීමක් ඇලීමක් නැතිකලැ; ආගති නති ගති න ඤායති, පරලොවින් මෙලොවට ඒම හෝ මෙලොවින් පරලොවට පැමිණීම හෝ නොවේ; ආගතිගතියා අසති, පරලොවින් මෙලොවට ඒමක් හෝ මෙලොවින් පරලොවට යාමක් හෝ නැතිකලැ; චුතූපපාතො න ඤායති, මරණය හා උපපත්තියක් නොවේ; චුතූපපාතෙ අසති, චුති උපපත්තියක් නැතිකලැ; ඉධ, මේ නිරයකජ්ඣත්තත ඝළායතනයන් කෙරෙහි; තතව, මමය මාගේ යයි බැලීමක් නොවේ මය; නහුරං, බාහිරවූ ඝළායතනයන් කෙරෙහිද එසේ බැලීමක් නොවේ; න උභයමන්තරෙන, අජ්ඣත්තිත බාහිර උභයායතනයන් අතරෙහිවූ එසස-විඤ්ඤාණ-වෙදනා-සඤ්ඤා-චෙතනා ආදි ධර්මයවූ භයා කෙරෙහි ද එසේ බැලීමක් නොවේ; දුක්ඛස්ස, වෘත්තදුක්ඛයාගේ; අත්තනා, කෙළවර; ඒවෙසා එව ඉති, ආත්මදෘෂ්ටියෙන් මේ නොබැලීමමැ යි වදළසේක.

"නිස්සිතස්ස චලිතං" යනමෙහි නිශ්‍රයනම් - තෘෂ්ණානිශ්‍රය-දෘෂ්ටිනිශ්‍රය යි දෙවැදෑරුම් වේ. ඒ දෙවැදෑරුම් නිශ්‍රයන් අතුරෙහි රූපාදි ආරම්මණයන්හි ඇළෙනුතැනැත්තාගේ යම් තෘෂ්ණාවෙත නාවක් වේද මේ තෘෂ්ණානිශ්‍රය නම්. අරමුණෙහි මුළාවූවහුගේ යම් ලොභසහගත චෙතසිකයක් වේද මේ දෘෂ්ටිනිශ්‍රය නම්. එකී ලොභසහගත මොහසහගත චෙතසිකය වනාහී සංඝකාරයි.

සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං පෙ එවං සමුදෙති පච්චයසමුප්පාදෙ මේ පච්චයසමුප්පාද යෙන් ඔතරණයි. එහි අරමුණෙහි ලොභයෙන් ඇළෙනහුගේ යම් සොමනස්ස වෙදනාවක් වේද මේ සුඛාවෙදනා නම්, අරමුණෙහි මුළාවූවහුගේ යම් උපෙක්ඛා වෙදනාවක් වේද මේ අදුක්ඛමසුඛා වෙදනා නම්, මෙකී වෙදනාවය බෙදනාසකසයි. මේ සකසයෙන් ඔතරණයි. ඒ වෙදනාවන් අතුරෙහි සුඛාවෙදනාව සුඛින්ද්‍රිය සොමනස්සින්ද්‍රිය යන ඉන්ද්‍රියවයෙකි, අදුක්ඛමසුඛාවෙදනාව උපෙක්ඛින්ද්‍රියයි, මේ ඉන්ද්‍රියයෙන් ඔතරණයි. එම ඉන්ද්‍රිය යෝ සංඝකාරසකසයෙහි ඇතුලත්වූවෝය, සාඤවූ භවචක්‍රයාගේ අවයවවූ යම් සංඝකාරයෝ වෙත්ද ඒ සංඝකාරයෝ ධර්මධාතුවෙහි සඞ්ග්‍රහකරන ලද්දේය, මේ ධාතුධර්මයෙන් ඔතරණයි.

ඒ ධම්මධාතුතොම සාසවවු භවාඞ්ගවූ ධම්මායතනයෙහි ඇතුළත් වූවාය, මේ ආයතනයෙන් ඔතරණයි. "අනිසසිතසස චලිතං නත්ථි" යන මෙහි සමඵභාවනා වශයෙන් තෘෂ්ණාව විසින් හෝ ආශ්‍රය නොකරන ලද්දේය, විදර්‍ශනාභාවනාවශයෙන් දෘෂ්ටිය විසින් හෝ ආශ්‍රය නොකරන ලද්දේය, එහි යම් විදර්‍ශනාවක් වේද මේ විඤ්ඤාණයයි, විඤ්ඤාණපාදකහෙතුවෙන් අවිඤ්ඤාණිරොධවේ.

අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධෝ පෙ එවං සබ්බා පටිච්චසමුප්පාදෙ මේ පටිච්චසමුප්පාදශයන් ඔතරණයි. එම විදර්‍ශනාව ප්‍රඥාසඤ්ඤියි, මේ සඤ්ඤායෙන් ඔතරණයි.

එම විදර්‍ශනාව විරිසින්ද්‍රිය- පඤ්ඤින්ද්‍රිය- යන ඉන්ද්‍රියවශයකි. මේ ඉන්ද්‍රියයෙන් ඔතරණයි. එම විදර්‍ශනාව ආශ්‍රව රහිතවූ භවාඞ්ගරහිතවූ සංසකාරසඤ්ඤායෙහි ඇතුළත් වේ ඒ සංසකාරයෝ ධම්මධාතුවෙහි සඞ්ග්‍රහකරන ලදහ, මේ ධාතුධම්මයෙන් ඔතරණයි. එම ධම්මධාතුව ආශ්‍රවරහිතවූ භවාඞ්ගරහිතවූ ධම්මායතනයෙහි ඇතුළත් වේ, මේ ආයතනයෙන් ඔතරණයි.

සඤ්ඤා සති- යන මෙහි කායිකවූද චෙතසිකවූද සී පසස්ඝිය දෙවැදෑරුම් වේ, කායිකවූ හෙවත් වෙදනා-සඤ්ඤා-සඞ්ඛාර යන සඤ්ඤිත්‍රයෙහි එලොපවාර වශයෙන්වූ යම් සුඛයක් වේද මේ කායපසාදයි, එසේම චෙතසිකවූ (සිතෙහිවූ) යම් සුඛයක් වේද මේ චිත්තපසාදයි, බරහැරීගිය නාමකය ඇත්තේ සුවවිදී, සුවඇත්තහුගේ සිත සමාධියෙහි පිහිටයි, සමාහිතවූයේ සවී සංසකාරයන් තත්වූ පරිදිම දනී, තත්වූපරිදි දන්නේ සවී සංසකාරයන් කෙරෙහි කලකිරේ, සංසකාරයන් කෙරෙහි කලකිරෙනුයේ එහි නොඇලී දුරැවෙයි, නොඇලීමෙන් තෘෂ්ණාවෙන් මිදේ, විමුත්තවූකලැ විමුත්තඤ්ඤේවම් සී පච්චවෙක්ඛණඤාණය පහළවේ, සඤ්ඤාප්‍රාදුර්භූත සඞ්ඛ්‍යාතජාතිය ක්ෂය වූවාය, මාගී බ්‍රහ්මචරියාව වැස නිමවන ලද්දේය, සිව්මගින් කටයුතු සොළොස්කිස කොටැ නිමවන ලද්දේය, සිව්මගින් කටයුතු මේ සොළොස්කිස පිණිස නොඇතත් මේ කෙලෙසක්ෂය පිණිස අන්‍යසඤ්ඤා පඤ්චකයක් නැතැයි දනී.

ඒ සම්මාඤාණවතෙමේ රූප වශ මොහයන් ක්ෂයකළ හෙයින් රූපාරම්මණයන්හිද ශබ්දාරම්මණයන්හිද ගන්ධාරම්මණයන්හිද රසාරම්මණයන්හිද සඵශාරම්මණයන්හිද ධම්මාරම්මණයන්හිද නොනැමේ. යම්බඳු රූපූපාදානයකින් යුක්තව ජරාකාලවශයෙන් සිටින්නාවූද චුතිඋපපත්ති වශයෙන් ඇඟිරෙන්නාවූද

සබ්බා ඒ ඒ ආකාරයෙන් පණවන තැනැත්තේ පණවන්නේද එබඳු රූපූපාදානයාගේ ක්ෂයකිරීමෙන් නොඇලීමෙන් නිරුඩ කිරීමෙන් හැරීමෙන් වෙසෙසින් දුරලීමෙන් රූපසංඛ්‍යාත නිමිත්ත කොට ගෙන අනුපාදාපරිනිබ්බාණ වශයෙන් මිදුනාවූ ක්ෂීණාශ්‍රව සත්ත්වයෙමේ, අත්ථිපි, තථා හා ලොකස්ස භාසිත වශයෙන් පවත්නේය සි ද; න උපෙති, තණ්හාදිට්ඨුපාදානයෙන් නොගනී; නත්ථිපි, තථා හා ලොකස්ස උච්ඡේද භයසින් නැත්තේය සි ද; න උපෙති, තණ්හාදිට්ඨි උපාදානයෙන් නොගනී; අත්ථි නත්ථිපි, එකච්චසස්සත වශයෙන් ඇතැ සි නැතැ සි ද; න උපෙති, තණ්හාදිට්ඨි උපාදානයෙන් නොගනී; නෙවත්ථි නත්ථිපි, අමරාවික්ඛේප වශයෙන් ඇතිනොවෙයි නැතිනොවෙයි ද; න උපෙති, තණ්හාදිට්ඨිඋපාදානයෙන් නොගනී; අථෙඛා, යළිදු; තථිභාවා, ප්‍රකටභාව හෙතුක ක්ලේශයන්ගේ අභාවයෙන් හැඬුරුවූයේය; අප්පමාණසීලා, සත්ත්වරිත ප්‍රමාණකරන ක්ලේශ රහිත නෙයින් හෝ ප්‍රමාණකළ නොහැකි අග්‍රඵල ගුණසමූහයෙන් යුක්තානෙයින් අප්‍රමෙය්‍යවූයේය; අසංඛ්‍යසීලා, සඞ්ඛ්‍යා කළහැකි නෙළෙස් රහිත හෙයින් හෝ සඞ්ඛ්‍යාකළනොහැකි ගුණැතිහෙයින් අසඞ්ඛ්‍යෙය්‍යවූයේය; නිබ්බුතා, අග්ග ඵනාදි වශයෙන් ගන්නාවූ තණ්හාදිට්ඨිආදි ක්ලේශයන්ගේ ව්‍යපශමභාවයෙන් නිවීගියේය; ඉති එව, මෙසේම; සඞ්ඛං ගච්ඡති, සඞ්ඛ්‍යාවට යේ; කුමක්හෙයින්නම්? රාගදෙෂමොහයන් ක්ෂයකළහෙයිනි.

යාය වෙදනාය පෙ යාය සඤ්ඤාය පෙ යෙහි සඞ්ඛා රෙහි පෙ යෙන විඤ්ඤාණෙන පෙ ඛයා මොහසස මෙකිවාර චතුෂ්කයද රූපවාරය මෙනි.

ආගති- යනු ප්‍රත්‍යක්ෂ සකකිපඤ්චකයට ය්මයි; ගති- යනු පරලොවට යාමයි, එම ක්ෂීණාශ්‍රවයාගේ ආගතිනතීනුද නොවෙත්, **නෙව්ඛ**-යනු අජ්ඣත්තික සළායතනයන්හිය; නහුරං-යනු බාහිරවූ සළායතනයන්හිය, **න උභයමන්තරෙන**- යනු සපශී යහෙතුකොට පහළවූ ධර්මයන් කෙරෙහි ආත්මයක් නොදක්නේය, **එවමෙතස්ස දුක්ඛස්ස**- යන මේහි පටිච්චසමුප්පාදය කියනලදී, ඒ පටිච්චසමුප්පාදතෙමේ ලෞකිකය ලොකොත්තර යයි දෙවැදෑරුම් වේ; එහි "අවිජ්ජාපච්චයා සඞ්ඛාරා" යනු පටන් "ජරාමරණං" යනු අවසන්කොට වදාරණලද්දේ ලෞකික පටිච්චසමුප්පාද සි, **සීලවතෝ අවිප්පටිසාරාදි ජායති**-යනු පටන් "නාපරං ඉත්ථත්තායාති පජානාති" යනු අවසන්කොට වදාරණලද්දේ ලොකුත්තර පටිච්චසමුප්පාදසි, එහෙයින් භාග්‍යවතුන් වහන්සේ

"නිස්සිතස්ස චලිතං අනිස්සිතස්ස චලිතං නත්ථි ...පෙ... එවෙ වෙන්නා දුක්ඛස්ස" ඉති වදන්තේන ...

යෙ කෙචි සොකා ...පෙ... ලොකෙ'ති ...

ලොකස්මිං, සත්තලොකයා කෙරෙහි; සෙ යොච් සොකා වා, යම් කිසි සොකයෝ හෝ; පරිදෙවිතා වා, යම් කිසි පරිදෙවයෝ හෝ වේද්ද; අනෙකාකාරූපං, අනෙකාකාරවූ; දුක්ඛඤ්ච, යම් කිසි දුකක් හෝ වේද; එවෙව, මෙකී සොකාදිහු; පියං පටිච්ච, ප්‍රියවූ වස්තූන් නිසා; පභවන්ති, පහළවෙත්; පියෙ අසතෙන, ප්‍රියවස්තු අවිද්‍යමානකල; එවෙව, මේ සොකාදිහු; න භවන්ති, නොවෙත්; තස්මා එතෙහින්; සෙඛස්ස, පහවූ සොතඇති යම් පුද්ගලයන්ගේ; ලොකෙ, ලොකයෙහි; කුහිඤ්චි, කිසිවක් කෙරෙහි; පියං නත්ථි, ප්‍රිය භාවයක් නැත්තේද; ඉති, එනෙයින්; සෙ, ඒ සඞ්ඛ්‍යෝ; සුඛි තෙනා, සුවපත්වූ; විතසොකා, පහවූ සොකඅත්තෝ වෙති; ඨාසමා, එහෙයින්; අසොකං, සොකරහිතවූ; විරජං, රාගාදි රජොරහිතවූ නිර්වාණය; පත්ථය තෙනා, පතන්නතැනැත්තේ; ලොකෙ කුහිඤ්චි, ලොවැ කිසිවක් කෙරෙහි; පියං න කයිරාථ, ප්‍රිය නොකරන්නේයයි වදන්තේක ...

මෙහි "යෙ කෙචි සොකා ...පෙ... පභවන්ති එතෙ" යන මේ දුක්ඛා වෙදනායි, "පියෙ අසතෙන න භවන්ති" යන මේ සුඛා වෙදනායි, මේ වෙදනාවය වෙදනාසඞ්ඛන්ධයි, මේ සඞ්ඛන්ධයෙන් ඔතරණයි ...

"වෙදනාපච්චයා තණ්හා ...පෙ... එවං සබ්බං" මේ පටිච්චසමුප්පාදයෙන් ඔතරණයි ... එහි සුඛාවෙදනාව සුඛින්ද්‍රිය සෞමනස්සින්ද්‍රිය වශයෙන් ඉන්ද්‍රියවෙයි, දුක්ඛාවෙදනාවද, දුක්ඛින්ද්‍රිය දෞමනස්සින්ද්‍රිය වශයෙන් දෙකෙකි, මේ ඉන්ද්‍රිය ධර්මයෙන් ඔතරණයි ... එම ඉන්ද්‍රියයෝ සාස්‍රවවූද භවාඞ්ගවූද සංස්කාරස්කන්ධයෙහි ඇතුළත්වූහ; ඒ සංස්කාරයෝ ධර්මධාතුවෙහි සඞ්ග්‍රහවූහ; මේ ධාතුධර්මයෙන් ඔතරණයි ... ඒ ධර්මධාතුව සාස්‍රව භවාඞ්ගවූ ධර්ම, ආයතනයෙහි ඇතුළත්වියි; මේ ආයතනයෙන් බැසගැනීමයි ...

තස්මා හි තෙ සුඛිනො විතසොකා ...පෙ... කුහිඤ්චි ලොකෙ -යන මෙය තෘෂ්ණාප්‍රහාණයි, "තණ්හානිරොධා උපාදාන නිරොධො ...පෙ... එවං සබ්බං" මේ පටිච්චසමුප්පාදයෙන් බැසගැනීමයි ... එම තෘෂ්ණාප්‍රහාණය සමථයි, ඒ සමථය සතින්ද්‍රිය සමාධින්ද්‍රිය වශයෙන් ඉන්ද්‍රියවෙයි, මේ ඉන්ද්‍රිය ධර්මයෙන් ඔතරණයි ...

ඒ සමථයම සමාධිසඤ්ඤියි, මේ සඤ්ඤියෙන් ඔතරණෙයි. එම සමථතෙමේ ආශ්‍රවරහිතවූ භවාඞ්ගරහිතවූ සංසකාරසඤ්ඤියෙහි ඇතුළත් වේ, ඒ සංසකාරයෝ ධම්ධාතුවෙහි සඞ්ග්‍රහ කරණලදහ, මේ ධාතුධම්යෙන් ඔතරණෙයි. ඒ ධම්ධාතුව අනාසවවූ භවාඞ්ගරහිතවූ ධම්ආයතනයෙහි ඇතුළත්විය, මේ ආයතනයෙන් බැඳගැනීමයි.

'තෙනාහ භගවා:- "යෙ කෙචි සොකා"නි.

"කාමං කාමයමානස්ස" යනාදි ගාථාත්‍රයෙහි පදවී දෙශනාහාර විභඞ්ගයෙහි කියනලදමැයි, එහි යම් ප්‍රිතිමනත්වයක් වේද මේ අනුනය නම්. "සල්ලවිද්ධොව රුප්පති"යි- යමක්කිඳ මේ ප්‍රතිඝයි, අනුනයත් ප්‍රතිඝයත් තෘෂ්ණාවට පක්ෂයි, තෘෂ්ණාවට වනාහි දශවිධරූපවත් ආයතනයෝ පදවඩානයි, මේ ආයතනයෙන් ඔතරණෙයි.

එම දශවිධරූපවත් ආයතනයෝ නාමයෙන් මිශ්‍රවූ රූපකඃ ය යි, තත්වය නාමරූපයි, "නාමරූපපච්චයා සළායතනං -පෙ- එවං සබ්බං" මේ පටිච්චසමුප්පාදයෙන් ඔතරණෙයි. එම නාමරූපය පඤ්චවඤ්ඤාණයි, මේ සඤ්ඤියෙන් ඔතරණෙයි. එම නාමරූපය අවශ්‍රොස්ධාතුයි, මේධාතුන් කරණකොටගෙන ඔතරණෙයි.

එහි යම් රූපකයෙක් වේද මේ රූපවත්වූ පඤ්චේන්ද්‍රියයෝයි, මිශ්‍රවූ යම් නාමකයෙක් වේද මේ අරූපවත් පඤ්චේන්ද්‍රියයෝ යි, මේ දශෙන්ද්‍රියයෝ යි, මේ ඉන්ද්‍රියයන් කරණකොටගෙන ඔතරණ යි. එහි "යෙ කාමෙ පරිවජ්ජෙති -පෙ- සම්තිවත්තති"යි, යමක් වදාළේද මේ සෙෘපාදිශෙෂ නිර්‍වාණධාතු යි, මේ ධාතුන් කරණකොටගෙන ඔතරණෙයි.

එම සෙෘපාදිශෙෂ නිර්‍වාණධාතුව විද්‍යා නම්, "විජ්ජුප්පාදා අවිජ්ජානිරොධා -පෙ- එවං සබ්බං" මේ පටිච්චසමුප්පාදයන් කරණකොටගෙන ඔතරණෙයි. එම විද්‍යාව ප්‍රඥාසඤ්ඤයි, මේ සඤ්ඤියන් කරණකොටගෙන ඔතරණෙයි. එම විද්‍යාව විරිසිඤ්ඤිය පඤ්චින්ද්‍රිය යන ඉන්ද්‍රියවයෙකි, මේ ඉන්ද්‍රියයන් කරණකොට ගෙන ඔතරණෙයි.

එම විද්‍යාව අනාසවවූ භවාඞ්ගරහිතවූ සංසකාරසඤ්ඤියෙහි ඇතුළත්ය, ඒ සංසකාරයෝ ධම්ධාතුවෙහි සඞ්ග්‍රහකරණලදහ; මේ ධාතුන් කරණකොටගෙන ඔතරණෙයි. ඒ ධම්ධාතුව අනාසවවූ භවාඞ්ගරහිතවූ ධම්ආයතනයෙහි ඇතුළත්ය, මේ ආයතනයන් කරණකොටගෙන ඔතරණෙයි. "තෙනාහ භගවා කාමිං කාමෙ ඡාහසස්"නි.

එත්තාවතා, මෙ පමණකින්; **පටිච්චසමුප්පාද- ඉන්ද්‍රිය-ඛන්ධ-ධාතු-ආයතනානි**, පටිච්චසමුප්පාද- ඉන්ද්‍රිය-ඛන්ධ-ධාතු-ආයතනයෝ; **සඞ්ගහසරණා තරණානි භවන්ති**, ඒ ඒ ධම්පදයන් කෙරෙහි එක්වීම බැසගැනීම ඇත්තාහුවෙත්; එවං, මෙසේ උකතප්‍රකාරයෙන් සඞ්කලනවාඛ්‍යා ශාසනාශාසනයෙහිම, පටිච්චසමුප්පාද- ඉන්ද්‍රිය- ඛන්ධ- ධාතු-ආයතනයෝ, චතුස්සත්‍යාවබෝධයෙහි බහාලිය යුත්තාහුය. තෙනාහ ආයස්මා මහාකච්චානෝ "යෝ ච පටිච්චසමුප්පාදෝ"ති.

ඔතරණහාර විභඞ්ගාථ වණ්ණනායි.

තත්ථ කතමෝ සෝධනෝ හාරෝ? "විස්සජ්ජිතමහි පඤ්හෝ" ඉත්‍යාදී නිද්දේශ හාථෝකත අනිප්‍රාය විභාගයි; "අජිතපුච්ඡා විස්සජ්ජනා හාථාපදථ ඨට දක්වනලදී, "කෙනස්සු නිවුතෝ ලෝකෝ ඉත ප්‍රශ්නයෙහි "අවිජ්ජාය නිවුතෝ ලෝකෝ"ඉත්‍යුවෙන් භාග්‍යවතුන්වහන්සේ තදඵිසස්සජිතා වශයෙන් පදසෝධනය කෙරේ, දැනුකැමති අර්ථය නොනිම් බැවින් මෙතෙකින් ආරම්භසෝධනය නො කෙරේ, "කෙනස්සු නප්පකාසති" ඉත ප්‍රශ්නයෙහි "විවිච්ඡා පමාදා නප්පකාසති" යි- පදසෝධනය කෙරේ, ආරම්භසෝධනය නොකෙරේ, "කිස්සාභිලෙපනං බ්‍රූසි, ඉත ප්‍රශ්නයෙහි ජප්පාභිලෙපනං බ්‍රූමි"යි- පදසෝධනය කෙරේ, ආරම්භසෝධනය නො කෙරේ, "කිංසු තස්ස මහබ්භයං" ඉත ප්‍රශ්නයෙහි "දුක්ඛමස්ස මහබ්භයං"යි දැනුකැමැති අර්ථය නිෂ්ඨාවශයෙන් ප්‍රබෝධකරවීමෙන් ආරම්භසෝධනය කරනලදී; එහෙයින් භාග්‍යවතුන්වහන්සේ "අවිජ්ජාය නිවුතා" ඉත්‍යාදිය වදාළසේක.

"සවන්ති සබ්බධි සොතා" ඉත්‍යාදියද පෙරකියනලදී; එහි "සවන්ති සබ්බධි සොතා සොතානං කිං නිවාරණං? ඉත ප්‍රශ්නයෙහි "යානි සොතානි ලොකසම්ං සති තෙසං නිවාරණං"යි පදසෝධනය කෙරේ, ආරම්භශුද්ධිය නොකෙරේ, "සොතානං සංවරං බ්‍රූහි කෙන සොතා පිහියරෙ? ඉත ප්‍රශ්නයෙහි "සොතානං සංවරං බ්‍රූමි පඤ්ඤයෙතෙ පිහියරෙ"යි ආරම්භසෝධනය කරණලදී, එහෙයින් "යානි සොතානි ලොකසම්ං" ඉත්‍යාදිය වදාළසේක. "පඤ්ඤයෙව සති ව.පෙ.එතෙතං උපරුජ්ඣති"යි ආරම්භ සෝධනය කරනලදී, තෙනාහ භගවා "යමෙතං පුච්ඡසි පඤ්හං නන්ති.සත්ථ, යම් ප්‍රශ්නයෙක්හි; එවං, උකතප්‍රකාරයෙන්; ආරම්භ, විචාරු දැනුකැමති අර්ථයන්ගේ පවත්හැණීම; සුද්ධා, විසඳුනිමකිරීමෙන් පිරිසිදුකරනලද්දේද; සෝ පඤ්හා, ඒ ප්‍රශ්න

තෙමේ; විසඤ්ඤිතෝ භවති, විසදතාලද්දේ වේ; යත්ථ පන, යම් ප්‍රශ්නයෙක්හි වනාහි; ආරම්භෝ, අතිප්‍රෙතාචාරමහය; අසුඛෝ විසදෘ නිමනෝකිරිමෙන් අසුඛවූයේද; තාව එපමණකින්; සෝ පයෝගෝ, ඒ ප්‍රශ්නතෙමේ; විසඤ්ඤිතෝ න භවති, විසදතාලද්දේ නොවේ-ඉසස්ස සේයි.

සොධනහාර විභඞ්ගාදී වණ්ණනායි.

තත්ථ කතමෝ අධිට්ඨානෝ හාරෝ? 'එකත්තනතාය ධම්මා යෙ පිව වෙමත්තනතාය නිද්දිට්ඨා" යනාදී නිද්දිසගාථොක්ත අභිප්‍රාය විභාගයි-කත්ථ, ඒ නිද්දිසගාථාවෙහි නොනොත් ඒ ඒ සූත්‍රාන්ත යන්හි; සෙ, දුඃඛසත්‍යාදී යම් ධර්මයෝ; නිද්දිට්ඨා, එකත්ව වශයෙන් හා නානත්ව වශයෙන් දක්වනලද්දාහුද; තෙ, ඒ ධර්මයෝ; තථා, එසේ එකත්වවශයෙන් හා නානත්ව වශයෙන්; ධාරෙතබ්බා, ධරිතයුත්තාහ හෙවත් උපධාරණකටයුත්තාහ; දුක්ඛං ඉති, දුක්ඛං යනු; එකත්තනතා, ජාත්‍යාදි දුක්ඛවිසෙෂය අපෙක්ෂා නොකොට කියනලද මේ දුඃඛසාමාන්‍යය දුඃඛසත්‍යයාගේ එකත්ව නම්, "කත්ථ කතමං දුක්ඛං? ජාති දුක්ඛා-පෙ-විඤ්ඤාණං දුක්ඛං" යයි, "ජාතිදුක්ඛා" යනාදි දුක්ඛසත්‍යයාගේ මේ විසෙෂතාවය; වෙමත්තනතා, වෙමත්තතා හෙවත් නානත්වනම්, "දුක්ඛසමුදයෝ" යන සමුදය සත්‍යයාගේ සාමාන්‍යය එකත්වනම්, "කත්ථ කතමෝ දුක්ඛසමුදයෝ? යායං තණ්හා-පෙ-විභවතණ්හා" යයි වෙමත්තනතා, සමුදයසත්‍යයාගේ මේ විසෙෂතාවය වෙමත්තතා නම්; ඉතරසත්‍යද්වාරවලයෙහි එකත්තනතා වෙමත්තතා විභාගය පාළිඅනුසාරයෙන් දතයුතු-ම මෙහෙයි. යන මේ සාමාන්‍ය ලාගීතාවය එකත්තනතා නම්; "කත්ථ කතමෝ මග්ගෝ? නිරයගාමිමග්ගෝ-පෙ-නිබ්බානගාමිමග්ගෝ" මේ විසෙෂ ලාගීතාවය ලාගීතාගේ වෙමත්තනතා නම්.

මහන්ති භවෙය්‍යන්ති- මහෙසා; තදන්තෙනෙති මග්ගීයති භවෙ සීයතීති වා-මග්ගෝ; නිරතියටෙන නිරසාදටෙන ච නිරයෝ; නිරයං ගච්ඡන්ති එතෙනාති- නිරයගාමී; උඩ්ඪමධොගහනතෝ තිරියං අඤ්ඤිතාති, තිරච්ඡානා-තිරච්ඡානා එව- තිරච්ඡානයොනි-, පෙතානං පෙතති, ප එති ඛුප්පිපාසාදිදුක්ඛං ගච්ඡති එතාසූති වා-පෙතති; පෙතති එව විසයෝ-පෙත්තිවිසයෝ, න සුරන්ති න භාසන්ති න දිබ්බන්තීති- අසුරා; අසුරා එව-අසුරකායෝනි; අසුරයොනියා නිබ්බත්තා- අසුරයොනිකා; දිබ්බන්ති රූපාදීහි සුට්ඨු අග්ඝන්ති- සග්ගා,

සඟහං ගමේතීති- සඟගාමිනියෝ; මනසා උසසන්නතාය මනු සසා-මනුසසලොකං ගමේතීති-මනුසසගාමි; නත්ථි වානං එත්ථා'ති-නිබ්බානං; වානතෝ නික්ඛන්තතං වා- නිබ්බානං; නිබ්බානං ගමේති'ති- නිබ්බානගාමි; නිද්දේසවාරෝ.

"නිරොධෝ" යනු නිරොධලක්ඛණසාමාන්‍යයෙහින් එකතන නාගි; නත්ථ, ඒ සාමාන්‍යනිරොධයෙහි; නිරොධා, නිරොධ විශෙෂය තෙමේ; කතමෙ? කවරේද? සඞ්ඛාරනිරොධා, පරිසඞ්ඛාරඞ්ගතවූ ප්‍රතිපක්ෂ භාවනාවෙන් නිරුඞ්කිරීමය;-නොහොත්= ප්‍රතිපක්ෂතොලඹයන් එසේ නොපවත්නා කලැසිනැ පහළවීමට සුදුසු කොළෙසුන් ප්‍රතිපක්ෂඛෙනනියෙන් නොනිපදවීමය; අපපවත්ති සඞ්ඛාතනිරොධා, සඞ්ඛත ධර්මයන්ගේ සරස නිරොධය හෙවත් ඛණිකනිරොධය; අනුපාදනිරොධා, අනුසයසඞ්ඛ්‍යාත තෘෂ්ණා නිරොධය; එසේම-ප්‍රතිසන්ධිනිරොධය- මානනිරොධය- මක්ඛනිරොධය- පළාසනිරොධය- ඉස්සානිරොධය- මච්ඡරියනිරොධය- සකල කෙලෙසනිරොධය- යන මේ නිරොධවෙමතනාගි; නිරොධියාගේ විශෙෂ සමහාවය යි සේඳීරූපං- යනු භූතොපාදායාදී විශෙෂ රහිතව සාමාන්‍යයෙන් හිහෙනින් එකවැ; නත්ථ, ඒ සාමාන්‍ය වශයෙන් දැක්වූ රූපයෙහි; රූපං, විශෙෂරූපය; කතමං? කවරේද? චතුමහාභූතිකරූපයද; චතුන්නං මහාභූතානං උපාදාය, සතරමහාභූතයන් නිසා; රූපස්ස පඤ්ඤත්තිච, රූපප්‍රඥප්තියද හෙවත් උපාදාය රූපයද වෙමතනරූපයි; නත්ථ, ඒ භූතඋපාදාය රූපයන් අතුරෙහි; චත්තාරි මහාභූතානි, සතර මහාභූතරූපයෝ; කතමානි? කවරවුද? පඨවිධාතු, කක්ඛළ ලොෝ සඨබ්බ ලක්ඛණ පෘථිවීධාතුය; ආපොධාතු, ආබන්ධන ලොෝ ද්‍රවලක්ඛණ ආපොධාතුය; තෙජොධාතු, පරිපාචනලක්ඛණ තෙජොධාතුය; වායොධාතු, සමුදීරණලක්ඛණ වායොධාතුය; යන මොහුයි

ඉමෙඛ්ධ්‍යපන ච, සංඛ්‍යෙප නෙයිග්ද; විත්ථාරෙන ච, විසතර නෙයින්ද; (යන) මේහි ආකාරෙහි, දෙආකාරයකින්; ධාතූ, ධාතූන්; පරිගහණාති, පරිග්‍රහණය කෙරේ හෙවත් ම්මසිම කෙරේ; විත්ථාරෙන, විසතරනයෙන්; ධාතූ, ධාතූන්; කථං පරිගහණාති, කෙසේ පරිග්‍රහණ කෙරේදයත්? ඉඤ්ඤා ආකාරෙහි, කොටස වශයෙන් මෙසි ආකාරයකින්; පඨවිධාතු, පෘථිවිධාතුව; විත්ථාරෙන, විසතර වශයෙන්; පරිගණ්හාති, පරිග්‍රහණකෙරේ; වාදසහි ආකාරෙහි, කොටස් වශයෙන් දෙලොස්ආකාරයකින්; ආපොධාතු, ආපොධාතුව; විත්ථාරෙන, විසතර වශයෙන්;

පරිගණ්හාති, පරිග්‍රහණකෙරේ; වතූසු ආකාරේසු ඔව් අයුරෙ කින්; පතිට්ඨාතුං, පිහිටුව; "විත්ථාරෙන පරිගණ්හාති"යි සේසි. ජණ්හි ආකාරෙහි, ඔබාකාරයෙකින්; වායෝධාතුං, වායොධාතුව; "විත්ථාරෙන පරිගණ්හාති"යි-සේසි.

"කතමේසු වීසතියා ආකාරේසු පඨවීධාතුං විත්ථාරෙන පරිගණ්හාති? අත්ථි ඉමස්මිං කායෙ කෙසා -පෙ- මත්ථලුඞ්ගන්ති" ඉමේසු වීසතියා ආකාරේසු පඨවීධාතුං විත්ථාරෙන පරිගණ්හාති" "කතමේසු වාදසසු ආකාරේසු ආපොධාතුං විත්ථාරෙන පරිගණ්හාති? අත්ථි ඉමස්මිං කායෙ පිත්තං -පෙ- මුත්තන්ති, ඉමේසු වාදසසු ආකාරේසු ආපොධාතුං විත්ථාරෙන පරිගණ්හාති, කතමේසු චතූසු ආකාරේසු තෙජොධාතුං විත්ථාරෙන පරිගණ්හාති? යෙන ච සන්තප්පති -පෙ- සම්මා පරිණාමං ගච්ඡති, විත්ථාරෙන පරිගණ්හාති; කතමේසු ජණ්හි ආකාරේසු වායොධාතුං විත්ථාරෙන පරිගණ්හාති,? උඞ්ඩඞ්ගමා වාතා -පෙ- අස්සාසො පස්සාසො ඉති, විත්ථාරෙන පරිගණ්හාති.

මේසි පදත්‍රී විභාගාදිය විසුඞ්මාගීාදිගෙන් දතයුතු. එකතත වෙමත්තතා විභාගය මෙසේ දතයුතු.

රූපං- යනු එකත්තතායි, "චතුන්නං මහාභූතානං උපාදාය" යනු වෙමත්තතායි; උපාදාරූපං-යනු එකත්තතායි, "චක්ඛායතනං-පෙ-කබලිඞ්කාරෙ ආහාරෙ" යනු වෙමත්තතායි; "භූත රූපං" යනු එකත්තතායි; "පඨවීධාතු-පෙ-වායොධාතු" යනු වෙමත්තතායි; පඨවීධාතු-යනු එකත්තයි; විසති ආකාරයෝ වෙමත්තතායි; ආපොධාතු- යනු එකත්තයි; වාදසාකාරයෝ වෙමත්තතායි; තෙජොධාතු-යනු එකත්තයි; සිවිආකාරයෝ වෙමත්තතායි; වායොධාතු- යනු එකත්තයි; ඡඞ්කාරයෝ වෙමත්තතායි.

එවං, මෙසේ උකතප්‍රකාරයෙන්; ඉමස්මිං චාතුමහාභූතිකස්ස කායස්මිං, මෙකී දෙසාලිස් අයුරෙන්; විත්ථාරෙන, විස්තර හෙයින්; ධාතුශෝ, මහාභූත ධාතූන්; සභාවසභාවතෝ, සභාව ලක්ෂණ වශයෙන්; උපලක්ඛණතෝ, උපධාරණය කරනුයේ; තුලනතෝ, සසඳ බලනුයේ; පරිවීමංසනතෝ, හාත්පසින් විමසනුයේ; පරිසොතාභතෝ, විමසීමට ඔස්නේ; චක්ඛුවිඤ්ඤණතෝ, පස්විකණ්ණුයේ; කායං වා, කයහි හෝ; කායපපදෙසං වා, කායප්‍රදෙශය හි හෝ; ගයහූපගං, ගතයුතුවූ; කිඤ්චි, කිසිවක්; න පස්සති, නොදක්නේය; චක්ඛුනිඤං, ඇස්දෙර ගවර වලක්; පවිච්චිතතෝ, සොයනුයේ; ගයහූපගං, ගතයුතුවූ; කිඤ්චි, කිසිවක්; ඡථා න පස්සතිස්ස, යම්සේ නොදක්නේද;

සඞ්කාරට්ඨානං, කසළයොඩක්; පවිචිනන්තා, සොයනුයේ; කිඤ්චිදත්ථංයේව පස්සති, කිසි ගතයුතු දෙයක්; යථා න පස්සසීති, යම් සේ නොදක්නේද; සිඛිට්ඨකං පවිචිනන්තා, සොහොනක් සොයනුයේ; ගතයුතු කිසිවක් යම්සේ නොදක්නේද; (එපරිද්දෙන්ම මෙකී දෙසාලිස් අයුරෙන් උකහප්‍රකාරයෙන් විසතරහෙයින් ධාතූන් සභාවලක්ඛණ වශයෙන් උපධාරණය කරණුයේ සඤ්ඤ ඵලනුයේ භාත්පසින් විමසනුයේ විමසීමට බස්නේ පස්විකණුයේ කරුණ යි හෝ කාරණප්‍රදේශය යි හෝ ගතයුතු කිසිවක් නොදන්නේමය) එහෙයින් භාණ්‍යවතුන් වහන්සේ "යා චෙව ඛො පන අජ්ඣත්තිකා පඨවීධාතු" යනාදිය වදාළසේක.

අජ්ඣත්තිකා, තමාකෙරෙහි නොහොත් සවිඤ්ඤාණක රූපකයෙහි පිහිටියාවූ; යා චෙව ඛො පන පඨවීධාතු, යම් ආකාර පෘථිවීධාතුවක් වේ ද; යා ච බාහිරා පඨවීධාතු, පරරූපකයෙහි නෝ අනින්ද්‍රිය ප්‍රතිබද්ධ වස්තූන් කෙරෙහි පිහිටියාවූ යම්බඳු පෘථිවීධාතුවක් වේද; එසා අහං නෙව, මේ පෘථිවීධාතුව මම නොවීමි; එසෝ මම න, මේ පෘථිවීධාතුව මාසතු නොවේ; අහං එසෝ න අස්මි, මම මේ පෘථිවීධාතු ඇත්තෙක් නොවීමි; එසෝ මෙ අත්තා න හොති, මේ පෘථිවීධාතු ඇත්තේ මාගේ ආත්මයක් නොවේ යයි; එවං, මෙපරිද්දෙන්; එතං, මේ පෘථිවීධාතුව; යථාභූතං, තත්වූ පරිද්දෙන්; සම්මප්පඤ්ඤාය, සම්‍යක් විදර්‍ශනා ප්‍රඥාවෙන්; දට්ඨබ්බං, දතයුතු; එවං, උකහප්‍රකාරයෙන්; එතං, මේ පෘථිවීධාතුව; යථාභූතං, තත්වූ පරිද්දෙන්; සම්මප්පඤ්ඤාය, සම්‍යක් විදර්‍ශනා ප්‍රඥාවෙන්; දිස්වා, දැක; පඨවීධාතුයා, පෘථිවීධාතුකෙරෙහි; නිබ්බින්දති, කලකිරේ; පඨවීධාතුයා, පෘථිවීධාතුකෙරෙන්; චිත්තං, තෘෂ්ණාදෘෂ්ටිනිස්‍රිතවූ සිත; විරාජෙති, වෙන්කෙරෙහි; ආපොධාතු ආදි වාරත්‍රයද මෙසේමැයි.

මේසේ සත්‍යම්ගීරූප ධර්මයන්ගේ වශයෙන් අධිට්ඨානහාරය දක්වා දැන් අවිජ්ජාවිජ්ජාදීන්ගේ වශයෙන් දැක්වීම පිණිස, "අවිජ්ජාති එකන්තනතා" යනාදිය කිහ:- අවිජ්ජා යනු එකන්තනතායි; තත්ථ, අවිදිත කරණාදියෙන් සාමාන්‍ය වශයෙන් එකක්වූ ඒ අවිද්‍යාවෙහි; අවිජ්ජා, කෘත්‍යජාති ආරම්මණවසතු ආදිවශයෙන් විශෙෂවූ අවිද්‍යාව; කතමා, කවරිද?, දුක්ඛෙ අඤ්ඤාණං, දුක්ඛ සත්‍යයෙහි ඝාථාවසරසලක්ඛණ නොදැනීම අවිද්‍යාවයි; "දුක්ඛසමුදයෙ අඤ්ඤාණං" යනාදියද මෙසේයි; පුබ්බන්තෙ අඤ්ඤාණං, අතීතඛන්ධායතන ධාතු සඞ්ඛ්‍යාතවූ පූර්‍වාන්තයෙහි අඥානය; අපරන්තෙ අඤ්ඤාණං, අනාගතඛන්ධායතනධාතු සංඛ්‍යාතවූ අපරා

න්‍තයෙහි අඥානය; සුඛඤාතාපරන්‍තෙ අඤ්ඤං, තදුභයානන්ත යෙහි නොදැනීමය; ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නානං, මේ අවිද්‍යාදි ප්‍රත්‍යයන්නිසා පහළවූ; ධම්මානං, සංස්කාරාදි ධර්මයන් කෙරෙහි; අඤ්ඤාණං, නොදැනීමය; එවරූපං, මෙබඳුවූ; යං අඤ්ඤාණං, චතුස්සත්‍යධර්මය විදින ප්‍රකට කරණයට අවසර නොදෙන ඥානප්‍රත්‍යනීකවූ යම් අඥානයක් වේද; අදස්සනං, සත්‍යාකාරය දක්නට අවසර නොදෙන යම් අදර්ශනයක් වේද; අනභිසමයෝ, සත්‍යාවබෝධයට අවසර නොදෙන යම් අනභිසමයෙක් වේද; "අනුබෝධ සම්බෝධ පටිවේධ කෘත්‍යයන්ට අවසර නොදෙන්නාවූ යම් අනනුබෝධ අසම්බෝධ අප්පටිවේධයෝ වෙත්ද, එසේම සලක්ඛණ- උපලක්ඛණ- පච්චුපලක්ඛණ- සම්පෙක්ඛණ- ක්‍රියාවන්ට ශක්‍රත්වයෙන් අවසර නොදෙන්නාවූ අසල්ලක්ඛණ- අනුපලක්ඛණ- අපච්චුපලක්ඛණ- අසම්පෙක්ඛණ-යන නාමයෝ වෙත්ද, ප්‍රත්‍යක්ෂවන කිසිම කර්මයක් නොමැති හෙයින් හෝ පස්නොවිකා කරණලද කර්මවත් හෙයින් අපච්චක්ඛණකම්මං යනුද, දුම්මේධයන්ගේ සවභාවක් හෙයින්; දුම්මේජ්ඣං, යනුද, අඥාන බාලයන්ගේ සවභාවක් හෙයින්; බාල්‍යං යනුද, අවිනාභූ කාරණා කාරණා චතුස්සත්‍යධර්මයන් දැනගැනීමට අවසර නොදෙන හෙයින්, අසම්පජඤ්ඤං යනුද, මොහන-පමොහන-සම්මොහන වසයෙන් මොහ පමොහ සම්මොහ යනු නොවිදියයුත්ත විඳින හෙයින් හා විදියයුත්ත නොවිඳින හෙයින් අවිජ්ජා යනුද, සංසාරවෘත්තයෙහි බස්නා හෙයින් අවිජ්ජාසෝ යනුද, වෘත්තයෙහි යොදන හෙයින් අවිජ්ජායොත්තා යනුද, අප්‍රහීනහෙයින් හා නැවත නැවත උපදනා හෙයින්ද අවිජ්ජානුසයෝ යනුද, මහ යන ජනයා වටලා පැහැරගන්නා සොරුන් මෙන් කුසලසිත වටලා පැහැරගන්නා හෙයින් අවිජ්ජාපරියුට්ඨානං යනුද, නගරවාරයෙහි පලිස පතනයවූකල මිනිසුන්ගේ ඇතුල්වීම නවත්නාක් මෙන් සක්කාය නගරවාරයෙහි පතිත අවිද්‍යාව නිවීණසම්පාපක ඥානගමන වලක්වන හෙයින් අවිජ්ජාලඞ්ගී යනුද, මොහය අකුසල්වූ හෝ අකුශලයන්ගේ හෝ පතිට්ඨාන හෙතු හෙයින් මෝහෝ අකුසලමූලං යනුද, අවිද්‍යා විශෙෂ නාමබැවින් අවිද්‍යාවගේ වෙනත්නාම නම්.

ශුක්ලපක්ෂයෙහි විජ්ජා යනු සකල ප්‍රඥාවන්ට සාමාන්‍ය හෙයින් එකත්නාම්; දුක්ඛෙ ඤාණං, දුඃඛාර්‍යසත්‍යය ගොචර කොට උපදනා ඥානය; සමුදය ඤාණාදියත් මේසේයි; එවරූපා, මෙසේ දුක්ඛ ඤාණං යන්නාදි අවඅාකාරයෙන් දක්වනලද්දාවූ; යා පඤ්ඤා, ඒ ඒ අරුත් පහළකරණ පණවන යම් ප්‍රඥාවක් වේද,

එසේම ප්‍රකාරයෙන් ඤාතපරිඤ්ඤා සම්පන්නයෝ, අනිත්‍යාදීන් සොයන විවයෝ, ප්‍රකාරයෙන් සොයන පවිචයෝ, සිව්ඇස් දහම් සොයන ධම්මවිචයෝ, අනිත්‍යාදීන් සලලකඛණ වශයෙන් උපදනා සල්ලකඛණාෂ, එම අනිත්‍යාදීන් නැවත නැවත උපධාරණය කරන පඤ්ඤලකඛණාෂ, පණ්ඩිතස්වභාවවූ පණ්ඩිච්චෂ, කුසල සවභාවවූ කොසල්ලෂ, නිපුණස්වභාවවූ නෛපුණෂ, අනිත්‍යාදීන් විභාවනයකරන භාවනාෂ, අනිත්‍යාදීන් සිතීම කරන චින්තාෂ, අනිත්‍යාදිය උපධාරණය කරන උපපරික්ඛාෂ, සියුම් බැවින් හා පතලබැවින් ගුහීෂ, නෙළෙසුන් හිංසාකරන නෙසින් හෝ වහා ග්‍රහණ ධාරණය කරනනෙසින් ඔමධාෂ, නුවණැත්තහු හිතප්‍රතිපත්තියෙසි යොදවන හෙසින් පරිණායිකාෂ, අනිත්‍යාදි වශයෙන් ධර්මයන් භවයෙසින් බලනහෙසින් විපස්සනාෂ, සම්‍යක් ප්‍රකාරයෙන් අනිත්‍යාදීන් දන්නා සම්පජඤ්ඤෂ, නොමග පිළිපන් සිඟුවයන් විපියට බස්වාගැනීමට උපකාරවන පතොදයක් (සෙවිටක්) මෙන් නොමහදුවන කුඑසින කුසලව්‍රතියට බස්වන හෙසින් පතෝදෂ, දශීන ලක්ෂණයෙහි ඉන්ද්‍රාධිය කරන හෙසින් පඤ්චින්ද්‍රියෂ, අවිද්‍යාවෙන් කවපා නොවන හෙසින් පඤ්ඤාබලෂ, නෙළෙසුන් නපන හෙසින් පඤ්ඤාසත්ථෂ, ඉතා උස්ම පැතැනැගුණු හෙසින් පඤ්ඤාපාසාදෂ, එසේම අවලෝකනාදි අර්ථයෙන් පඤ්ඤාඅලෝකෂ- පඤ්ඤාඔභාසෂ- පඤ්ඤාපජ්ජොතෂ- පඤ්ඤාරතනෂ- අමෝහෂ- ධම්මවිචයෂ- සම්මාදිට්ඨිෂ- ධම්මවිචයසම්බොජ්ඣඞ්ගෂ- මග්ගඞ්ගෂ- මග්ගපරියාපන්නෂ යන නාමයෝද ප්‍රඥාවගේ වෙමිතනතාසි.

සමාපත්තිෂ- යනු සඤ්ඤා සමාපත්ති ආදීන්ට සාමාන්‍ය හෙසින් එකතනතාසි; "තත්ථ කතමා සමාපත්ති? සඤ්ඤාසමාපත්ති පෙ නිරොධසඤ්ඤා සමාපත්ති" යනාදිය සමාපත්තිහුගේ වෙමිතනතාසි; අර්ථවිභාගාදිය අටුවා නයින් දතයුතු.

ඛාණිෂ- යනු එකතනතාසි; "තත්ථ කතමෝ ඛාණි? අත්ථි සෙඛෝ ඛාණි පෙ පඤ්ඤුත්තරෝ ඛාණි" යනු ඛාණීහුගේ වෙමිතනතාසි; මෙහි ධ්‍යානලාභී පෘථග්ජනතෙමේ නෙවසෙඛනාසෙඛඛාණී නම්, සම්මෘශ්‍රවතෙමේ ආජානීයඛාණී නම්, අභිඥලාභී පෘථග්ජනතෙමේ අසඛඩුංඛසෙකු සමානවූ ඛාණී නම්, හේතෙසේද? ඛලුඛකතම් අශ්වතෙමේ යම්සේ දමනයට නොපැමිණ ඔඛමොඛ ධාවනය කරන්නේද එසේම අභිඥලාභීවූ යම් පෘථග්ජනයෙක් නෙමේ අභිඥුපුඛය ආශ්වාදකොටැමට මෙපමණක් ඇත මෙතෙකින් මාවිසින් කවයුතු කරන ලදී

දේ ය සි මතු චිත්තදමනයට උත්සාහ නොකොට අනිඤ්ජිත්ත බලයෙන් ඔබිමොබ බාවනය කෙරේද මෙබඳුවූ තැනැත්තේ අසඛඵංකඝෙකු වැනි ධ්‍යානඇත්තේසි; ධ්‍යානලාභී දෘෂ්ටිගතික තැනැත්තේ දිට්ඨුත්තරඋක්කාසී නම්, ත්‍රිලක්ෂණෝපනිධ්‍යානයෙන් ධ්‍යානඇත්තේ පඤ්ඤුත්තරඋක්කාසි නම්.

සමාධි- යනු සරණසම්බන්ධාදීන්ට සාධාරණ හෙයින් එක තත්තනාසි, "තත්ථ කතමෝ සමාධි? සරණෝ සමාධි ...පෙ... සම්මාසමාධි" යන මේ සමාධි විශෙෂණ සමාධිහුගේ වෙමතන නාසි.

මෙහි අකුසල චිත්තෙකාග්‍රතාවය නොහොත් සකල සාසව සමාධිය සරණ සමාධි නම්, සකල කුසල අව්‍යාකෘත සමාධිය හෝ ලොකොත්තර සමාධිය අරණසමාධි නම්, ප්‍රතිසවිත්තෙක කාග්‍රතාවය සමවරසමාධි සී, මෙයනා වෙතොවිමුත්තිය අසවර සමාධි සි, සඛ්‍යාපජ්ජ අඛ්‍යාපජ්ජසමාධියත් මේසේහි, තොඉක් මවනලද වට්ටාමිස ලොකාමිස ඇති බැවින් ලෞකිකසමාධිය සාමිසසමාධි සී, ලොකොත්තර සමාධිය නිරාමිසසමාධි සි, දණ්ඩා භිඤ්ඤසමාධිය සඝඛ්ඛාරයි, බිප්පාභිඤ්ඤසමාධිය අඝංඛාරසි, සුඛවිපස්සකයාගේ සමාධිය එකංඝනාවිත සමාධි සි, සමථයා නිකයාගේ සමාධිය උභයංඝනාවිත සමාධිසි, කායසක්‍ඛී පුද්ගල යාගේ හා උභතොභාග විමුත්තයාගේද සමාධිය උභයතා භාවිත භාවනා සමාධි සි, සෙස්ස සුගමසි.

පටිපදා- යනු එකත්තනාසි; "තත්ථ කතමා පටිපදා?, අඟාළහ පටිපදා ...පෙ... සුඛාපටිපදා බිප්පාභිඤ්ඤා"නි අසං, ආඝාළහාදි මේ ප්‍රතිපදා විශෙෂණ ප්‍රතිපදාවගේ වෙමතනනාසි, මෙහි කාම සුඛානුයොගය සඛ්‍යාතවූ කාමොරුහන ප්‍රතිපත්තිය අඝාළහ පටිපදාසි; කාමනිධ්‍යාපනවසයෙන් ඛෙදවනයෙන් පවත්නා අත්තකිලමථානුයොගය නිෂ්ක්‍රාමපටිපදා සි; භාවනානුයොග කාලයෙහි සීතාදිය නොඉවසන්නහුගේ පිළිපැදීම අකඛමා පටි පදා සි; එය ඉවසන්නහුගේ ප්‍රතිපදාව ඛමාපටිපදා සි; "උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති" යනාදි වශයෙන් මිථ්‍යාවිතර්කයන් සහනන්නහුගේ පිළිවෙත, සමාපටිපදා සි, ඉඳුරන් දමනය කරන් නහුගේ පිළිවෙත දමාපටිපදා සි, සෙස්ස සුගමසි.

කායා-යනු නාමකාය රූපකායාදි වශයෙන් විශෙෂ නොවන සාමාන්‍යයෙන් කීහෙයින් එකත්තනතා සි; "තත්ථ කතමෝ කායෝ? නාමකායෝ රූපකායෝ ච ...පෙ... අයං නාමකායෝ'ති අසං ඉවමත්තනතා, මේ කායයාගේ වෙමතනතාසි.

එවං, මේසේ උක්තප්‍රකාරයෙන්; **යෝ ධම්මෝ**, යම්කිසි ජාත්‍යාදි ධර්මයෙක් නම්; **යස්ස ධම්මස්ස**, තදන්‍යවූ ජරා ආදි යම් ධර්මයකට; **සමානභාවෝ**, දුක්ඛාදි සත්‍යභාවයෙන් සමාන භාවය ඇත්තේද; **යෝ ධම්මෝ**, ඒ ජාත්‍යාදිධර්මතෙමේ; **තස්ස ධම්මස්ස**, ඒ ජරාආදි ධර්මයාගේ; **එකත්තනානා**, සමානතාවයෙන් හෙවත් දුඃඛාදි සභාවයන්ගේ එකිභාවයෙන්; **එකී හවති**, අතෙක විධවූයේද **දුක්ඛං**, ජාත්‍යාදි වශයෙන් සාමාන්‍ය ශබ්දඥානවිෂයත්වයෙන් සමාන වේ; මේ එකත්තනානාලක්ඛණයයි; **වා පන**, නොහොත්; **සභාව සභාව**, යම් යම් සභාවයකින්; **විලක්ඛණා**, යම් ධර්මයෙක් යම් ධර්මයකට අසමානලක්ෂණ ඇත්තේද; **තත්ත තත්ත**, තත් තත් සභාවයෙන්; **වෙමත්තතං හවජ්ජති**, ඒ ධර්මතෙමේ ඒ ධර්මයාගේ අසමානභාවයට යේ; "ජාත්‍යාදිය දුක්ඛභාවයෙන් ජරාආදියට සමාන නමුදු අනිත්‍යභාවාදිභාවයෙන් ජරාආදීන්ගේ විශිෂ්ටත්වයට යේ එබැවින් අසමානයයි යේයි; එවං, මෙසේ එකත්තනානා වෙමත්තනානා ලක්ෂණය; **සුත්තතෝ වා**, සූත්‍රාඛ්‍යයෙහි ලා හෝ; **වෙය්‍යාකරණතෝ වා**, වෙය්‍යාකරණාඛ්‍යයෙහි ලා හෝ; **ගාථාතෝ වා**, ගාථාඛ්‍යයෙහි ලා හෝ; පුච්ඡිතෙන, විවාරණලද්දක් නම්; **කිං**, කිමෙක්ද? **එකත්තනානා පුච්ඡති**, එකත්වයෙහි පිහිටා විවාරයිද; **උදාහු**, නොහොත්; **වෙමත්තනානා**, වෙමත්තභාවයෙහි පිහිටා විවාරයිද යි; **වීමංසිතබ්බං**, විමසියයුතු; **සචේ**, ඉදින්; **එකත්තනානා**, එකත්වයෙහි පිහිටා; **පුච්ඡිතං**, විවාරණලද්දක් නම්; **එකත්තනානා**, එකත්වයෙහි පිහිටා; **විස්සජ්ජෙතබ්බං**, විසඳියයුතු; **සචේ**, ඉදින්; **වෙමත්තනානා**, වෙමත්තභාවයෙහි පිහිටා; පුච්ඡිතං, විවාරණලද්දක් නම්; **වෙමත්තනානා**, වෙමත්තභාවයෙහි පිහිටා; **විස්සජ්ජෙතබ්බං**, විසඳියයුතු; **සචේ**, ඉදින්; **සන්තානාධිට්ඨානෙන**, සන්තානාධිෂ්ඨානයෙහි පිහිටා; පුච්ඡිතං, විවාරණලද්දක් නම්; **සන්තානාධිට්ඨානෙන**, සන්තානාධිෂ්ඨානයෙහි පිහිටා; **විස්සජ්ජෙතබ්බං**, විසඳියයුතු; **සචේ**, ඉදින්; **ධම්මාධිට්ඨානෙන**, ධර්මාධිෂ්ඨානයෙහි පිහිටා; පුච්ඡිතං, විවාරණලද්දක් නම්; **ධම්මාධිට්ඨානෙන**, ධර්මාධිෂ්ඨානයෙහි පිහිටා; **විස්සජ්ජෙතබ්බං**, විසඳියයුතු; **වා පන**, නොහොත්; **යථා යථා** පුච්ඡිතං, යම් යම් ආකාරයකින් විවාරණලදද; **තථා තථා විස්සජ්ජෙතබ්බං**, ඒ ඒ ආකාරයෙන්ම විසඳියයුතු.

තෙනාහ ආයස්මා මහාකච්චානෝ "එකත්තනානා ධම්මා"තිආදි.

අධිට්ඨානහාරවිභඞ්ගාට්ඨකථා නිට්ඨිතා.

තත්ථ කතමෝ පරිකඛාරෝ නාරෝ? "යෙ ධම්මා යං ධම්මං ජනයන්ති"- යනාදි නිද්දේශභාවෙන අභිප්‍රාය විභාගයි.

යෝ ධම්මෝ, යම් හෙතු ප්‍රත්‍යය ධර්මයෙක් නම්; **යං ධම්මං**, යම් ඵල ධර්මයක්හු; **ජනයති**, නිපදවාද; **තස්ස**, ඒ ඵලධර්මයාගේ; **සෝ**, ඒ හෙතුප්‍රත්‍යය ධර්මතෙමේ; **පරිකඛාරෝ**, පිරිකර වේ; **පරිකඛාරෝ**, ඒ පරිෂ්කාර ධර්මතෙමේ; **කිංලකඛණෝ**, කෙබඳු ලක්ෂණ ඇත්තේද **පරිකඛාරෝ**, පරිෂ්කාර ධර්මතෙමේ; **ජනක ලකඛණෝ**, නිපදවීම ලක්ෂණකොට ඇත්තේය; **හෙතු ච**, අසාධාරණ ලක්ෂණ හෙතුවද; **පච්චයෝ ච**, සාධාරණ ලක්ෂණ ප්‍රත්‍යය ද යන; **ඉම ධම්මා**, ධර්මයෝ මේදෙදනා; **ජනයන්ති**, ඵලය නිපද වත්; **තත්ථ**, ඒ හෙතු ප්‍රත්‍යයන් අතුරෙහි; **හෙතු**, හෙතුධර්මතෙමේ; **කිංලකඛණෝ**, කෙබඳු ලක්ෂණ ඇත්තේද?; **පච්චයෝ**, ප්‍රත්‍යය ධර්මතෙමේ; **කිං ලකඛණෝ**, කෙබඳු ලක්ෂණ ඇත්තේද? **හෙතු**, හෙතුධර්මතෙමේ; **අසාධාරණ ලකඛණෝ**, නිපදවියයුතු ඵලයෙහි ර අන්‍යඵලයන් හා අසාධාරණ ලක්ෂණ ඇත්තේය; **පච්චයෝ**, ප්‍රත්‍යයතෙමේ; **සාධාරණ ලකඛණෝ**, සකලඵලයන් හා සාධාරණ ලක්ෂණ ඇත්තේය; **යථා**, යම් සාධාරණ අසාධාරණ විශෙෂයෙක් නම් ආකාරයකින් පවත්නේද; **කිං භවෙ**, ඒ විශෙෂය කෙබඳු වන්නේදයත්?; **යථා**, යම්සේ; **අඞ්කුරස්ස නිබ්බත්තියා**, අඞ්කුරයාගේ පහළවීමෙහි; **බීජං**, බීජය; **අසාධාරණං**, අසාධාරණ වන්නේද; **පඨවී**, පෘථිවීධාතුවද; **ආපෝ ච**, ආපොධාතුවද; **සාධාරණා**, සාධාරණවන්නාහුද **එවමෙව**, හි, ඒ එසේ මැයි; **අඞ්කුරස්ස**, අඞ්කුරයාගේ පහළවීමට; **පඨවී ආපෝ ච**, පොළොවද ජලයද; **පච්චයත්ථා**, ප්‍රත්‍යය යි; **සහාවෙ**. සමානඵල නිපදවන බීජසංඛ්‍යාත සමානභාවය; **හෙතු**, හෙතුයි; **වා පන**, මෙසින් අනිකුදු උදාහරණයක් දක්වනු ලැබේ; **සෙවට**, කළයෙක්හි; **දුද්ධං කිරි**; **සක්ඛිත්තං**, දමනලද්දේ; **යථා දධි භවති**, යම්සේ දී වේ ද; **එතඤ්ච**නයින් හෝ අභෙදෙපචාරයෙන් මෙසේ කියනලදී; අන් පරිද්දෙකින් නොවේ, කිරි දී නොවේ මැයි; එහෙයින්ම 'න ච භූමි' යනාදිය කිහ; **දුද්ධස්ස**, කිරාගේද; **දධිස්සච**, දිහුගේද රසක්ෂීර ඵලාදියෙන් භින්නසභාව ඇති බැවින්; **එකකාලසමවධානං**, සමානකාලයෙහි එක්ව පිහිටීමක්; **න චත්ථි**, නොමැත්තේය; **එව මෙවං**, එපරිද්දෙන්ම; **හෙතුස්ස ච**, හෙතුහුගේද; **පච්චයස්ස ච**, ප්‍රත්‍යයාගේද; **එකඤ්ඤාල සමවධානං නත්ථි**, එක්කලෙක එක්ව පිහිටීමක් නැත්තේය; හෙතු වූ ක්ෂීරයාගේ ඵලයවූ දී හා සමාන කාලයෙහි එක්ව පිහිටීමක් යම්සේ නොවන්නේද- එසේ අන්‍ය හෙතු ධර්මයන්ගේද ඵලය හා සමානකාලයෙහි එක්ව පිහිටීමක්

නොවන්නේමය; ප්‍රත්‍යයාගේ එබදු ශක්තියක් නැත ප්‍රත්‍යය තෙමේ එකාන්තයෙහි ඵලය නා නිපදනකාල ඇත්තේ නොවන්නේමය. මෙසේ වක්ෂ්‍යමාණාකාරයෙන්ද හෙතුප්‍රත්‍යයන්ගේ විශෙෂ දතයුතු.

ඕ, ඒ එසේමැයි; **අයං සංයාමෙ**, "ඛඞ්ගානං පටිපාටි" යනාදින් කියනලද මේ සසරතෙමේ; **සඞ්ඛතං**, හෙතු සහිතවූයේම; **සප්පච්චයා**, ප්‍රත්‍යය සහිතවූයේම; **නිබ්බත්තා**, නිපන්නේය; වුත්තඤ්හි අවිජ්ජාපච්චයා සඞ්ඛාරා පෙ. එවං සබ්බා පටිච්ච සමුප්පාදෙ.

ඉති, මෙසේ පටිච්චසමුප්පාදික හෙතුප්‍රත්‍යයාකාරයෙන් අවිද්‍යාව අවිද්‍යාවට හෙතුවන්නේය; අයොනිසොමනසිකාරය ප්‍රත්‍යයවන්නේය; **පුරිමිකා අවිජ්ජා**, පළමු පහළවූ අවිද්‍යා තොමෝ; **පච්ඡිමිකානං අවිජ්ජානං**, පසුව පහළවන අවිද්‍යාවට; **හෙතු**, හෙතු වේ; **තතො**, ඒ පුරිම්කා පච්ඡිම්කා අවිද්‍යාවන් අතුරෙහි; **පුරිමිකා අවිජ්ජා**, පළමු පහළවූ අවිද්‍යාව; **අවිජ්ජානුභාවානං** අවිද්‍යා අනුභාවයන්නේය; **පච්ඡිමිකා අවිජ්ජා**, පසුව උපදනා අවිද්‍යාව; **අවිජ්ජාපච්චුට්ඨානං**, අවිද්‍යාප්‍රත්‍යුත්ථානය වන්නේය; **පුරිමකා අවිජ්ජා අනුභාවා**, පූර්වවූ අවිද්‍යානුභාවය; **පච්ඡිමකානං අවිජ්ජා පරියුට්ඨානස්ස**, පසුව පහළවන අවිද්‍යාප්‍රත්‍යුත්ථානයාගේ; **පතිබ්‍රූහනාය**, වැඩීමට; **හෙතුභූතා**, හෙතුවූයේය; **බීජඞ්කුරෙ විය**, බීජාංකුර මෙනි; **සමනන්තර හෙතුතාය**, සමනන්තර හෙතු බැවිනි; "බීජය අඞ්කුරයට සමනන්තර හෙතුවශයෙන් යම්සේ හෙතු වන්නේද එමෙන් පළමු පහළවූ අවිද්‍යාව පසුව පහළවන අවිද්‍යාවට සමනන්තර හෙතුවශයෙන් හෙතු වන්නේය යි" සේයි; **යං පන**, යම් හෙයකින් වනාහි; **යස්මා**, යම් බීජයක් නිමිති කොට හෙත; **ඵලං නිබ්බත්තති**, ඵල නිපදනේද; **ඉදං**, මේ බීජය; **අස්ස**, ඒ ඵලයට; **පරම්පරහෙතුතාය**, පරම්පරහෙතු භාවයෙන්; **හෙතු භූතං**, හෙතු වූයේය; **ඕ**, ඒ එසේමැයි; **අහෙතු**, හෙතුතෙමේ; **සමනන්තරහෙතු**, සමනන්තරකාලවශයන් පවත්නා හෙතුය; **පරම්පරහෙතු ච**, පරම්පර කාලවශයෙන් පවත්නා හෙතුයි; **දුවිධා**, දෙවැදෑරුම් වේ; **එවං**, එසේ බීජාංකුරහෙතු මෙන්; **අවිජ්ජාපි**, අවිද්‍යාවඟේද; **අහෙතු**, හෙතුව; **සමනන්තරහෙතු**, සමනන්තර හෙතුය; **පරම්පරහෙතු ච**, පරම්පරහෙතුය යි; **දුවිධා**, දෙවැදෑරුම් වේ; සමනන්තරකාලයෙහි පහළවූ අවිද්‍යානුභාවය සමනන්තර කාලයෙහි පහළවන අවිද්‍යාප්‍රත්‍යුත්ථානයට සමනන්තරහෙතු වන්නේය; පළමු පහළවූ අවිද්‍යානුභාවය පසුව පහළවන අවිද්‍යාප්‍රත්‍යුත්ථාන

නඤට පරමපරහෙතුවන්නේහි- සේසි' වාපන, මෙයින් අනිකුදු උදාහරණයකින්ද හෙතු ප්‍රත්‍යය විභාගය දක්වනු ලැබේ:-

ථාලකඤ්ච, පහන්කබලද; වට්ටිච, පහන්වැටියද, තෙලඤ්ච තෙලද; **පදීපස්ස, පහනට; පච්චයභූතං**, ප්‍රත්‍යයවූයේය; **යථා න සභාවහෙතු, යම්සේ සම්භාරඵලවඩන හෙතු නොවේ ද; පදීපස්ස පච්චයභූතං**, ප්‍රදීපයට ප්‍රත්‍යයවූ; **අනඝනිකං**, ඝනිරහිතවූ; **ථාලකඤ්ච**, තැටියද; **වට්ටි ච**, වැටියද; **තෙලඤ්ච**, තෙලද; **දීඝපතුං**, දල්වන්ට; **ඝි**, ඝම්හෙයකින්; **න සක්කා**, නොහැකි වේ ද එහෙයින්; **පදීපා**, පූර්‍වප්‍රදීපය; **සභාවෝ හෙතු හොති**, පශ්චිම ප්‍රදීපයට සභාවහෙතු වේ ද; **විය**, එමෙනි; **ඉති**, මෙසේ හෙයින්; **සභාවෝ**, ඵලයට ආසන්නකාරණ වශයෙන් සමඵල පහළ්‍රකරන සමානභාවය; **හෙතු**, හෙතුනම්; **පරභාවෝ**, වන්තියෙන් අන්‍යවූ කබල්වැටි තෙල් ආදි ඵලොපකාර වස්තුසමපත්ති සභාවතෙමේ **පච්චයෝ**, ප්‍රත්‍යය නම්; **හෙතු**, හෙතුතෙමේ; **අප්පඛත්තිකෝ**, නියකප්‍රඛත්තයෙහි වූයේය; **පච්චයෝ**, ප්‍රත්‍යයතෙමේ; **බාහිරෝ**, එයින් බාහිරවූයේය; **ජනකෝ**, ජනකවූ අවිජ්ජානුසයතෙමේ; **හෙතු**, අවිජ්ජාපරියුට්ඨානයාගේ හෙතු වේ; **පටිගහාහකෝ**, උපස්තම්භකවූයේ; **පච්චයෝ**, ප්‍රත්‍යය නම් වේ; **අසාධාරණෝ**, අන්‍ය ඵලයන් හා සාධාරණ නොවූයේ; **හෙතු**, හෙතුයි; **සාධාරණෝ**, සකල ඵලයන් හා සාධාරණවූයේ; **පච්චයෝ**, ප්‍රත්‍යය වන්නේ ය යි; මෙසේ හොදු ප්‍රදීපොපමාවෙන්ද- හෙතුප්‍රත්‍යයන්ගේ ප්‍රකට විශෙෂය දතයුතුය- යනු භාවයි.

තවද:- ඝම්හෙයකින් හෙතු ප්‍රත්‍යය ප්‍රභෙද කාරණය මෙහි **පරිකඛාරය**-යි- කියනලද්දේද- ඒ කාරණයාගේ කාරණභාවයත්- ඵලය අපෙක්ෂානොට ඇත්තේ වේ ද එහෙයින් යම් හෙතුභාවයක් යම් කාරණයකින් වන්නේද- ඒ කාරණභාවය කිමෙක්ද? ඒ ආකාරය කිමෙක්ද? යම් ඵලයක් යම් විශෙෂයක් හෙතු නොට වේ ද- ඒ ඵලය කිමෙක්ද?-ඒ විශෙෂය කිමෙක්ද? කාරණ ඵලයන්ගේ යම් සම්බන්ධයෙක් වේද- ඒ සම්බන්ධය කිමෙක්ද? යන සියල්ල ප්‍රකාශකිරීම පිණිස "**අවූපඡෙජදඅත්ථා**" යනාදිය කීහ. අවූපඡෙජදඅත්ථා, අනුපච්ඡින්න හෙතුප්‍රත්‍යයසංඛ්‍යාත කාරණයාගේ හා ඵලයාගේ යම් අවූපඡෙජදභූතයෙක් වේ ද; **අත්ථා**, ඒ අර්‍ථය ඵලය හා සම්බන්ධයෙකින් **ඤාතති** "යම් හෙතුධර්‍මයෙක් සර්‍වථ ඵලයට උපස්තම්භකව නිරුඬ වේ ද එම හෙතුධර්‍මය අනුපච්ඡින්නය වන්නේය, යම් ඵලයක් අන්‍ය ඵලයකට හෙතු නොවී නිරුඬ වේ ද එය උපච්ඡින්න නම් ක්ෂීණාශ්‍රවයන්ගේ චුති සිත මෙනි":-

නිබ්බත්තිඅත්ථෝ, හෙතුවෙන් නිපන් ඵලයාගේ යම් නිෂ්පත්‍යවීයක් මේ ද එය, **ඵලමත්ථෝ**, ඵලාවීහි; **පටිසන්ධිඅත්ථෝ**, ප්‍රතිසන්ධිකඛන්ධයන්ගේ යම් ප්‍රතිසන්ධනාවීයෙක් වේ ද එය; **පුනබ්භවඅත්ථෝ**, පුනර්භවාවීහි; **සම්පළිබොධඅත්ථෝ**, කෙලෙසයන්ගේ යම් සම්පළිබොධාවීයෙක් හෙවත් සන්තානයෙහි පහළවන අවීයෙක් වේද- එය; **පරියුට්ඨානඅත්ථෝ**, පර්‍යුත්ථානාවීහි; **අනුසයඅත්ථෝ**, කෙලෙසුන් අරිගමනින් මුල්සිඳ නොහැරීම් අවීයෙක්වේද එය අනුසයාවීහි; **අසම්පටිවේධඅත්ථෝ**, චතුස්සත්‍යාවබෝධ බාධකාවීයෙක් වේද එය අවිද්‍යාවගේ අවිදිතකරණාවීහි; **අපරිඤ්ඤාතඅත්ථෝ**, අග්‍රමාගීයෙන් අපරිඥතාවීයෙක් වේද එය; **විඤ්ඤාණස්ස**, ප්‍රතිසන්ධිවිඥානයාගේ; **බීජඅත්ථෝ**, නාම්රූපාංකුරයට හෙතුඅයිති බීජාවීයි.

මෙපමණකින් හෙතුභාවයද- හෙතුකාරයද- ඵලයද- ඵල විඤඤයද- දක්වා පරම්පර හෙතුප්‍රත්‍යයාවීය හා සම්බන්ධාවීයක් දක්වනු පිණිස- "යත්ථ අනුපවෙජ්දෙ" යනාදිය කියනලදි:-

යත්ථ, යම් රූපාරූපධර්මප්‍රවෘත්තියෙක්හි; **අබ්භඤඤඤඤඤ**, අනුපච්ඡින්නහෙතුප්‍රත්‍යය ප්‍රභෙද කාරණයාගේ යම් අනුපවෙජ්ද යෙක් ඇත්තේද; **තත්ථ**, ඒ රූපාරූපප්‍රවෘත්තියෙහි; **සන්තති**, හෙතුඵල සම්බන්ධතාසංඛ්‍යාත සන්තතිය වේ; **යත්ථ**, යම් රූපාරූප ප්‍රවෘත්තියෙක්හි; **සන්තති**, එකී සන්තතිව්‍යවහාරය ඇත්තේද; **තත්ථ නිබ්බත්තති**, එහි සඤ්ඤයන්ගේ පහළවීම වේ; **යත්ථ**, යම් තැනෙක; **නිබ්බත්තති**, සඤ්ඤයන්ගේ පහළවීම වන්නිද; **තත්ථ ඵලං**, එහි විඥානනාම්රූපාදි ඵලය වේ; **යත්ථ ඵලං**, යම්තැනක ඵලය වන්නේද; **තත්ථ පටිසන්ධි**, එහි පිළිසිඳගැණීම වන්නීය; **යත්ථ පටිසන්ධි**, යම් තැනක පිළිසිඳගැණීම වන්නීද; **තත්ථ පුනබ්භවෝ**, එහි පුනර්භවය වන්නේය; **යත්ථ පුනබ්භවෝ තත්ථ පළිබොධෝ**, යම් තැනක පුනර්භවයක් වන්නේද එහි පළිබෝධසංඛ්‍යාත කෙලෙස තපනතිය වන්නේය; **යත්ථ පළිබොධෝ තත්ථ පරියුට්ඨානං**, යම් තැනෙක පළිබොධය වන්නේද, එහි කෙලෙසුන්ගේ නැගිසිටීම වන්නේය; **යත්ථ පරියුට්ඨානං තත්ථ අසමුග්ඝාතෝ**, යම් තැනෙක කෙලෙසුන්ගේ නැගිසිටීම වන්නේද එහි කෙලෙසසමූද්ඝාතනයෙක් නොවන්නේය; **යත්ථ අසමුග්ඝාතෝ තත්ථ අනුසයෝ**, යම් තැනෙක කෙලෙසසමූද්ඝාතනයෙක් නැත්තේද එහි අනුශය වන්නේය; **යත්ථ අනුසයෝ තත්ථ අසම්පටිවේධෝ**, යම් තැනෙක අනුශයද එහි සත්‍යාවබෝධ බාධක වේ; **යත්ථ අසම්පටිවේධෝ තත්ථ අවිජ්ජා**, යම්තැනෙක සත්‍යාවබෝධ බාධකද එහි අවිද්‍යාව වේ; **යත්ථ**, යම් රූපාරූප ප්‍රවෘත්තියෙක්හි; **අවිජ්ජා**, අවිද්‍යාව වන්

නීද; තත්ථ; එහි; **ආසවානං විසෙසපච්චයෝ**, ආසවප්‍රතිඝසම්පයුත්තවිඤ්ඤාණය; **අපරිඤ්ඤාපච්චයා**, පරිඥානම්මය වශයෙන් ප්‍රහාතව්‍යය යි නොදන්නා ලද්දේය; **යත්ථ ආසවානං විසෙසපච්චයෝ අපරිඤ්ඤාපච්චයා**, තත්ථ, ඒ රූපාරූප ප්‍රවෘත්තියෙහි; **බීජත්තං**, විඤ්ඤාණයාගේ බීජභූතය වේ.

සීලක්ඛන්ධෝ, පරිශුද්ධ ශීලසඤ්චිතයෙමේ; **සම්මාදිට්ඨිඛන්ධස්ස පච්චයෝ**, මහද්ගත ධර්මසමූහයට ප්‍රත්‍යය වන්නේය; **සම්මාදිට්ඨික්ඛන්ධෝ පඤ්ඤාක්ඛන්ධස්ස පච්චයෝ**, මහද්ගත ධර්මසමූහතෙමේ මාගීඵල ප්‍රඥාසඞ්ඛ්‍යාත ප්‍රඥාස්කන්ධයට ප්‍රත්‍යය වන්නේය; **සමාධික්ඛන්ධෝ විමුත්තික්ඛන්ධස්ස පච්චයෝ**, ප්‍රඥාස්කන්ධතෙමේ ඵල සමාධිසඞ්ඛ්‍යාත විමුක්තිස්කන්ධයට ප්‍රත්‍යය වන්නේය; **විමුත්තික්ඛන්ධෝ විමුත්තිඤාණදස්සනක්ඛන්ධස්ස පච්චයෝ**, විමුක්තිස්කන්ධතෙමේ ප්‍රත්‍යවේක්ෂණඥානදර්ශනස්කන්ධසඞ්ඛ්‍යාත ප්‍රත්‍යවේක්ෂාඥානස්කන්ධයට ප්‍රත්‍යය වන්නේය; **තිස්සෝ සික්ඛා පිතඤ්ඤූතාය පච්චයෝ**, තිස්සඞ්ඛ්‍යාත බහුශ්‍රුතයන් මෙනවට පයිරුපාසනය කිරීම පිත සඞ්ඛ්‍යාත ධර්මෝපසංහිතප්‍රමෝද්‍යය උපදවා කමටහන් වැඩීමට ප්‍රත්‍යයවන්නේය; **පීතඤ්ඤූතා මනසිකාරානං පච්චයෝ**, එකි පිතඤ්ඤූතාවය කමටහන් වැඩීමෙන් භාවනාමාත්‍රජනනය ට ප්‍රත්‍යය වන්නේය; **මනසිකාරානං අනන්තරසමනන්තරානං පච්චයෝ**, භාවනාමාත්‍රජනනය පඤ්චවිධපධානියඞ්ගයෙන් සමන්විතවූ ආනන්තර්‍යභාවජනනයට ප්‍රත්‍යය වන්නේය; **වාපනා**, තෙහොත්; **ඡට්ඨා**, ඝම් පරිද්දකින්; **චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච පටිච්ච**, චක්ෂුරින්ද්‍රියනිසාද- රූපාරම්මණයන් නිසාද; **චක්ඛුවිඤ්ඤාණං උප්පජ්ජති**, චක්ඛුවිඤ්ඤාණය පහළ වේ ද; **තත්ථ**, එහි; **චක්ඛු**, චක්ෂුරින්ද්‍රියය; **අධිපතිආදිපච්චයට්ඨානාය**, ඉන්ද්‍රියප්‍රත්‍යයභාවයෙන්; **පච්චයෝ**, චක්ඛුවිඤ්ඤාණයට ප්‍රත්‍යය වන්නේය; **රූපා ආරම්මණපච්චයට්ඨානා**, රූපයෝ ආරම්මණප්‍රත්‍යයභාවයෙන් ප්‍රත්‍යය වෙති; **ආලෝකෝ**, ආලෝකතෙමේ; **සහජාතාදිපච්චයට්ඨානා**, උපනිශ්‍රය භාවයෙන් ප්‍රත්‍යයවන්නේය; **මනසිකාරෝ**, මනසිකාර සඞ්ඛ්‍යාත ක්‍රියා මනොධාතුතෙමේ; **සහාදිවා හෙතු**, චක්ෂුර්විඤ්ඤාණය හා සමාන බැවින් සහාවහෙතු වන්නේය; **සඞ්ඛාරා**, පුණ්‍යාදි අභිසංඛාරයෝ; **විඤ්ඤාණස්ස පච්චයෝ**, ප්‍රතිසන්ධිවිඤ්ඤාණයට ප්‍රත්‍යය වෙති; **සහාදිවා හෙතු**, නාමසන්ධිභාවයෙන් සමානවෙයින් සහාවහෙතුද වේ; **විඤ්ඤාණං නාමරූපස්ස පච්චයෝ**, විඤ්ඤාණය නාමරූපයට ප්‍රත්‍යයවන්නේය; **සහාදිවා හෙතු**, සවභාවහෙතුද වන්නේය.

නාමරූපං සළායතනස්ස ... පෙ ... දෙමනස්සං උපායාසස්ස පච්චයෝ, සහාදිවා හෙතු ... මේහි අරුත් උත්තානයි ...

එවං, උක්තප්‍රකාරවූ; **සෝ කෝචි උපනිස්සයෝ**, යම් කිසි ප්‍රත්‍යය ධර්මයෙක් වේද; **සෝ සබ්බෝ**, ඒ සකල ප්‍රත්‍යයධර්ම තෙමේ; **පරිකථාහාරෝ**, සප්තියඵලය හා‍ත්පසින් රැස්කරණතෙයින් පරිෂ්කාරනම්; ඒ හෙතුප්‍රත්‍යය සංඛ්‍යාතවූ පරිෂ්කාරධර්මයන් නිඛ්‍යාරණය කොට වර්ණනා කරණ නෙත්තික්‍රමය පරිකථාහාර ය යි කියත්‍ර ලැබේ:- තෙනාහ ආයස්මා මහාකච්චායනෝ, "යෙ ධම්මා ඤං ධම්මං ජනයන්තී"ති.....

පරිකථාහාර විභඞ්ගාපි වර්ණනායි.

නන්ථ කතමෝ **සම්මාරොපනා** හාරෝ? "යෙ ධම්මා යම්මූලා යෙ චෙකන්ථා පකාසිතා", යනාදි නිදේශ ග්‍රන්ථොක්ත අභිප්‍රාය විභාගකිරිමයි.....

එකස්මිං පදට්ඨානෙ, යම් කිසි එකමකාරණයහුත ධර්මයක්හු සූත්‍රයෙන් ගත්කලෑ; **සතතකානි පදට්ඨානානි**, අන්‍ය ධර්මයන්ට කාරණවූ යම්පමණ ධර්මයෝ; **ඔතරන්ති**, ඒ ධර්මයෙහි බැස ගනිද්ද; **තානි සබ්බානි**, ඒ සකල පදට්ඨාන භූතධර්මයෝ; **සම්මාරොපිතන්ති**, මොනවට නිඛ්‍යාරණ වශයෙන් හෙත දෙශනා රූඪකවයුත්තාහුය; (දෙශනාරූඪවූ ධර්මයන් මෙන් ගරුතොට කියයුත්තාහ යි සේසි) **ආවත්තෙට්ඨෙන හාරෙ**, ආවර්තනහාරයෙහි; **ඉථා යම්සේ**; අනෙනපදට්ඨානයන්ගේ පර්‍යේෂණය කියන්නලද්දේද- එසේම මෙහිදු- **බහුකානි පදට්ඨානානි**, බොහෝ පදස්ථාන ධර්මයෝ; **ඔතරන්ති ඉති**, බැසගනිත්ය යි දතයුතු; **නන්ථ**, ඒ සම්මාරොපනහාරයෙහි; **සම්මාරොපනා**, සම්මාරොපනය; **වත්තබ්බා**, පදට්ඨානය වෙවචනය භාවනාය පහාණය යි සිව්වැදෑරුම්වේ.....

"මේ සම්මාරොපනහාරයෙහි- පදට්ඨාන වෙවචනයෝ කුමක් හෙයින් ගන්නාලද්දාහුද? පදට්ඨාන වෙවචනහාරවලයෙහි නම් භාගය කියන්නලද්දේ නොවේද? ඒ එසේමය මෙහි පදට්ඨාන වෙවචනයන්ගේ ගැණීම භාවනා ප්‍රහාණයන්ගේ අධිෂ්ඨානවිෂය දැක්වීම පිණිසද ඔවුන්ගේ අධිවචන විභාග දක්වනුපිණිසද වේ, එසේ ඇතිකල භාවනප්‍රහාණයෝ සුවසේ දතහැක්කාහුද පණවන්ට සුකරවූවෝ ද වෙති එහෙයිනි.....

නන්ථ, ඒ චතුර්විධ සම්මාරොපනයන් අතුරෙහි; **පදට්ඨානෙන**, පදට්ඨාන වශයෙන්; **සම්මාරොපනා**; සම්මාරොපනය; **කතමා**, කවරිද?.....

සබ්බපාපස්ස ..... පෙ ..... සාසනනන්ති.....

(මේ ඔවාද පාතිමෝක්ඛගාථාවෙහි කියනලද) කායස්ස, ඒ බුද්ධ ශාසනයට නෙවත් බුද්ධොවාදයට; පදට්ඨානං, පදට්ඨානවූයේ කිං, කිමෙක්ද? කායසුචරිත වචීසුචරිත මනොසුචරිත යන ත්‍රිවිධ සුචරිත කෙනෙක් වෙද්ද මේ ත්‍රිවිධ සුචරිතය බුද්ධශාසනයට පදට්ඨානයි;

ඒ ත්‍රිවිධ සුචරිතයන් අතුරෙහි කායිකවූද වාචසිකවූද යම් සුචරිතයෙක් වේද මේ ශීලසකඛයි; මනොසුචරිතයෙහි යම් අනභිජ්ඣා අබ්‍යාපාදයෝ වෙත්ද මේ සමාධිසකඛයි; එහිම සම්මාදිට්ඨිය ප්‍රඥාසකඛයි; ත්‍රිවිධ සුචරිතයෙන් නිඛාරණය කරණලද මේ ශීලාදි සකඛත්‍රය ශාසනයට පදසථානයි; එහි ශීලසකඛයත් සමාධිසකඛයත් සමථයි, ප්‍රඥාසකඛය විදර්ශනායි; සකඛත්‍රයෙන් නිඛාරණය කරණලද මේ සමථ විදර්ශනාවයද පදසථානයි; ඒ සමථවිදර්ශනාවන් අතුරෙහි සමථයාගේ ඵලය රාගවිරාගයෙන් ලැබෙන ඵලසමාධියයි; විදර්ශනානුභාවයේ ඵලය අවිජ්ජාවිරාගයෙන් ලැබෙන ඵලප්‍රඥාවයි; සමථවිදර්ශනාවෙන් නිඛාරණය කොටැගන්නාලද මේ ඵලවයද පදසථානයි.

වනං, වනසංඛ්‍යාත පඤ්චකාමගුණය; වනථස්ස, වනථසංඛ්‍යාත කාමතෘෂ්ණාවට; පදට්ඨානං, පදසථානයි; වනං, වනනම්; කිඤ්චි, කිමෙක්ද? වනථෝ, වනථනම්; කෝච, කවරේද? පඤ්චකාමගුණා, රූපාදි පවකාම බඛනයෝ; වනං කාච, වනනම්; තණ්හා, පඤ්චකාම තෘෂ්ණාව; වනථෝ වනථ නම්; මෙය පදසථාන යි; තවද- ඉත්ථී වා, ඉතිරි යි හෝ; පුරිසෝ වා, පුරිස් යි හෝ; නිමිත්තග්ගාහාදිභා, නිමිත්තවශයෙන් ගැණීම; වනං නාම, වනනම්; අභිභවති බන්ධුං, ඇස යෙහෙන; අභිභවති සඛාතං, කණ යෙහෙක; අභිභවති ඝාණං, නාසිකා යෙහෙක; අභිභවති ජිව්හා, දිව යෙහෙක; අභිභවති කාදිභා, කය යෙහෙක; ඉති, මෙසේ; තෙසං තෙසං සංඅඛභපච්චඛානං, ඒ ඒ අභප්‍රත්‍යයන්ගේ; අනුව්‍යඤ්ජනග්ගාහාදිභා, අනුබ්‍යඤ්ජනවශයන් ගැණීම වනථ නම්; ඉදං, මේ නිමිත්තග්ගහණ සංඛ්‍යාත වනය, පදට්ඨානං, අනුබ්‍යඤ්ජනග්ගහණසංඛ්‍යාත වනථයට පදසථානයි.

එහි- වනීයතීති වනං; වනති වනුතෙ ඉතිවා වනං; වනසමාජතෝ වනථෝ යි නිරුක්තිවන යි.

අපරිඤ්ඤාතානි, පරිඥාභිසමය වශයෙන් අවබොධ නොකරණලද්දාවූ; ජ අජ්ඣත්තිකබාහිරානි ආයතනානි, අධ්‍යාත්මික බාහිර ඝළායතනයෝ වන නම්; තදුභයං පටිච්ච, ඒ උභයායතන කයන් නිසා; යං සංයොජනං උප්පජ්ජති, යම්බඳු සංයොජන

යක් උපදනේද- මේ වනථ නම්; ඉදං මේ වාදහායතන සංඛ්‍යාත වනය; පදට්ඨානං, සංයොජන සංඛ්‍යාත වනථයට පදසථානයි; "වන නම් අනුසයයි- වනථ නම් පරියුට්ඨානයි" ඉදං, මේ අනුශයසංඛ්‍යාත වූහාය; පදට්ඨානං, පරියුට්ඨානවනථයට පදසථානයි; අඤ්ඤා, එනෙයින්; භඟවා, භාග්‍යවතුන්වහන්සේ- "ජෙට්ඨං වනසණ්ඩ වනථසණ්ඩ" යනාදිය; ආහ, වදළසේකැ:- මේ පදසථාන වශයෙන් සමාරොපනයි.

නනු, ඒ චතුර්විධ සමාරොපනයන් අතුරෙහි; වවවත්‍ථාන සමාරොපනා, පඤ්ඤාය වචනයෙන් සමාරොපනය; කතමා, කවරිද? "රාගවිරාගා චෙතොවිමුත්ති සෙක්ඛඵලං" යන මෙහි රාග විරාගා චෙතොවිමුත්ති අසෙක්ඛඵලං" යන වචනත්‍රය අනාගාමී ඵලයට පඤ්ඤායයි; අවිජ්ජාවිරාගා පඤ්ඤාවිමුත්ති අසෙක්ඛ ඵලං, යන වචනත්‍රය අහත්ඵලයට පඤ්ඤායයි; එසේම රාගවිරාගා චෙතොවිමුත්ති ඛාමධාතු සමතික්කමනං, යන වචනත්‍රය අනාගාමී ඵලයටද අවිජ්ජාවිරාගා පඤ්ඤාවිමුත්ති සොඝතරිධාතු සමතික්කමනං, යන වචනත්‍රය අහත්ඵලයටද පඤ්ඤායයි; "පඤ්ඤින්ද්‍රියං පෙ ඛමෙම ඤාණං" යන ඉදං සබ්බං, මේ සියලු වචන ප්‍රඥාවට වෙවචනයි; මේ වවචනයෙන් සමාරොපනයි.

නනු, ඒ චතුර්විධ සමාරොපනයන් අතුරෙහි; භාවනාය සමාරොපනා, භාවනාවෙන් සමාරොපනය; කතමා, කවරිද?, යථා හ භඟවා, "තසමා තිහ ත්වං භික්ඛු කායෙ කායානුපස්සී විහරාහි. පෙ අභිජ්ඣාදොමනස්සං"

මේකි ඇනාපි යන්තැන් විරියින්ද්‍රියද සම්පජඤ්ඤා යන්නෙන් පඤ්ඤින්ද්‍රියද සතිවා යන්නෙන් සතින්ද්‍රියද චිතෙකග්ග ලොකෙ අභිජ්ඣාදොමනස්සං යන්නෙන් සමාධින්ද්‍රියද නිබ්බාරණ වශයෙන් සමාරොපක කි; "මෙසේ රූපකයෙහි කායඅනුවබලන සුලුව වසන යොගාවචරයාගේ ඔවිසීවථන්හුම වැඩීමෙන් පිරීමට යෙත්, කිනම් කරුණකින්දයත්? සීවථන්ගිය සිවිඉදුරන්ගේ සමලකුණු ඇතිබැවිනි; ඔවිසීවථන් වඩනුලබනකලැ සිවි සම්පදන්හු වැඩීමෙන් පිරීමට යෙත්, එසේම ඉදුපා ඉදුරු බල බොජ්ඣ මඟඟයෝද වැඩීමට යෙත්; ඉඤ්ඣ කාරණා, කිනම් හෙතුවකින් ද යත්?, කි, යම්නෙයකින්; සබ්බබොධිපක්ඛියා, සත්‍යාව බොධියට පවුණුවන්නාවූ; බොධිපක්ඛියා, මාගීඥනයට පසඟවූ; ඉමෙඛ ධම්මා, සමථවිදර්ශනා ධර්මයෝම; නිඤානිනලකඛණා, නෙයථීය \කලක්ෂණයෙන්; එකලකඛණා, සමානලක්ෂණ ඇත්තෝය, ඉතිනි; ඉති, ඒ බොධිපාක්ෂික ධර්මයෝ; එකලකඛණත්තා,

සමාන ලක්ඛණවත් බැවින් භාවනාවෙන් පිරීමට යෙත්; මේ භාවනාවෙන් සමාරොපනය යි.

තත්ථ කතමා පනානේඤ්ජා සමාරොපනා? කායෙ කායානුපස්සී විහරන්තස්ස, කායං කායානුපස්සිං ච ඉරියන්තං පවත්තන්තේ; අනුමත්තං සුඛන්ති විපල්ලාසං පජහති, අදුක්ඛමසුඛන්ති සුඛං යි ගන්නා සුඛවිපල්ලාසය පහකෙරේ; කබළීකාරෝ ආහාරෝ ඔජා අරූපී පරිඤ්ඤං නච්ඡති, ඒ කායානුපස්සිහුගේ කබළීකාර ආහාරයද පරිඤ්ඤාසමයයයේ; කාමුපාදානා නාම අනුපාදානා හවන්ති, කාමුපාදානයෙන් කාමභවය දැඩිකොට නොගන්නේ දවේ; කාමයොගෝපි නාම විසංයුත්තා හවන්ති, කාමයොගයෙන් වෙන්වූයේද වේ; අභිජ්ඣා කායගන්ථෝපි නාම විප්පයුජ්ජති, අභිජ්ඣාකායගන්ථ සංඛ්‍යාත කාමච්ඡන්ද සමූහග්‍රන්ථියෙන්ද විශේෂයට පැමිණේ; කාමාසවෝපි නාම අනාසවා හවන්ති, කාමාශ්‍රවයෙන් ආශ්‍රව රහිතද වේ; කාමෝඝෝපි නාම උත්තිණ්ණා හවන්ති. කාමෝඝයෙන් එතරවූයේද වේ; රාගසල්ලෝපි නාම විගතසල්ලා හවන්ති, රාගහුලෙන් විගත හුළැත්තේද වේ; කායසංඛාරෝපි නාම විසඞ්ඛාරණිරෝධං පරිඤ්ඤං ගච්ඡති, ඒ කායානුපස්සිහුගේ රූපධර්මානුගතවූ විඥානස්ථිතියද පරිඤ්ඤාසමයට යේ; රූපධාතුයා චිත්තජෝපි නෝපි හවති, ඒ කායානුපස්සිහුගේ රූපධාතු කෙරෙහි ඇලීමද පහවූයේ වේ; නව ඤාණානි භාවෙති, ඤාණතෝයෙද නොයේ.

මෙසේ කායානුපස්සනා විශේෂයෙන් අසුභානුපස්සනාවම කාමරාගයට හා තදේකඨ කිලෙසයන්ටද එකාන්තයෙන් ප්‍රතිපක්ෂවන්නීත්‍රයි අසුභසඤ්ඤා- කබළීකාරාහාර පරිඥාවන්ට සතු රූවූ කාමුපාදාන- කාමයොග- අභිජ්ඣා කායගන්ථ- කාමාසව- කාමෝඝ- රාගසල්ල- ආදි කෙලෙසයන්ගේද නිර්වාරණ වශයෙන් සමාරොපනය දක්වනලදී.

වේදනාසු වේදනානුපස්සීවූ ඉරියව් පවත්වන යොගාවචර තෙමේද "දුක්ඛේ සුඛන්ති" විපල්ලාසං පජහති, දුක්ඛයෙහි සුඛයයි ගන්නා සුඛවිපල්ලාසය පහකෙරේ; ඵස්සෝ වස්ස ආහාරෝ ඔජා අරූපී පරිඤ්ඤං ගච්ඡති, ඔහුගේ ඵස්සාහාරයද පරිඤ්ඤාවට පැමිණේ; භවුපාදානෙනාපි නාම අනුපාදානා හවති, ශීලාදියෙන් භවසුඛිය වන්නේයයි වේදනා සස්වාදයෙන් පවත්නා සීලබ්බතුපාදාන සංඛ්‍යාත භවෝපාදානයෙන් උපාදාන රහිතවූයේද වේ; භවයොගෝපි නාම විසංයුත්තා හවති, භවයොගයෙන් වෙන්වූයේද වේ; බ්‍යාපාද කායගන්ථෝපි නාම විප්පයුජ්ජති, වේදනා වශයෙන් "අනත්ථං මේ අවධි" යනාදි ක්‍රමයෙන් පවත්නා ව්‍යාපාද

කාරණග්ගහණෙහි වෙන්වේ; භවාසවභවනව අනාසවෝ භවති, භවාශ්‍රවයෙන් අනාශ්‍රවද වේ; "සඞ්ඛාරසඤ්ඤා උභතිභාගාභවති භවෝඝයෙන් එතරවූයේද වේ; "දුක්ඛඤ්ඤල්ලනව විඤ්ඤල්ලා භඞ්ගී, වෙදනුපිකාවසා විඤ්ඤාණන්ති පරිඤ්ඤං ගච්ඡති, වෙදනා ඛාතුයං වසා රාගෝ පහීනෝ භවති, තව දෙසාගතිං ගච්ඡති" මේ උභතානතිය. "විඤ්ඤාණ විඤ්ඤාණුපසසි විහරතෝ අතිවෙව නිවත්තති විපල්ලාසං පජහති" යනාදිය සුගමයි. මේ ප්‍රභාණක්‍රමයෙන් සමාරොපනයි. "යෙ ධම්මා ඝම්මූලා" යනාදි නිදෙසගාථාව උකතාවිය.

සමාරොපනාහාර විභඞ්ගාපි වණ්ණනායි.

ශ්‍රී සඛඤ්ඤාදය පාඨිවඞ්ගා ඝණවාවඛාවාඛ්‍යී ප්‍රණීත ඤාණකී ඡාරාවිඛිපනී නාමිවූ ඤෙයාපිවඛ්‍යාඛ්‍යාන ඝණී ඝමාරොපනාහාර විභඞ්ගාපි වණ්ණනා නිමි.

උකතප්‍රකාරයෙන් අනෙකවිධ සූත්‍රප්‍රදෙශයෙන් දෙශනාදී ඝෝඛඝගාරයන්ගේ විභාගදර්ශන සංඛ්‍යාතහාර විභඞ්ගයාගේ අවිච්භාගය සැකෙවින් දක්වා දැන් එකම සූත්‍රප්‍රදෙශයෙක්හි ඝොඩිඝහාරයන් යෙදූ සූත්‍රාවිසංවණ්ණනා සංඛ්‍යාතහාර සමපාත වාරයාගේ අවිච්භාගය දක්වනු ලැබේ.

මෙම හාරසමපාත වාරාපි සංවණ්ණනාරම්භයෙහි බදරතිථ ධම්මපාල මහාසවාමිපාදයෝ:-

"එවං සුපරිකම්මකතාය භූමියා නානාවණ්ණානි මුත්තාපුප්ඵානි පකිරිත්වා විය සුනිකඛිත සිප්පාචරිය විචාරිතෙසු සුරත්ත සුවණ්ණාලඞ්කාරෙසු නානාවිධ රංසිජාල සම්පජ්ජලානි විවිධානි මණිරත්නානි බන්ධිත්වා විය මහාපථවිං පරිවත්තෙත්වා පපට ඝොජං ඛාදාපෙත්වා විය භයාජනික මධුගණ්ඩං පීළෙත්වා සුම ධුරසං පායෙත්වාවිය ච ආයස්මා මහාකච්චාඝනා නානා සුත්තාපදෙසෙ උදාහරන්තා ඝෝළසහාරෙ විභජිත්වා ඉදානි තෙ එකසම්බන්ධෙනෙව සුත්තෙන ඝොජෙත්වා දස්සෙන්තා හාරසමපාත වාරං ආරභි" යනු කිහ.

හාරසමපාතවාරය ආරම්භකරණුදෙස් "ඝොළස හාරා පඨමං" යනාදි ගය දක්වූහ. එහි අරුත් නිදේශවාරයෙහි කියනලදී. කස්සා, ඒ ගාථාවගේ; නිද්දෙසා, නිදේශවිභාගතෙමේ; කුණිං

දක්ඛිණා, කොතැනක දහයුතුද; **ආරම්මණූපනිධාය**, ආරම්මණූපනිධාන වාරයෙහිය; **තත්ථ**, ඒ ඡෝඩශාකාර සම්පාතයන් අතුරෙහි; **දේසනාහාර සම්පාතෝ**, දෙශනාහාරයාගේ සම්පාත තෙමේ; **කතමෝ**, කවරේද?

අරක්ඛිතේන චිත්තේන මිච්ඡාදිට්ඨි හතේනව
පීනම්බාහි භූතේන වසං මාරස්ස ගච්ඡතී"ති.

අරක්ඛිතේන, චක්ඛුර් වාරාදින්හි සමෘති ආරක්ෂා රහිත කෙසින් ගොපනය නොකරණ ලද්දාවූ; **මිච්ඡාදිට්ඨිහතේනව**, ශාශ්වතාදි මිථ්‍යාදෘෂ්ටි වෙශයෙන් දූෂිතවූ; **පීනම්බාහි භූතේන**, චිත්ත චෛතසිකයන්ගේ අකල්‍යතාලක්ෂණ සම්පීනම්බයෙන් මඩ නාලද්දාවූ; **චිත්තේන**, චිත්තහෙතුවෙන්; **මාරස්ස වසං ගච්ඡති**, කෙලෙශාදිමාරයාගේ වශසංඛ්‍යාත ඵලාභාව කරණීයභාවයට පැමිණේය යී වදාළසේක.

මෙහි අරක්ඛිතේන චිත්තේන යනු කුමක් දක්වන්නේද? සමාදං, ෂඩ්වාරයෙහි සමෘති පරිත්‍යාග ලක්ෂණ ප්‍රමාදය දක්වයි; **තං**, ඒ ප්‍රමාදය; **මච්චුමුඛාභිභූතං**, ගුණධර්මයන් මරණ කෙසින් මෘත්‍යුසංඛ්‍යාත මාරයාගේ වශයෙහි පවත්වන නැනය. මෙසින් අරක්ඛිතේන චිත්තේන යන ප්‍රථමපාදය සහ දුරවැනිපාදය හා සම්බන්ධකොට දක්වයි; මිච්ඡාදිට්ඨිහතේනව යනු ෂඩ් අභිවෙග නිවරණයි පශ්‍යති, ශාශ්වතයෙහි නිත්‍යයයි දක් නේද එකලු ඔහුගේ සිත, මිච්ඡාදිට්ඨිහතංනාම වුවමනි, මිථ්‍යා නිවේශයෙන් දූෂිතවූයේ නමැයි කියනු ලැබේ.

ඡන්දා, ඒ සවභාවයෙන්ම අනිත්‍යවූ සඤ්ඣපචකයාගේ නිත්‍ය යයි බැලීම; **විපල්ලාසෝ**, විපර්‍යාශ ග්‍රහණයවේ; **ඡන්දා පන විප ල්ලාසෝ**, ඒ විපර්‍යාශ ග්‍රහණතෙමේ; **කිං ලක්ඛණෝ**, කිතම් ලක්ෂණ ඇත්තේද?; **විපරීතග්ගාහලක්ඛණෝ විපල්ලාසෝ**, විපර්‍යාශතෙමේ විපරීතග්‍රහණ ලක්ෂණකොට ඇත්තේය; **ඡන්දා කිං විපල්ලාසයති**, ඒ විපර්‍යාශතෙමේ කුමක් විපර්‍යාශයට පමුණුවාද?, සඤ්ඤා- චිත්ත- දිට්ඨි- යන ධර්මත්‍රය විපර්‍යාසයට පමුණුවන්නේය; **ඡන්දා කුහිං විපල්ලාසයති**, ඒ විපර්‍යාසතෙමේ කුමක් ගොචරකොටැ පිහිටා එකී ධර්මත්‍රය විපර්‍යාස කෙරේද යත්?; **චතූසු අත්තභාව වත්ථූසු**, "රූපං අත්තතෝ සමනුපස්සති" යනාදි චතුර්විධ සක්කායදෘෂ්ටියට වැතුවූ පඤ්චෝපාදානස්කන්ධ යන් ගොචරකොට ගෙණය.

ආහිතෝ අහං මානෝ එත්ථාති අත්තා, අත්තානි භවති එත්ථ බුද්ධිවොහාරෙවාති අත්තභාවෝ, සෝ එව සුභාදීනං විපල්ලා සස්සව අධිට්ඨාන භාවතෝ වත්ථුමාති අත්තභාවවත්ථූනි වුච්චති.

රූපං අත්තතෝ සමනුපස්සති, රූපය ආත්මවශයෙන් බලන්නේද; **රූපවන්තං වා අත්තානං**, තමන් රූපවන්තයෙකු කොට හෝ බලන්නේද; **අත්තනි වා රූපං**, තමා තෙරෙහි රූපය ආරූඪකොට හෝ බලන්නේද; **රූපස්මිං වා අත්තානං**, රූපය තෙරෙහි තමන් ආරූඪකොට හෝ බලන්නේද යන සත්කායදෘෂ්ටිය විස්තර කරයි; වේදනා සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණ යන සත්කායන් පිළිබඳ වද මෙසේමැයි.

කාමං, විපශ්‍යීබෝධිසත්වයනුවූ ඒ රූපාදි පඤ්චස්කන්ධයන් අතුරෙහි; **අසුභෙ සුභං ඉති**, අසුභයෙහි සුභය යී විපරීතග්‍රහණයට නිමිත්ත නොදැ; **රූපං සඛණ්ඩං විසල්ලාඝවත්තු**, රූපස්කන්ධය ප්‍රථම්වූ සුභ විපශ්‍යීබෝධියට වසනුයි; **දුක්ඛෙ සුඛං ඉති**, දුක්ඛයෙහි සුඛයයී විපරීත ග්‍රහණයට නිමිත්තවූ; **සමදනා දුක්ඛං විසල්ලාඝවත්තු**, වේදනාස්කන්ධය විතීයවූ සුඛවිපශ්‍යීබෝධියට වසනුයි; **අනත්තනි අත්තා ඉති**, අනාත්මයෙහි ආත්මයයි විපරීතග්‍රහණයට නිමිත්තවූ; **සඤ්ඤා, සඞ්ඛාරා ච නතිඤං විසල්ලාඝඩිත්තු**, ඇංඳුසංසකාරයෝ තෘතීයවූ ආත්මබෝධි විපශ්‍යීබෝධියට වසනුයි; **අනිච්චම්ව නිච්චං ඉති**, අනිත්‍යයෙහි නිත්‍යයයි විපරීතග්‍රහණයට නිමිත්තවූ; විඤ්ඤාණං චතුත්ථං විපල්ලාඝවත්තු. විඤ්ඤාණස්කන්ධය ඝතාවැහිවූ නිත්‍ය භාව විපශ්‍යීබෝධියට වසනුයි.

මේ සංඛ්‍යා ප්‍රණීණානුක්‍රමය සත්ත්වභෙදයෙහි- සමෘති ප්‍රසාදනවශයෙන් නිත්‍යභාව විපශ්‍යීබෝධය චිත්තානුපස්සනාභිදැ- ආත්මභාවවිපශ්‍යීබෝධය ධම්මානුපස්සනාභිදැ- හෙවරැඹ්ග්‍රහණයටයෑමෙන් නෘතීය චතුර්ථ සප්තතයන් භජනය කෙරේ.

මේ විපල්ලාඝවිභාගයෙහි "කෙඃ කිං විපල්ලාඝයතීති තඤ්ච ධම්මෙ සඤ්ඤං චිත්තං දිට්ඨිම්හි" යන ප්‍රථමානුයෝග විසර්ජිතා වාක්‍යයෙන් ස්ථූලතරණලද සඤ්ඤා- චිත්ත- දිට්ඨි- විපල්ලාඝයන් අතුරෙන් සඤ්ඤාවිපල්ලාඝය සියල්ලටම මඛා මෘදු වන්නේය අනිත්‍යාදි විෂය ධර්මයන් මිථ්‍යාවශයෙන් වැටහෙන ආකාර ග්‍රහණය පමණක් කෙරේ මුවපොල්ලන්ව පඹරුකෙරෙහි මිනිසය යි උපදනා සංඥාවමෙයි, චිත්තවිපල්ලාඝය ඊටවඩා බල වත් වන්නේය, ඕණිරුවන් නොවූයෙහි එබදු වත් සටහන් අසුරෙන් ඕණිරුවනැයි පැටලිම සමන් නිත්‍යාදි විෂයෙන් සිතූ හන් පමණක් කෙරේ, දිට්ඨිවිපල්ලාඝය සියල්ලවමවඩා ඉතා බල වත්ය, යම් යම් අරමුණක යම් යම් ආකාරයකින් වැටහේද ඒ ඒ ආකාරයෙන් එම අරමුණ සස්සතාදි වශයෙන් "ඉදමෙව සච්චං මොඝමඤ්ඤං" යනුවෙන් ඇතුළත්වෙමින් පවත්නේය, මෙහි

සඤ්ඤාවිපල්ලාසය චිත්තවිපල්ලාසයටද චිත්තවිපල්ලාසය දිට්ඨි විපල්ලාසයටද හේතුවේ.

තවද මූලහේතුවශයෙන් විපල්ලාසයන් විභාගකොට දක්වනු පිණිස "ඉමේ ධම්මා චිත්තස්ස සඞ්කිලෙසා" යනාදිය කිහ:- තණ්හාව අවිජ්ජාව, තෘෂ්ණාවද අවිද්‍යාවද යන; මේ ධර්මයෝ, අකුශලධර්මයෝ දෙදෙනා; චිත්තස්ස සඞ්කිලෙසා; චිත්තසංක්ලේශයෝයි; තණ්හානිවුතං චිත්තං, තෘෂ්ණාවෙන් වසුදනාලදසිත; "අසුභෙ සුභන්ති දුක්ඛෙ සුඛන්ති" යන මිසි විපල්ලාසඝි, සුභ සුඛසංඛ්‍යාත විපල්ලාසවශෙන්; විපල්ලාසිසති, විපර්‍යාසකරණ ලැබේ; දිට්ඨිනිවුතං චිත්තං, දෘෂ්ටිවශයන් වසුදනාලද සිත; අනිච්චෙ නිච්චන්ති අනත්තෙ අත්තාති" යන මිහි විපල්ලාසෙති, නිත්‍ය භාව අත්තභාව සංඛ්‍යාත විපල්ලාසවශෙන්; විපල්ලාසිසති, විපර්‍යාසකරණ ලැබේ; තත්ථ, ඒ විපර්‍යාසයන් අතුරෙහි; සෙය දිට්ඨිවිපල්ලාසො, යම් දෘෂ්ටිවිපර්‍යාසයෙක් වේද; සෙය, ඒ දෘෂ්ටි විපර්‍යාසතෙමේ; අත්තානංරූපං, ඉකුත්වූරූපද; අත්තතොතා, ආත්මවශයෙන්; සමනුපස්සති, බලයි; අත්තතොවේදනාදියද එසේමය; තත්ථ, ඒ විපල්ලාසයන් අතුරෙහි; සොතණ්හා විපල්ලාසො, යම් තෘෂ්ණා විපර්‍යාසයෙක් වේද; සෙය, හේතුතෙමේ; අනාගතරූපං අභිනන්දති, අනාගතරූපද දිඹාහිනන්දනා වශයෙන් සතුටින් පිළිගන්නේය; අනාගත වේදනාදියද මෙසේමය.

මෙහි "අතීතං රූපං අත්තතොතා සමනුපස්සති" යනාදියෙන් බුදුරජාණන් වදළ අටලෝස් වැදෑරුම්වූ පුබ්බන්තානුකප්පිකවාදය නිත්‍යභාව අත්තභාව විපල්ලාසවය වශයෙන් දක්වනලදී, අනාගතං රූපං අභිනන්දති" යනාදියෙන් එනිම වදළ සුසාළිස්වැදෑරුම්වූ අපරන්තානුකප්පිකවාදය බොහෝසේ යුහ සුඛ විපල්ලාස වය වශයෙන් දක්වනලදී.

තවද විතෙතාපඤ්ක්ලේශවූ තෘෂ්ණා අවිද්‍යා දෙදෙනා පරම සාවද්‍යවූ විපල්ලාසයන්ගේ මූලහේතුය යි විශෙෂයෙන් දක්වනු පිණිස "මෙ ධම්මා චිත්තස්ස උපක්කිලෙසා තණ්හා ච අවිජ්ජා ච" යනු නැවතත් කිහ.

"තාහි විසුජ්ඣන්තං චිත්තං විසුජ්ඣති" යනුවෙන් ප්‍රතිපක්ෂ වශයෙන්ද ඒ තෘෂ්ණා අවිද්‍යාවන්ගේ උපක්ලේශභාවයම ප්‍රකාශ කරේ, තෘෂ්ණා අවිද්‍යාවන් ප්‍රහීණවූකලැ කිසිම සංක්ලේශ ධර්මයෙක් පහනොවූයේ ඇත්තේම නොවේ; තෘෂ්ණා අවිද්‍යාවෝ විපල්ලාසයන්ට යම්සේ මූලහේතුවෙද්ද එසේම සියලුම වට ට මූලහේතුය යි යථානුසන්ධි වශයෙන් හැයනිමවන්ට ඔවාදං යනා දිය කිහ.

අවිජ්ජානිවරණානං, අවිද්‍යාවෙන් වැසීගියාවූ; තණ්හාසංයොජනානං, තෘෂ්ණාවෙන් බැඳිගියාවූ; සකිංනිරයං, වරක් නිරයටද; සකිං තිරච්ඡානයොනිං, වරක් තිරිසන් යොනියටද; සකිං පෙත්තිවිසයං, වරක් ප්‍රේතයොනියටද; සකිං අසුරකායං වරක් අසුරනිකායටද; සකිං දේවලොකං, වරක් දෙව්ලොවටද; සකිං මනුස්සත්තං, වරක් මිනිස්ලොවටද; සන්ධාවිස්සන්ති, වෙසෙසින් දුවන්නාවූ; සංසරිස්සන්ති, ඔබිමොබ හැසිරෙන්නාවූ; අපායං, නොරක්නා ලද්දාවූද මිථ්‍යාදෘෂ්ටියෙන් දූෂිතවූද සිත් ඇත්තාවූ ඔවුන්ගේ; දුබ්බිඤ්ඤාපි, අනාදිමත් සසරැ පෙරකොණෙක්; න පඤ්ඤායති, නොපෙණේ.

පිතම්බාහිභූතෙන යනාමෙති චිත්තස්ස, විඥානසන්තතියාගේ; සාඅකල්ලතා, යම්බදු ගිලන්බවක් වේද; අනාඔමනිඝතා, යම්බදු අකර්මණ්‍යතාවයක් වේද; ජීවිතං නාම, ඒ පිනතමි; කායස්ස, නාම කායයාගේ; සංලිඛකතං, යම්බදු සැඟවිම්බවක් වේද; ඔධිං නාම, එයම්බනම්.

"වසං මාරස්ස ගච්ඡති" යනු කෙලෙසමාරයාගේද; සත්තමාරසහිව, සවසංඛ්‍යාත දිව්‍යපුත්‍රමාරයාගේද; වසංගච්ඡති, වසයට පැමිණේ; ඒ, ඒ එසේමැයි; අසා, මාරවසගතවූ ඒ පුද්ගලතෙමේ නිවු නා, කෙලෙස්සුන් විසින් වළඳනා ලද්දේ; සංසාරගාමිමුඛා හොති, යම්තාක් මාරබන්ධනය නොසිඳේද ඒ තාක් සසරට මුහුණලා යන්නේ වේ.

මෙසින් භාග්‍යවතුන් වහන්සේ විසින් දුක්ඛසමුදය ඇත සත්‍යවය වදාරණලදී. ඒ සත්‍යයන්ගේ පරිජානනය පිණිසද පහාණය පිණිසද භාග්‍යවතුන් වහන්සේ දහම්දෙසනාසේන. දුක්ඛසත්‍යයාගේ පරිජානනය පිණිසද සමුදය සත්‍යයාගේ ප්‍රහාණය පිණිසදැයි සේසි, අයඤ්ච, යම්උපායකින්; පරිජානාති, වෙසෙසින් දනීද; අයඤ්ච, යම්උපායකින්; පජහති, පහකෙරේද; අයං මග්ගඤ්ඤා, මේ අරියමගයයි; 'තණ්හාය අවිජ්ජායඤ්ච යං පහානං අයං නිරොධෝ' මෙකී සිව්සස්හු දෙසන ලද්දාහුය.

හේකෙසේ දෙශනාකරණ ලද්දාහුදයත්? "අරක්ඛිතෙන චිත්තෙන යනාදිගසින් දුක්ඛඤ්ඤුදය සත්‍යවයද- තසමා රක්ඛිත චිත්තස්ස" යනාදිනසින් නිරොධ මාගී සත්‍යවයද දෙශනාකරණ ලදහ, කෙසේදයත්? අභිධම්මනිශ්‍රිත දෙශනාවද- සූත්‍රානතනිශ්‍රිත දෙශනාවදැයි- ධම්මකථා විවිධ වේ, එහි අභිධම්මනිශ්‍රිතකථා නම්- "අරක්ඛිතෙන චිත්තෙන" යන මෙහි "රත්තම්පි චිත්තං අරක්ඛිතං

දුඤ්ඤපි චිත්තං අරක්ඛිතං මුළ්හංපි චිත්තං අරක්ඛිතං"යි අටුවාදෘ රූඪවූ ලොභසහගත චිත්තෝත්පාදයන්ගේ වශයෙන් රත්තවූද- විවිධ ප්‍රතිඝචිත්තයන්ගේ වශයෙන් දුඤ්ඤවූද විවිධ මොමූහචිත්ත යන්ගේ වශයෙන් මුළ්හවූදැයි- වාදශාකුසල චිත්තෝද්පාදයන් දැක්වූහ, මෙකී චිත්තයන්ගේ වශයෙන් චක්ඛුරාදි ඉන්ද්‍රියන් ගොප නය නොකිරීම නොරැකීම් සමාන පරිත්‍යාගය චිත්තසංවරය අරක්ඛිතචිත්තයි, දෘෂ්ටිසම්ප්‍රයුක්තවූ චතුර්විධ අකුසල චිත්තයන් ගේ වශයෙන් මිථ්‍යාදිසි හතවූ චිත්තය දතයුතු, සඝඩ්ඛාරිකවූ පවවිධ අකුසලචිත්තයන්ගේ වශයෙන් පීනම්ඛානිභූත චිත්තය දතයුතු, මෙසේ අගණිතග්‍රහණ වශයෙන් සියලුම දෙළොස් අකු සලයින් ගෙදෙත්. "කතමේ ධම්මා අකුසලා? යස්මිං සමයෙ අකු සලං චිත්තං උප්පන්නං හොති" යනාදීන් වදාරණලද චිත්තුප්පා දකණ්ඩ දෙශනාවෙන් ඒබව දතයුතු.

මාරස්ස- යනමෙහි පවමාරයෝ කියනලදහ; එහි චතුරාසව චතුරෝඝ චතුයොග චතුගන්ථ චතුරෝපාදාන අට්ඨනීවරණ දසකිලෙසවත්ථු යනාදින්ගේ වශයෙන් ආසවගොචජ්‍ජාදිගෙහි කිහසින් හා එසේම ජාතිමද ගොත්තමද ලිඛමදාදි වශයෙන් බුදුකවත්ථු විභඩ්ගයෙහි දැක්වූ සත්තවිධ කෙලස සමූහයන්ගේ වශයෙන් කෙලසමාරයාගේ විභාගදතයුතු, මේ සංක්ෂෙපයෙන් අභිධම්මී නිස්‍රිතකථාසි.

සුත්‍රානන්තනිස්‍රිතකථා නම් අරක්ඛිතෙන යනමෙහි "චක්ඛු නා රූපං දිසවා නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී පෙ මනින්ද්‍රියෙ සංවරං න ආපජ්ජති එවං අරක්ඛිතං චිත්තං හොති" මෙසේ පසිඳුරන් නොරැකීම් වශයෙන් අරක්ඛිතචිත්ත විභාගය කියයුතුය, "මිච්ඡාදිඨිසහගතෙනව" යන මෙහි "පුබ්බන්තානුදිට්ඨිසහගතෙන අපරන්තානුදිට්ඨිසහගතෙන පුබ්බන්තාපරන්තානුදිට්ඨිසහගතෙන" වශයෙන් මිථ්‍යාදිසි නිමිසනය කරන්නාවූ නුනුවනින් එහිගිලෙන්නාවූ පුද්ගලයාගේ ඔත්හි "අසස්සතොලොකො" යනාදිවශයෙන් උපදනා යම්විපරීත දෘෂ්ටියක්වේද, බඹදැල් සුත්‍රාදියෙහි ආ දෙසැවදිටුවේද ඔවුන්ගේ වශයෙන් චිත්තයාගේ මිථ්‍යාදිසි හතභාවය කියයුතුය.

"පීතං නාම චිත්තස්ස අකම්මඤ්ඤතා; මිඛංනාම වෙදනාදි මිඛාභිභූතතාවය කියයුතුය.

"වසං මාරස්ස ගච්ඡති" යනු "වසෙනාම ඉච්ඡා ලොභො" යනාදි නිද්දෙසවිභාග වශයෙන් විසතරකවයුතුය. මේ ආදි දෙශනාක්‍රමයෙන් සුත්‍රානන්තනිස්‍රිතකථාව දතයුතු.

"ඉමානි චත්තාරි සච්චානි" යන්නෙන් දැක්වූ චතුස්සත්‍යයන් අතුරෙහි සමුදයෙන් ආශ්වාදයද දුක්ඛයෙන් ආදීනවයද මාර්ග නිරෝධයෙන් නිස්සරණයද සබ්බඤ්ඤුජ්ඣාසය ඵලයද රක්ඛිත චිත්තතාදිය උපායද අරක්ඛිනචිත්තතාදි නිඝෙධනවාරයෙන් රක්ඛිතචිත්තතාදියෙනි යොදවාලීම ආණත්තියදැයි මෙසේ ආශ්වාදාදීවූ දෙසනාහාර පදවීයෝ නිද්ධාරණ කටයුත්තාහ.

දෙසනාහාරසම්පාතාදී වණ්ණනා යි.

කත්ථ, ඒ දෙසනාහාරසම්පාතාදි ෂොඩෂහාර සම්පාතයන් අතුරෙහි; **කතමෙසං**, කිනම් අර්ථවර්ණනා විශෙෂයෙක් තෙමේ; **විවයහාරසම්පාතෙසා**, විවයහාර සම්පාත නම් වන්නේද? මේ ධර්මයන් අතුරෙහි මෙනම් ධර්මතෙමේ යම් සංවර්ණනා විශෙෂයක් කින් විවිනනය කටයුතුද ඒ සංවර්ණනා විශෙෂයවිවයහාර සම්පාත නමැයි නියමකොට විභාගකරණු පිණිස "තත්ථතණ්හා" යනාදිය කිහ.

තත්ථ අරක්ඛිතෙන චිත්තෙන යනාදි සූත්‍රාර්ථයෙහි දෙසනාහාරසම්පාතයෙන් වර්ණනාකරණුලද අකුසල ධර්මයන් අතුරෙහි; **තණ්හා**, නිද්ධාරණය කරණුලද සකල තෘෂ්ණාතොමෝ; **කුසලාපි**, චාතුර්භූමික කුශලයන් උදෙසා පවත්නාවූද; **අකුසලාපි**, අකුශලධර්මයන් උදෙසා පවත්නාවූද තෘෂ්ණාවදැයි; **දුව්ඛා**, දෙවැදෑරුම් වන්නීය; **අකුසලා**, අකුශලධර්මයන් උදෙසා පවත්නා තෘෂ්ණාතොමෝ; **සංසාරගාමිනී**; සතුන් සසර ගමන්කර වන්නීය; **කුසලා**, කුශලධර්මයන් උදෙසා පවත්නාවූ; **පහාණතණ්හා**, තදඩගාදිවශයෙන් කෙලෙශප්‍රහාණයට හෙතුවූ තෘෂ්ණාතොම; **අපවසගාමිණී**, නිවනට ගමන්කරවන්නීය; **මානොපි**, උන්නතිලක්ෂණ මානයද; **කුසලොපි**, කුශලධර්මයන් උදෙසා පවත්නේද; **අකුසලොපි**, අකුශලධර්මයන් උදෙසා පවත්නේදැයි **දුවිධා**, දෙවැදෑරම් වන්නේය; **සංමානංනිස්සාය**, ප්‍රහාණහෙතු කවූ ධර්මානයක් උපනිශ්‍රයකොට; **මානංපජහති**, පහකිරීමට සුදුසුමානය පහකෙරේද; **අයං මානො කුසලා**, උපනිශ්‍රය ප්‍රත්‍යයවූ මේ මානතෙමේ එලූපවාරහෙයින් කුශලයි; **ඔසාපන මානො**, පරභිංසනාදි වශයෙන් පවත්නාවූ ධර්මානයක් තෙමේ; **දුක්ඛංනිබ්බත්තෙති**, තමන්ට හා මෙරමාතවත් දුක් උපදවන්නේද; **අයංමානො අකුසලා**, මේ මානය අකුශලයයි; **විවිනනයකොටැ දතයුතු**.

නත්ථි, ඒ සංසාරගාමිනී අපචයගාමිනී තෘෂ්ණාවන් අතුරෙහි; යං නෙක්ඛම්මසිතං දෝමනස්සං, නෛෂ්ක්‍රම්‍ය නිශ්‍රිතවූ යම් දෙම්නසෙක් වේද; තේ කවරේද? අරියා, ආර්‍යපුද්ගලයෝ; ඝනතං, ඝනතවූ; යං අරියානං, යම් ආර්‍යඵලධර්මයක්; සච්ඡිකතා, ප්‍රත්‍යක්ෂකොට; උපසම්පජ්ජ, ඊට පැමිණ; විහරන්ති, වෙසෙද්ද; අයං, මම්ද; කුදාස්සූනාම, කවදෘ නම්; තං අරියානං, ඒ ආර්‍ය ඵලය; සච්ඡිකතා, ප්‍රත්‍යක්ෂකොට; උපසම්පජ්ජ, ඊට පැමිණ; විහරිස්සං ඉති, වාසයකරන්නෙම්දැයි; පිහා, යම්පැතිමක්; තස්ස, ඒ කුලපුත්‍රයාහට; උප්පජ්ජති, උපදනේද; පිහාපච්චයා, ඒ පැතිම පසකොට; දෝමනස්සං, යම් දෙම්නසෙක් උපදනේද; මේ නෙක්ඛම්මසිතවූ දෙම්නසයි; අයං තණ්හා, ආර්‍යඵලයෙහි පිහා සංඛ්‍යාතවූ මේ තෘෂ්ණාතොමෝ; කුසලා, අවද්‍ය ආර්‍යඵලය උදෙසා පවත්නා බැවින් අවද්‍ය වන්නීය; කෙසේ පැවැත්තා වූදයහ? රූපවිරාගා චෙතොවිමුත්තිං, යම් රූපවිරාග චේතෝ විමුක්තියක් පැමිණියයුතු වන්නීද; තදාරම්මණං, ඒ චේතෝ විමුක්තිය අරමුණුකොට පවත්නිවූද; අවිජ්ජා විරාගා පඤ්ඤාවිමුත්තිං, යම් අවිද්‍යාවිරාග ප්‍රඥාවිමුක්තියක් පැමිණියයුතු වන්නීද එය අරමුණුකොට පවත්නීවූද තෘෂ්ණාව; කුසලා, අවද්‍යවූවාය යි කෙවියයුතු, කත්‍ථා, ඒ ප්‍රඥාවිමුක්තියහුගේ; එකාපච්චවෙක්ඛා, පච්චවේක්ෂණතෙමේ කවරේද? "සම්මාදිට්ඨි සම්මාසංකප්පෝ සම්මාවාචා සම්මාකම්මන්තෝ සම්මාආජීවෝ සම්මාවායාමෝ සම්මාසති සම්මාසමාධි" යන අෂ්ටාංගිකමාර්ගයෝයි; නෝ, ඒ පච්චවේක්ෂණතෙමේ; කතමේ ධම්මේ, කිනම් ධර්මයෙක්හි දතයුතුද? චතුප්පඤ්ඤානා, චතුර්ධ්‍යානයෙහි; සාරම්මණාය, උකහාංසහිත හෙවත් උතුකෘෂ්ටභාවයට පැමිණියාවූ භාවනාවෙහි ඒ පච්චවේක්ෂණතෙමේ දතයුතුය; ඕ, ඒ එසේමැයි-නොගොත්-යම්හෙයකින්; චතුපඤ්ඤානා, චතුර්ධ්‍යානයෙහි පිහිටි යොගාවචරතෙමේ; "පරිසුද්ධං පරියෝදාතං අනඞ්ගණං විගතූපක්කිලෙසං මුදුං කම්මනියං ඨිතං ආනෙඤ්ජප්පත්තං" යන; අභිඤ්ඤාසම්මන්නාහරති, අභිඥාවෙන් සම්පන්නවූ; චිත්තං හාවෙති, සිතවඩයි; නෝ, ඒ චතුර්ධ්‍යානලාභී පුද්ගලතෙමේ; ඒ අභිඤ්ඤාවෙන්:-

"අනේකවිධං පුබ්බේනිවාසං අනුස්සරති සේය්‍යථිදං
එකම්පි ජාතිං ද්වේපි ජාතියෝ"

යන ලෞකිකපඤ්ඤාභිඥාවෙන් හා අභින්නාගී ප්‍රඥාවෙන් යන අභිඥාවන්ටද; චෙවචිත්තසාරම්, මනාවූ චිත්තයට විපස්සනාකූණ යන ගුණවිශේෂයටද යි; අරියාය භූමිං අධිගච්ඡති, ආර්‍ය උත්තරි මනුෂ්‍ය ධර්මයට පැමිණෙයි.

තං චිත්තං, ඒ චතුර්ධ්‍යානිකයාගේ සිත; **සතෝ**, යම් උපෙ
කඛාසතිපාරිසුද්ධි භාවයක් හෙතුකොටගෙන; **පරිසුද්ධං**, පිරිසිදු
වීද; **සතෝ**, එවි උපෙකඛාසති පාරිසුද්ධිභාවනාව හෙතුකොට
ගෙන; **පරිසෝදකං**, වෙසෙසින් පිරිසිදුවිය; **සතෝ පරිසෝදකං**, යම්හෙතුවකින් වෙසෙසින් පිරිසිදුවීද; **සතෝ අනඞ්ගණං**, එම්හෙතුවෙන් කෙලෙස රහිතවිය; **සතෝ අනඞ්ගණං**, සුඛාදීන්
ගේ පසනැසීමෙන් යම් විතරාගත්වාදි අඞ්ගණ රහිත භාවයක්
හෙතුකොටගෙන අනඞ්ගණවේද; **සතෝ විගතූපක්කිලෙසං**,
එම විතරාගාදි අනඞ්ගණභාවය හෙතුකොටගෙන පහවගිය උප
කෙලෙස් ඇත්තේ වේ; **සතෝ විගතූපක්කිලෙසං**, යම්හෙතුව
කින් පහවගිය උපකෙලෙස ඇතිවේද; **තණ්හාමුදු**, එම්හෙතුවෙන්
මෘදුවේ; **මුදූසු කම්මනියං**, යම් සුභාවිතත්වයක් හෙතු
කොටැ මෘදුවේද එම සුභාවිතත්වය හෙතුකොටම කර්මණ්‍යවේ;
සතෝ තඤ්ඤේව කම්මනියං සතෝ ඨිතං, යම්හෙයකින් කර්මණ්‍යවේද
එහෙයින්මම සිතවේ; **සතෝ ඨිතං සතෝ ආනෙඤ්ජප්පත්තං**,
යම්පරිසුද්ධාදිහෙයි සිතිනිවයක් හෙතුකොටැ සිතවේද එහෙ
යින්ම නිශ්චලත්වයට පැමිණියේවේ නොවෙහෙත් මෘදුකර්මණ්‍ය
භාවයෙන් සියවසෙකි සිටි බැවින් සිතවේ ශ්‍රද්ධාදීන් විසින් පරි
ගෘහීත බැවින් නිසලබවට පැමිණියේවේ, ඒ එසේමැයි:- ශ්‍රද්ධා
වෙන් පරිගෘහීතවූ සිත අශ්‍රද්ධාභාවයෙන් නොසැලේ. වීර්‍යයෙන්
පරිගෘහීතවූ චිත්තය කුසීතභාවයෙන් නොසැලේ. සමාධියෙන්
පරිගෘහීතචිත්තය ප්‍රමාදයෙන් නොසැලේ. සමාධියෙන් පරිගෘ
හීත චිත්තය ඔඝඩික්‍යයෙන් නොසැලේ, ප්‍රඥාවෙන් පරිගෘහීත
චිත්තය අවිද්‍යාවෙන් නොසැලේ. ඔභාසගත චිත්තය කෙලෙසදු
රෙන් නොසැලේ. මෙකී ශ්‍රද්ධාදිවූ ෂට්විධ ධර්මයෙන් පරිගෘහීත
චතුර්ධ්‍යානචිත්තය අනෙඤ්ජප්පත්තය යි දතයුතු.

තත්ථ, ඒ රාගාදි අඞ්ගණාදීන් අතුරෙහි; **අඞ්ගණාව**, රාගාදි
අඞ්ගණයෝද; **උපක්කිලෙසාව**, අභිධ්‍යාදී උපකෙලෙසයෝත්
වෙද්ද; **සබ්බෙපි**, ඒ අඞ්ගණෝපකෙලෙසවය; **තණ්හූපක්කිලෙසා**,
තෘෂ්ණාවට පක්ෂයි; **සාවජ්ජානං**, චිත්තයාගේ යම්වඤ්චල භාව
යක් වේද; **සාව චිත්තස්ස අවසිති**, චිත්තයාගේ යම් අනවස්ථිත
භාවයක් වේද; **අයං දිට්ඨිපක්ඛෙ**, තවත මිථ්‍යාභිනිවෙශයට
හෙතුබැවින් මෙය දෘෂ්ටියට පක්ෂයි.

**දුක්ඛින්ද්‍රිය දෞමනස්සින්ද්‍රිය සුඛින්ද්‍රිය සෞමනස්සින්ද්‍ර
ය්‍ය** චතුරින්ද්‍රියයෝ චතුර්ධ්‍යානයෙහිදී නිරුඛවෙත් ඒ සිව්වැනි
දෑනැනලත් පුහුලාගේ **උපෙකඛින්ද්‍රිය** අවශිෂ්ටවේ හෙතෙමේ

රූපාවචරසමාපත්තියෙන් මත්තෙහිවූ ආකාසානඤ්චායතන සමාපත්තිය අඛණ්ඩාන්තතාවයෙන් හා ආරම්මණ ශාන්තතාව යෙන් ශාන්තය යි මෙතෙහි කෙරේ යම්කෙයකින් යම් යම් ආකාරයකින් අරූපසමාපත්තිය ශාන්තවශයෙන් මෙතෙහි කෙරේද ඒ ඒ ආකාරයෙන් රූපාවචරධ්‍යානය අවිසයකමහන නොවිම වැටහේ මැයි.

තස්ස උපරිමං සමාපත්තිං සන්තතෝ මනසිකාරතෝ, මතෙනහි ආකාසානඤ්චායතන සමාපත්තිය ශාන්තවශයෙන් මෙතෙහි කරන්නාවූ ඒ චතුර්ථධ්‍යානිකයාගේ; බලවිහාසඤ්ඤා, ඔදාරිකසංඥාව; චතුසට්ඨිකප්පාණ සණ්ඨහති, සිව්වැනි දහැනෙහි පිහිටයි; සවිඝසඤ්ඤාව, ප්‍රතිඝසංඥාසංඛ්‍යාතවූ පඤ්චවිඥානසංඥාද; උපඛාණෝ, නොඇලුනිව පිහිටයි; තස්සා සබ්බසෝ රූපසඤ්ඤානං සමතික්කමා, යථොක්තනයකාරයෙන් මෙතෙහිකරණ ඒ යොගාවචරතෙමේ නිරවශෙෂයෙන් රූපසංඥාවන් සමතික්‍රමණය කිරීමෙන්; පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා, ප්‍රතිඝසංඥා සඞ්ඛ්‍යාත විඥාන සංඥාවන් අස්තඟත පැමිණවීමෙන්; නානත්තසඤ්ඤානං අමනසිකාරා, නානාරම්මණයන්හි පවත්නා නානත්තසංඥාවන් මෙතෙහි නොකෙරෙමින්; අනන්තං ආකාසන්ති ආකාසානඤ්චායතන සමාපත්තිං සවිඤ්ඤකත්තා උපසම්පජ්ජ විහරති, කිසුණු ඉගිළු අහස අනන්තයයි මෙතෙහි කිරීමෙන් පැවැත්විය යුතු ආකාසානඤ්චායතන සමාපත්තිය ප්‍රත්‍යක්ෂකොටැ ඊට පැමිණ වෙසේ.

අයඤ්හි-රූපසඤ්ඤා, රූපාවචරසංඥාව පළවිඩ අනිඤ්ජත්වා අභිනීහාරමත්තය සිද්ධකෙරේ; "අරූපාවචරසමාපත්තීන්මෙන් ශාන්තය යි අදහස ඉට්ඨඵලකරේයි යේ යි" වොහාර ශ- නානත්තසඤ්ඤා, නානත්වසංඥාව නානාරම්මණයන්හී වොහාරය කෙවත් චිත්තයාගේ ආකුලව පැවැත්ම ඇතිකෙරේ; සඞ්ඛිච්චකාරතෝති, උකතප්‍රකාරයෙන් රූපසංඥා නානත්ව සංඥාවන් ගේ ආදීනව දැක ඒ සංඥාවන් ඉක්මවන්නේය; පටිඝසඤ්ඤා එසා අබ්භත්ථං ගච්ඡති, ඒ ආකාසානඤ්චායතන සමාපත්තියට පැමිණි යොගීහුගේ දශවිධ ප්‍රතිඝසංඥාව විශෙෂයෙන් පහවේ එවං සමාධිනයා, මෙසේ උකතප්‍රකාරයෙන් රූපාවචර ධ්‍යාන යෙහි විතතෙකාග්‍රතාවය පවා ඉක්මවීමෙන් සමාධිතවූ; සමාහිතස්ස, අරූපසමාධියෙන් සන්හුන් පැවතුන් ඇති හෙයින් සමාහිතවූ යොගීහුගේ; ඔළාරිකා, පළමු රූපාවචරධ්‍යානාවභාසය; අනාපාථං ගච්ඡති, අරූපාවචරධ්‍යානය ට සම්මදනාකලැ අතුරුදන්වේ; රූපානං දස්සනංව, රූපදහැකැඟින් කිසුණු දැක්මද

අතුරුදන්වේ; සෝ සමාධි, ඒ ඇතොකත රූපාවචරසමාධිතෙමේ ජළඞ්ගසම්භාරාගතෝ, උපකාරක පරිෂ්කාර සම්භාරවූ ෂඩ්ඞ්ග යකින් සමන්විතවූයේ; සව්වණ්ණිකාභඞ්ගා, පස්විකියයුතු තෙවත් නැවත නැවත සිතියයුතු; පස්ත්තන අයුරු හොවර සහිතව දක්වනු පිණිස "අනභිජ්ඣාසහගතං" ඇතාදිය කීහ:-

සබ්බලොකහිතා, පිහරූපසාහරූපවූ සකල සත්වලෝකයා තෙරෙහි හා සබ්බාරම්මණෝකාසා තෙරෙහි; ඒමමානසං, මාහේසිත; අනභිජ්ඣාසහගතං, අභිධ්‍යාසහගත නොවේ (තෙවත්) කාමච්ඡන්දරහිතය; සඞ්ඛාරෙසුත්, සිඇළු සතුන් තෙරෙහි; මමමානසං, මාසිත; අබ්‍යාපන්නං, විරොධඇතට නොපැමිණියේය; මෙ, මා විසින්; විදිතං, චතුර්විධ විඇත්තීය; ආරබ්ධං, පටන්ගන්නා ලද්දේය; පග්ගහිතං, දැඩිකොට ගත්තා ලද්දේය; මමකාරසා, මාහේ නාමකය; පඤ්ඤාදුබ්බා, බරහැරි ගියේය; අසාරද්ධා, එතෙහින්ම අසාරබ්ධය තෙවත් පහවූ දරථ ඇත්තේය; සමාහිතං චෙව විත්තං, මාසිත සමාහිත වූයේය; අවිකම්පිතං, විකම්පිත නොවීය; මෙඝති, මාහේ ධ්‍යානසමාධිය; උපට්ඨිතා, එළඹ සිටියාය; අපම්මුට්ඨා, නොමුලාවූවාය යී මෙසේ ෂඩ්ඞ්ගයෙන් යුක්තකොට සමාධිප්‍රත්‍යවෙක්ෂා කටයුතු.

ඒ ෂඩ්ඞ්ගයන් අතුරෙහි සකල ලොකයා තෙරෙහි අනභිජ්ඣා සහගතවූ යම් මානසෙක් වේද සියලු සතුන් තෙරෙහි විරොධයව නොපැමිණි යම් සිතෙක් වේද පවත්ගන්නාලද දැඩිකොට ගන්නාලද යම් විඇත්තීයෙක් වේද. සමාහිතවූ අවිකම්පිතවූ යම්සිතෙක් වේද මේ චතුරඞ්ගය සම්පූර්ණම්. කාමච්ඡන්දයාහේ යම්බරහැරි මෙක් වේද දරථරහිතභාවයෙක් වේද මේ සමාධි පරිස්කාරයි, යම් එළඹසිටියාවූ නොමුළාවූ සිතියක් වේද මේ විදර්ශනායි.

මෙතෙකින් පඤ්ඤාවිමුත්තිය යි කියනලද රහත්පල සමාධි වාරයෙන් දූසීහාග ප්‍රතිපදාව දක්වා දැන් රහත්ඵලසමාධිය දක්වනු පිණිස "සොසමාධි" ඇතාදිය කීහ:-

සොසමාධි, ඇවකී ආර්‍යශ්‍රාවකයාහේ විපාකවූ ඒ සම්‍යක් සමාධිතෙමේ; පඤ්ඤාවිමුත්තා, දැන් කියනු ලබන පඤ්චවිධ ප්‍රත්‍යවෙක්ෂාඥානයෙන් පස්විකියයුතු පස්පරිදිදෙන්; සවිඤ්ඤාණකා, දනයුතු; අයං සමාධි, මේ අග්‍රඵලසමාධිතෙමේ; පච්චුප්පන්නසුඛා ඉති, අර්පිතඅර්පිත ක්ෂණයෙහි තෙවත් පත්පත් තෙණෙහිම නිරුම්හ සුඛවයෙන් ප්‍රත්‍යුත්පන්නසුඛ ඇත්තේයයි; ඉතිසය, මෙසේ ඒ සොගිඤව; සව්වඤ්ඤං එව, තමාහෙරෙහිවූම; යතුණ දස්සනං, ප්‍රත්‍යවෙක්ෂාඥාන දර්ශනය; සව්වුපට්ඨානං භවති, එළඹ

සිටියේ වේ; අයං සමාධි, මේ අග්‍රඵල සමාධිතෙමේ; ආයතිං සුඛවිපාකෝ ඉති, පළමුවූ පළමුවූ උපන් සමාධිය පසු පසුව උපදනා සමාධිසුඛයට ප්‍රත්‍යයබැවින් මතුකල සුඛවිපාක ඇත්තේය යි; ඉතීස්ස, මෙසේ ඒ යොගිතුමාගේ; පච්චත්තඤ්ඤව, සවඝන්නානයෙහි වූම; ඤාණදස්සනං, ප්‍රත්‍යවෙක්ෂා ඥානදර්ශනය; පච්චුපට්ඨිතං භවති, එළඹසිටියේවේ; අයං සමාධි, මේ සමාධිතෙමේ; අවිකම්පෝ, කෙලසාරින් තෙරෙන් දුරුවූ හෙයින් නිකෙලෙසය; නිරාමිසෝ ඉති, කාමාමිස වට්ටාමිස ලොකාමිස රහිතය යි ද; අයං සමාධි, මේ අග්‍රඵල සමාධිතෙමේ; අනාසුරිය සෙවිතත්තා ඉති, අකුවජිනවූ බුඩ ප්‍රත්‍යේකබුඩ බුඩශ්‍රාවකවූ ශ්‍රේෂ්ඨ පුරුෂයන් විසින් සෙවනය කරණ ලද්දේ යි ද; අයං සමාධි, මේ අග්‍රඵල සමාධිතෙමේ; සඝනනාභවව, අඛණ්ඩනාන කෙලෙසදරථ ශාන්තබව යෙන් යුත් බැවින් ශාන්තද වේ; පණීතොව, දවසකුදු සමවද නාහට තෘෂ්ණාකර රහිත හෙයින් ප්‍රණීතද වේ; පටිපස්සඩ්ධිලඛ්ධොව, සතඝන්ධලද කෙළෙසුන් ඇති රහතන් විසින් ලැබිය යුතුබැවින් පටිපස්සඩ්ධිලඛ්ධද වේ; එකොදිභාවාධිගතොව, අග්‍රඵල සමාධිසංඛ්‍යාත එකොදීභාවයෙන් අධිගත බැවින් එකොදිභාවාධිගතද වේ; සඝඛ්ඛාර නිග්ඝහ යාහවාරිවාවහොවන ඉති, "ප්‍රයොග සහිතව නීවරණාදි ප්‍රත්‍යනීක ධර්මයන්ට නිග්‍රහ කොටැ හෝ "හා හා එපා එපා" කියන්නාක්මෙන් ප්‍රයොග යෙන් අනිකුත් කෙළෙසුන් වලකා හෝ නොපත් බැවින් අග්‍රඵල වශයෙන්ම අධිගත හෙයින්" සඝඛ්ඛාර නිග්ඝහ යාහවාරිවාවවද නොවේ යයි; මෙසේ පස්විකන ඒ රහත්හට සවඝන්නාන යෙහි පහළවූම ඥානදර්ශනය එල්බසිටියේ වේ; සඝතොව අහං, සම්‍යක් සමාහි ඇත්තාවූ මම; තං ඛෝ පන ඉමං සමාධිං සමාපජ්ජාමි, ඒ මේ සමාධියට පැමිණෙන්නෙමි; සඝනොවුට්ඨාහාමි ඉති, සිහිඇත්තේම එයින් නැගීසිටින්නෙමි යි මෙසේ ඥානදර්ශනය එල්බසිටියේ වේ.

මෙකී පඤ්චවිධ ඥානදර්ශනයෙන් ඒ අග්‍රඵල සමාධිය විවරණ කොට දතයුතු, ඒ පවවුපන්න සුඛාදි සමාධින් අතුරෙහී පවවුපන්නසුඛවූ යම් සමාධියෙක් වේද ආයතිසුඛ විපාකවූ යම් සමාධියෙක් වේද මේ සමාධිවිය සම්ඵස්සි, අරියනිරාමිසවූ යම් සමාධියෙක් වේද අකාපුරිස සෙවීතවූ යම් සමාධියෙක් වේද මේ ආදිගුණ විශෙෂගත සමාධිවිශෙෂය විදර්ශිනා සි.

සෝ සමාධි, පූර්වභාග ප්‍රතිපදාවෙහි යම් රූපාවචර චතුර්ධ්‍යාන සමාධියක් කියනලදද ඒ චතුර්ධ්‍යාන සමාධිතෙමේ; පඤ්ච විඛන වෙදිතබ්බා, පඤ්චප්‍රකාරයකින් දතයුතු වන්නේය;

කිනම් පවප්‍රකාරයකින්ද යත්? "පීතිඵරණතා සුඛඵරණතා චෙතොඵරණතා ආලෝකඵරණතා පච්චවෙක්ඛණ නිමිත්තකං" යන පවප්‍රකාරයෙනි; මෙහි ප්‍රීතිඵරණතා නම් ප්‍රීතිය සහගතවූ රෙමින් පතුරුවමින් ප්‍රථම විතීයධ්‍යානයන්හි උපදනා ප්‍රඥාවයි, සුඛඵරණතා නම් සුඛය පතුරුවමින් ප්‍රථම විතීය තෘතීය ධ්‍යානයන්හි උපදනා ප්‍රඥාවයි, චෙතොඵරණතා නම්, මෙරමා විසින් ස්පර්ශ කෙරෙමින් උපදනා චෙතොපරිය ඤාණයයි; ආලෝකඵරණතා නම්, ආලෝක පතුරුවමින් උපදනා දිව්‍ය චක්ෂු ප්‍රඥාවයි, ප්‍රත්‍යවෙක්ෂාඥානය පච්චවෙක්ඛණ නිමිත්තයයි; එහි පීතිඵරණ සුඛඵරණ චෙතොඵරණ යන තුන සමථයයි, ආලෝක ඵරණ පච්චවෙක්ඛණ නිමිත්ත යනදෙක විපස්සනාවයි; මෙහිදු ප්‍රඥාශීර්ෂයෙන් දෙශනාකළ හෙයින් ප්‍රඥාවශයෙන් විවරණසංඛ්‍යේපා කරණලදී, "පඤ්ඤාපීතිඵරණතා" යනාදිතන්හි සමාධිසහගතවූ ප්‍රඥාවම දක්වනලද්දීනුයි එහි සමාධි වශයෙන් සමථය උඩරණය කරණලදී, එනෙහින් පීති සුඛ චෙතොඵරණකාවයෝ විෂයිවශයෙන් සමාධිප්පධාර වශයෙන් සිඛවෙත්නුයි ඔවිහු විපස්සනා ය යි කියනලදහ. දැන් ඒ සමාධිය ආරම්මණ වශයෙන් විභාගකොට දක්වනු පිණිස "දසකසිණායතනානි" යනාදිය කීහ.

"දසකසිණායතනානි පඨවීකසිණ ආපොකසිණ තෙජෝ කසිණ වායොකසිණ නීලකසිණ පීතකසිණ ලොහිතකසි ණ ඔදාතකසිණ ආකාසකසිණ විඤ්ඤාණකසිණ=ය යි" කසි ණායතනයෝ දශයෙක් වෙති.

මෙහි කසිණඛ්‍යාන සංඛ්‍යාතවූ කසිණයෝත් ඔවිහුමය. යොගාවචරයාගේ සුඛවිහෙඨයන්ට හා මනායතන ධම්මායතන භාවයෙන්ද ආයතනයෝ වූවෝත් ඔවිහුමනුයි කසිණායතන යෝ යයි කියනලදහ, කරනලද පරිකම්මැති පෘථිවීමඬලයද එහි පවත්නා උද්ග්‍රහ ප්‍රතිභාගනිමිත්තද ඒ නිමිත්ත ගොචරකොට උපදනා ධ්‍යානයද පඨවීකසිණය යි කියනුලැබේ. ඒ පෘථිවීමඬලා දින් අතුරෙන් ධ්‍යානයම මෙහි අදහස්කරණලදී; ආපොකසිණා දියද මෙසේමැයි; ආකාසකසිණ නම් සිදිබුකිසුණු සිඹවන් කිසුණු ඉගුළු අනත අහසැ පෑවැති පළමු අරුදහැනයි; විඤ්ඤාණ කසිණ නම් පළමු අරුදහැන්හිත අරමුණු කොට පහළවන දෙවැනි අරුදහැනයි; මේ දශකසිණයන් අතුරෙහි පඨවීකසි ණාදි භූත කසිණ චතුෂකය හා නීලකසිණාදි වණ්ණකසිණ චතුෂකයද යන අට කිසුණු සමථයයි, ආකාශ විඤ්ඤාන කසිණවය විපස්සනායයි.

එවං, මේ ක්‍රමයෙන්; සම්බහුලා අභිසම්මාචාරිකා, "සම්මාදිට්ඨි" ආදි භාවයෙන් අභින්නවූ සතිපට්ඨානාදි පුබ්බභාග පරිපදා භෙදයෙන් අනේකභෙදභින්නවූ" නිරවසේෂාචාරධර්මාගීතෙමේ; සබ්බේ සබ්බේ ආකාරේන, අනභිජ්ඣාදීවූද පච්චුපන්නසුඛතාදීවූද ආකාරයන් අතුරෙන් යම් යම් ආකාරයකින්; චුත්තෝතා, කියන ලදද; සබ්බේ සබ්බේ, "ඒ ඒ ආකාරයන් අතුරෙහි යම් යම් ධර්මයෝ හෝ ආකාරයෝ සමථ වශයෙන් හා යම් යම් ආකාර ධර්මයෝ විදර්ශනා වශයෙනුත් යොදන්ට ලැබෙද්ද" ඒ ඒ ආකාරයෙන්; (ආචාරධර්මාගීය සෝයා සමථ විදර්ශනාවන් හා) සම්පජ්ජිත්වා, යොදලියයුතුය; සෝ, ඒ සමථාධිෂ්ඨාන විදර්ශනාධර්මයෝ; තිවිධමේවාති, අසිච්චතා දුක්ඛතා අනත්තතා යන ත්‍රිවිධ අනුපස්සනා ධර්මයන් හා; සඞ්ගහිතා, සංග්‍රහකරණලද්දාහුය; සෙසා, ආචාරධර්මාගීධර්මය පිණිස යුක්තප්‍රයුක්තවූ ඒ යොගීතෙමේ; සම්පජ්ඤ්ඤං භාවේතබ්බා, කලෙක සමථය සම්පජ්ජනවශයෙන් හා කලෙක විදර්ශනාව සම්මසනවශයෙන්ද වඩනුයේ; තීණිවිමොක්ඛමුඛානි, අනිමිත්තත විමොක්ඛමුඛාදි ත්‍රිවිධ අනුපස්සනාවන්; භාවියන්ති, වඩති; තීණි විමොක්ඛමුඛානි, අනිමිත්තතාදි ත්‍රිවිධ අනුපස්සනාවන්; භාවේතබ්බානා, මතුමතු විශෙෂයට පමුණුවනුයේ; තත්‍රයා බ්‍යතා භාවියන්ති, සීලස්කන්ධ සමාධිස්කන්ධ පඤ්ඤාස්කන්ධ සංඛ්‍යාතවූ තුන් ගුණකඳුවඩති; තත්‍රයා බ්‍යතා භාවේතබ්බානා, තුන්ගුණකඳුවඩනුයේ; අභිසං අධිසීලිකං මග්ගං භාවේතීති, එම තුන්ගුණකඳු හා සංග්‍රහකරණලද අර්යටමඟවඩති.

යම් ගුණකෙරෙක්හි භික්මෙන්නාවූ යම්යම් පුද්ගලයන්ට විශෙෂයෙන් නීත්‍යානුබ්බවූද යම් කෙලෙසුන්ට ප්‍රතිපක්ෂවූද ත්‍රිවිධ විමෝක්ෂ මුඛයන් හා එම සීලාදීන් දක්වනු පිණිස "රාගවිරාගා" යනාදිය කීහ:-රාගවිරාගා සුභාභාලා, රූපිරිතැනි පුහුල්තෙමේ; අධිචිත්තසික්ඛාය සික්ඛමානෝතා, අධිසිතසික්ෂා හික්මෙනුයේ; ලෝභං අකුසලමූලං පජහමානෝතා, ලොභසංඛ්‍යාතවූ අකුසල මූලපහකරණුයේ; සුඛවේදනීයං ඵස්සං, සුඛවෙදනාවට හිතවූ ස්පර්ශයකට; අනුපගච්ඡමානෝතා, නොඇමිණෙනුයේ; සුඛං වේදනං පරිජානමානෝතා, මේ සුඛවෙදනාවගේ පෙරළීම් ආදියෙන් දුක්ඛවෙදනාව පහළවන්නීය යි විශෙෂයෙන් දන්නේ; රාගබලං පවාහෙමානෝතා, රාමූල බෝදහරිණුයේ; රාගරජං නිබ්බාපෙමානෝතා, රාගරජස සලාහරිණුයේ; රාගවිසං වමමානෝතා, රාවිසවමාරණුයේ; රාගඝසිං නිබ්බාපෙමානෝතා, රාගිනි නිවනුයේ; රාගඝල්ලං උප්පාටෙමානෝතා, රාහුල උදුරා හරිණුයේ;-

රාගජ්ඣං විජමෙඤ්ඤා, රූඅවුල නිරවුල්කරණ්නේ; **අනිමිත්තා විමොක්ඛ මුඛේන නියාති**, අනිත්‍යානුපස්සනා වාරයෙන් අරිය මගටයේ.

අනිච්චානුපස්සනාව වනාහි නිච්චනිමිත්තාදිය උදුරුලන හෙයින් **අනිමිත්තනාම**' රාගාදීන්ගේ සමූච්ඡේද විමුක්තියෙන් විමොක්ඛනම් අනිමිත්ත වූයේත් විමොක්ඛ වූයේත් හේමනුසි අනිමිත්ත විමොක්ඛ නම්, ආචාර්‍යවාදීහු, ඒට වාරයක්වූයේනුයි අනිමිත්ත විමොක්ඛ මුඛයයි කියනුලැබේ.

"දෙසවරිතෝ පුග්ගලෝ අප්පණිහිතවිමොක්ඛමුඛේන නියාති" යනාදිය හා "මොහචරිතෝ පුග්ගලෝ සුඤ්ඤතවිමොක්ඛ මුඛේන නියාති" යනාදිය උභතාභාගවසයෙන් දතයුතු.

එහි දුක්ඛානුපස්සනාව අප්පණිහිත විමොක්ඛමුඛයි, අනත්තානුපස්සනාව සුඤ්ඤත විමොක්ඛමුඛයි, ඒ ත්‍රිවිධ විමොක්ෂමුඛයන් අතුරෙහි සූන්‍යතා විමොක්ෂමුඛය ප්‍රඥාස්කන්ධයයි, අනිමිත්ත විමොක්ෂමුඛය සමාධිස්කන්ධයයි, අප්‍රනිහිත විමොක්ෂමුඛය ශීලස්කන්ධයයි, මෙහි ශීලාදි සත්‍රිත්‍රය භාවිතාතරණ්නේ ආර්‍යාෂ්ටාංගිකමාර්ගය භාවිතාතෙරේ, ඒ ආර්‍යාෂ්ටාංගිකමාර්ගධර්මයන් අතුරෙහි යම් සම්‍යක් වචනයක්වේද යම් සම්‍යක්කර්මාන්තයෙක්වේද යම් සම්‍යක් ආජීවයෙක්වේද මේ ශීලස්කන්ධයි; යම් සම්‍යක් ව්‍යායාමයෙක්වේද යම් සම්‍යක් සමාධියෙක්වේද යම් සම්‍යක් සමාධියෙක්වේද මේ සමාධිස්කන්ධයි; යම් සම්‍යක්දෘෂ්ටියක්වේද යම් සම්‍යක්සංකල්පයෙන්වේද මේ ප්‍රඥාස්කන්ධයි; එහි ශීලස්කන්ධයත් සමාධිස්කන්ධයත් සමථයි, ප්‍රඥාස්කන්ධය විදර්ශනායි; ශීලස්කන්ධය ඤානාදීන්ට ප්‍රධානකොට ඇතිබැවින් හා සමාධියට බොහෝ උපකාර ඇතිබැවින්ද සමථ පක්ෂය භජනයකෙරේ යම් පුද්ගලෙක්තෙමේ සමථවිදර්ශනා වඩන්නේද ඒ පුද්ගලාගේ උපපත්තිභවයට අභවූ කාය චිත්ත දෙදෙනා වැඩීමටයෙන්; ශීලඥමාධි යන පාදධර්මයෝ දෙදෙනා භවනිරෝධගාමිනී පටිපදායි.

සෝ භික්ඛු, ඒ ශීලසමාධියෙහි පිහිටි මහණතෙමේ; භාවිතාකායඤාණයාභාගී, ආභිසමාචාරිකශීල පාරිපූරණයෙන් භාවිතකාය ඇත්තේවේ; භාවිතසීලෝ, ආදිබ්‍රහ්මචරියකසීල පාරිපූරණයෙන් භාවිතශීලඇත්තේවේ; තොහොත් ඉන්ද්‍රියසංවරයෙන් භාවිතකාය ඇත්තේද ඉතිරිසිල්වතයෙන් භාවිතසීල් ඇත්තේදවේ; භාවිතවිතෝනා, භාවිතසමාධි ඇත්තේවේ; භාවිතපඤ්ඤෝ, භාවිතවිදර්ශනා ප්‍රඥාඇත්තේවේ; කායෙ භාවියමානෙ මේ ධම්මා

භාවනං ගච්ඡන්ති සම්මාසඞ්කප්පෝ සම්මාවායාමෝව, කාවඩ්ඪු ලඛ්ධකාලෑ සම්මාසඞ්කප්පෝත සම්මාවායාම ඉත ධම්මෝ දෙදෙනා වැඩිමටයෙන්; සීලෙ භාවියමානෙ මේ ධම්මා භාවනං ගච්ඡන්ති. සම්මාවාචා සම්මාඅාජීවෝව, සිල්වඩ්ඪු ලඛ්ධකාලෑ සම්මාවාචා සම්මා ආජීව ඉත ධම්මෝ දෙදෙනා වැඩිමටයෙන්; චිත්තෙ භාවියමානෙ මෙ ධම්මා භාවනං ගච්ඡන්ති සම්මාසති සම්මාසමාධිව, සිතවඩ්ඪුලබ්ධ කාලෑ සම්මාඤාති සම්මාඤාධි ඉත ධම්මෝ දෙදෙනා වැඩිමටයෙන්; පඤ්ඤාය භාවියමානාය මේ ධම්මා භාවනං ගච්ඡන්ති සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පෝව, පැණවඩ්ඪු ලබ්ධකාලෑ සම්මාදිට්ඨි සම්මාසඞ්කප්ප ඉත ධම්මෝ දෙදෙනා භාවනාවට යෙත්ඌනත්ථ ඒවාව සම්මාසඞ්කප්පෝත යෝව සම්මාවායාමෝ සියා කායිකෝ සියා චෙතසිකෝ; ඒ මාහීඩගයන් අතුරෙහි යම්කිසිම්යක් කම්මාන්තයෙක් වේද යම් සම්යක් ව්‍යායාමයෙක් වේද, හේ කායිකද වන්නේය. චෙතසිකද වන්නේයඌ තත්ථ යෝ කායසඞ්ඛාරෝ ඒසා කායෙ භාවිතෙ භාවනං ගච්ඡති, යෝ චිත්ත සඞ්ඛාරෝ සෝ චිත්තෙ භාවිතෙ භාවනං ගච්ඡති, ඒ කායිකචෙතසිකවූ සම්මාසඞ්කප්පත සම්මාවායාමියන් අතුරෙහි යම්ක් කායිකවඉයෙන් සංග්‍රහකරණ ලද්දේද එම සම්යක්කම්මාන්තය හෝ ව්‍යායාමය කායභාවනාකළ කලෑ වැඩිමටයේ; යම්ක් චෙතසික වඉයෙන් සංග්‍රහකරණ ලද්දේද එය චිත්ත භාවනාකළකල වැඩිමටයේඌ සෝ සමථවිපස්සනං භාවයනෙත්‍රා පවඩ්ඪං අධිගමං අධිගච්ඡති, ඒ යොගීතෙමේ උකත්‍රප්‍රකාරයෙන් සමථවිපස්සනා වඩ්ඪුයේ අවස්ථා විශෙෂ වඉයෙන් පවත්‍රප්‍රකාරවූ ආර්‍යමාර්ගාධිගම යට පැමිණේ, හේ කවරේද? බිප්පාධිඉමොච්ච ඉහොති, වඉ එක චිත්තක්ඛණයෙකින්ම ආර්‍යමාර්ගාධිගම ඇත්තේද වේ; "ආර්‍යමාර්ගී තෙමේ වඉ එස්වරක් එකචිත්තක්ඛණයෙකින්ම චතුස්සත්‍ය යන්හි තමා ආර්‍යමාර්ගය විසින් පැමිණිය යුත්තට පැමිණේ, ලෞකිසම්මතෙහිමෙන් වසිභාවනා කෘත්‍යයෙක් ආර්‍යමාර්ගියාගේ නැත්තුයි බිප්පාධිගම ඇත්තේඉ සී සේකි"ඌ විමුත්තාධිඉමොව ඉහොති, පඉකටයුතු අකුශලධර්මයන් අත්‍යන්තවිමුක්ති වඉයෙන් පහනරණ හෙයින් විමුත්තාධිගම ඇත්තේද වේ; මහාධිඉමොව ඉහොති, මහත්වූ ශීලස්කන්ධාදීන්ගේ අධිගමනභාවයෙන් මහත්වූ ආර්‍යමාර්ගාධිගම ඇත්තේදඉවේ; විපුලාධිඉමොව ඉහොති, විපුලඵලවත් එම ශීලස්කන්ධාදීන්ගේ අධිගමන භාවයෙන් විපුලාර්‍යමාර්ගාධිගම ඇත්තේද වේ; අඉවසෙයාධිඉමොව ඉහොති, තමාවිසින් කටයුතුවූ කිසිවක් ඉතිරි නොකරණ හෙයින් අනවසෙසාධිගම ඇත්තේද වේ,ඌ ඒ අධිගමලාභීහු

කවරහුදයත්? කිසිවෙක් සමථානුභාවයෙන් පැමිණෙත් කිසිවෙක් විදර්ශනානුභාවයෙන් පැමිණෙත් යයි දක්වනු පිණිස "තත්ථසමථෙන" යනාදිය කීහ:- තත්ථ සමථෙන ඛිපපාධිගමොච මහාධිගමොච විපුලාධිගමොච හොති, ඒ පඤ්චවිධාධිගමයන් අතුරෙහි සමථයෙන් ඛිපපාධිගමයද මහාධිගමයද විපුලාධිගමයද වේ; විපස්සනාය විමුත්තාධිගමොච අනවසෙසාධිගමොච හොති, විදර්ශනාවෙන් විමුත්තාධිගමයද අනවශෙෂාධිගමයද වේ; මෙසේ සිව්පිළිසිඹියාපත් තෙමහින් මාහිමියාණෝ "නාසමා රභිනවිකතායස" යනාදි ගාථාවශයෙන් අතීත්ඵල විමුක්තිචාරයෙන් විවරණභාරසමපාතය දක්වනුවෝ දෙශනාවෙහි දක්ෂභාවයෙන් අනෙකසූත්‍ර ප්‍රදෙශයෙන් ඒ අතීත්ඵල විමුක්තිහුගේ පූර්වභාගප්‍රතිපදා සම්බන්ධවූ භාවනා විශෙෂයන්ගේ හා භාවනානිසංසයන්ගේද විභාගවශයෙන් අනෙකාකාරයෙන් විවරණභාරය දක්වා දුන් දශවිධ තථාගත බලයන්ගේද වශයෙන් ඒ විවරණභාරය දක්වනු පිණිස "තත්ථයොදසයකි" යනාදිය කීහ. තත්ථ යො දෙසයති සෙ දසබලසමන්නාගතො සත්ථා ඔවාදෙන සාවකෙ න විසංවාදයති, ඒ සමථවිදර්ශනා භාවනා කරන්නාවූ ශ්‍රාවකයන් කෙරෙහි යමෙක් "අරක්ඛිතෙන චෙතසා" යනාදි ධර්මයක් දෙශනාකෙරේද සථානසථානඥානාදි දශවිධඥාන බලයෙන් සමන්විතවූ ඒ ශාස්තෘන්වහන්සේ අවවාදයෙන් සවුවන් විප්‍රලම්භනොකෙරේ හෙවත් වචානොකෙරේ, විසංවාදන හෙතු පාපධර්මයන් බෝමුලදීම අරියමිහින් මෙනවට පහකළ බැවිනි. සො තිවිධං ඉදං කරොථ ඉමිනා උපායෙන කරොථ, ඉදං මොඝ කුරුමානානං හිතාය සුඛාය භවිස්සති, ඒ ශාස්තෘතෙමේ මේ සරණගමනශීල සමාදානාදිය කරව් මේ ආකාරයෙන් ශීලසම්ධ්‍යාදිය සම්පූර්ණ කරව් එසේ ප්‍රතිපත්ති සම්පූර්ණකරන්නාවූ තොපගේ හිතසැප පිණිස මේ කාරණය වන්නේයැයි මෙසේ නෙපරිද්දකින් අවවාද කෙරේ. සෙ තථාඔවදිතො තථාඅනුසිට්ඨො තථා කරොතෙනතා තථා පටිපජ්ජනෙතා තං භූමිං න පාපුණිස්සතීති නෙතං ඨානං විජ්ජති, "ඉදං කරොථ ඉමිනා උපායෙන කරොථ"- යනාදිවූ ඒ ආකාරයෙන් අවවාදකරණලද්දාවූ එසේම අනුශාසනා කරණලද්දාවූ ඒ සුගතොවාදය එසේම කරන්නාවූ එසේම ඊට පිළිපන්නාවූ ඒ ශ්‍රාවකතෙමේ යම් ආර්‍යභූමියක්හුගේ අධිගමය පිණිස අවවාද කරණලද්දේද එම දර්ශනභූමියට හෝ භාවනාභූමියට නො පැමිණෙන්නේද එසේ නොපැමිණීමට හෙතුවූ යම් මේ කාරණයක් නැත්තේය. සෙ හි තථාඔවදිතො තථා අනුසිට්ඨො සීලක්ඛන්ධං අපරිපූරයනෙතා තං භූමිං අනුපාපුණිස්සතී'ති නෙතං

ඨානං විජ්ජති. එසේ අවවාදකරණලද එසේ අනුසාසනාකරණ ලද ඒ ශ්‍රාවකතෙමේ සිල්කඳ නොපුරන්නේ ඒ ආර්‍යභූමියට පැමිණෙන්නේද එසේ පැමිණීමට හෙතුවූ යම් මේ කාරණයෙක් නැත්තේය. මෙහි ශුක්ලපක්ෂ දෙශනාවාරය සුහමයි.

සම්මාසම්බුද්ධස්ස තෙ සතෝ ඉමෙ ධම්මා අනභිසම්බුද්ධා"ති නෙතං ඨානං විජ්ජති, මම සම්‍යක් සම්බුද්ධවීම් මාවිසින් සවී ධර්මයෝ අවබොධකරණ ලද්දාහුයයි ප්‍රතිඥාකරණකල සම්‍යක් සම්බුද්ධවූ නුබවහන්සේ විසින් මෙනම් ධර්මයෝ අවබොධ නොකරණ ලද්දාහුය යි යමෙක් කියාද එසේකීමට හෙතුවූ යම් මේ කරුණක් නැත්තේය. සබ්බාසවපරික්ඛීණස්ස තෙ සතෝ ඉමෙ ආසවා අපරික්ඛීණාති නෙතා ඨානං විජ්ජති, සර්‍වාශ්‍රවයන් ක්ෂය කළාවූ නුබවහන්සේගේ මේ ආශ්‍රවයෝ ක්ෂයනොවූවාහුය යි කියාද එසේ කීමට හෙතුවූ යම් ඒ කාරණයෙක් නැත්තේය. යස්ස තෙ අත්ථාය ධම්මා දෙසිතා සෝ න නීය්‍යාති තක්කරස්ස සම්මාදුක්ඛක්ඛයාය"ති නෙතං ඨානං විජ්ජති, රාගාදීන් අතුරෙන් යමක් යමක් පහකිරීම පිණිස නුබවහන්සේ විසින් අසුභභාවනාදිධර්මය දෙශනාකරණ ලද්දේද ඒ ධර්මතෙමේ එසේ පිළිපන්නාහුගේ මනාහෙතු උපායෙන් දුක්ගෙවීම පිණිස නොපැමිණෙය යි කියාද එසේ කීමට හෙතුවූ යම් ඒ කරුණක් නොමැත්තේය. සාවකෝ ඛොපන තෙ ධම්මානුධම්මපටිපන්නෝ සාමීචිපටිපන්නෝ අනුධම්මචාරී සෝ පුබ්බන්ත අපරං උළාරං විසෙසාධිගමං න සච්ඡිකරිස්සතී"ති නෙතං ඨානං විජ්ජති, නුබවහන්සේගේ ලොකොත්තර ධර්මයට අනුව පිළිපන්නාවූ සාමීචිකර්මයට සුදුසුව පිළිපන්නාවූ අවවාද ධර්මයට අනුව හැසිරෙන සුළුවූ ශ්‍රාවකයෙක් වේද හෙතෙමේ පූර්‍වභාග ප්‍රතිපදාගුණ හෙතු කොටගෙණ අපරවූ මහත් උත්තරිමනුෂ්‍යධර්ම ඥානදර්ශනවිශෙෂාධිගමයක් ප්‍රත්‍යක්ෂ නොකරන්නේය යි කියාද එසේ කීමටහෙතුවූ යම් ඒ කරුණක් නැත්තේය. යෙ ඛෝ පන ධම්මා අන්තරායිකා තෙ පටිසෙවතෝ නාලං අන්තරායාය"ති නෙතං ඨානං විජ්ජති, නුබවහන්සේ විසින් දෙශනාකරණලද සඟි මොක්ෂානන්තරාය කරණ සභාව ඇත්තාවූ කර්ම කිලෙස විපාක උපවාද ආණාවිතික්කම සංඛ්‍යාතවූ යම් පවධර්මයෙණෙක් වෙත්ද ඒ ධර්මයන් සේවනය කරන්නාහට අන්තරාය පිණිස පොහොසත් නොවෙත් යයි කියාද එසේ කීමට හෙතුවූ යම් ඒ කරුණක් නැත්තේය. යෙ ඛෝපන ධම්මා අනීය්‍යානිකා තෙ නීයන්ති තක්කරස්ස සම්මාදුක්ඛක්ඛයාය"ති නෙතං ඨානං විජ්ජති, නුබවහන්සේ

විසින් ආර්‍යාමාගීගත විරුඩහෙයින් අනියත නිකාය යි යම් ධර්ම නෙණෙක් වදුරණුලද්දාහුද ඒ ධර්මයෝ එහේ පිළිපන්නහුගේ මනාඋපායෙන් දුක්ඛෙවීම පිණිස පමුණුවත්යයි කියාද එබඳු කරුණක් නැත්තේය; මෙහි ශුකුලපක්ෂය සුගමයි.

සාවකෝ පන තෙ සඋපාදිසෙසෝ අනුපාදිසෙසං නිබ්බාන ධාතුං අනුපාපුණිස්සතී"ති නෙතං ඨානං විජ්ජති; නුබවහන්සේ ගේ උපාදිශෙෂ සහිතවූ යම් ශ්‍රාවකයෙක් තෙමේ අනුපාදිශෙෂ නිර්‍වාණධාතුවට පැමිණෙන්නේයයි කියාද එබඳු කරුණක් නැත් තේය. දිට්ඨසම්පන්නෝ මාතරං ජීවිතා වොරොපෙය්‍ය හත්ථෙන වා පාදෙන වා සුඛතං නරෙය්‍යා"ති නෙතං ඨානං විජ්ජති, දෘෂ්ටි සංඛ්‍යාත මාගීඥානයෙන් යුක්තවූ පුද්ගලතෙමේ ජනනීමාතෘව ජීවිතයෙන් නොරකරන්නේද අතින් හෝ පාදයෙන් හෝ අධික වධකරන්නේද යන මේ කරුණ නොවන්නේය. පුථුජ්ජනෝ මාතරං පෙ. ඨානමේතං විජ්ජති. එවං පිතරං. අරහන්තං යන්තාදිය සුගමයි.

දිට්ඨසම්පන්නෝ පුග්ගලෝ සංඝං භින්දෙය්‍ය සංසෙවා සංඝරාජිං ජනෙය්‍යාති නෙතං ඨානං විජ්ජති, මාගීඥානයෙන්යුත් පුද්ගල යෙක් තෙමේ සමාන සංවාසකවූ සමානසංවාසිමාවෙහි සිටියාවූ සමග්ගසංඝයා භඞ්ග උදෙදස වොහාර අනුසාවනා සලාක ගාහ යන පඤ්චාකාරයන් අතුරෙන් යම්කින් භෙදකරන්නේද නොහොත් එබඳුවූ සංඝයා කෙරෙහි සංඝරාජියක් සංඝයාගේ පැළීමක් උපදවන්නේද යන මේ කරුණ නොවන්නේය. මෙහි දුපුථුජ්ජන වාරය සුගමයි. දිට්ඨසම්පන්නෝ තථාගතස්ස දුට්ඨ චිත්තෝ ලොහිතං උප්පාදෙය්‍ය පරිනිබ්බුතස්ස වා තථාගතස්ස දුට්ඨචිත්තෝ ථූපං භින්දෙය්‍යාති නෙතං ඨානං විජ්ජති, දිට්ඨසම්පන්න යෙක් වධකයින් ඇත්තෙක්ව තථාගතයන් වහන්සේගේ දිව මන්කයෙහි ලේසොළවා උපදවන්නේද පිරිනිවීගිය තථාගතයන් වහන්සේගේ ශාරීරිකධාතු ප්‍රතිෂ්ඨාපිත යූපයක් විනාශකරණ දූෂිතචිත්තයෙන් යුක්තව බිඳින්නේද යන මේ කරුණ නොවන් නේය. පුථුජ්ජනවාරය උත්තානයි.

දිට්ඨසම්පන්නෝ අඤ්ඤං සත්ථාරං අපදිසෙය්‍ය අපිජීවිතහෙතු නි නෙතං ඨානං විජ්ජති, දිට්ඨසම්පන්නයෙක් සවජීවිතය හෙතු කොටගෙණවත් අන්‍යශාසනාවරයෙකු මේ මාගේ ශාසනායහි දක්වන්නේද භජනට හන්නේද යන මේ කරුණ නොවන් නේය; පුථුජ්ජන වාරය සුගමයි. දිට්ඨසම්පන්නෝ ඉතෝ බහිද්ධා අඤ්ඤං දක්ඛිණෙය්‍යං පරියෙසෙය්‍යාති නෙතං ඨානං විජ්ජති,

දිට්ඨිසම්පන්නානෙයක් මේ ශාසනයෙන් පිටත්හි අන්‍ය ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ මේතෙමේ දක්ෂිණාර්හයයි සොයන්නේද යන මේ කරුණ නොවන්නේය. දිට්ඨිසම්පන්නා කුතූහලමඩහලෙන සුඩිං පවේවය්‍යාති නෙතංඨානං විජ්ජති, දිට්ඨි සම්පන්නයෙක් මේ කාරණයෙන් මෙතම් අනිමන්ත්‍රිතසිද්ධිය වන්නේයයි ලෞකික මහාජනයා විසින් සාරවශයෙන් ගන්නා ලද දිට්ඨසුතමුත මඩහලයෙන් තමන්ගේ සුඛියපතන්නේද අදහන්නේද යන මේ කරුණ නොවන්නේය.

ඉත්ථී රාජා චක්කවත්තී භවියා"ති නෙතං ඨානං විජ්ජති, යතු පටන් 'තිණ්ණං සුචරිතානං ඉධෙව නන්නෙතා පිතුයා මාතාපෙතා භරිස්සතීති ඨානමෙතං විජ්ජති"ති යනු අවසන්කොට උත්තානා පිසිංකුඛගෙඩා, පාපිච්ඡත්ව අවිද්‍යමානගුණ ප්‍රකාශකාරණ අදහසින් මහාජනයා විශ්මයට පමුණුවන්නාවූ; ලපකඩා, ප්‍රත්‍යයසන්නිශ්‍රිත ප්‍රයුක්තවචනයෙන් කථාකරන්නාවූ; නෙමිත්තකෙහා, පඤ්ච උපද්‍රවංකැණීමට හෙතු කාරණයන්හි පිහිටියාවූ; සමණෙහාවා, පැවිදි සටහන් පමණින් ශ්‍රමණවූ හෝ; බ්‍රාහ්මණෙහාවා, ජාතිමාත්‍රයෙන් බ්‍රාහ්මණවූ හෝ; අඤ්ඤතරෙ, යම්කිසිවෙක්; කුහනලපනනෙමිත්තකතනං, එකී කුහනලපනනෙමිත්ත කර්මයක; පුබ්බඛෙපිංඛතවා, පෙරටුකොටගෙණ; (ඉන්ද්‍රියභාවනාමාර්ගාදි ගුණවර්ණනයෙකුමෙන් කොටැ දක්වයිද්‍ය යි) මෙත්තෙඉාඋපෙක්ඛාසහගතෙ, චිත්තෙනාපකෙලෙසවූ; පඤ්ඤාය දුබ්බලිකරණෙ, ප්‍රඥාව දුර්වල කරන්නාවූ; පඤ්චනීවරණෙ, කාමච්ඡන්දාදි පඤ්චනීවරණයන්; අප්පහාය, ප්‍රහාණ නොකොට; චතූසු සතිපට්ඨානෙසු, සිව්සිවටන්හි; අනුපඤ්ඤානති, නොළඹවනලද සිහිඇතිව; විහරතෙනා; ඉරියව් පවත්වන්නේ; සත්තබොජ්ඣඞ්ගෙ, සප්බොජ්ඣඞ්ගයන්, අභාවයිත්වා, නොවඩා; අනුත්තරං සම්මාසම්බොධිං, අනුත්තර සම්‍යක්සම්බෝධිය; අභිසම්බුජ්ඣිස්සතීති, අවබෝධ කරන්නේය යන:- එතං ඨානං නාවිජ්ජති, පශ්චිමවාරයෙහි "අඤ්ඤතරෙ සමණෙහාවා බ්‍රාහ්මණෙහාවා" යනු බොධිසත්ත්වයන් නිසා කියනලදි, එහි සබ්බඤ්ඤුභාවපතිතා, පාරමිධර්මයන්ට ප්‍රතිපක්ෂවූ සකලදෝෂයෙන් පහවූයේ යි, සතිපට්ඨානයෝ විදිතාහි, බොජ්ඣඞ්ගයෝ මිගාහි, අභිත්වය අනුත්තර සම්මාසම්බොධිසි.

එසේ, මේ ඨානාඨානපරීක්ෂයෙහි; හෙතුතෝ, සථානයාගේ හා අසථානයාගේ හෙතුවශයෙන්; ඨානතෝ, එතෙක්ෂණයිම ආවර්ජනයට අනුකූලවූ (වහාම); අනොධිතෝ, ඔධිරහිත වශයෙන් කිසිවක් ඉවිරිනොකොට; ඤාණං, යම් සථානාසථානඥානයක්

උපදනේද; ඉදං ඨානාඨානඤාණං, මෙකී සථානාසථානඥානය; පඨමං තථාගතබලං වුච්චති, පළමුවැනිවූ තථාගතඤාණබලයයි කියනු ලැබේ. ඉති, මෙසේ උකතප්‍රකාරයෙන්; සබබෙ ඛය ධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා, ඛය වය විරජජන නිරුජඣන සභාව ඇත්තාවූ සකල සංඛතධම්මයෝ; ඨානාඨාන ගතා, සථානාසථානසවභාවට පැමිණියෝ වෙත්; කෙවි, එකිධම් යන්හි හැසිරෙන්නාවූ සමසර සතවයෝ; සඝගූපගා, සඝලොවට පැමිණෙන්නෝ වෙති; කෙවි, අධම්මයෙහි හැසිරෙන සමහරක්; අපායූපගා, හිවි අපාදුකට පැමිණෙන්නෝ වෙති; කෙචි, කම් ඛයකර දෘෂ්ටිමාර්ගයට පිළිපන්නාවූ සමහරක්; නිබබානූපගා, නිවණට පැමිණෙන්නෝමෙනි; එවං, එහෙයින්; කෙවලං ඛෝ, භාග්‍යවතුන් වහන්සේ විසින්ලසේක.

සබෙබසතතා මරිසසනති පෙ අනාසවාති

සබබෙසතතා, ආර්‍යවූද අනාර්‍යවූද සකලසතවයෝ; මරිසසනති, දැඩිවැඩි සංඛ්‍යාත විප්‍රකාර මරණයෙන් මැරෙත්; කිං, ඒ එසේමැති; ජීවිතං, ජීවිතෙන්ද්‍රියයාගේ පැවැත්ම; ඔරණිකනං, මරණ කෙළවරකොට ඇත්තේය; පුඤඤඤාසඛීපූපගා, කුසලා කුසල ඵලයට පැමිණි සතවයෝ; සකාකමමං ගමිසසනති, කම්වූ පරිද්දෙන් පරලොව යන්නාහුය; කාසඛමමණා, කරණලද පවිකම්ඇත්තෝ නොනොත් කරණලදපවිකම්හෙතුකොට ගෙණ; නිරසං, නරකයටද; පුඤඤකමමා, කරණලද පින්කම් ඇත්තෝ නොහොත් කරණලද පින්කම් හෙතුකොටගෙණ; සුගහගිංව, සුගතියටවද යෙත්; අසඤඤ, සසරබියදක්නාසුළුවූ ඇතැම් ප්‍රාඥයෝ; මඤඤං භාවෙඛා, භවඛණ්ඩනවෙත්දක ආර්‍ය මාර්ගයවඩා; අනාසවා, ආශ්‍රවරහිතවූවෝ; පරිනිබබනති, ඉඝපාදි ශෙෂඅනුපාදිශෙෂසංඛ්‍යාතවිප්‍රකාරයෙන් පිරිනිවෙත්. එහි සබබෙසතතා යනු ආර්‍යවූද අනාර්‍යවූද සකකායදෘෂ්ටියෙහි බැසගත්තාවූද සකකායදෘෂ්ටිය ඉක්මෙව්වාවූද සතවයෝය, මරිසසනති යනු දඩිමරණ අදඩිමරණ යන විප්‍රකාරමරණ යෙන්මැරෙත්, එහි සකකායදෘෂ්ටියෙහි බැසගත්තවුන්ගේමරණය අදඩිසි, සකකායදෘෂ්ටිය ඉක්මවූවුන්ගේමරණය දඩිසි.

මරණයනසඛාජීවිතං, යනු ආයුගෙවීමෙන් චක්ෂුරාදී ඉන්ද්‍රිය යන්ගේ උපවෙත්දයෙන් වන්නාවූ; ජීවිතපරියොසානා, දිවිකෙළවර නම්; මරණපරියොසානා, මරණ සඞ්ඛ්‍යාතවූ අන්තයයි; සකා කාමමං ගමිසසනති, යනු කමමසසකතා හි, සවියන්ගේ කම්වූ පරිද්දෙගි යම් ගමනක්වේද එය කමමසසකතායයි කියයි;

පුඤ්ඤූපාපඵලූපනා, යන්නෙන් කම්පල දක්නාසුළුබව හා කම් පලින් වියොව නොවෙන බවද දක්වයි; නිරයං පාපකම්මනෙතා යන්නෙන් අකුසල සංසකාරයෝ දක්වනලදහ; පුඤ්ඤූකම්මා ච සුගතිං, යන්නෙන් කුසලසංසකාර හෙතුවෙන් සුගතියට යන් යි කිහ; අපරෙ ච මග්ගං භාවෙත්වා පරිනිබ්බන්ති අනාසවා- යන් නෙන් සම්සංසකාරයන්ගේ සමතික්‍රමනය දක්වන ලදී.

තෙනා හ භගවා සබ්බෙ -පෙ- අනාසවාති, මෙහි සබ්බෙ සත්තා මරිස්සන්ති -පෙ- පාපකම්මනෙතා- යනු ආහාලහප්‍රතිපදා හා නිජ්ඣාම ප්‍රතිපදායි; අපරෙව -පෙ- අනාසවා, යනු මධ්‍යම ප්‍රතිපදායි; සබ්බෙසත්තා -පෙ- පාපකම්මනෙතා, යනු සංකෙලෙසයි; එවං සංසාරං නිබ්බත්තෙයන්ති, මෙසේ සසර නිපදවයි; සබ්බ සත්තා-පෙ- පාපකම්මනෙතා, යන්නෙන් දුකඛවට කම්මවට කිලෙසවට යන තෙවටහු කියනලදහ; අපරෙව මග්ගං භාවෙත්වා යනාදියෙන් නිවටන් විවරකිරීම දක්වත්; සබ්බ සත්තා -පෙ- පාපකම්මනෙතා- යනු ආදිනවයි; පුඤ්ඤූකම්මා ච සුගතිං යනු අස්සාදයි; අපරෙ ච මග්ගං භාවෙත්වා යනාදිය නිස්සරණයි; සබ්බ සත්තා -පෙ- පාපකම්මනෙතා යනු හෙතු හා ඵලයි; එහි පඤ්චසකඛ්ධයෝ ඵලයි, තෘෂ්ණාව හෙතුයි; අපරෙ ච මග්ගං භාවෙත්වා යනාදිය මාර්ගය හා ඵලයි; සබ්බ සත්තා -පෙ- පාපකම්මනෙතා-යී- මේ සංකෙලෙසයි ඒ සංකෙලෙස තෙමේ තණ්හා සංකිලෙස දිට්ඨිසංකිලෙස දුච්චරිත සංකිලෙස යි තෙවැදෑරුම් වේ; එහි තණ්හා සංකිලෙසය කාමතණ්හා භවතණ්හා විභව තණ්හා යන තුන්තණ්හින් දුක්ඛයුතුය නොහොත් යම් යම් වස්තුවකින් බැසගන්නා ලද්දේද ඒ ඒ වස්තුවෙන්ම දුක්විය යුතුය, සත්තිස්වැදෑරුම් තෘෂ්ණාජාලා විවරිතයෝ එම තෘෂ්ණාව ගේ විසතරයි; දිට්ඨිසංකිලෙස, දුච්චරිත සංකිලෙස විවයද ප්‍රකටයි; අපරෙව මග්ගං භාවෙත්වා යනාදිය වොදනයි, ඒ මේ වොදනය තෙවැදෑරුම්වේ; තෘෂ්ණා සංකෙලෙසය සමථයෙන් සුදුවේ, ඒ සමථය සමාධිසකඛ්ධයි; දෘෂ්ටිසංකෙලෙසය විදර්ශනාවෙන් සුදුවේ ඒ විදසුන් පැණකඳයි; දුශ්චරිත සංකෙලෙසය සුචරිතයෙන් සුදු වේ ඒ සුචරිතය සිල්කඳයි; සබ්බ සත්තා -පෙ- පාපකම්මනෙතා- යනු අපුඤ්ඤූපටිපදායි, පුඤ්ඤූකම්මා ච සුගතිං-යනු පුඤ්ඤූකම්ම පටිපදායි; අපරෙව මග්ගං භාවෙත්වා- යනාදිය පුඤ්ඤූ පාප සමතික්‍රමන පටිපදායි; ඒ ප්‍රතිපදාවන් අතුරෙහි යම් පුඤ්ඤූ පටිපදාවක් හා අපුඤ්ඤූපටිපදාවක් වේද මේ සුඛති දුග්ගති සංඛ්‍යාන සකල භවගාමිනීවූ එක් ප්‍රතිපදාවකි, එයින් එක් ප්‍රති

පදවක් සිව්අපායෙහිද එක් ප්‍රතිපදාවක් සුගතිසංඛ්‍යාත දෙව ගතින්හිද උතපත්තීයට හෙතුවන්නීය. යම් පුඤ්ඤ පාපස මන්විකකම පටිපදාවක් වන්නිද මෙය ඒ ඒ කෙලෙසපරිනිබ්බාණ යෙහි යන සුළුවන්නිය; නැවත මෙහි ප්‍රතිපදාවන්ගේ විභාගය දක්වනු පිණිස තයොරාසි යනාදිය කීහ; තයො රාසි මිච්ඡත්තනියතොරාසි සම්මත්තනියතොරාසි අනියතොරාසි, මිච්ඡත්තනියත රාසිය සම්මත්තනියත රාසිය අනියත රාසිය හි ප්‍රතිපදා රාශි තුණෙක් වෙති:-

තත්ථ යො ච මිච්ඡත්තනියතොරාසි යො ච සම්මත්තනියතොරාසි එකා පටිපදා, තත්ථනන්තරිකාමිනී, ඒ ත්‍රිවිධරාසින් අතු රෙහි යම් මිච්ඡත්තනියත රාසියෙක් වේද යම් සම්මත්තනියත රාසියක් වේද, මේ තත්ථනන්තරිකාමිනීවූ එකම ප්‍රතිපදාවකි, තත්ථ යො අනියතොරාසි අයං සබ්බත්ථකාමිනී පටිපදා, එහි යම් අනියත රාසියක් වේද මේ සබ්බත්ථගාමිනී පටිපදාවයි; කෙන කාරණේන, කිතම් කරුණකින්ද යත්? පච්චයං ලභනෙනා නිරයෙ උපපජ්ජිත්‍ය, අච්චන්තාදි ප්‍රත්‍යයලබන්නේ නරකයෙහි උපදනේය; පච්චයං ලභනෙනා තිරච්ඡානයොනියු උපපජ්ජිත්‍ය, ප්‍රත්‍යයක් ලබන්නේ තිරිසන්යොනින්හි උපදනේය; පච්චයං ලභනෙනා පරිනිබ්බායෙය්‍ය-යනු අවසන්කොට උත්තානාථියි; තස්මා සං සබ්බත්ථගාමිනී පටිපදා, එසේ ප්‍රතිපදාවිභාගයෙයින්- සබ්බ සත්තා මරිස්සන්ති- යනාදි ඝාථාවයෙන් නිද්ධාරණයකොට විවි තනයකරණලද මේ ධම්ක්‍රමය සච්චත්‍රගාමිනී ප්‍රතිපදානම්. යං එත්ථ කුසලං හෙතුසෝ ඨානසෝ අත්තාධිසෝ ඉදං වුච්චති සබ්බත්ථගාමිනීපටිපදා කුසලං දුතියං කථාසම්බලං, මේ සච්චත්‍රගාමිනී ප්‍රතිපදාවෙහි ප්‍රතිපදා මහතුවශයෙන් ආවර්ජිත කල අනතුරුව වහාම සච්චත්‍රකාරයෙන් උපදනාවූ යම් කුසලයක් වේද එදවැනි තථාගතබලයවූ මේ කුසලය සච්චත්‍රගාමිනී ප්‍රතිපදා ඥානය හි කියනු ලැබේ, භාග්‍යවතුන් වහන්සේ මෙම ඥානයෙන් සච්චප්‍රතිපදා විභාගය තත්වූපරිද්දෙන් දන්නාසේක- හේකෙසේද යත්-? "යම් ගමක වැසි සියල්ලන්ම එක්ව එකම හුරෙකු හෝ මුවෙකු මරණකල්හි ඒ සියලු මිනිසුන්ගේම සවනයාව සත්ව ඉන්ද්‍රිය අරමුණුකොටැ පවත්නිය ඒ ප්‍රාණඝාත අකුසල කර්මය වනාහි රැස්කරණ කෙණෙහිම ඔවුන්ගේ සිත්හි වෙන් වෙන්වූ ආකාර ඇත්තේ වේ ඔවුනතුරෙන් එකෙක් අනාදර යෙන් හිංසාකාරයි එකෙක් නෝත්සාරවයි අනුන් මිඹින් පීඩා කරණලදුව කෙරෙයි, එකෙක් සදිකාමැත්තෙකුමෙන්වී ප්‍රති ඝාතය නොකෙරෙමින් හැඟිරෙයි, ඔවුනතුරෙන් එකෙක් එම

කම්මයෙන් නරකයෙහි උපදී එකෙක් තිරිසන් යොනියෙහිද එකෙක් ප්‍රේතලෝකයෙහිද උපදී, මෙසේ විමට කාරණය තථාගතයන් වහන්සේ එම කම්මය රැස්කළ කෙණෙහිම මේ ආකාරයෙන් රැස්කළ බැවින් මොහු නරකයෙහි උපදින්නේය මොහු තිරිසන් යොනියෙහි උපදින්නේය මොහු ප්‍රේතවිෂයෙහි උපදින්නේයයි දන්නා සේක්මය, නරකයෙහි උපදින්නවුන් අතුරෙන්ද මොහු මහ නරකයෙහි උපදින්නේය මොහු ඔසුපත්හි උපදින්නේය යි දන්නා සේක, තිරිසන්යොනියෙහි උපදින්නවුන් කෙරෙහිද මොහු අපාදකයෙක් වන්නේය මොහු විපාදකයෙක් වන්නේය මොහු සිවිපාවෙක් වන්නේය මොහු බහුපාවෙක් වන්නේය යි දනී, ප්‍රේතයොනියෙහි උපදින්නවුන් අතුරෙහිද මොහු නිජ්ඣාමතණ්හිකයෙක් වන්නේය මොහු ඛුප්පිපාසයෙක් වන්නේය මොහු පරදත්තූපජීවිකයෙක් වන්නේය යි දනී. ඒ අකුශලකම්මයන් අතුරෙහිද මේ කම්මය ප්‍රතිසන්ධිය අදනේය මේ කම්මය ප්‍රතිසන්ධිය නො අදනේය දුර්ම්ල කම්මය ප්‍රතිසන්ධිය දුන්කල උපධි විපාකමාත්‍රයක් වන්නේය යි දන්නා සේක. එසේම යම් ගමෙක වැසි සියල්ලන් එක්ව දනක් දෙනකැලැ ඒසියල්ලගේම වෙතනාව එම දානවස්තූන් අරමුණු කොට ඇත්තේවේ ඒ දානමය කුශලකම්මය වනාහී ඔවුන් රැස්කළ කෙනෙහිම නානාකාරවේ ඔවුනතුරෙහි ඇතැම් කෙනෙක් දෙව්ලොව උපදින් ඇතැම්කෙනෙක් මිණිස්ලොවැ උපදින්, තථාගතයන් වහන්සේ ඒ කම්මය රැස්කළකෙණෙහිම මේ ආකාරයෙන් මේ කම්මය රැස්කොට මොහු මිනිස්ලොවැ උපදනේය මොහු දෙව්ලොවැ උපදනේය යි දන්නා සේක, ඒ දෙවියන් අතුරෙහිද මෙතෙමේ පරනිම්මිත වසවත්ති දෙවියන් කෙරෙහිද මෙතෙමේ බ්‍රහ්මාවු දෙවියන් කෙරෙහිද මෙතෙමේ ප්‍රධාන දිව්‍යරාජයෙක්වද මෙතෙමේ දෙවැනි තුන්වැනි තනතුරුකරණ පරිවාරකයෙක්වද උපදනේය යි දන්නා සේක, ඒ කුශලකම්මයන් අතුරෙහිද මේ කම්මය ප්‍රතිසන්ධිදානයට සමර්ථවන්නේය මෙය සමර්ථ නොවන්නේය දුර්ම්ලවන්නේය ප්‍රතිසන්ධිදුන්කලැ උපධි විපාකමාත්‍රයක් දෙන්නේය යි දන්නා සේක, එසේම විදසුන් වඩන යොගීන් අතුරෙහිද මෙතෙමේ මේ ආකාරයෙන් විදසුන් අරමුණුකළබැවින් රහත්වන්නේය මෙතෙමේ අනාගාමීද-මෙතෙමේ සකෘදාගාමීද-මෙතෙමේ සොතාපන්නද- එකබීජීද-කොලංකොලද- සත්තක්ඛත්තුපරමද වන්නේය මෙතෙමේ ආර්‍යමාර්ගයට පත්වන්ට නොහැකි වන්නේය ත්‍රිලක්ඛණාරම්මණික විදර්‍ශනාඥානයෙහි හිටින්නේය මෙතෙමේ ප්‍රත්‍යය පරිග්‍රහණ

යෙහිද මෙතෙමේ නාමරූප පරිග්‍රහණයෙහිද මෙතෙමේ අරූප ධර්මපරිග්‍රහණයෙහිද සිටින්නේය මෙතෙමේ මහාභූතමාත්‍රයක් ව්‍යවස්ථානය කරන්නේය මෙතෙමේ කිසිවක් සලකාගත නොහැක්කේවන්නේය යි දන්නාසේක, කිරුණුපිරියම්කරන් නවුන් අතුරෙහිද මෙහෙමේ පරිකර්මමාත්‍රයෙහි සිටින්නේය මෙහෙමේ කසිණ නිමිත්ත අමණක් උපදවන්නට හැකිවන්නේය අර්හාදීන් උපදවන්ට නොහැකිවන්නේය මෙතෙමේ අර්හාදීන් උපදවන්නේය මෙතෙමේ ධ්‍යානයට පැමිණෙන්නේය මතු ගුණවිශෙෂයට කොපැමිනෙන්නේය මෙතෙමේ උපරිගුණවිශෙෂයට පැමිණෙන්නේය යි දන්නාසේක, මෙසේ භාග්‍යවතුන් වහන්සේගේ සර්වඥතාඥානී ප්‍රතිපදාඥානවිභාගය දතයුතු.

ඉති සබ්බඤ්ඤුතඤාණිනී පටිපදා අනෙකධාතුලෝකා:-මෙසේ උක්තප්‍රකාරයෙන් සර්වඥතාඥානී ප්‍රතිපදාතොමෝ චක්ෂුරාදිවූද පෘථිව්‍යාදිවූද අනෙකධාතූන්ගෙන් යුත් සකලාධ්‍යාත්මාදි ලෝක නම්; හෙවත් තත්ථගාමිනීප්‍රතිපදාව අන්‍යෝන්‍යවිලක්ෂණයෙන් නානා ධාතු ලෝකනම්. එහි අනෙකධාතුලෝක නම් කවරේද? පඨවී ධාතු පටන් නිබ්බානධාතු අවසන්කොට දක්වනලද එක්තිස්ධාතු අනෙකධාතුලෝකනම් විභාග අර්ථනයානුසාරයෙන් දතයුතු. එහි නානාධාතුලෝක නම් වේද? අසුභ චක්ඛුධාතු අසුභ රූප ධාතු අසුභ චක්ඛුවිඤ්ඤාණධාතු ආදිවශයෙන් අන්‍යෝන්‍ය විලක්ෂණත්වයෙන් නානාප්‍රකාර ධාතූන්නෙන්යුත් ලෝකයයි; යං එත්ථ සඞ්ඛතං හෙතුසෝ ඨානසෝ අනොධිසෝ ඉදං වුච්චති අනෙකධාතු නානාධාතුඤාණං තථාගතබලං;- මේ අනෙකධාතු නානාධාතුඤාණය චක්ඛුධාතුආදි භෙදයෙන් උපාදින්නක නෙවත් සවිඤ්ඤාණක සඞ්ඛාරලෝකයාගේ වශයෙන් අනෙකධාතු නානාධාතුලෝකය භාග්‍යවතුන්වහන්සේ ඇසීමෙන් දන්නාසේක්ද එසේම අනුපාදින්නක අවිඤ්ඤාණක සංඛාරලෝකයාගේ වශයෙන් ද එය දන්නාසේක් ම ය, පසේ බුදුවරයන්වහන්සේලා භාග්‍යවතුන් වහන්සේලාද උපාදින්නකසඞ්ඛාරලෝකයාගේ ම නානත්වය දනිත් හෙද එක දෙසකින් ම ය නිප්‍රදේශයෙන් නොවේ අනුපාදින්නක සංඛාර ලෝකයාගේ නානත්වය නොදනිත්. භාග්‍යවතුන්වහන්සේ වනාහී මේ නාම් ධාතුහුගේ උස්සන්නතාවයෙන් මේ වෘක්ෂයාගේ කඳ සුදුය මේ වෘක්ෂයාගේ කඳ කළුය මේ වෘක්ෂයාගේ කඳ මටය මේ වෘක්ෂයාගේ කඳ සණුය මේ වෘක්ෂයාගේ සිව්ය තුනිය මෙනම් ධාතුහුගේ උස්සන්නතාවයෙන් මේ වෘක්ෂයාගේ පත්‍ර වර්ණසංස්ථානාදි වශයෙන් මෙබඳු වෙත් ය යී ද මේ නාම් ධාතුහුගේ උස්සන්නභාවයෙන් එලු කුඩාස මහත්

ය දිගය වටය මනාසවහන් ඇත්තේය මවය කැකීඝය සුඟදය දුඟදය මෙනම් ධාතුහුගේ අධිනත්වයන් මේ වෘක්ෂයාගේ මල් නිල්වන්ය පිඟුවන්ය ලේවන්ය සුදුවන්ය සුඟදය දුඟදය යී ද තිත්තය මධුරය කටුකය ඇඹුල්ය කසටය යී ද මෙනම් ධාතුහුගේ උසස්භාවයෙන් මේ වෘක්ෂයාගේ කටු සියුම්ය රළුය සෘජුය වඩිකය කළුය නිල්ය සුදුය යි මේ ආදි ආකාරයෙන් අවිඥානකසංසාර ලොකයාගේද අනෙකධාතු නානාධාතුස්වභාව ත්වූ පරිද්දෙන් දන්නා සේක. අනෙකධාතු නානාධාතුලෝකය.

ඉතිඅනෙකධාතු නානාධාතුකස්සලෝකස්ස, උකතප්‍රකාර වූ අනෙකධාතු නානාධාතු ලොකයාගේ; සංසත්තදවධාතුංසත්තා අධිමුච්චන්ති, යම් කිසි හීනාදි සවභාවවත් ධාතුවකට සත්වයෝ අදහස්වශයෙන් පැමිණෙත්ද; තං තං ඒව, ඒ ඒ ධාතුම; අධිමුච්චන්ති, ඉවත්; අභිනිවිසන්ති, තෘෂ්ණාදිවශයෙන් ඇතුළත්වත්. අධිමුච්චනවිසයවිභාගවශයෙන් දක්වනුපිණිස කෙවි රූපාධිමුත්තා යන්නාදිය කීහ. හේ උත්තානාපීසි. යං එත්ථ කුසලං හෙතුසෝ ඨානසෝ අනොධිසෝ අයං වෙනෙය්‍යෝ අයං න වෙනෙය්‍යෝ අයං සග්ගගාමී අයං දුග්ගතිගාමී'ති ඉදං වුච්චති සත්තානං නානාධිමුත්තිකතාඤාණං චතුත්ථං තථාගතබලං. මේ හීනප්‍රණීතාධිමුත්තිතාවය හොවර කොටගෙන මේ සත්ව තෙමේ භික්ෂවිා ලිය හැක්කේය මේ තෙමේ භික්ෂවා ලිය නොහැක්කේය මේ තෙමේ සුගතිගාම්ය මේ තෙමේ දුග්ගතිගාමී ය යි හෙතුවශයෙන් වහාම සීඝ්‍රප්‍රකාරයෙන් යම් ඥානය උපදනේ ද මේ සත්වයන්ගේ නානාධිමුත්තිතාවය දන්නා ඥානය සිව්වැනි තථාගතබලය යි කියනු ලැබේ. නානාධිමුත්තිකතා ඥානයයි. ඉති තෙ යථාධිමුත්තා ව භවන්ති තං තං කම්මසමාදානං සමාදියන්ති, උකතප්‍රකාරයෙන් ඒ හීනාධිමුත්තිකප්‍රණීතාධිමුත්තිකසත්වයෝ යම් ආකාරයකින් අදහස් ඇත්තෝවෙත් ද ඒ ඒ අධිමුත්තියට අනුරූපපරිද්දෙන් තමන් විසින් සමාදන්විය යුතු කටයුතුකම්සමාදානය කෙරෙත්, ඔව්හු සමහරෙක් ලොභවශයෙන්ද සමහරෙක් ද්වේෂවශයෙන්ද සමහරෙක් මොහවශයෙන්ද සමහරෙක් ශ්‍රද්ධාවශයෙන්ද සමහරෙක් වීර්‍යවශයෙන්ද සමහරෙක් ප්‍රඥාවශයෙන් දැයි සමුච්චාතෘභෙදයෙන් අඛාකාරවූ කම්ය සමාදන් වෙත්, තං විභජ්ජමානං දුවිධං සංසාරගාමී නිබ්බාන ගාමී ච, සමුච්චාතෘවශයෙන් අඛාකාරවූ ඒ කම්ය ප්‍රවෘත්තිනිවෘත්ති වශයෙන් විභාගකරණ්හි ලබන්නේ සංසාරගාමීකම්ය නිබ්බාණගාමී කම්යද යි දෙවැදෑරුම් වේ, ඒ ද්විවිධකම්යන් අතුරෙහි යම් කම්යක් ලොභවශයෙන් දොසවශයෙන් මොහවශයෙන් කෙරේද

මේ කර්මය සංක්ලිෂ්ට බැවින් කෘෂ්ණයි කාලකසංඛ්‍යාත අකුසල විපාක බැවින් කෘෂ්ණවිපාකයි, එහි යම් කර්මයක් ශ්‍රද්ධා වශයෙන් වීර්‍ය්‍ය වශයෙන් නොවේ ද මේ කර්මය අසංක්ලිෂ්ට බැවින් ශුක්ලයි සොභන විපාක බැවින් ශුක්ල විපාකයි. එහි යම් කර්මයක් ලොභ දෘෂ මොහ වශයෙන් හා ශ්‍රද්ධාවශයෙන් නොවේ ද මේ කර්මයද සංක්ලේශ අසංක්ලේශ වශයෙන් උභය මිශ්‍රභෙයින් කෘෂ්ණ සුක්ලයි. කෘෂ්ණසුක්ලවිපාක ඒ තත්ථ යං විරිය්වසෙන පඤ්ඤා වසෙන ච කම්මං කරොති ඉදං කම්මං අකණ්හං අසුක්කං අකණ්හ අසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති ඒ ෂඩ්කාර කර්මයන් අතුරෙහි විර්‍ය්‍යවශයෙන් හා ප්‍රඥාවශයෙන් ද චතුර්මහාචෙතනා සංඛ්‍යාතවූ යම් කර්මයක් නොවේ ද මේ ලොකොත්තර කුශලකර්මය කාලකසංඛ්‍යාත දුඃඛවිපාක නො දෙන භෙයින් අකණ්හ ද වේ සොභනඃඛවිපාක වූ සුඃඛවිපාකද නො දෙන භෙයින් අසුක්ක ද වේ තදුභය විපාක රහිතභෙයින් ම අකණ්හ අසුක්ක විපාක ඇත්තේ ද වේ මේ කර්මය කර්මයන් අතුරෙන් උතුම් වේ එසේ ම ශ්‍රේෂ්ඨ වේ සකල කුසලාකුසල කර්මයන් ක්ෂයකිරීම පිණිස පවත්නේ ඒ චත්තාරිමානි කම්මසමාදානානි- අත්ථිකම්මසමාදානං පච්චුප්පන්නසුඛං ආයතිං දුක්ඛවිපාකං, අත්ථි කම්මසමාදානං පච්චුප්පන්න දුක්ඛං ආයතිං සුඛවිපාකං, අත්ථිකම්මසමාදානං පච්චුප්පන්නාදුක්ඛංවෙව ආයතිං ච දුක්ඛ විපාකං, අත්ථිකම්මසමාදානං පච්චුප්පන්නාසුඛං වෙව ආයතිච සුඛ විපාකං මේ කර්මසමාදානයෝ සතරෙක් වෙති කර්මායූහන වතීමානකාලයෙහි කාමපාතව්‍යතා සංඛ්‍යාත සුඛවේදනාන්විතවූ මතුකල දුක්ඛවිපාක ඇත්තාවූ කර්මසමාදානයෙක් ඇත කාමපාතව්‍යතාසංඛ්‍යාත අවෙලක ප්‍රතිපදාවයි, කර්මායූහන වතීමාන කාලයෙහිදුක්වූ මතුකල සුඛවිපාක ඇත්තාවූ කර්මසමාදානයෙක් ඇත, නියුණු කෙලස් ඇත්තහුගේ දුකසේ බඹසරවිසීම් ආදිය යි, කර්මරුස්කරණ වත්මන්කලත් දුක්වූ ද මතුත් දුක් පලදෙන්නාවූ ද කර්මසමාදානයක් ඇත කාමපාතව්‍යතා රහිතවූ අවෙලක ප්‍රතිපදාව හා දුක්ඛවේදනාවෙන් යුක්තවකරණ ප්‍රාණවධාදිය යි, වත්මන්කලැ සුඛවේදනාන්විතවූ ද මතු සුඛවිපාක ඇත්තාවූ ද කර්මසමාදානයක් ඇත, පඤ්ච කොලබන්නාවූ ද ධ්‍යානවිදර්ශීනා වඩන්නහුගේ සසුන් බඹසරවාසය යි.

යං එවං ජානියං කම්මසමාදානං, යම් බඳු අනිකුත් මෙබඳු කර්මසමාදානයක් ඇත්තේ ද.

ඉමිනා පුග්ගලේන අකුසලකම්මසමාදානං උපචිතං අවිපක්කං විපාකාය පච්චුපට්ඨිතං න ච භබ්බා අනිබ්බිද්ධ ඤාතු'න්ති තං

භගවා න ඔවදති යථා දෙවදත්තං කොකාලිකං සුනක්ඛත්තං වලිච්ඡවිපුත්තං.

මේ පුද්ගලා විසින් අකුශලකර්ම සම්භාරයක් එලදෙනයට සමර්ථ වශයෙන් රැස්කරණ ලද්දේය එම අකුශලකර්මය නොපැසුණේය පැසීම පිණිස දැන් පැමිණියේ ය හෙවත් විපාකදීමට කරණ ලද අවකාශ ඇතිවිය එහෙයින් කෙලශාභිසංඛාරයන් බිඳ හැරීමෙන් අනිනිබ්බිද සංඛ්‍යාත ආඤ්ඤාමාගීයට පැමිණෙන්ට හව්‍ය යෙක් නොවන්නේම ය යි දැන භාග්‍යවතුන් වහන්සේ විපාකාවරණයෙන් වැසිගියාවූ එබඳු පුද්ගලයාහට සත්‍යප්‍රතිවේධය පිණිස ඔහම කොට අවවාද නොකරණසේක. දෙවදත්ත-කොකාලික-සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රාදීන්හට අවවාද නොකොට හැරියාක් මෙනි; මතුවාසනා පිණිස එබඳු අයට ද දහම් දෙසේ මැ යි අජාසත් ආදීන්ට මෙන්.

යෙ වා පනඤ්ඤෙපි සත්තා මිච්ඡත්තනියතා ඉමෙසඤ්ච පුග්ගලානං උපච්චිතං අකුසලං නා ච තාවපාරිපූරිගතං පුරා පාරිපූරිං ගච්ඡති පුරා ඵලං නිබ්බත්තයති පුරාමග්ගමා වාරයති පුරාවෙනෙය්‍යත්තං සමතික්කමතී ති තෙභගවා අසමත්තං ඔවදති යථා පුණ්ණච ගොවතිකං අචෙලකඤ්ච කුක්කුරවතිකං. මෙයින් අන්‍ය වූ හෝ මිච්ඡත්තනියත යම් සත්වයෝ වෙත් ද මේ පුද්ගලයන් විසි නුදු කිරීමට පවත්නන්නාලද අකුසල කර්මයක් ඒතාක් පලනිපද විමෙහි සමත්බවට නො පැමිණියේද මතුකල පලනිපදවීමෙන් පිරීමට යේ ද මිච්ඡත්තනියතභාවයෙන් මතුකල වහා ඵලධර්මයාගේ අභාජනත්වය නිපදවයි ද කර්මය සම්පූර්ණව සමාප්ත කොට නො හත්නාවූ එබඳු පුද්ගලයන්ට භාග්‍යවතුන් වහන්සේ අවවාද කරණසේක. ගොවෘත්තයෙහි යෙදුනාවූ පුණ්ණයාහටද සවාණ වෘත්තයෙහි යෙදුනාවූ අචෙලකයාහට ද යම්සේද එමෙනි. මෙයින් කෙලශානන්තරයෙන් මිශ්‍රවූ කර්මානන්තරය ද දක්වනලදී.

ඉමස්ස ච පුග්ගලස්ස අකුසලකම්මසමාදානං පරිපූරමානං මග්ගං ආවාරයිස්සති පුරා පාරිපූරිං ගච්ඡති පුරා ඵලං නිබ්බත්තයති පුරා මග්ගමාවාරයති පුරා වෙනෙය්‍යත්තං සමතික්කමතී'ති තං භගවා අසමත්තං ඔවදති. යථා ආඝසමත්තං අඞ්ගුලිමාලං. මේ පුද්ගලයාගේ ද අකුසලකර්මසමාදානය පරිපූර්ණවනුයේ මාර්ගය ආවරණය කරන්නේය මතුකල පලනිපදවීමෙන් පිරීමට යන්නේය මතුකල වහා ආඤ්ඤාඵල අභාජනත්වය නිපදවන්නේය එසේම මතුකල මාර්ගාවරණය ද කරන්නේය වෛනෙයත්වය ඉක්මවන්නේ ය යි සර්වාකාරයෙන් දන්නා භාග්‍යවතුන් වහන්සේ මිච්ඡත්තනියත වශයෙන් සම්පූර්ණව නිමකොට නොගන්නා

ලද අකුසලකර්ම ඇත්තාවූ ඒ පුද්ගලයාට අවවාද කරණසේක ආයුෂ්මත් දාරුචීරිය තෙරුන්ට මෙනි. මෙයින් අභිප්‍රාය කිම්ද කියා විමසූ සැබෑසේ මුදුමැජ්ඣිමත්තකා, මේ බලනිදේශයෙහි කියනලද සකල කර්මයන්ගේ මෘදුමධ්‍යඅධිමත්ත භාවය දතයුතු, කර්මයන්ගේම මෘදු මධ්‍ය අධිමත්තභාවයෙන් කර්මවිපාකයන්ගේද මෘදු මධ්‍ය තීක්ෂ්ණභාවය හැඟෙයි යන අදහස යි. තත්ථ මුදුආනෙඤ්ජාභි සංඛාරා මජ්ඣිං අවසෙසකුසලා සංඛාරා අධිමත්තං අකුසලසංඛාරා, ඒ මෘදුත්වාදීන් අතුරෙහි අරූපාවචර සමාපත්ති සංඛ්‍යාත ආනෙඤ්ජාභිසංඛාරයෝ මෘදු යි- අවසෙස කුසල සංඛාරයෝ මධ්‍ය යි-අකුසලසංඛාරයෝ අධිමත්ත යි.

යං එත්ථ සුත්තං නෙතුසෝ ඨානසෝ අනොධිසෝ ඉදං දිට්ඨ ධම්මවෙදනීයං ඉදං උපපජ්ජවෙදනීයං ඉදං අපරාපරියවෙදනීයං ඉදං නිරය වෙදනීයං ඉදං තිරච්ඡාන වෙදනීයං ඉදං පෙත්ති විසය වෙදනීයං ඉදං අසුරවෙදනීයං ඉදං දෙවවෙදනීයං ඉදං මනුස්ස වෙදනීය'න්ති ඉදං වුච්චති අතීතානාගත පච්චුප්පන්නානං කම්මසමාදානානං හෙතුසෝ ඨානසෝ අනොධිසෝ විපාකවෙ මත්තතාසුත්තං පස්සවමං තථාගතබලං.

